# වර්ධනයට දිරියක්



INSURANCE BOARD OF SRI LANKA

ශ්‍රී ලංකා රක්ෂණ මණ්ඩලය

වාර්ෂික වාර්තාව | 2016

# පටුන


වසරේ වැදගත් සිදුවීම් 4
සභාපතිතුමියගේ පණිවිඩය 7
අධ්‍යක්ෂ ජනරාල්වරියගේ සමාලෝචනය 10
මණ්ඩලයේ සාමාජිකයින් 14
මණ්ඩලයේ සාමාජිකයින් පිළිබඳව 15
ජ්‍යෙෂ්ඨ කළමනාකරණ කණ්ඩායම 17
කාර්ය මණ්ඩලය 18
සමාලෝචන
පොදු සමාලෝචනය 22
සංඛ්‍යානමය සමාලෝචනය 29
මෙහෙයුම් සමාලෝචනය
- අධීක්ෂණ සමාලෝචනය 60
- නියාමන සමාලෝචනය 64
- විමර්ශන සමාලෝචනය 68
- වෙළඳපොළ සංවර්ධන සහ බාහිර සබඳතා සමාලෝචනය 73
- පරිපාලනමය සමාලෝචනය 76
- මූල්‍ය සමාලෝචනය 77
මූල්‍ය තොරතුරු
- මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශනය 80
- මෙහෙයුම් ප්‍රතිඵලය පිළිබඳ ප්‍රකාශනය 81
- මුදල් ප්‍රවාහ ප්‍රකාශනය 82
- රක්ෂණ ඔප්පු හිමියන්ගේ ආරක්ෂණ අරමුදල මුදල් ප්‍රවාහ ප්‍රකාශනය 83
- ගිණුම්කරණ ප්‍රතිපත්ති 84
- මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන් 86
විගණකාධිපති වාර්තාව 93
විගණකාධිපති විසින් මතුකළ කරුණුවලට මණ්ඩලයේ ප්‍රතිචාර දැක්වීම 98
පරිශිෂ්ඨය I 105
පරිශිෂ්ඨය II 106
පාරිභාෂික ශබ්ද මාලාව 108



අපි ප්‍රායෝගික හා
නව්‍යකරණයෙන් යුතු සහ
ව්‍යාපාරයන් මුහුණදෙන
අභියෝගයන්ට උචිත වූ
විසඳුම් ලබාදීම තුළින්
අපගේ සේවාලාභීන් හා
සැමදා සමීපව
කටයුතු කරන්නෙමු.

# දැක්ම

ආසියාවේ රක්ෂණ නියාමනයේ මිනුම්
ලකුණ බවට පත්වීම.

# මෙහෙවර

රක්ෂණ කර්මාන්තය නියාමනය කිරීම, අධීක්ෂණය
කිරීම සහ අභිවෘද්ධිය සඳහා
පහසුකම් සැලසීම සිදුකරලමින් රක්ෂණ ඔප්පු
හිමියන්ගේ යහපත සුරැකීම.



# වසරේ වැදගත් සිදුවීම්

- රක්ෂණ සමාගම් 29ක්
- රක්ෂණ තැරැව්කාර සමාගම් 56ක්
- රක්ෂණ නියෝජිතයින් 43,816ක්
- ප්‍රාදේශීය ලේකම් කාර්යාල 12ක ග්‍රාම නිලධාරී කොට්ඨාස 798ක් වෙත ලබා දුන් රක්ෂණ දැනුවත්භාවය

## රක්ෂණ කර්මාන්තයේ කාර්යසාධනය

| | 2016 | 2015 | වෙනස % |
|---|---|---|---|
| දළ ලිඛිත වාරික ආදායම (රු. බිලියන) | 143 | 123 | 16.26% |
| මුළු වත්කම් (රු. බිලියන) | 527 | 467 | 12.84% |
| දළ දේශීය නිෂ්පාදනයේ % ලෙස ව්‍යාප්තිය | 1.21 | 1.12 | 8.03% |
| රක්ෂණ ඝනත්වය (රු.) | 6,743 | 5,865 | 14.97% |

## රක්ෂණ මණ්ඩලයේ කාර්යසාධනය

| | 2016 | 2015 | වෙනස % |
|---|---|---|---|
| ඔප්පුහිමියන්ගේ ආරක්ෂණ අරමුදල (රු. බිලියන) | 3.30 | 2.64 | 25% |
| සෙස් ආදායම (රු. මිලියන) | 408.20 | 321.75 | 26.87% |
| වාර්ෂික ගාස්තුව (රු. මිලියන) | 125.50 | 103.81 | 20.89% |

**රු. බිලියන 527**
රක්ෂණ කර්මාන්තයේ මුළු වත්කම්

**රු. බිලියන 143**
රක්ෂණ කර්මාන්තයේ ද.ලි.වා.ආ.



# කළමනාකරණ තොරතුරු



“මධ්‍ය ආදායම් සහිත රටක් සහ ඊට අනුරූප දළ
දේශීය ආදායමක් සහිත රටක් හැටියට
ශ්‍රී ලංකාව හඳුනා ගැනීමත් සමග, මෙරට මූල්‍ය
අවශ්‍යතාවයෙහි එක් කුළුණක් සේ සලකන
රක්ෂණ අංශය, අනාගත අභියෝගවලට මුහුණ
දීමට නැගී සිටීම අත්‍යවශ්‍ය කරුණකි.”

# සභාපතිතුමියගේ පණිවිඩය

ශ්‍රී ලංකා රක්ෂණ මණ්ඩලයේ අධ්‍යක්ෂ මණ්ඩලය වෙනුවෙන්, 2016 වර්ෂය සඳහා වන ශ්‍රී ලංකා රක්ෂණ මණ්ඩලයේ වාර්තාව මා ඉදිරිපත් කරන්නේ ඉමහත් සතුටිනි. දකුණු ආසියාවේ රක්ෂණ නියාමකයන් අතර ආදර්ශමත් නියාමක වීම අරමුණු කොට ගත් අපගේ ගමන් මගෙහි, අභියෝග අතරින්, තවත් ඉදිරි පියවරක් තැබීමට මෙම වර්ෂය තුළ අපට හැකි විය.

කලින් සැලසුම් කළ පරිදි හා නීතිමය අවශ්‍යතාවයක් වූ ජීවිත හා ජීවිත නොවන රක්ෂණ ව්‍යාපාර වෙන් කිරීමේ ක්‍රියාවලිය අවසන් කිරීම, අප මුහුණ පෑ බැරෑරුම් අභියෝගයන්ගෙන් ප්‍රධාන විය. වර්ෂ 2011 අංක 03 දරන රක්ෂණ කර්මාන්තය විධිමත් කිරීමේ (සංශෝධන) පනත අනුව සියලු සංයුක්ත (Composite) රක්ෂණ සමාගම් තම ව්‍යාපාර වෙන් වෙන් වශයෙන් නෛතික ඒකක දෙකකට බෙදීම අවශ්‍ය විය. බොහෝ රටවල ක්‍රියාවට නංවා ඇති මෙම අවශ්‍යතාවය, රක්ෂණ ඔප්පුහිමියන්ගේ වැඩි ආරක්ෂාව සහතික කිරීමේ ප්‍රධාන අරමුණින් මෙන්ම යහපත් පාලන මූලධර්මයක් ලෙස නීතිගත කර ඇත. පැවති සංයුක්ත සමාගම් දොළහෙන් නවයක් සිය කැමැත්තෙන් සහ සහයෝගීතාවයෙන් තම මෙහෙයුම් බෙදා වෙන් කර මෙම අවශ්‍යතාවට අනුගත වීම දිරිගන්වන සුළුය. එහෙත් රක්ෂණ වෙළෙඳපොළෙහි විශාල පංගුවක් හිමිව ඇති රජයට අයත් රක්ෂණ සමාගමක් ඇතුළු සමාගම් තුනක් තවමත් නීතිමය අවශ්‍යතාවට අනුගත වෙමින් වෙන් කිරීම සිදුකර නැත.

රජය විසින් "ජාතික රක්ෂණ දිනය" ප්‍රකාශයට පත් කිරීම නිසා, 2016 වර්ෂය ශ්‍රී ලංකා රක්ෂණ කර්මාන්ත ඉතිහාසයේ සන්ධිස්ථානයක් වනු ඇත. 2016 නොවැම්බර් 22 දින කැබිනට් මණ්ඩලය විසින් මෙය අනුමත කරන ලද අතර, ඒ අනුව සෑම වසරකම සැප්තැම්බර් 01 දින ජාතික රක්ෂණ දිනය ලෙස සනිටුහන්වීම සහ උත්සවාකාරයෙන් සැමරීම සිදුවනු ඇත.

## කර්මාන්තයෙහි කාර්යසාධනය

අභියෝගාත්මක පරිසරයක් පැවතිය ද, ජීවිත රක්ෂණය සහ සාමාන්‍ය රක්ෂණය යන ව්‍යාපාරයන් දෙකෙහිම ධනාත්මක වර්ධනයක් වර්ෂය තුළ ඇති විය. රක්ෂණ කර්මාන්තය තුළ ආසන්න වශයෙන් රුපියල් බිලියන 143 ක සමස්ත දළ ලිඛිත වාරික වර්ධනයක් ජීවිත රක්ෂණ හා සාමාන්‍ය රක්ෂණ මෙහෙයුම්වලින් උපයා ගත හැකි විය. මෙම ඉපැයුම නිරපේක්ෂ වශයෙන් රුපියල් බිලියන 20 ක වැඩිවීමක් සහ 16.27%ක වර්ධනයකි.

එමෙන්ම ජීවිත රක්ෂණ සහ සාමාන්‍ය රක්ෂණ සමාගම් සහ ජාතික රක්ෂණ භාර අරමුදලට අයත් වත්කම් ඇතුළු රක්ෂණ කර්මාන්තයට අයත් සම්පූර්ණ වත්කම්වල ද සුවිශේෂ වැඩි වීමක් මෙම වසර තුළ සිදුවී ඇත. 2016 වර්ෂය අවසන් වන විට සම්පූර්ණ වත්කම්වල ආගණිත අගය රුපියල් බිලියන 527ක් වූ අතර, එම ප්‍රමාණය ඉකුත් වසර හා සසඳන කළ 12.97%ක වර්ධනයක් වේ.

ශ්‍රී ලංකා රක්ෂණ මණ්ඩලය හඳුන්වා දුන් නියාමන වෙනස්කම් හේතු කොට ගෙන ඉකුත් වසර කීපය තුළ රක්ෂණ කර්මාන්තයේ ව්‍යුහය සැලකිය යුතු පරිවර්තනයකට භාජන වී ඇත. අවදානම් පාදක ප්‍රාග්ධන ආකෘතිය (RBC Model) භාවිතයට ගැනීම එම වෙනස්කම්වලින් එකකි. අදියර කීපයක් පසු කොට අවදානම් පාදක ප්‍රාග්ධන මොඩලය ක්‍රියාත්මක කිරීම 2016 ජනවාරි මාසයේ දී ආරම්භ විය. නව ප්‍රාග්ධන මොඩලය කර්මාන්තය විසින් සාර්ථක ලෙස අන්තර්ග්‍රහනය කරගත් නමුත්, එය ක්‍රියාත්මක කිරීමේ දී සමහර ගැටළු මතු වූ බව පෙනී යන ලදී. බාහිර විශේෂඥයන්ගේ සහායද ඇතිව මෙම ගැටළු විසඳීම සඳහා අවදානම්

පාදක ප්‍රාග්ධන මොඩලයේ සීමා රීති (Solvency Margin Rule) වෙත නැවත පරීක්ෂාකර අවශ්‍ය පරිදි සංශෝධනය කිරීමට අපි අදහස් කරන්නෙමු.

2016 වර්ෂය තුළදී රක්‍ෂණ කර්මාන්තයෙහි නියුතු විශාල සමාගම් දෙකක් විසින් සාමාන්‍ය රක්‍ෂණ සමාගම් තුනක් අත්පත් කර ගැනීමත් සමග දේශීය රක්‍ෂණ කර්මාන්තය තුළ ඒකාබද්ධවීමේ ක්‍රියාවලියක් දක්නට ලැබිණ. සංයුක්තකරණය (merge) සහ අත්පත්කරණය තුළින් ව්‍යාපාර මෙහෙයුම් කාර්යක්‍ෂම වීම සහ වඩා ශක්තිමත් ශේෂ පත්‍ර ලැබීමෙන් රක්‍ෂණ කර්මාන්තය වඩා හොඳින් සන්නද්ධ වීම සිදු වනු ඇතැයි අපේක්‍ෂා කෙරේ.

සාමාන්‍යයෙන් රක්‍ෂකයන් අතර පවතින තියුණු තරඟයට අමතරව රක්‍ෂණ සමාගම් විසින් අත්දුටු අභියෝග ක්‍රමයෙන් වැඩි වීමක් ද දක්නට ලැබිණ. වර්ෂය තුළ පැවති අහිතකර දේශගුණ තත්ත්වය හේතු කොටගෙන මතුවූ ගංවතුර හා හදිසි අනතුරු සම්බන්ධව රක්‍ෂණ වන්දි ඉල්ලීම බෙහෙවින් වැඩි වීම විශේෂයෙන් සාමාන්‍ය රක්‍ෂණ සමාග ම්වලට බරපතල ප්‍රශ්න ඇති කළේය.

රජය විසින් "ජාතික ස්වාභාවික ආපදා රක්‍ෂණ යෝජනා ක්‍රමයක්" ප්‍රවර්ධනය කිරීම සහ රක්‍ෂණ සමාගම් විසින් ගංවතුර ආශ්‍රිත වන්දි ඉල්ලීම් කඩිනමින් නිරවුල් කිරීම, සාමාන්‍ය මහජනයා අතර තම ජීවිත හා දේපළ ආරක්‍ෂා කිරීමට රක්‍ෂණ ආවරණයක් තිබීමෙහි අවශ්‍යතාව සහ වැදගත්කම ගැන ධනාත්මක බලපෑමක් ඇති කරන්නට ඇත. තව ද, මෙම තත්ත්වය, රක්ෂණ සමාගම්වල අවධානය ස්වාභාවික ව්‍යසන අවදානම් වෙත යොමු කිරීමට ද, ගංවතුර සහ වෙනත් ස්වාභාවික විපත් සඳහා අවරණය සපයන විශේෂිත රක්‍ෂණ නිමැවුම් (products) සහ විසඳුම් නිර්මාණය කිරීමට ද, සමාගම්වලට අනුබල දීමත් විය.

## ඉදිරි මග

මධ්‍ය ආදායම් සහිත රටක් සහ ඊට අනුරූප දළ දේශීය ආදායමක් සහිත රටක් හැටියට ශ්‍රී ලංකාව හඳුනා ගැනීමත් සමග, මෙරට මූල්‍ය අවශ්‍යතාවයෙහි එක් කුළුණක් සේ සලකන රක්‍ෂණ අංශය, අනාගත අභියෝගවලට මුහුණ දීමට නැගී සිටීම අත්‍යවශ්‍ය කරුණකි.

සෑම වසරකම සැප්තැම්බර් 01 දින ජාතික රක්‍ෂණ දිනය ලෙස ප්‍රකාශයට පත් කිරීමත් සමග රක්‍ෂණයෙහි ව්‍යාප්තිය වැඩි වීම සහ කර්මාන්තයෙහි සමස්ත වර්ධනය ගැන අපි ශුභවාදී ලෙස බලන්නෙමු. කර්මාන්තය විසින් දියත් කර ඇති නොයෙක් ප්‍රවර්ධන ක්‍රියාකාරකම් සහ ශ්‍රී ලංකා රක්‍ෂණ මණ්ඩලය මෙහෙයවන වෙළෙඳපොළ සංවර්ධන කටයුතු මගින් මහජනයා රක්‍ෂණය පිළිබඳ සංකල්පය සහ රක්‍ෂණ ආවරණයක් ලබා ගැනීමේ වැදගත්කම ගැන හොඳ දැනීමක් සහ අධ්‍යාපනයක් ලබා ගන්නා බව අපි විශ්වාස කරමු. මෙම තත්ත්වය අනාගතයේ දී ඉල්ලුම විසින් මෙහෙයවන රක්‍ෂණ කර්මාන්තයක් බිහි කිරීම පහසු කරලීම පිළිබඳ සැකයක් නැත.

මෙරට රක්‍ෂණයේ ව්‍යාප්තිය වැඩි දියුණු කිරීමට රක්‍ෂණ කර්මාන්තයෙහි නවතම මූලාරම්භයන් රැසක් දැන් ක්‍රියාත්මක වෙමින් පවතින අතර ඉන් සමහරක් ශ්‍රී ලංකා රක්‍ෂණ මණ්ඩලයේ සහයෝගයෙන් යුතුව ක්‍රියාත්මකය. ක්‍රමයෙන් වර්ධනය වන ජංගම රක්‍ෂණ යෝජනා ක්‍රමය අඩු ආදායම්ලාභී ජන කොටස් සැලකිය යුතු සංඛ්‍යාවක් අතරට දැනටමත් පිවිසී ඇත. ජංගම රක්‍ෂණය මගින් රක්‍ෂණ ආවරණය ලබා ඇති ජනතාවගේ ආරක්‍ෂණය සහතික කිරීමත්, මෙම රක්‍ෂණ නිමැවුම්වල ගුණාත්මකභාවය දියුණු කිරීමත්, අරමුණු කොට ගෙන දැනට පවත්නා ජංගම රක්‍ෂණ යෝජනා ක්‍රම අපගේ සමාලෝචනයට භාජන වෙමින් පවතී.

ජනගහනයෙන් 52%ක් පමණ වන කාන්තාවන්ට ආරක්‍ෂාව සැපයීමෙහිලා දැනට පවතින ආරක්‍ෂණ හිඩැස පිරවීමට රක්‍ෂණ සමාගම්වලට ද වැදගත් කාර්යභාරයක් ඉටු කළ හැක. නව පාරිභෝගික කොටසක් නිර්මාණය කරමින්, ගනුදෙනුකාර පාර්ශ්වයන් හරහා විශේෂයෙන්ම වෙනත් කාන්තාවන් අතර රක්‍ෂණ නිමැවුම් අලෙවි කරන අතරම ඒ ගැන කරුණු පහදා දීමෙන් කාන්තාවනට වැදගත් කාර්යභාරයක් ඉටු කළ හැක. කර්මාන්තය විසින් ජනතාවගේ විවිධ අංශ අතර පවත්නා රක්‍ෂණ අවශ්‍යතා හඳුනා ගැනීමට තමන් සතු හැකියාවන් නැවත ඇගයීමකට පාත්‍ර කොට එම අවශ්‍යතා සපුරාලීමට යෝග්‍ය මූල්‍ය නිමැවුම් වර්ධනය කළ යුතු බව මම යළිත් අවධාරණය කරනු කැමැත්තෙමි.

ඉදිරි අනාගතයේදී රජය විසින් අනුමත කරනු ඇතැයි අපේක්‍ෂිත, ආසියානු සංවර්ධන බැංකුවේ "ප්‍රාග්ධන වෙළෙඳ පොළ සංවර්ධන වැඩසටහන" සහ ලෝක බැංකුවේ "මූල්‍ය අංශය නූතනකරණය කිරීමේ ව්‍යාපෘතිය" යටතේ පිරිනැමෙන විදේශ අරමුදල් සපයන ව්‍යාපෘති දෙකක ශ්‍රී ලංකා රක්‍ෂණ මණ්ඩලය ප්‍රතිලාභියා වනු ඇත.

මෙරට මූල්‍ය අංශය වැඩි දියුණු කිරීම සඳහා සංඝටක රැසක් ඇතුළත් වන ලෝක බැංකු ව්‍යාපෘතියෙන්, ශ්‍රී ලංකා රක්‍ෂණ මණ්ඩලයේ නියාමන හැකියාව ශක්තිමත් කිරීමට සහ යටිතල ව්‍යුහය සංවර්ධනය කිරීමට මූල්‍ය සහ තාක්‍ෂණික සහාය අපේක්‍ෂා කෙරේ. සාමාන්‍ය ජනතාවගේ මූල්‍ය සාක්ෂරතාව පුළුල් කිරීම සඳහා උපායමාර්ග සංවර්ධනය කිරීමටත්, රක්ෂණ නියාමක සහ කර්මාන්තය විසින් දැනට පැමිණිලි ගැන කටයුතු කරන ක්‍රියාමාර්ගය සමාලෝචනය කිරීමටත්, අන්තර්ජාතික වශයෙන් ඉතා යහපත් සේ සැලකෙන ක්‍රියාමාර්ගවලට අනුකූල විස්තරාත්මක ගැටුම් නිරාකරණ ක්‍රියාදාමයක් සංවර්ධනය කිරීමටත්, ආසියානු සංවර්ධන බැංකුව තාක්‍ෂණික සහාය සපයනු ඇත. මෙම ප්‍රතිසංස්කරණ, රක්ෂණ ක්ෂේත්‍රයේ නියාමක වශයෙන් කටයුතු කරන අපට, අපගේ දර්ශනය සහ මෙහෙවර සාක්ෂාත් කර ගැනීමට උපයෝගී වන බවට සහ එමගින් කර්මාන්තය සඳහා වඩාත් සහෝපකාරී වාතාවරණයක් නිර්මාණය වන බවට ශුභවාදී අපේක්‍ෂාවන් ඇත.

ඉදිරි වසර තුළ දැනට "ශ්‍රී ලංකා රක්‍ෂණ මණ්ඩලය" යනුවෙන් හැඳින්වෙන රක්‍ෂණ කර්මාන්තයේ නියාමක, "ශ්‍රී ලංකා රක්ෂණ නියාමන කොමිසම" යනුවෙන් නම් කෙරෙනු ඇත. සියලු විධි නියමයන් දැනටමත් සම්පූර්ණ කර ඇති බැවින් නුදුරු අනාගතයේ දී ම නම් වෙනස් කිරීම අනුමත කොට නීතිගත කරනු ඇත.

## ස්තූතිය

අවසාන වශයෙන්, අධ්‍යක්ෂ මණ්ඩලයේ සාමාජිකයන්ගෙන් ලැබුණ උපරිම සහයෝගය සහ අගනා දායකත්වය මා අගය කරන බව සඳහන් කරනු කැමැත්තෙමි. රක්‍ෂණ කර්මාන්තයට බලපාන විවිධ ප්‍රතිපත්තිමය පියවර ගැන තීරණ ගැනීමේ දී ඔවුන් දැක් වූ කැපවීම අපගේ අතිශය ප්‍රබලතම ශක්තියක් විය.

තවද, රක්ෂණ කර්මාන්තයේ අනෙකුත් පාර්ශවකරුවන් වන රක්‍ෂණ ඔම්බුඩ්ස්මන්, ශ්‍රී ලංකා රක්‍ෂණ සංගමය, ශ්‍රී ලංකා රක්‍ෂණ තැරැව්කරුවන්ගේ සංගමය සහ ශ්‍රී ලංකා රක්‍ෂණ ආයතනයට ද ඔවුන් අප සමග අඛණ්ඩව පවත්වන අනර්ඝ සහයෝගීතාවය සහ සුහද සබඳතාවය ගැන ස්තූතිවන්ත වීමට මෙය අවස්ථාවක් කරගනිමි.

ශ්‍රී ලංකා රක්‍ෂණ මණ්ඩලයේ පරමාර්ථ සාක්ෂාත් කර ගැනීමෙහිලා, අධ්‍යක්ෂ ජනරාල්, අධ්‍යක්ෂවරු ඇතුළු මණ්ඩලයේ සියලු නිලධාරීන් දැක් වූ කැපවීම සහ ප්‍රත්‍යස්ථීතිය මම බෙහෙවින් අගය කරන අතර ඒ සැමට මාගේ ස්තූතිය පුද කරමි. ශ්‍රී ලංකා රක්‍ෂණ මණ්ඩලයේ දර්ශනය හා මෙහෙවර අනුව කටයුතු කරමින්, ඉදිරියේදීද මෙම ආයතනයේ උපායමාර්ග අනුව එක් කණ්ඩායමක් සේ සේවක මණ්ඩලය නිසැකවම කටයුතු කරන බව, මම සුභවාදී විශ්වාස කරමි.



ඉන්ද්‍රාණී සුගතදාස
සභාපතිනිය

# අධ්‍යක්ෂ ජනරාල්වරියගේ සමාලෝචනය



"රජය විසින් ආරම්භ කරන ලද මූල්‍ය අංශයේ ප්‍රධාන සංවර්ධන ව්‍යාපෘති සඳහා ශ්‍රී ලංකා රක්ෂණ මණ්ඩලය තාක්ෂණ සහාය සම්බන්ධයෙන් මුඛ්‍ය ප්‍රදානලාභියකු බව විශේෂයෙන් සඳහන් කළ යුතුය. ශ්‍රී ලංකාවේ සමස්ත මූල්‍ය ප්‍රමුඛ පද්ධතිය අන්තර්ජාතික මට්ටමට ඔසවා තැබීමෙහි අරමුණ ඇතිව, ශ්‍රී ලංකාවේ රක්ෂණ අංශය සංවර්ධනය කිරීමට රජය දක්වන සෘජු මැදිහත්වීම මෙයින් පැහැදිලි වේ."

ශ්‍රී ලංකා රක්ෂණ මණ්ඩලය ශ්‍රී ලංකාවේ රක්ෂණ කර්මාන්තය නියාමනය, අධීක්ෂණය සහ සංවර්ධනය පහසු කිරීමට ඉටුකළ ක්‍රියාකාරකම් සමාලෝචනය කිරීම සහ 2016 වසර තුළ රක්ෂණ කර්මාන්තයේ කාර්යසාධනය පිළිබඳ විවරණයක් සැපයීම මා ඉටු කරන්නේ ඉමහත් සන්තෝෂයෙනි.

වර්තමාන රක්ෂණ ඔප්පු හිමියන් සහ අනාගත රක්ෂණ ඔප්පු හිමියන්ගේ යහපත සුරැකීම උදෙසා ශ්‍රී ලංකාවේ රක්ෂණ ව්‍යාපාරය අවංකව, වෘත්තීය නිපුනතාවයෙන් යුක්තව සහ ඥානාන්විත ලෙස මෙහෙයවන බව සහතික කිරීම, රක්ෂණ කර්මාන්ත නියාමන පනත යටතේ ශ්‍රී ලංකා රක්ෂණ මණ්ඩලයෙන් අපේක්ෂිත කාර්යය වේ. මෙම පරමාර්ථය සාක්ෂාත් කරගැනීමේ අරමුණ ඇතිව, රක්ෂණ සහතික හිමියන්ගේ වැඩි ආරක්ෂාව සමග කර්මාන්තයේ වඩා හොඳ කාර්යසාධනය සහ ස්ථාවරත්වය සහතික කිරීමේ මූලික අපේක්ෂාව ඇතිව, රක්ෂණ මණ්ඩලය, 2016 වසර තුළ ක්‍රියාකාරකම් කීපයක්ම ක්‍රියාත්මක කළේය.

## ප්‍රධාන නියාමන සහ අධීක්ෂණ ඇරඹුම්

ව්‍යාපාරය ආශ්‍රිත අවදානම සැලකිල්ලට භාජන කරමින් සැලසුම් කළ ප්‍රාග්ධන රාමුව විස්තරාත්මක වුත්, ස්ථිරසාර වුත් ඇගයීමෙහි ප්‍රතිඵලයක් වශයෙන් අවදානම් පාදක ප්‍රාග්ධන නීති ක්‍රියාත්මක කිරීම ශ්‍රී ලංකා රක්ෂණ මණ්ඩල ඉතිහාසයේ වැදගත් සන්ධිස්ථානයකි. නීතිය ඇගයීම සහ ක්‍රියාත්මක කිරීමෙන් පසු භාවිතයෙහි තවත් ඉදිරි පියවරක් වශයෙන් අවදානම් පාදක ප්‍රාග්ධන නීති ක්‍රියාත්මක කිරීමේ ඵලදායීත්වය සහ එම නීතිවල කාර්යක්ෂමතාව ගැන මූලික සමාලෝචනයක් ලෝක බැංකුවේ සහාය ඇතිව අප විසින් සිදු කරන ලදී. මෙම සමාලෝචනය අනාගතයේ දී කර්මාන්තයේ නීති සහ පිළිවෙත් තවදුරටත් හැඩගැස්වීමට සහාය වනු ඇතැයි විශ්වාස කරමු.

නව අවදානම් පාදක ප්‍රාග්ධන තන්ත්‍රය මගින් නියම කර ඇති අවම ප්‍රාග්ධන අවශ්‍යතාවලට අනුගත

නොවීම නිසා රක්ෂකයන් දෙදෙනෙකු අත්හිටුවීම ඇතුළු හඳුනාගත් සුවිශේෂී උල්ලංඝනයන් ගැන රක්ෂණ මණ්ඩලය මෙම වර්ෂය තුළ දැඩි බලාත්මක පියවර ගෙන ඇත.

ඇතැම් ඔප්පු ලාභීන්ට ඔප්පු නොලැබීම ගැන පැමිණිලි කරන බව නිරීක්ෂණය වූ බැවින්, ඔප්පු නිකුත් කළ දිනයේ සිට දින 14ක් ඇතුළත එම ඔප්පු ලැබුණු බවට ඔප්පු ලාභීන්ගෙන් ලිඛිත පිළිගැනීමක් ලබා ගත යුතු බවට නියෝගයක් රක්ෂණ මණ්ඩලය විසින් නිකුත් කිරීම, රක්ෂණ ඔප්පු ලාභීන්ගේ අපේක්ෂාවන් ඉටු කිරීමට හඳුන්වා දුන් පියවර අතර විය.

සියලු දීර්ඝ කාලීන රක්ෂණ නිමැවුම් (Products) සඳහා රක්ෂණ ලේඛන ලැබුණ දිනයේ සිට දින 21ක සම්මත කාලයක් තම තීරණ වෙනස් කිරීම සඳහා ඔප්පු ලාභීන්ට ලබාදීමට ශ්‍රී ලංකා රක්ෂණ මණ්ඩලය නියම කළේය. රක්ෂණ ඔප්පු ලේඛන ලැබුණ පසු එම ලේඛනවල නියමයන් සහ කොන්දේසි පිරික්සා ඒවා ගැන සෑහීමට පත්විය නොහැකි නම් ඔප්පු අවලංගු කිරීමට රක්ෂණ ඔප්පු ලාභීන්ට අවස්ථාවක් ලබා දීම මෙම තීරණයේ අරමුණ විය.

පනත යටතේ රක්ෂකයන්ගේ සහ රක්ෂණ තැරැව්කරුවන්ගේ ප්‍රධාන නිලධාරීන් සතු කාර්යභාරය සහ වගකීම සලකා බැලීමෙන් අනතුරුව, ශ්‍රී ලංකා රක්ෂණ මණ්ඩලය ප්‍රධාන නිලධාරීන් සමාගමේ ව්‍යාපාරික කටයුතු පිළිබඳ සාමාන්‍ය පාලනය, විධානය සහ අධීක්ෂණය ගැන වගකිව යුතු බව ද, එබැවින් ප්‍රධාන විධායක නිලධාරී තනතුර හෙබවිය යුතු බව ද නැවත අවධාරණය කළේය.

අවදානම් පාදක ප්‍රාග්ධනය සඳහා බලගැන්වීමේ උපාය මාර්ගයක් සංවර්ධනය කිරීම, ගනුදෙනුකරුවන්ගේ පැමිණිලි සම්බන්ධයෙන් ක්‍රියාකරන ආකාරය ගැන රක්ෂකයන් සහ තැරැව්කරුවන් සඳහා පැමිණිලි ගැන කටයුතු කිරීම පිළිබඳ මාර්ගෝපදේශ නිකුත් කිරීම, රක්ෂණ වන්දි ඉල්ලීම් විමර්ශනය කිරීම පිළිබඳ මාර්ගෝපදේශ නිකුත් කිරීම, රක්ෂණ නියෝජිතයන් කළ බවට චෝදනා නැගෙන වැරදි ක්‍රියා ගැන පරීක්ෂණ පැවැත්වෙන විට අනුගමනය කළ යුතු යහපත් පිළිවෙත් ගෙනහැර දැක්වීම සහ රක්ෂණ නියෝජිතයන් සඳහා චර්යාධර්ම පද්ධතියක් නිකුත් කිරීම වැනි ක්ෂේත්‍රයන් හී රක්ෂණ කර්මාන්තය සමග ශ්‍රී ලංකා රක්ෂණ මණ්ඩලය සාර්ථක ලෙස සහයෝගයෙන් කටයුතු කර ඇත.

## අනාගත ඇරඹුම්

රජය විසින් ආරම්භ කරන ලද මූල්‍ය අංශයේ ප්‍රධාන සංවර්ධන ව්‍යාපෘති සඳහා ශ්‍රී ලංකා රක්ෂණ මණ්ඩලය තාක්ෂණ සහාය සම්බන්ධයෙන් මුඛ්‍ය ප්‍රදානලාභියකු බව විශේෂයෙන් සඳහන් කළ යුතුය. ශ්‍රී ලංකාවේ සමස්ත මූල්‍ය ප්‍රමුඛ පද්ධතිය අන්තර්ජාතික මට්ටමට ඔසවා තැබීමෙහි අරමුණ ඇතිව, ශ්‍රී ලංකාවේ රක්ෂණ අංශය සංවර්ධනය කිරීමට රජය දක්වන ඍජු මැදිහත්වීම මෙයින් පැහැදිලි වේ. එබඳු එක් සංවර්ධන ව්‍යාපෘතියක් නම්, ලෝක බැංකුවේ ආධාර ඇතිව ක්‍රියාත්මක කරන මූල්‍ය අංශය නවීකරණය කිරීමේ ව්‍යාපෘතියයි. මෙම ව්‍යාපෘතිය යටතේ අන්තර්ජාතික පිළිගැනීමට පාත්‍ර වූ රක්ෂණ කර්මාන්තයේ ප්‍රමිති සහ සිද්ධාන්තවලට සම වන ලෙස රක්ෂණ නීති සංශෝධනය කිරීමට ශ්‍රී ලංකා රක්ෂණ මණ්ඩලය අපේක්ෂා කරයි. තව ද, එම ව්‍යාපෘතිය, නවීන තොරතුරු තාක්ෂණ පදනමක් සමග අවදානම් පාදක අධීක්ෂණය පූර්ණ වශයෙන් ක්‍රියාත්මක කිරීම සාක්ෂාත් කර ගැනීමට සහාය වනු ඇත. ව්‍යාපෘතිය යටතේ හඳුනාගත් තවත් ප්‍රධාන කාර්යයක් නම් ක්ෂුද්‍ර රක්ෂණය සඳහා නියාමන සහ අධීක්ෂණ රාමුවක් හඳුන්වා දීමයි.

ක්ෂුද්‍ර රක්ෂණ සඳහා නියාමන රාමුවක් සංවර්ධනය කිරීමට අදාළව ක්ෂුද්‍ර රක්ෂණ නිමැවුම් (Products) සඳහා පවතින ඉල්ලුම සහ සැපයුම පිළිබඳව බිම් මට්ටමෙහි පවත්නා යථාර්ථය තේරුම් ගැනීමට ලෝක බැංකුවේ සහාය ඇතිව වෙළෙඳපොළ සමීක්ෂණයක් සමාලෝචිත වර්ෂය තුළ මෙහෙයවන ලදී. ක්ෂේත්‍රය තුළ නියාමන ප්‍රතිසංස්කරණ ආරම්භ කිරීම සඳහා වේදිකාවක් මෙම අධ්‍යයනය ලබා දෙනු ඇත.

ආසියානු සංවර්ධන බැංකුව මගින් ක්‍රියාත්මක කරන, ප්‍රාග්ධන වෙළෙඳ පොළ සංවර්ධන ව්‍යාපෘතිය අනෙක් ප්‍රධාන මූල්‍ය අංශ සංවර්ධන ව්‍යාපෘතියයි. එම ව්‍යාපෘතිය තුළ, ශ්‍රී ලංකා රක්ෂණ මණ්ඩලය, පාරිභෝගික කටයුතු අධිකාරිය සහ රක්ෂණ ඔම්බඩ්ස්මන් ඇතුළු අධිකාරීන් රැසක් මගින් දැනට ක්‍රියාත්මක කරන රක්ෂණ ඔප්පු ලාභීන්ගේ දුක්ගැනවිලි සමනය කරන ක්‍රියා පද්ධතිය ක්‍රමවත් කිරීමට, ශ්‍රී ලංකා රක්ෂණ මණ්ඩලයට තාක්ෂණික සහාය ලැබෙනු ඇත. ව්‍යාපෘතිය අවසන් කිරීමෙන් පසු, ඔප්පු ලාභීන්ගේ දුක්ගැනවිලි ගැන ක්‍රියා කිරීමට මධ්‍යගත ක්‍රියාවලියක් ශ්‍රී ලංකාවට ලැබෙනු ඇතැයි අපි අපේක්ෂා කරමු. තව ද, මහජනතාවගේ රක්ෂණය පිළිබඳ දැනුවත්කම ගැන විශ්ලේෂණයක් කිරීමට ද, එමගින් රක්ෂණ ගැන වැඩි මහජන අවබෝධයක් ඇති කිරීම සඳහා ශක්තිමත් උපායමාර්ගයක් සංවර්ධනය කිරීමට ද, ශ්‍රී ලංකා රක්ෂණ මණ්ඩලයට තාක්ෂණික සහාය ලැබෙනු ඇත.

## රක්ෂණ අංශයේ කාර්යසාධනය

රක්ෂණ ව්‍යාපාරයෙහි ගමන් පථ ද්විත්වයෙහිම වර්ධනයක් 2016 වර්ෂයේ දී දක්නට ලැබුණි. 2015 වසරේ සම්පූර්ණ වර්ධනය 16.22%ක් වූ අතර, 2016 වසරේ වර්ධනය 16.27%ක් විය. කෙසේ වුව ද, දීර්ඝ කාලීන රක්ෂණ ව්‍යාපාර වර්ධනය 20.40% සිට 2016 දී 18.26% දක්වා පහත වැටී තිබුණි. අසමාන වර්ධනයක් පෙන්නුම් කරමින් සාමාන්‍ය රක්ෂණ ව්‍යාපාරය 13.18% සිට 2016 දී 14.73% දක්වා වැඩි වී තිබුණි. මෙය 2012 න් පසු වාර්තා වූ වැඩිම වර්ධන අනුපාතයයි.

ජාතික රක්ෂණ භාර අරමුදල මගින් වර්ෂය තුළ ජනනය වූ ප්‍රතිරක්ෂණ වාරික ආදායම සුවිශේෂ ලෙස 35.62% කින් වැඩි වී ඇත. මෙයට ප්‍රධාන හේතුව නම්, සාමාන්‍ය ප්‍රතිරක්ෂණ ව්‍යාපාරයේ විවිධ උප පංති පුළුල් පරාසයක් පිළිගැනීම සහ සාමාන්‍ය රක්ෂණ අංශයේ දක්නට ලැබුණ සුවිශේෂ වර්ධනයයි.

කර්මාන්තයෙහි ධනාත්මක වර්ධන අනුපාතයක් දක්නට ලැබුණ නමුත්, රක්ෂණ ග්‍රහනය පහත් මට්ටමක, එනම් 1.21% ක පැවතින. දීර්ඝ කාලීන ව්‍යාපාරය සඳහා මෙය 0.54% මට්ටමේ පැවති අතර සාමාන්‍ය රක්ෂණ ව්‍යාපාරය සඳහා එය 0.67% මට්ටමේ පැවතුණි. කෙසේ වුව ද, කෘෂිකර්ම රක්ෂණ මණ්ඩලය සහ ශ්‍රී ලංකා අපනයන ණය රක්ෂණ සංස්ථාව, ශ්‍රී ලංකා රක්ෂණ මණ්ඩලයේ අධීක්ෂණ සහ නියාමන විෂය පාඨය යටතට පත් නොවන බැවින් ග්‍රහන අනුපාතය ගණන් බැලීමේ දී එම ආයතන ජනනය කළ වාරික ප්‍රමාණය නොසලකන බව සැලකිය යුතුය. ඒ අයුරින් ම, ක්ෂුද්‍ර රක්ෂණ ආයතන ජනනය කරන රක්ෂණ වාරික සහ ක්ෂුද්‍ර මූල්‍ය ආයතන විසින් ආරක්ෂණ ආවරණ මත අය කරන වාරික ද ග්‍රහන අනුපාතය ගණන් බැලීමේ දී ගණන් ගන්නේ නැත. ඒක පුද්ගල දළ ලිඛිත වාරික ආදායම විසින් නියෝජනය කරනු ලබන රක්ෂණ ඝනත්වය රු. 5,865 සිට රු. 6,743 දක්වා වැඩි වී ඇත. එය 2016 තුළ 15% ක වැඩි වීමකි.

2016 දෙසැම්බර් 31 දින වන විට රක්ෂණ කර්මාන්තයේ වත්කම් වටිනාකම රුපියල් මිලියන 527,288ක් විය. මෙය 2015 වර්ෂය අවසානයේ දී වාර්තා වූ අනුරූප වටිනාකම වන රුපියල් මිලියන 466,707 හා සසඳන විට 12.97%ක ස්ථිර වර්ධනයකි. මෙම ප්‍රමාණය අතුරෙන් රුපියල් මිලියන 345,675ක් වූ වැඩි ප්‍රමාණය, දීර්ඝ කාලීන රක්ෂකයන් සතු විය. කෙසේ වුව ද, දීර්ඝ කාලීන රක්ෂණ වත්කම් වටිනාකමෙහි වර්ධන අනුපාතය 2015 දී වාර්තා වූ 26.6%, 2016 දී 10.5% ලෙස වාර්තා වීමෙන් පෙනීයන්නේ එම වත්කම් වටිනාකම සැලකිය යුතු ලෙස අඩු වී ඇති බවය. මෙයට අසමානව, සාමාන්‍ය රක්ෂණයෙහි වත්කම් වටිනාකම 2015 දී සෘණ 13% වුව ද, 2016 දී ධන 16%ක් වීමෙන් වත්කම් වටිනාකම වැඩි වී ඇති බව පෙනේ.

වර්ෂය තුළ දළ ලිඛිත වාරික ආදායම රුපියල් මිලියන 63,495ක් ජනනය කරමින් දීර්ඝ කාලීන රක්ෂණ ව්‍යාපාරය සතුටුදායක ලෙස ක්‍රියා කර ඇත. 2016 දී දීර්ඝ කාලීන රක්ෂකයන් විසින් රක්ෂණ වන්දි සඳහා ගෙවා ඇති මුදල රුපියල් මිලියන 22,622 ක් වන අතර, 2015 දී ගෙවූ අනුරූප ප්‍රමාණය රුපියල් 20,934ක් වන අතර මෙය 8% ක වැඩි වීමකි. දීර්ඝ කාලීන රක්ෂණ වන්දි ගෙවීම් අතුරෙන්, වැඩිම ප්‍රමාණය කල්පිරීම සඳහා කළ ගෙවීම් වන අතර, එය රුපියල් මිලියන 12,712ක් විය. වර්ෂය තුළ අබලතා ප්‍රතිලාභ ගෙවීම් 2015 හා සසඳන කල 37% කින් වැඩි වී ඇති අතර එසේ ගෙවූ සම්පූර්ණ ප්‍රමාණය රුපියල් මිලියන 591ක් වීම සැලකිය යුතු කාරණයකි.

2016 වර්ෂයේ දී ඔප්පු අවලංගු වීම් ඉහළ අනුපාතයක් දැක්වීය. නව දීර්ඝ කාලීන රක්ෂණ ඔප්පු අවලංගුවීම් සංඛ්‍යාව 96,502ක් විය. මෙය 2015 දී අවලංගු වූ සංඛ්‍යාව වන 93,008 ට වඩා 3.76%ක වැඩි වීමකි. තව ද, සම්පූර්ණ ඔප්පු අවලංගු වීමෙහි ද වැඩි වීමක් දක්නට ලැබුණි. මෙයින් පිළිබිඹු වූයේ දීර්ඝ කාලීන රක්ෂණ ව්‍යාපාරය පිළිබඳ සෘණ හැඟීමකි.

සාමාන්‍ය රක්ෂණ අංශයෙහි යහපත් ධනාත්මක වර්ධන සහගත තත්ත්වයක් දක්නට ලැබුණි. එම අංශය 2015 වර්ෂය හා සසඳන කල 14.73% වර්ධනයක් පෙන්නුම් කළේය. තව ද, වර්ෂය තුළ ඒකාබද්ධවීම් සහ අත්කරගැනීම් වැඩි වී වඩා හොඳ කාර්යසාධනයක් සඳහා සහබද්ධවීමක් පෙන්නුම් කළේය.

සම්පූර්ණ දළ ලිඛිත වාරික 62%ක් හිමි කරගත් මෝටර් රථ රක්ෂණය සිරිත් පරිදි සාමාන්‍ය රක්ෂණ අංශයෙහි ප්‍රමුඛස්ථානය හිමි විය. කෙසේ වුව ද, 2015 දී පැවති වර්ධන අනුපාතය 19.10%ක් වූ නමුදු එය 2016 දී 15.64%ක් වී වර්ධන අනුපාතයෙහි පහත වැටීමක් පෙන්නුම් කළේය. සාමාන්‍ය රක්ෂණ අංශයෙහි පැවති උප වර්ග අතුරෙන් ගිනි, සෞඛ්‍යය, විවිධ සහ වැඩ වර්ජන, කැරලි කෝලාහල, ජන කැළඹීම් සහ ත්‍රස්තවාදය වැනි කරුණු සඳහා රක්ෂණ ව්‍යාපාර 2015 හා සසඳන විට වර්ධනය වී ඇති බව පෙනේ.

නැවත නැවතත් සිදු වූ ස්වාභාවික විපත් හේතු කොට ගෙන ගිනි රක්ෂණ කොටස, 2015 වර්ෂය තුළ ජනනය වූ ව්‍යාපාරවලට වඩා 12.79% කින් වර්ධනය වීමට හේතු වන්නට ඇත. විවිධ රක්ෂණ වර්ගයෙහි 2015 දී පැවති සෘණ 3.37% ක වර්ධන අනුපාතය වෙනුවට 10.06%ක වර්ධන අනුපාතයක් 2016 දී පෙන්නුම් කළේය.

ප්‍රධාන වශයෙන් දිවයිනේ පළාත් රැසක පැවති ගංවතුර හේතු කොට ගෙන, 2015 ට වඩා ශුද්ධ වන්දි ඉල්ලීම් අනුපාතය 3.83% කින් වැඩි කරමින්, 2016 වර්ෂය වන්දි ඉල්ලීම් අනුපාතයෙහි වැඩි වීමක් පෙන්නුම් කළේය.

## තැරැව්කරුවන්ගේ ව්‍යාපාරයෙහි කාර්යසාධනය

තැරැව්කාර සමාගම්වල සම්පූර්ණ දළ ලිඛිත වාරික වර්ධන ප්‍රමාණය 2015 වර්ෂය හා සසඳන කල 8.89% ක් වූ අතර එය 2%ක අඩු වීමකි. 2015 දී වාර්තා වූ 13.28% සම්පූර්ණ දළ ලිඛිත වාරික ආදායමට තැරැව්කාර සමාගම්වල දායකත්වය ද, 12.44% දක්වා අඩු විය. මෙම දායකත්වය, සාමාන්‍ය රක්ෂණ සහ දීර්ඝ කාලීන රක්ෂණ ව්‍යාපාර ජනනය කරන ලද වාරික ආදායම එකතුවීමෙන් සෑදී ඇත. එය පිළිවෙළින් 98.52% සහ 1.47% ලෙස වාර්තා විය.

## ස්තූතිය

අපගේ ශක්තියට සහ ශ්‍රී ලංකා රක්ෂණ මණ්ඩලයේ පරමාර්ථ සාර්ථක ලෙස සාක්ෂාත් කරගැනීමට හේතුපාදක වෙමින් අපට මගපෙන්වූ සහ ආධාර කළා වූ සභාපතිනිය සහ මණ්ඩලයේ සාමාජිකයන්ට මම ස්තූතිවන්ත වෙමි. ශ්‍රී ලංකා රක්ෂණ සංගමය, ශ්‍රී ලංකා රක්ෂණ තැරැව්කරුවන්ගේ සංගමය සහ ශ්‍රී ලංකා රක්ෂණ ආයතනය යන සංවිධානවල සභාපතිවරු සහ නිලධාරීන්ට ද දැක්වූ සහයෝගය ගැන මම කෘතඥ වෙමි. අවසාන වශයෙන්, වර්ෂය සඳහා හඳුනාගත් අරමුණු ළඟා කර ගැනීමට දැක් වූ කැපවීම හා දැඩි උත්සාහය වෙනුවෙන් මගේ ප්‍රවීන අධ්‍යක්ෂ මණ්ඩලයට සහ නිපුනතා පූර්ණ සේවක පිරිසට මගේ කෘතඥතාවය හිමි වේ.



**දමයන්ති ප්‍රනාන්දු**
*අධ්‍යක්ෂ ජනරාල්*



# කළමනාකරණ තොරතුරු

# මණ්ඩලයේ සාමාජිකයින්




[1] ඉන්ද්‍රාණි සුගතදාස මහත්මිය - සභාපතිනිය
[2] ඒ. ආර්. දේශප්‍රිය මහතා
[3] පී. සමරසිරි මහතා
[4] ඩී. එන්. ආර්. සිරිවර්ධන මහතා
[5] දේශබන්දු ආචාර්ය ඒ. ඒ. ශබීර් ගුලාම්හුසේන් මහතා
[6] ජෙරෙමි බෝලින් මහතා

# මණ්ඩලයේ සාමාජිකයින් පිළිබඳව

## [1] ඉන්ද්‍රාණි සුගතදස මහත්මිය සභාපතිනිය

ඉන්ද්‍රාණි සුගතදාස මහත්මිය ශ්‍රී ලංකා පරිපාලන සේවයට ඇතුළත් වී සිය වෘත්තිය දිවිය ආරම්භ කරන ලදි. ඇයගේ වසර 35 ඉක්මවා ගිය දීර්ඝ කාලීන රාජ්‍ය සේවා කාලය තුළ අමාත්‍යංශයන්හි විවිධ වූ ජ්‍යෙෂ්ඨ තනතුරු දරන ලද අතර ශ්‍රී ලංකා සුරැකුම්පත් හා විනිමය කොමිෂන් සභාවේ සභාපතිනිය ලෙසද ක්‍රියාකරන ලදී.

වර්තමානයේදී සුගතදාස මහත්මිය ශ්‍රී ලංකා රක්ෂණ මණ්ඩලයේ සභාපති ධුරයට අමතරව ජාතික සංවර්ධන බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලයේ සාමාජිකාවක් ලෙස සහ කළුබෝවිටියාන තේ කර්මාන්තශාලා සමාගමේ අධ්‍යක්ෂිකාවක ලෙසද කටයුතු කරයි. සිය රාජ්‍ය සේවා කාලය තුළ සුගතදාස මහත්මිය ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය, අපනයන සංවර්ධන මණ්ඩලය, ශ්‍රී ලංකා තේ මණ්ඩලය, මධ්‍යම පරිසර අධිකාරිය, ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශය, ජාතික තරුණ සේවා සභාව, ජාතික වැවිලි කළමනාකරණ ආයතනය සහ තේ, පොල්, රබර් යන පර්යේෂණ ආයතනවල අධ්‍යක්ෂ මණ්ඩල සාමාජිකාවක ලෙස ද කටයුතු කර ඇත.

ඉන්ද්‍රාණි සුගතදාස මහත්මිය කොළඹ විශ්ව විද්‍යාලයෙන් ශාස්ත්‍රවේදී උපාධිය ලබා, අනතුරුව ඕස්ට්‍රේලියාවේ මොනෑෂ් සරසවියෙන් ව්‍යාපාර/රාජ්‍ය පරිපාලන ශාස්ත්‍රපති උපාධිය හිමිකරගෙන ඇත. මීට අමතරව, ඇය එක්සත් ජනපද රාජ්‍යයෙන් පිරිනමන හියුබට් එච්. හම්ප්‍රි අධි ශිෂ්‍යත්වයක් ලබාගෙන ඇත. සුගතදාස මහත්මිය ශ්‍රී ලංකාව නියෝජනය කරමින්, දූත මණ්ඩල හා ජාත්‍යන්තර ආයතන විසින් සංවිධානය කරන ලද සම්මන්ත්‍රණ සහ වැඩමුළු ගණනාවකට ද සහභාගි වී ඇත. සුගතදාස මහත්මිය රාජ්‍ය සේවයට කළ දායකත්වය හා විවිධ ක්ෂේත්‍රයන්හි කටයුතු කරමින් ලබාදෙන ලද නායකත්වය අගයමින් ඇය වෙත ප්‍රදානයන් හා සම්මාන කිහිපයක්ම ලැබී ඇති අතර 2013 ඕස්ට්‍රේලියානු ඇලුම්නි විශිෂ්ට සම්මානයෙන්ද කාන්තා කළමනාකාරිත්ව සංවිධාන විසින් වෘතීමය කාන්තාවන් සඳහා පිරිනමන ලද "Inspirational Woman 2014/2015" සම්මානයෙන්ද ඇය පිදුම් ලැබුවාය.

## [2] ඒ. ආර්. දේශප්‍රිය මහතා

ඒ. ආර්. දේශප්‍රිය මහතාට රාජ්‍ය අංශයේ වසර 30ක අත්දැකීම් ඇත. ඔහු මේ වන විට ශ්‍රී ලංකා පරිපාලන සේවයේ විශේෂ ශ්‍රේණියේ නිළධාරියකු වේ.

රාජ්‍ය අංශයේ විවිධ අංශයන්හි සිය රාජකාරී කටයුතු කළ ඔහු, මහා භාණ්ඩාගාරයේ අධ්‍යක්ෂ සහ අතිරේක අධ්‍යක්ෂ ජනරාල් තනතුරුද දරණ ලදි.

වර්තමානයේදී මහා භාණ්ඩාගාර නියෝජ්‍ය ලේකම් තනතුර දැරීමට ප්‍රථම ඔහු ජාතික අයවැය දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල් තනතුර හොබවන ලදි. තවද ප්‍රාදේශීය සංවර්ධන බැංකුවේ අධ්‍යක්ෂවරයෙක් සහ සුභසාධන ප්‍රතිලාභ මණ්ඩලයේ සාමාජිකයෙක්ද වේ.

ඒ.ආර්. දේශප්‍රිය මහතා ශ්‍රී ජයවර්ධනපුර විශ්ව විද්‍යාලයේ රාජ්‍ය පරිපාලනය විද්‍යාවේදී උපාධිය ලබා ස්ලෝවේනියාවේ ලුබ්ලිජානා සරසවියෙන් විද්‍යාපති උපාධිය ලබා ගෙන ඇත.

## [3] පී. සමරසිරි මහතා

පී. සමරසිරි මහතා වර්තමානයේ දී ශ්‍රී ලංකා මහ බැංකුවේ මූල්‍ය අංශ නියාමන හා අධීක්ෂණය සම්බන්ධයෙන් නියෝජ්‍ය අධිපති ධුරය හොබවයි. නියෝජ්‍ය අධිපති ධුරයට පත් කරනු ලැබීමට පෙර ඔහු සහකාර අධිපති, මුදල් මණ්ඩලයේ ලේකම්, මහ බැංකුවේ අනුකූලතා නිළධාරී සහ බැංකු අධීක්ෂණය පිළිබඳ අධ්‍යක්ෂ ආදී තනතුරු ගණනාවක සේවය කර ඇත. එමෙන්ම ඔහු ශ්‍රී ලංකා ගිණුම් හා විගණන ප්‍රමිති සමීක්ෂණ මණ්ඩලයේ සභාපති ධුරය (29.01.2009 සිට 20.01.2015) සහ ශ්‍රී ලංකා බැංකුකරුවන්ගේ ආයතනයේ උප සභාපති ධුරය ද (27.09.2011 සිට 31.12.2015) දරන ලදි. වර්තමානයේ ඔහු ශ්‍රී ලංකා බැංකුකරුවන්ගේ ආයතනයේ සහ ණය තොරතුරු කාර්යාංශයේ සභාපතිධුර දරන අතර ශ්‍රී ලංකා සුරැකුම් හා විනිමය කොමිෂන් සභාවේ සාමාජිකයකු සහ ආරක්ෂක අමාත්‍යාංශය යටතේ වන "අපි වෙනුවෙන් අපි අරමුදලේ" කළමනාකරණ මණ්ඩලයේ සාමාජිකයෙක් ද වේ.

සමරසිරි මහතාට කොළඹ විශ්ව විද්‍යාලයෙන් පිරි නමන ලද ආර්ථික විද්‍යාව පිළිබඳ (ගෞරව) ශාස්ත්‍රවේදී උපාධියක් හා ඇමෙරිකා එක්සත් ජනපදයේ කැන්සාස් විශ්වවිද්‍යාලයේන පිරි නමන ලද ආර්ථික විද්‍යාව පිළිබඳ ශාස්ත්‍රපති උපාධියක් හිමි වන අතර සංඛ්‍යාලේඛන, ආර්ථික ප්‍රතිපත්ති, බැංකු හා බැංකු නොවන මූල්‍ය ආයතනවල නියාමනය හා අධීක්ෂණය, මූල්‍ය තත්ත්ව ස්ථායිතාව, සංස්ථානික පාලනය, ව්‍යවහාර මුදල් කළමනාකරණය, විදේශ විනිමය ප්‍රතිපත්ති, මූල්‍ය

බුද්ධි හා කලාජීය සංවර්ධනය ආදී ක්ෂේත්‍ර සම්බන්ධයෙන් වසර 35ක අත්දැකීම් සහිත නිලධාරියෙකි.

සමරසිරි මහතා මහ බැංකුව මගින් ප්‍රකාශයට පත් කළ "මුදල් ගනුදෙනු, බැංකු සහ ආර්ථිකය(2010-6 වන නැවත මුද්‍රණය)","මූලික ආර්ථික විද්‍යා මූලධර්ම විග්‍රහය" සහ "ආර්ථික විද්‍යා මූලධර්ම සහ ප්‍රතිපත්ති" (2013 - නැවත මුද්‍රණය) යන පොත් රචනා කර ඇත. මෙයට අමතරව එතුමා විවිධ ප්‍රකාශන හා පුවත්පත්වලට ආර්ථික හා මූල්‍ය මාතෘකා පිළිබඳ ලිපි පළ කර ඇත.

### [4] ඩී.එන්.ආර්. සිරිවර්ධන මහතා

ඩී. එන්. ආර්. සිරිවර්ධන මහතා පේරාදෙණිය විශ්ව විදශාලයේ භූගෝලීය විද්‍යාව පිළිබඳ ගෞරව ශාස්ත්‍රවේදී උපාධියක් ද, ශ්‍රී ලංකා විවෘත විශ්ව විද්‍යාලයේ නීති උපාධියක්ද හිමිකරගෙන ඇති අතර, එක්සත් ජනපදයේ කාඩිෆ් ද්‍යමට්‍රොපොලිටන් සරසවියේ තොරතුරු තාක්ෂණය සහ බුද්ධිමය දේපළ සම්බන්ධයෙන් නීතිපති උපාධිය ලබා තිබේ.

ඔහු වෘත්තියෙන් නීතීඥයෙකි. සිරිවර්ධන මහතා 1988 දී සමාගම් ලියාපදිංචි කිරීමේ දෙපාර්තමේන්තුවට බැඳුණි. වර්තමානයේදී ඔහු සමාගම් රෙජිස්ට්‍රාර් ජනරාල් වශයෙන් කටයුතු කරයි. සිරිවර්ධන මහතා වරලත් ගණකාධිකාරීන්ගේ ආයතනය, ශ්‍රී ලංකා ගිණුම් සහ විගණන ප්‍රමිති සමීක්ෂණ මණ්ඩලය සහ ශ්‍රී ලංකා සුරැකුම්පත් හා විනිමය කොමිෂන් සභාව යන ආයතනයන්හී නිල බලයෙන් පත් වූ සාමාජිකයෙක් ද වේ.

### [5] දේශබන්දු ආචාර්ය ඒ.ඒ. ශබීර් ගුලාම්හුසේන් මහතා

ජපානයේ ටෝකියෝ විශ්ව විද්‍යාලයෙන් ලැබූ දර්ශනශූරී උපාධියක් ද එක්සත් රාජධානියේ ලන්ඩන්වල කින්ග්ස් කොලිජියෙන් ලැබූ උපාධියක් ද හිමි වේ. ආචාර්ය ගුලාම්හුසේන් මහතා "දේශබන්දු, මානවහිතවාදී, ලංකාපුත්‍ර" යන කීර්තිමත් ගෞරව නාමයන්ගෙන් පිදුම් ලැබ ඇති අතර ශ්‍රී ලංකා පේෂකර්ම හා ඇඟළුම් ආයතනයේ අධ්‍යක්ෂ මණ්ඩල සාමාජිකයෙක් වූහ. (මුළු දිවයිනටම) සාම විනිසුරුවරයෙක් ලෙස ද සේවය කරයි.

ආචාර්ය ගුලාම්හුසේන් ඇඩම් කැපිටල් පීඑල්සී, ඇඩම් කාබන් (පුද්) සමාගම, ගොරීන් ට්‍රේඩ්ස්, ඇඩම් එක්ස්පෝ (පුද්) සමාගම, නෙට්වර්ක්ස් කමියුනිකේෂන්ස් (පුද්) සමාගම, ඇඩම් එයා කන්ඩිෂනර්ස් (පුද්) සමාගම, ඇඩම් ඔටෝමොබයිල්ස් (පුද්) සමාගම, සීමාසහිත කොළඹ ඇපොතිකරීස් සමාගම, වාණිජ මණ්ඩලය, හැමිල්ටන් රිසෝට්ස් (පුද්) සමාගම, සෙලෝන් ඇන්ඩ් ගොරීන් ට්‍රේඩ් සර්පි-ටෙක් (පුද්) සමාගම, කොළඹ ගැල්කුලී හා ප්‍රවාහන සමාගම සහ ඩොඩ්වෙල් ඇන්ඩ් කම්පැනි ලිමිටඩ් සමගාම යන ආයතනවල අධ්‍යක්ෂවරයා ලෙස ද සේවය කරයි.

### [6] ජෙරෙමි බෝලින් මහතා

ලන්ඩනයේ වරලත් රක්ෂණ ආයතනයේ ආශ්‍රිත සාමාජිකයෙක් වන අතර සිඩ්නි විශ්ව විද්‍යාලයේ ව්‍යාපාර පරිපාලනය පිළිබඳව ශාස්ත්‍රපති උපාධියක් හිමි කර ගත් අයෙකි.

රක්ෂණ අංශයේ වසර 20කට වැඩි අත්දැකීම් සහිත ඒ මහතා ශ්‍රී ලංකාව, ඔස්ට්‍රේලියාව සහ මාලදිවයින ආදී රටවල් රාශියක රක්ෂණ සමාගම් හා රක්ෂණ/ප්‍රතිරක්ෂණ තැරැව්කාර සමාගම්වල සේවය කර අත්දැකීම් සහිත ප්‍රවීණයෙකි.

වර්තමානයේ දී NHJ අවදානම් කළමනාකරණ සේවා පී/එල්, ඔක්ටැගල් කන්සල්ටන්ට්ස් පී/එල් සහ එන්ඩ්ලස් අවුට්ඩෝර්ස් පී/එල් යන සමාගම්වල අධ්‍යක්ෂකවරයා ලෙස සේවය කරයි.

# ජ්‍යෙෂ්ඨ කළමනාකරණ කණ්ඩායම




[1] දමයන්ති ප්‍රනාන්දු මහත්මිය (අධ්‍යක්ෂ ජනරාල්වරිය)
[2] චමරී ඒකනායක මහත්මිය (අධ්‍යක්ෂ - අධීක්ෂණ)
[3] චායා විතානවසම් මහත්මිය (අධ්‍යක්ෂ - මූල්‍ය හා පරිපාලන)
[4] රනිල් අඟුණවෙල මහතා (අධ්‍යක්ෂ - නීති)
[5] සුධීර සේනාරත්න මහතා (අධ්‍යක්ෂ - විමර්ශන)
[6] රාජන් නිරූබසිංහම් මහතා (සහකාර අධ්‍යක්ෂ - නීති)
[7] බිම්සර විජේසිංහ මහතා (සහකාර අධ්‍යක්ෂ - වෙළඳපොළ සංවර්ධන සහ බාහිර සබඳතා)
[8] සාරිකා වත්තුහේවා මහත්මිය (සහකාර අධ්‍යක්ෂ - අධීක්ෂණ)

# කාර්ය මණ්ඩලය




[1] ඩී.ඩබ්ලිව්.එස්.එස්. සුපුලි මහත්මිය
[2] මෙරීනා ඩයස් මහත්මිය
[3] චන්දිමා කඹුරුගමුව මහත්මිය
[4] සුජීවා රණසිංහ මහත්මිය
[5] තුෂාරි විජේගුණවර්ධන මහත්මිය
[6] කෞශාලි දයාරත්න මහත්මිය
[7] එතිර්රාජ් ශ්‍රීකාන්තන් මහතා
[8] උපේන්ද්‍රා සෙනෙවිරත්න මහත්මිය
[9] ලක්ෂ්මන් විජේසිංහ මහතා
[10] පවිත්‍රා පුංචිහේවා මහත්මිය
[11] චමින්ද ලාල් කුමාර මහතා
[12] උපලක්ෂි රණසිංහ මෙනෙවිය
[13] ලක්මාලි අල්ගම මහත්මිය
[14] රුවිනි ලියනගේ මහත්මිය
[15] තනූජා ඇන්තනී මහත්මිය

# කාර්ය මණ්ඩලය




[16] ලසන්ති තොටහේවා මහත්මිය
[17] සමන් සේනාධීර මහතා
[18] වීණා දිනේකා මහත්මිය
[19] රොෂාන් ද කොස්තා මහතා
[20] තිළිණි වාකිෂ්ඨ මහත්මිය
[21] වින්ද්‍යානි තුලපිටිය මහත්මිය
[22] ප්‍රියංගි ද සිල්වා මහත්මිය
[23] මල්හාරී වික්‍රමසිංහ මහත්මිය
[24] ශ්‍යාමලී අත්තනායක මහත්මිය
[25] ශානිකා නානායක්කාර මහත්මිය
[26] කෝකිලා සිරිවර්ධන මහත්මිය
[27] චරිත වික්‍රමසිංහ මහතා
[28] චතුරි බණ්ඩාර මහත්මිය
[29] සනත් උදයංග මහතා
[30] ෂශිනි ප්‍රේමලාල් මහත්මිය
[31] නලින් තලගල මහතා
[32] ඩෙසිකා රත්නායක මහත්මිය (ඡායාරූපයේ නැත)
[33] හසිනි පෙරේරා මහත්මිය (ඡායාරූපයේ නැත)



# සමාලෝචන


පොදු සමාලෝචනය 22
සංඛ්‍යානමය සමාලෝචනය 29
මෙහෙයුම් සමාලෝචනය 60

# පොදු සමාලෝචනය

## පනත ක්‍රියාත්මක කිරීම සහ නියාමන ප්‍රතිසංස්කරණ

### නීති සම්පාදනය

රක්ෂණ ඔප්පු හිමියන්ගේ සහ අනාගත රක්ෂණ ඔප්පු හිමියන්ගේ අයිතිවාසිකම් ආරක්ෂා කිරීමේ අරමුණ ඇතිව ශ්‍රී ලංකා රක්ෂණ කර්මාන්තය සද්භාවයන්ද වෘත්තීමය හා විචක්ෂණභාවයෙන් ද යුතුව කරගෙන යනු ලබන බවට සහතික කිරීම (මෙහි මින්මතු මණ්ඩලය යනුවෙන් සඳහන් කරනු ලබන) ශ්‍රී ලංකා රක්ෂණ මණ්ඩලයේ පරමාර්ථය හා වගකීම වේ.

රක්ෂණ සමාගම්, රක්ෂණ තැරැව්කරුවන්ගේ සමාගම්, රක්ෂණ නියෝජිතයින් හා අලාභ ගලපන්නන් නියාමනය හා අධීක්ෂණය සඳහා අවශ්‍ය නෛතික රාමුව 2000 අංක 43 දරන රක්ෂණ කර්මාන්තය විධිමත් කිරීමේ පනත (මෙහි මින්මතු පනත යනුවෙන් සඳහන් කරනු ලබන) මගින් සලසා ඇත.

මෙම පනත 2007 අංක 27 සහ 2011 අංක 3 දරන රක්ෂණ කර්මාන්තය විධිමත් කිරීමේ (සංශෝධන) පනත්වලින් සංශෝධනය වී ඇත.

### උප නීති සම්පාදනය

පනත යටතේ වර්ෂය තුළ නිකුත් කරන ලද උප නීති පහත නියාමන ප්‍රතිසංස්කරණ යටතේ දක්වා ඇත.

### නියාමන ප්‍රතිසංස්කරණ

#### රීති

**රක්ෂණ තැරැව්කාර සමාගමක තිබිය යුතු අවම ගෙවා නිමි කොටස් ප්‍රාග්ධනය පිළිබඳ රීතිය**

මණ්ඩලය විසින් 2016 ජුනි මස 01 වන දිනැති අංක 1969/40 දරණ අතිවිශේෂ ගැසට් පත්‍රය මගින් අවම ගෙවා නිමි කොටස් ප්‍රාග්ධනය (ප්‍රකාශිත ප්‍රාග්ධනය) පිළිබඳ රීති - 2016 හඳුන්වා දෙන ලදි. මේ අනුව පනත යටතේ රක්ෂණ තැරැව්කරුවකු ලෙස ලියාපදිංචි වීමට කැමති යම් තැනැත්තකු සමාගමේ රුපියල් මිලියන දෙකයි දශම පහකට නොඅඩු ගෙවා නිමි කොටස් ප්‍රාග්ධනයක් තබාගත යුතු බවද පවත්වාගෙන යා යුතු බවටද නියම කර ඇත.

**පනතේ 96 අ වගන්තිය යටතේ නිකුත් කළ විධාන**

(i) **විධාන අංක 20 කල සංශෝධනය - රක්ෂණ ඔප්පු ලේඛන ලද බවට ලිඛිත පිළිගැනීමක් ලබාගැනීම**

විධානයේ පරිදි රක්ෂණ ඔප්පුව නිකුත් කළ දිනයේ සිට සතියක් ඇතුලතදී ඔප්පු හිමියාට රක්ෂණ ඔප්පු ලේඛන ලැබී ඇති බවට ඔප්පු හිමියාට රක්ෂණ ඔප්පු ලේඛන ලැබී ඇති බවට ඔප්පු හිමියාගෙන් ලිඛිත පිළිගැනීමක් ලබා ගැනීම ප්‍රායෝගික හේතු මත අපහසු බවට දැක්වුණු කර්මාන්තයේ මතය සැලකිල්ලට ගෙන මණ්ඩලය විසින් එම ලිඛිත පිළිගැනීමේ කාලසීමාව දින 7 සිට දින 14 දක්වා දීර්ඝ කරන ලදි. කෙසේද යත් : රක්ෂණ සමාගමක් විසින් රක්ෂණ ඔප්පුව නිකුත් කළ දිනයේ සිට දින 14 ක් ඇතුළතදී ඔප්පු ලේඛන ලැබී ඇති බවට දක්වමින් ඔප්පු හිමියාගෙන් ලිඛිත පිළිගැනීමක් රක්ෂණ සමාගම් විසින් ලබාගත යුතුවේ.

(ii) **විධාන අංක 08 - දීර්ඝකාලීන රක්ෂණ ඔප්පුවක් අවලංගු කිරීමට අදාළව ඔප්පුව අවලංගු කිරීමේ අයිතියේ කාලසීමාව සඳහා සම්මත අගයක් ලබා දී නැති බව මණ්ඩලය විසින් හඳුනාගන්නට යෙදුණු අතර ඒ සම්බන්ධයෙන් පනතේ 96 අ වගන්තිය යටතේ පහත විධානය සියලුම දීර්ඝ කාලීන ජීවිත රක්ෂණ සමාගම් වෙත නිකුත් කරන ලදි.**

දීර්ඝකාලීන රක්ෂණ ඔප්පුවක් ලබාගත් අයෙකුට එම ඔප්පුවේ සඳහන් නියමයන් හා කොන්දේසි පරීක්ෂා කර බලා සිය රක්ෂණ ඔප්පුව අවලංගු කිරීම සඳහා අයිතිය ඇති කාලසීමාව එනම්, ඔප්පුව අවලංගු කිරීමේ අයිතියේ සම්මත කාල සීමාව ලෙස සැලකෙන්නේ ඔප්පුව රක්ෂණ හිමියා අතට පත්වූ දිනයේ සිට දින විසි එකක කාල සීමාවකි. එවැනි අවලංගු කිරීමකදී අදාල රක්ෂණ සමාගම විසින් :-

අ) වෙන් නොකළ වාරික මුදල්

ආ) එළඹෙන තක්සේරු දිනයට ඒකක වටිනාකමට අනුව ගණනය කළ වෙන්කළ ඒකක (තිබේනම්) වටිනාකම, සහ

ඇ) කිසියම් රක්ෂණ වියදම් සහ ඔප්පු ගාස්තු අඩුකරගෙන තිබේනම්, පැන නැගි වෛද්‍ය වියදම් තිබේනම් එම මුදල් ප්‍රමාණය නැවත ඔප්පු හිමියා වෙත ලබාදිය යුතු වේ.

ඉහත දැක්වූ විධානය ඒකක සම්බන්ධිත රක්ෂණ ඇතුළු සියලුම දීර්ඝකාලීන රක්ෂණ ඔප්පු සඳහාද වලංගුවේ.

(iii) **විධාන අංක 9 - රක්ෂණ සමාගමක සහ රක්ෂණ තැරැව්කාර සමාගමක ප්‍රධාන නිලධාරියා ලෙස පත් කරනු ලබන තැනැත්තකුගේ වගකීම, කාර්යභාරය සහ තිබිය යුතු මූලික සුදුසුකම්**

රක්ෂණ සමාගමක සහ රක්ෂණ තැරැව්කාර සමාගමක ප්‍රධාන නිලධරයාගේ කාර්යභාරය සහ වගකීම පිළිබඳව කර්මාන්තයේ තිබෙන මතයන් සැලකිල්ලට ගත් මණ්ඩලය විසින් පනතේ 96 අ වගන්තිය යටතේ පහත දැක්වෙන විධානය නිකුත් කරන ලදි.

"රක්ෂණ සමාගමක හෝ රක්ෂණ තරැව්කාර සමාගමක ප්‍රධාන නිලධරයා එම ආයතනයේ ප්‍රධාන විධායක නිලධාරිවරයා සහ/හෝ කළමනාකාර අධ්‍යක්ෂවරයා සහ/හෝ එම සමාගමේ අධ්‍යක්ෂ මණ්ඩලයේ විධාන ක්‍රියාවට

නැංවීමෙහිලා වගකීම දරන තැනැත්තා හෝ විය යුතුවේ."

ඉහත විධානය වහාම නිකුත් කළ යුතු බවට නිකුත් කරනු ලැබුවත්, එකී විධානයට අනුකූලව ක්‍රියා කිරීම සඳහා රක්ෂකයන් හා රක්ෂණ තැරැව්කරුවන්ට වර්ෂ 2017 මැයි 12 වන දින තෙක් සහන කාලයක් ලබා දෙන ලදි.

### අංක 01 දරන නිශ්චය ප්‍රතිස්ථාපනය

එක් රක්ෂකයෙක් සහ ශ්‍රී ලංකා රක්ෂණ සංගමය විසින් දැක්වූ අදහස් සැලකිල්ලට ගත් මණ්ඩලය විසින් නිශ්චය අංක 01 ප්‍රතිස්ථාපනය කිරීමෙන් අනතුරුව ක්‍රියාවට නැංවීම සඳහා රක්ෂකයන් වෙත නිකුත් කරන ලදි.

ඒ අනුව, අංක 01 දරන නිශ්චයට සිදු කරන ලද වැදගත් වෙනස්කම් පහත පරිදි වේ.

- සංයුක්ත ණය ආයෝජන තිබිය හැකි උපරිම අගය තාක්ෂණික සංචිතයේ සහ දීර්ඝ කාලීන රක්ෂණ අරමුදලේ ප්‍රතිශතයක් ලෙස ගත්විට 5% සිට 10% දක්වා වැඩිකර ඇත. වත්කම් සුරැකුම්පත්වල සිදුකරන ආයෝජන උපරිම සීමාව තාක්ෂණික සංචිතයේ ප්‍රතිශතයක් ලෙස ගත්විට 5% සිට 10% තෙක් වැඩිකර ඇති අතර දීර්ඝ කාලීන රක්ෂණ අරමුදලේ ප්‍රතිශතයක් ලෙස 5% සිට 10% තෙක් හෝ එක් වාර නිකුතුවකදී 15% යන දෙකින් අඩු අගය ලෙස හෝ සැලකේ.

  කෙසේ නමුත්, සංයුක්ත ණය සම්බන්ධයෙන් ගත් කළ තාක්ෂණික සංචිතයෙන් සහ දීර්ඝ කාලීන රක්ෂණ අරමුදලෙන් 5%ක අවම ප්‍රතිශතයක් අනිවාර්යයෙන්ම A ශ්‍රේණි තක්සේරු අගයක් සහිත සාධන පත්‍රයක ආයෝජනය කිරීම අවශ්‍ය වේ.

- ඒකක භාර/අන්‍යොන්‍ය අරමුදල් ආයෝජන තාක්ෂණික සංචිතයේ සහ දීර්ඝකාලීන රක්ෂණ අරමුදලේ ප්‍රතිශතයක් ලෙස දැක්වූ විට ආයෝජනය කළ හැකි උපරිම සීමාව 5% සිට 10% දක්වා ඉහළ නංවා ඇත. කෙසේ වෙතත්, අවමය වූ 2.5%ක ප්‍රමාණය ආයෝජනය කල හැකි වන්නේ ආයෝජන ශ්‍රේණි තක්සේරුවක් සහිත සාධන පත්‍රවල පමණකි.

- සියලුම ආශ්‍රිත සමාගම් වල ආයෝජනය කල හැකි උපරිම ප්‍රමාණය තාක්ෂණික සංචිතයේ සහ දීර්ඝකාලීන රක්ෂණ අරමුදලේ ප්‍රතිශතයක් ලෙස ගත්විට තිබිය හැකි උපරිම අගය 7.5% සිට 10% දක්වා ඉහළ නංවා ඇත.

- නව ආයෝජන අයිතමයක් ලෙස ඒ කෙසේද යත්, ඕනෑම බලපත්‍රලාභී වාණිජ බැංකුවක හෝ පාර්ලිමේන්තු පනතක විධිවිධාන වලට අනුකූලව ශ්‍රී ලංකා ආණ්ඩුව විසින් සහතික කරන ලද ඕනෑම බලපත්‍රලාභී විශේෂණීකෘත බැංකුවක කරන ලද තැන්පතු, තාක්ෂණික සංචිතයේ සහ දීර්ඝකාලීන රක්ෂණ අරමුදලේ 20% ක් දක්වා වන ප්‍රතිශතයක් හෝ එම බැංකුවේ කොටස් හිමියන්ගේ අරමුදලෙන් 15% ක ප්‍රතිශතයක් යන මේවායින් අවම වටිනාකම පිළිගැනීමට අවසර ලබාදී ඇත.

- තවත් නව ආයෝජන අයිතමයක් ලෙස එනම්, එක් ආස්ථිතයක/එක් සමාගමක හෝ සමූහ ව්‍යාපාරයක කරනු ලබන ආයෝජන තාක්ෂණික සංචිතයේ සහ දීර්ඝකාලීන රක්ෂණ අරමුදලේ 20% ක උපරිම ප්‍රතිශත අගයක් වනතෙක් පිළිගැනීමට අවසර ලබාදී ඇත. එහෙත් එම ආයතනයන්හි කරනු ලබන තැන්පතු ඉහත සඳහන් පරිදි ආවේශ්‍ය කරගත නොහැකි වේ.

## චක්‍රලේඛ

අංක 36 දරන චක්‍රලේඛය යටතේ දක්වන ලද බලය ලබාදීමේ ගාස්තුව සහ අනෙකුත් දැක්විය යුතු කරුණු සම්බන්ධව ශ්‍රී ලංකා රක්ෂණ තැරැව්කරුවන්ගේ සංගමය විසින් ඉදිරිපත් කල කරුණු සැලකිල්ලට ගත් මණ්ඩලය විසින් එකී චක්‍රලේඛය සඳහා පහත දැක්වෙන පැහැදිලි කිරීම් ලබාදෙන ලදී.

(අ) අංක 36 දරන චක්‍රලේඛයේ සඳහන් වන පරිදි බලය ලබාදීමේ බලපත්‍රය අලුත් කිරීම සඳහා ගාස්තුව බලපත්‍රය ලත් දින සිට වසර තුනක් යනතෙක් ගෙවිය යුතු නොවේ: සහ

(ආ) ඉන්පසු එළඹෙන සෑම වර්ෂයක් සඳහාම අළුත් කිරීමේ ගාස්තුව රු. 25,000/- ක් වේ.

### අංක 38 සහ 39 දරණ චක්‍රලේඛ - රක්ෂණ ඔප්පු ලේඛන මණ්ඩලය වෙත ලබාදීම

මෙම චක්‍රලේඛ මගින් සියලු රක්ෂණ සමාගම් විසින්:

(1) නව රක්ෂණ ඔප්පු නිෂ්පාදනයක් දියත් කරන දිනය මණ්ඩලය වෙත දැනුම් දී තිබිය යුතුය.

ශ්‍රී ලංකා රක්ෂණ සංගමයේ ඉල්ලීම විමර්ෂණය කිරීමෙන් අනතුරුව රක්ෂණ ඔප්පු ලේඛණ මණ්ඩලය වෙත ලබාදිය යුතු දින සීමාව නව රක්ෂණ ඔප්පු නිෂ්පාදනය දියත් කරනු ලබන දිනයට මාස 3 කට පෙර නොව දින 45 කට පෙර දිනයක් වන ලෙසට කාල සීමාව අඩුකර සංශෝධනය කරන ලදි. එසේම, මෙම කාල සීමාව අදාල වන්නේ දීර්ඝ කාලීන රක්ෂණ ඔප්පු නව නිෂ්පාදන සඳහා පමණි. සාමාන්‍ය රක්ෂණ ඔප්පු ලේඛණ මණ්ඩලය සමග ගොනු කිරීම එම රක්ෂණ ඔප්පු නව නිෂ්පාදනය දියත් කිරීමට පෙරදී සිදුකල යුතුවේ.

(2) සාමාන්‍ය රක්ෂණ ඔප්පු නිෂ්පාදන සම්බන්ධ ලේඛන (ඔප්පු ලියවිල්ල, යෝජනා පත්‍රය, ප්‍රචාරණ ලිපිද්‍රව්‍ය ඇතුළු අනෙකුත් දෑ) මණ්ඩලය සමග ගොනු කිරීම රක්ෂණ ඔප්පු නව නිෂ්පාදනය දියත් කිරීමට පෙරදී සිදුකළ යුතුය.

(3) ඉහත අංක 2 හි සඳහන් අයිතමයන්ට අමතරව දීර්ඝකාලීන රක්ෂණ ඔප්පු නිෂ්පාදන සම්බන්ධයෙන් ඇතැම් ලිපිලේඛන එකී නව නිෂ්පාදනය දියත් කිරීමට අවම වශයෙන් දින 45 කට පෙරවත් මණ්ඩලය වෙත ඉදිරිපත් කළ යුතුය.

මීට අමතරව දීර්ඝ කාලීන ඔප්පු නව නිෂ්පාදන සම්බන්ධව තවත් විශේෂිත ලිපි ලේඛන කිහිපයක් එකී නව නිෂ්පාදනය දියත් කිරීමට අවම වශයෙන් සති දෙකකට පෙරවත් මණ්ඩලය වෙත ඉදිරිපත් කල යුතු බව මණ්ඩලය විශේෂයෙන් දක්වා තිබේ.

අ) ඔප්පු හිමියා විසින් රක්ෂණ ඔප්පුව විකිණීම සිදුවන අවස්ථාවේදී යෝජනා පත්‍රය හැර වෙනයම් ලේඛණයකට අත්සන් තබයි නම් එක් ලේඛනය.

ආ) රක්ෂණ නිෂ්පාදන විකිණුම් / ප්‍රචාරණයට අදල අත් පත්‍රිකා සහ වෙනත් ලේඛන (උදා : මිල ගණන් කැඳවීම් ලේඛණ, උපුටා ගැනීම් සටහන්)

ඇ) නව රක්ෂණ ඔප්පු නිෂ්පාදනයට අදල ජීවගණකඥ සහතිකය ලබා ගැනීමට ප්‍රථමයෙන් ඊට අදල සියලුම අවශ්‍ය විස්තර ජීවගණකඥවරයාට ලබා ගැනීමට සැලැස්වූ බවත්, මණ්ඩලය වෙත ලබාදුන් නව නිෂ්පාදනයට අදල සියලුම ලේඛන වල සඳහන් විස්තර ජීවගණකඥ සහතිකයේ සඳහන් විස්තර හා සැසඳෙන බවත්, දක්වමින් රක්ෂණ සමාගමේ ප්‍රධාන නිලධරයා විසින් දුන් ලිඛිත පොරොන්දුවක්;

ඈ) නව රක්ෂණ ඔප්පු නිෂ්පාදනය / නිෂ්පාදන සම්බන්ධයෙන් මණ්ඩලය වෙත ඉදිරිපත් කරන ලද ලිපි ලේඛන වලට කිසිදු භෞතිකමය වෙනසක් සිදු කර නොමැති බවට රක්ෂණ සමාගමේ ප්‍රධාන නිලධරයා විසින් දුන් ලිඛිත පොරොන්දුවක්.

ප්‍රතිරක්ෂණ ආවරණ සම්බන්ධයෙන් වූ නියමයන් හා කොන්දේසි සංශෝධනය කරන ලද්දේ වඩාත් හොඳින් පෙළ ගැස්වූ සහ සවිස්තරවූ දැක්මක් රක්ෂණ සමාගම්වල ප්‍රතිරක්ෂණ ක්‍රියාපටිපාටිවල මෙහෙයුම් දල විශ්ලේෂණය සඳහා ලබාදීම තහවුරු කිරීමේ අරමුණිනි.

ඉහත සඳහන් කරන ලද ප්‍රතිරක්ෂණ ආවරණ සම්බන්ධයෙන්වූ නියමයන් හා කොන්දේසි සඳහා පහත දැක්වෙන වැදගත් වෙනස්කම් සිදු කර ඇත.

### ප්‍රතිරක්ෂණ සංසදය

මණ්ඩලය විසින් මෙවැනි වූ ක්‍රියා පටිපාටියක් සලකා බැලීමට නම් එකී යෝජිත ප්‍රතිරක්ෂණ සංසදයක් ඉහත දැක්වෙන ප්‍රතිරක්ෂණ ආවරණ සම්බන්ධ නියම හා කොන්දේසි වල දැක්වෙන අවම තක්සේරු අගය හෝ වෙන් වෙන්ව දක්වන ප්‍රතිරක්ෂකයන්ගේ අනුග්‍රහයෙන් සමන්විතව තිබිය යුතුය.

එමෙන්ම, සංසදය සලකා බලන ලෙස මණ්ඩලය වෙත කරන ඉල්ලීමක්, ප්‍රතිරක්ෂණ සංසදය සමග ප්‍රතිරක්ෂණ ආවරණ යොදා ගැනීමට අවම වශයෙන් සති හතරකට හෝ පෙර ඉදිරිපත් කළ යුතුය.

### අසීමිත වගකීම් ආවරණය

මෝටර් රථ වාහන ඔප්පු යටතේ වන තෙවන පාර්ශවීය ශාරීරික හානි ආවරණය සහ කම්කරු වන්දි රක්ෂණ ඔප්පු යටතේ වගකීම් ආවරණය හැර, අන් සියලුම රක්ෂණ පන්තීන් සහ උප පන්තීන් සඳහා අසීමිත වගකීම් ආවරණයක් සැපයීමට සෘජු රක්ෂකයන්ට හැකි වන්නේ එකී රක්ෂකයන්ද අසීමිත ප්‍රතිරක්ෂණ ආවරණයක් ලබාගෙන සිටින්නේ නම් පමණි.

### ප්‍රති රක්ෂණ/අවදානම් වැඩ සටහන්

රක්ෂකයන් විසින් ඇතැම් කරුණු සම්බන්ධව කෙටි සටහන්ද ඇතුළත් කර ඔවුන්ගේ රක්ෂණ සමාගමට අදළ ප්‍රතිරක්ෂණ/අවදානම් පැවරීමේ වැඩසටහන පිළිබඳව මණ්ඩලයට වාර්තා කිරීම වාර්ෂිකව සිදුකළ යුතුය.

### මූල්‍ය තත්ත්වයට ඇතිවන තර්ජනයන්

නියමයන් හා කොන්දේසි උල්ලංඝනය වීම හේතුවෙන් හෝ තම සමාග මේ ආර්ථික තත්ත්වයට අහිතකර භෞතිකමය බලපෑමක් එල්ල විය හැකි ආකාරයේ ගැටලුවක් ප්‍රතිරක්ෂණය සම්බන්ධයෙන් පැන නැගී ඇති අවස්ථාවකදී හෝ රක්ෂකයකු විසින් ඒ බව වහාම මණ්ඩලය වෙත දැනුම් දිය යුතුය.

### ගිවිසුම් කාලීන ලෙස සම්පූර්ණ කිරීම

රක්ෂකයන් විසින් ප්‍රතිරක්ෂණ ගිවිසුම සම්බන්ධයෙන් එකගත්වයට පැමිණි ප්‍රධාන ප්‍රතිරක්ෂණ නියමයන් නොපමාව කලානුරූපි ලෙස ලේඛණගත කළ යුතුය. නමුත්, පූර්ණ වශයෙන් ක්‍රියාත්මක නොවූ හෝ ගිවිසුමේ නෛතිකත්වය පිළිබඳ සහතික විය නොහැකි ආකාරයේ ගිවිසුම් තිබේනම් ඒවා ශේෂ පත්‍රයේ බැර සටහනක් සේ නොදැක්විය යුතුය.

### සම්බන්ධිත දීර්ඝකාලීන රක්ෂණ ව්‍යාපාර පිළිබඳ මාර්ගෝපදේශ 14.4 වගන්තියට සිදුකරන ලද සංශෝධනය

සම්බන්ධිත දීර්ඝකාලීන රක්ෂණ ව්‍යාපාර පිළිබඳ මාර්ගෝපදේශ අතුරින් 14.4 වන අයිතමයේ අවසාන වගන්තියේ සඳහන් කරුණු නිසා රක්ෂණ ඔප්පු හිමියකු ඔහුගේ රක්ෂණ ඔප්පුව අවම වශයෙන් පසුගිය වසර 3 තුළදීවත් සක්‍රියව පවත්වාගෙන ගොස් තිබුණේ නම් හැර, එම රක්ෂණ ඔප්පුවට අදළ පවාරණ අගය ඔප්පුහිමියාට ලබාදීමට රක්ෂකයකුට හැකියාව නැත.

කෙසේ වෙතත්, පනතේ 40 වන වගන්තියට අනුව, යම් රක්ෂණ ඔප්පුවක් මුල් වසර 3 තුළදී කල් ඉකුත් වී තිබුණත්, එවැනි රක්ෂණ ඔප්පුවක් සඳහා හිමි පවාරණ අගය ඔප්පුහිමියාට ලබා දීමේ අභිමත බලය රක්ෂකයා සතුවේ.

ඔප්පු හිමියන්ගේ අයිතිවාසිකම් සුරක්ෂිත කිරීමේ පරමාර්ථයෙන් සහ සම්බන්ධිත දීර්ඝ කාලීන රක්ෂණ ව්‍යාපාර පිළිබඳ මාර්ගෝපදේශයන්හි 14.4 වාක්‍ය ඛණ්ඩය සහ පනතේ 40(1) වගන්තියේ ප්‍රතිපාදන එක තලයකට ගෙන ඒමේ පරමාර්ථයෙන් යුතුව, මණ්ඩලය විසින් එකී 14.4 වාක්‍ය ඛණ්ඩය එහි අවසාන වගන්තිය ඉවත් කොට සංශෝධනය කරන ලදි. මේ අනුව, රක්ෂණ ඔප්පුවකට අදළ පවාරණ අගය එම ඔප්පු හිමියාට ලබාදීමට ඔහුගේ රක්ෂණ ඔප්පුව අඛණ්ඩව වසර 3ක් පවත්වාගෙන යාම අවශ්‍ය නොවේ.

## වෙළෙඳ පොළ ව්‍යුහය


### රක්ෂණ සමාගම්

පනතේ 12 වන වගන්තියට අනුව, පනතේ විධිවිධානවලට යටත්ව, යම් තැනැත්තෙකු ශ්‍රී ලංකාවේ රක්ෂණ ව්‍යාපාර කරගෙන යාමට මේ පනත යටතේ තත් කාලයේ ලියාපදිංචි වී ඇත්නම් හෝ ලියාපදිංචි කර ඇතැයි සලකනු ලබන්නේ නම් මිස, ඒ තැනැත්තා ශ්‍රී ලංකාවේ රක්ෂණ ව්‍යාපාර කරගෙන යනු නොලැබිය යුතුය.

පනතේ 13 වන වගන්තියට අනුව, ශ්‍රී ලංකාව තුළ රක්ෂණ ව්‍යාපාරයේ නියැලෙන්නට උනන්දුවක් දක්වන තැනැත්තෙකු 2007 අංක 7 දරන සමාගම් පනත යටතේ පොදු සමාගමක් වශයෙන් සංස්ථාපනය විය යුතු අතර පනතෙන් නිශ්චිතව දක්වා ඇති අනෙකුත් සියලුම ව්‍යවස්ථාපිත අවශ්‍යතා සපුරාලීමෙන් අනතුරුව පනත යටතේ ලියාපදිංචි වී රක්ෂකයෙක් වශයෙන් බලපත්‍රය ලබා ගත යුතුය.

වසර අවසාන වන විට සමාගම් 29ක් රක්ෂකයින් ලෙස ක්‍රියාකාරීව පැවැති අතර සෙලින්කෝ තකාෆුල් ලිමිටඩ් මත පනවන ලද ලියාපදිංචිය අත්හිටුවීම 2009 වසරේ සිට ක්‍රියාත්මක වේ. රක්ෂණ ව්‍යාපාර සමාගම් මෙහෙයුම් සඳහා ලියාපදිංචි වී ඇති පන්තීන් රූප සටහන 1 මගින් දැක්වේ. ක්‍රියාකාරීව පවතින සමාගම් 29න් 03ක් දිගු කාලීන හා සාමාන්‍ය යන දෙආකාරයෙන්ම රක්ෂණ කටයුතු කරන සංයුක්ත රක්ෂණ සමාගම් වන අතර සමාගම් 12ක් දීර්ඝ කාලීන රක්ෂණ ව්‍යාපාරයද සමාගම් 14ක් සාමාන්‍ය රක්ෂණ ව්‍යාපාර කටයුතු ද සිදු කරනු ලබයි.

**රූපසටහන 1**
**රක්ෂණ සමාගම් විසින් කරගෙන යනු ලබන රක්ෂණ ව්‍යාපාර පන්තීන්**





### රක්ෂණ තැරැව්කරුවන්

රක්ෂණ තැරැව්කරුවන් යනු 2007 අංක 7 දරන සමාගම් පනත යටතේ සංස්ථාපනය කරන ලද හා රක්ෂණ තැරැව්කාර ව්‍යාපාරයෙහි යෙදීම සඳහා පනත යටතේ ලියාපදිංචි කරන ලද සමාග මක් වේ. රක්ෂණ තැරැව්කරුවන් යනු තැරැව්කාර ගාස්තු හෝ කොමිස් මුදල් අපේක්ෂාවෙන් රක්ෂණ සමාගමක් හෝ ප්‍රතිරක්ෂණ සමාගමක් සමඟ හෝ ඔවුන් වෙනුවෙන් රක්ෂණ ව්‍යාපාර ඇති කිරීම සඳහා රක්ෂණ සමාගම් හෝ රක්ෂණ සහතික දරන්නන් හෝ රක්ෂණය හෝ ප්‍රතිරක්ෂණ සඳහා යෝජනා කරන්නන් අතර අතරමැදියන් ලෙස කටයුතු කරන්නන් අදහස් කෙරේ.

වසර අවසානයේදී සමාගම් 55ක් රක්ෂණ තැරැව්කාර ව්‍යාපාර ලෙස ලියාපදිංචි වී තිබුණි. එම සමාගම් අතරින් සමාගම් 39ක් දිගු කාලීන හා සාමාන්‍ය රක්ෂණ තැරැව්කාර ව්‍යාපාර යන දෙකෙහිම ලියාපදිංචි වී සිටි අතර සමාගම් 16ක් සාමාන්‍ය රක්ෂණ තැරැව්කාර ව්‍යාපාර කටයුතුවල පමණක් යෙදී සිටියේය. පහත 2 වන රූප සටහන මගින් රක්ෂණ තැරැව්කාර සමාගම් ව්‍යාපාර මෙහෙයුම් සඳහා ලියාපදිංචි වී ඇති පන්තීන් දැක්වේ.

**රූපසටහන 2**
**රක්ෂණ සමාගම් විසින් කරගෙන යනු ලබන රක්ෂණ ව්‍යාපාර පන්තීන්**




### රක්ෂණ නියෝජිතයන්

පනත යටතේ රක්ෂණ සමාගමක් හෝ රක්ෂණ තැරැව්කාර සමාගමක් සමඟ ලියාපදිංචි වී සිටින සහ එම රක්ෂණ සමාගම් හෝ රක්ෂණ තැරැව්කාර සමාගම් සඳහා රක්ෂණ ව්‍යාපාර සොයා දීම වෙනුවෙන් ප්‍රතිශ්ඨාව ලෙස කොමිස් ලබා ගන්නා පුද්ගලයින් රක්ෂණ නියෝජිතයන් වේ. එලෙස ලියාපදිංචිය ලබා ගැනීම සඳහා අවශ්‍ය සුදුසුකම් මණ්ඩලය විසින් නිශ්චිතව දක්වා ඇත.


පනතේ 34 වන වගන්තිය අනුව රක්ෂණ නියෝජිතයින් රක්ෂණ සමාගම්වලට රක්ෂණ ව්‍යාපාර සොයා දෙනු ලබන වැදගත් ප්‍රවාහයන්ගෙන් එකක් වේ.

රක්ෂණ සමාගම් විසින් සපයා ඇති තොරතුරුවලට අනුව, වසර තුළදී රක්ෂණ නියෝජිතයින් වශයෙන් බඳවාගෙන ඇති මුළු තනි පුද්ගලයින් සංඛ්‍යාව 13,390ක් පමණ වන අතර එය පසුගිය වසරේ (16,879) ට වඩා 20.67% ක පහළ යාමකි.

වසර අවසානය වන විට රක්ෂණ සමාගම් නියෝජනය කරමින් සිටි මුළු තනි රක්ෂණ නියෝජිත සංඛ්‍යාව 43,810ක් පමණ වූ අතර එය පසුගිය වසරේ 45,433 සිට 3.56%ක ඉහළ යාමකි.

3 වන රූප සටහනින් රක්ෂණ සමාගම් සමඟ ලියාපදිංචි වී සිටින රක්ෂණ නියෝජිතයින් (තනි පුද්ගලයින්) සංඛ්‍යාව නිරූපනය වේ.

**රූපසටහන 3**
**රක්ෂණ සමාගම්වල ලියාපදිංචි තනි රක්ෂණ නියෝජිතයන්**
**2016.12.31 දිනට මුළු රක්ෂණ නියෝජිතයින්**




පසුගිය වසර තුළදී ආසන්න වශයෙන් තනි පුද්ගල රක්ෂණ නියෝජිතයින් 386ක් පමණ රක්ෂණ තැරැව්කාර සමාගම් සමඟ ලියාපදිංචි වී ඇත.


### සමාගම්වල තත්ත්වය සහ ප්‍රාග්ධන වෙනස්කම්

රක්ෂණ සමාගම් අතරින් රක්ෂණ සමාගම් 9ක් කොළඹ කොටස් හුවමාරුවේ ලැයිස්තු ගත කොට

ඇත. නම් වශයෙන් ඒවා ඒ අයි ඒ ඉන්ෂුවරන්ස් ලංකා පී එල් සී, යුනියන් ඇෂුවරන්ස් පී එල් සී, සොෆ්ට් ලොජික් ලයිෆ් ඉන්ෂුවරන්ස් පී එල් සී (මින්පෙර ඒෂියන් එලායන්ස් ඉන්ෂුවරන්ස් පී එල් සී), එච්එන්බී ඇෂුවරන්ස් පී එල්සී, අමානා තකාෆුල් පී එල් සී, ජනශක්ති ඉන්ෂුවරන්ස් පී එල් සී සහ ආර්පිකෝ ඉන්ෂුවරන්ස් පී එල් සී සහ පීපල්ස් ඉන්ෂුවරන්ස් පී.එල්. සී. වේ.

ලයිස්තුගත සහ ලැයිස්තුගත නොවූ රක්ෂණ සමාගම්වල ප්‍රතිශතය 4 වන රූප සටහනේ දැක්වේ.

**රූපසටහන 4**
**ලැයිස්තුගත කරන ලද/ලැයිස්තුගත නොකරන ලද රක්ෂණ සමාගම්වල තත්ත්වය**




සංශෝධිත පනතින්, රක්ෂණ සමාගම්, 1987 අංක 36 දරන ශ්‍රී ලංකා සුරැකුම්පත් හා විනිමය කොමිෂන් සභා පනත යටතේ බලපත්‍රලාභී කොටස් හුවමාරුවක ලැයිස්තුගතව තිබීම අවශ්‍ය කරයි. සංයුක්ත රක්ෂණ සමාගම් 2015 පෙබරවාරි මාසය වන විට හෝ ඊට පෙර ඒවායේ ව්‍යාපාර කටයුතු වෙන් වෙන් සමාගම් දෙකකට වෙන් කිරීමට සහ 2016 පෙබරවාරි මාසය වන විට හෝ ඊට පෙර ලැයිස්තු ගත කිරීමට ද අවශ්‍ය වේ.

සංශෝධිත පනත බලාත්මක වුවායින් පසුව ලියාපදිංචිය ලැබූ නව රක්ෂණ සමාගමක්, මණ්ඩලය මගින් බලපත්‍රයක් නිකුත් කරනු ලැබීමෙන් පසුව වසර තුනක කාලයක් ඇතුලත දී, 1987 අංක 36 දරන ශ්‍රී ලංකා සුරැකුම්පත් හා විනිමය කොමිෂන් සභා පනත යටතේ බලපත්‍රලාභී කොටස් හුවමාරුවක ලැයිස්තුගත විය යුතු බවට දක්වා ඇත.

2011 ජූනි මාසයට පෙරාතුව ලියාපදිංචිය ලද රක්ෂණ සමාගම්, 2015 පෙබරවාරි මාසය වන විට හෝ එදිනට පෙර එක් ව්‍යාපාර පන්තියක් සඳහා තමන්ගේ ගෙවා නිමි කොටස් ප්‍රාග්ධනය රු. මිලියන 500ක අවමයක් දක්වා වැඩි කළ යුතු බවට මණ්ඩලය නියම කර ඇත.

2011 ජූනි මාසයට පසුව ලියාපදිංචි වූ රක්ෂණ සමාගම්වලට රු. මිලියන 500කට නොඅඩු ගෙවා නිමි ප්‍රාග්ධනයක් ඇත.

## රක්ෂණ සමාගම්වලින් සෙස් බද්දක් අයකිරීම

පනතේ 7 වන වගන්තිය යටතේ ගරු මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍යවරයා විසින් රක්ෂණ ඔප්පු හිමියන්ගේ ආරක්ෂණ අරමුදලක් පිහිටුවීම සඳහා සෙස් බද්දක් අයකිරීමේ නියෝගයක් පනවන ලදී. 2002 ජූලි 9 වන දින අංක 1244/5 දරන ගැසට් නිවේදනය මගින් දීර්ඝ කාලීන රක්ෂණ ව්‍යාපාරයක සමස්ත ශුද්ධ වාරිකයෙන් 0.2% ක්ද සාමාන්‍ය රක්ෂණ ව්‍යාපාරයක සමස්ත ශුද්ධ වාරිකයෙන් 0.4% ක්ද වශයෙන් රක්ෂණ ඔප්පු හිමියන්ගේ ආරක්ෂණ අරමුදලට බැර කල යුතු බවට පැහැදිලි කොට ඇත. රක්ෂකයන්ගෙන් සෙස් බදු එකතු කිරීම 2003 ජනවාරියේ සිට ක්‍රියාත්මක වූ අතර 2016 වසරේ එසේ එකතු කරන ලද මුදල රු. මිලියන 408 කි.

වගුව 1 මගින් සෙස් බද්ද හා ඔප්පු හිමියන්ගේ ආරක්ෂණ අරමුදල ගැන දැක්වේ.

## ඔප්පු හිමියන්ගේ ආරක්ෂණ අරමුදල


පනතේ 103 වන වගන්තිය ප්‍රකාර ස්ථාපනය කෙරුණු ඔප්පු හිමියන්ගේ ආරක්ෂණ අරමුදලට රක්ෂකයන්ගෙන් එකතු කළ සෙස් බද්ද තැන්පත් කරනු ලැබේ. වර්තමාන මෙන්ම අනාගත ඔප්පු හිමියන්ගේ ද යහපත උදෙසා මෙම අරමුදල පහත දැක්වෙන කාර්යයන් සඳහා යොදා ගනු ලැබේ.

අ) රක්ෂණ කර්මාන්තය පිළිබඳව මහජනතාව දැනුවත් කිරීමේ දීත්, රක්ෂණ කර්මාන්තය සංවර්ධනය කිරීමේ කටයුතුවලදීත් සිදුවන වියදම් පියවාලීම සහ

ආ) මණ්ඩලය එහි බලතල, වගකීම් හා මෙහෙයුම් ක්‍රියාවට නැංවීමේදී දරනු ලබන වියදම් පියවා ගැනීම

ඔප්පු හිමියන්ගේ ආරක්ෂණ අරමුදලේ ඇති වත්කම් රජයේ සුරැකුම්පත්වල ආයෝජනය කෙරේ. 2016 දෙසැම්බර් 31 වන දිනට එම අරමුදලේ සංචිතය රු. මිලියන 3,292ක් විය. මෙය පසුගිය වසරට වඩා (රු. මිලියන 2,643) 24.56% ක වර්ධනයකි.

**වගුව 1**
**සෙස් බද්ද හා ඔප්පු හිමියන්ගේ ආරක්ෂණ අරමුදල**




## රක්ෂණ බදු

සාමාන්‍ය රක්ෂණ කටයුතුවල කිසිදු පන්තියක් සඳහා වන බදු කිසිවක් දැනට ක්‍රියාත්මක නැත. 2002, 2005 හා 2007 යන වර්ෂවල ජනවාරි 1 වැනි දින සිට අනු පිළිවෙලින් ක්‍රියාත්වක වන පරිදි මෝටර් රථ රක්ෂණය, ගිනි රක්ෂණය සහ කම්කරු වන්දි රක්ෂණය මත ක්‍රියාත්මක වූ බදු අහෝසි කරන ලදී.

## පනතේ බලපෑමෙන් නිදහස්වීම

1999 අංක 20 දරන කෘෂි හා වගා රක්ෂණ පනත මගින් ස්ථාපනය කරන ලද කෘෂි හා වගා රක්ෂණ මණ්ඩලය, 1978 අංක 15 දරන ශ්‍රී ලංකා අපනයන ණය රක්ෂණ සංස්ථා පනත මගින් ස්ථාපිත ශ්‍රී ලංකා අපනයනය ණය රක්ෂණ සංස්ථාව සහ 1996 අංක 17 දරන සමාජ රක්ෂණ මණ්ඩලය පනත යටතේ සමාජික සමාජ රජක්ෂණ මණ්ඩලය ආදියට පනතේ 12 (3) වන වගන්තිය ප්‍රකාරව පනතෙන් පැනවෙන නීති රීති අදාළ නොවේ.

### ජාතික රක්ෂණ භාර අරමුදල (NITF)

2006 අංක 28 දරන ජාතික රක්ෂණ භාර අරමුදල් පනත මගින් ස්ථාපනය කරන ලද ජාතික රක්ෂණ භාර අරමුදල, පනතට කරන ලද සංශෝධනයක් මගින් මණ්ඩලයේ විෂයපථය තුළට ග්‍රහනය කරනු ලැබ ඇත.

ජාතික රක්ෂණ භාර අරමුදල් පනත ප්‍රකාරව මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍යංශය විසින් පවත්වාගෙන යනු ලබන වර්ජන, කැරලි, සිවිල් කැලඹීම් හා ත්‍රස්ත අරමුදල් ජාතික රක්ෂණ භාර අරමුදලට පවරන ලදී. ජාතික රක්ෂණ භාර අරමුදල වෙනුවෙන් වර්ජන, කැරලි, සිවිල් කැලඹීම් හා ත්‍රස්ත අවදානම් ආවරණය කෙරෙන රක්ෂණ කටයුතු කරන සමාගම් අයකර ගන්නා වාරික ජාතික රක්ෂණ භාර අරමුදලට බැර කළ යුතුය.

2007 අංක 27 දරන සංශෝධිත පනත අනුව සියළු ලියාපදිංචි රක්ෂණ සමාගම් සාමාන්‍ය රක්ෂණ කටයුතු සඳහා වන ප්‍රතිරක්ෂණ වගකීමෙන් 50%ක් නොඉක්මවන ප්‍රතිශතයක් ජාතික රක්ෂණ භාර අරමුදලට ලබා දිය යුතුය. මේ සම්බන්ධයෙන් මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍යවරයා විසින් සියළු රක්ෂණ සමාගම් වෙත නියෝගය පනවමින් 2013 ජනවාරි 01 වැනි දින සිට සියලුම වර්ගයේ ප්‍රති රක්ෂණ සම්මුති සහ වෛකල්පිත ප්‍රතිරක්ෂණ සැලසුම් සඳහා 30%ක ජාතික රක්ෂණ භාර අරමුදලට දායක කළ යුතු බවට දන්වා ඇත. මීට පෙර මෙම ප්‍රතිශතය 20%ක් විය.

### අනෙකුත් අදාළ කරුණු

#### මාර්ග ආරක්ෂාව පිළිබඳ ජාතික සභාව (NCRS)

මෝටර් රථ වාහන පනත යටතේ ස්ථාපනය කරනු ලැබූ මාර්ග ආරක්ෂාව පිළිබඳ ජාතික සභාව නම් වූ ආයතනය ප්‍රවාහන අමාත්‍යංශයේ විෂයපථය යටතේ පවතී.

මෝටර් රථ වාහන රක්ෂණ ආවරණය ලබා දෙන රක්ෂකයින් සෑම කෙනෙකුම තෙවන පාර්ශ්ව රක්ෂණ ආවරණයකින් 1%ක් මාර්ග ආරක්ෂණ අරමුදලට දායක කළ යුතුය. මෙම ජාතික සභාවේ පාලක සභාවෙහිද රක්ෂණ මණ්ඩලයට නියෝජනයක් ඇත.

හදිසි අනතුරකදී පීඩාවට පත්වන වින්දිතයින් හට වන්දි ගෙවීම සඳහා මෙම අරමුදල පිහිටුවා ඇත.

#### Financial Sector Oversight Council (FSOC)

ශ්‍රී ලංකා මහ බැංකුව විසින් පිහිටුවන ලද අන්තර් නියාමන ආයතන සභාව "Financial Sector Oversight Council" ලෙස නැවත නම්කරනු ලැබ ඇත.

ඉහළ මට්ටමේ කමිටුවක් වන මෙය පිහිටුවීමේ අරමුණ වූයේ මූල්‍ය වෙළෙඳාමෙහි ක්‍රමානුකූල වර්ධනය සඳහා අවශ්‍ය නිසි ප්‍රතිපත්ති සම්පාදනය හා සමස්ත මූල්‍ය පද්ධතියේම අභිවෘද්ධිය උදෙසා සියලු නියාමන නියෝජිතයින් සම්බන්ධීකරණය කරමින් තොරතුරු හුවමාරු කර ගැනීමයි. රක්ෂණ මණ්ඩලය අන්තර් නියාමන සභාවේ ද නියෝජනය වෙයි.

#### ශ්‍රී ලංකා රක්ෂණ සංගමය (IASL)

1989 දී ස්ථාපනය කරන ලද ශ්‍රී ලංකා රක්ෂණ සංගමයේ සාමාජිකත්වය පනත යටතේ ලියාපදිංචිය ලබා ඇති සෑම රක්ෂණ සමාගමකටම ලබා ගත හැකිය. ජාතික රක්ෂණ භාර අරමුදල හැර අනෙක් සියලූ රක්ෂණ සමාගම් මෙම සංගමයේ සාමාජිකයෝය.

සියලුම රක්ෂණ සමාගම් හී ප්‍රධාන විධායක නිලධාරීන්ගෙන් සමන්විත විධායක කමිටුව සමස්ථ කළමනාකරණය පිළිබඳ වගකීම දරයි.

- ජීවිත රක්ෂණ සංසදය
- සාමාන්‍ය රක්ෂණ සංසදය
- මූල්‍ය තාක්ෂණ අනු කමිටුව
- නීති උපදේශන සංසදය
- මානව සම්පත් අනුකමිටුව
- තොරතුරු තාක්ෂණය පිළිබඳ අනුකමිටුව
- අලෙවිකරණය හා විකුණුම් සංසදය
- පීවගණක අනුකමිටුව

යන කමිටු විසින් විධායක කමිටුවට සහය වෙමින් ස්වකීය වගකීම් හා අදාළ වන්නා වූ විෂය ක්ෂේත්‍ර පිළිබඳ නිර්දේශ ඉදිරිපත් කෙරේ.

#### ශ්‍රී ලංකා රක්ෂණ සංගමයේ ප්‍රධාන අරමුණු

1. රක්ෂණය වන ජනතාව හා රක්ෂකයන්ගේ පොදු යහපත හා සුබසාධනය උදෙසා උපදෙස් සැපයීමටත්, සහයෝගීතාවටත් අවස්ථාව සලසනු වස් ශ්‍රී ලංකාව තුළ රක්ෂණ ව්‍යාපාරයේ නිරතව සිටින සියලු රක්ෂකයන් එකමුතු කිරීම.
2. රක්ෂණ ව්‍යාපාරය තුළ ඒකාකාරී යහපත් ක්‍රියා පිළිවෙතක් සහ උසස් සදාචාරාත්මක මට්ටමක් පවත්වා ගැනීම හා ප්‍රවර්ධනය කිරීම මගින් රක්ෂණ ව්‍යාපාරය පිළිබඳ රක්ෂණය වන ජනතාවගේ විශ්වාසය වර්ධනය කිරීම.
3. සාමාන්‍ය ජනතාව අතර රක්ෂණ අවශ්‍යතා හා වටිනාකම් පිළිබඳ දැනුවත්භාවය ගොඩනැගීම.
4. ව්‍යවස්ථාදායක හා නියාමන අවශ්‍යතා නිරීක්ෂණය තුළින් රක්ෂණ කර්මාන්තයේ ස්ථායිථාවය හා වර්ධනය සඳහා අදාළ බලධාරීන් වෙත කරුණු ඉදිරිපත් කිරීම.
5. වෙනත් රටවල රක්ෂණ ක්‍රමවේද හා තාක්ෂණ උපක්‍රම පරීක්ෂා කිරීම හා පුනරීක්ෂණය කිරීම මගින් වඩාත් සුදුසු ක්‍රමවේදය ශ්‍රී ලංකා වෙළෙඳ පොලට යොදා ගැනීම.
6. අධ්‍යාපන හා පුහුණු වැඩමුළු ඔස්සේ රක්ෂණ ක්ෂේත්‍රයේ වෘත්තීයභාවය ප්‍රවර්ධනය දිරි ගැන්වීම සහ ඊට සක්‍රීයව සහය වීම. ඒ සඳහා පන්ති, සම්මන්ත්‍රණ, වැඩමුළු, සංවාද, උපදේශන, රැස්වීම් පැවැත්වීම.

#### ශ්‍රී ලංකා රක්ෂණ තැරැව්කරුවන්ගේ සංගමය (SLIBA)

මණ්ඩලය විසින් අනුමත කරන ලද එකම රක්ෂණ තැරැව්කරුවන්ගේ සංගමය වන්නේ ශ්‍රී ලංකා රක්ෂණ තැරැව්කරුවන්ගේ සංගමයයි. පනතේ

79 වන වගන්තිය අනුව රක්ෂණ තැරැව්කාර සමාගමක් ලෙස ක්‍රියා කිරීමට අපේක්ෂා කරන සෑම සමාග මක්ම මණ්ඩලයේ ලියාපදිංචිය ලබා ගැනීමට පෙර මෙම සංගමයේ සාමාජිකත්වය ලබා ගැනීමට අවශ්‍ය වේ. සංගමය විසින් සකස් කරනු ලැබූ එහි කටයුතු සඳහා අදාළ නීති මාලාව සාමාජික සමාගම් විසින් පිලිපදිනු ලැබිය යුතු වන්නේය.

### ශ්‍රී ලංකා රක්ෂණ තැරැව්කරුවන්ගේ සංගමයේ ප්‍රධාන අරමුණු

රක්ෂණ තැරැව්කරුවන්ගේ කාර්යභාරය පිළිබඳ මහජනතාව තුළ දැනුවත්භාවයක් ඇති කිරීම.

සාමාජිකයින් අතර තාක්ෂණික දැනුම වැඩි කිරීම හා ඉහළ මට්ටමක නිපුනතාවයක් සහ වෘත්තීය භාවයක් ගොඩ නැගීම.

රක්ෂණ පාඨමාලාවන් හැදෑරීම සහ වෘත්තීය සුදුසුකම් ලබා ගැනීමට සාමාජිකයන් දිරිමත් කිරීම සහ සහයෝගය ලබාදීම.

නියාමනයන්, රක්ෂකයින්, සහ මහජනතාව සමගින් හොඳ හිත සහ හිතකර සබඳතාවන් පවත්වා ගැනීම.

### ශ්‍රී ලංකා රක්ෂණ ආයතනය (SLII)

1982 වසරේ දී ස්ථාපනය කරන ලද ශ්‍රී ලංකා රක්ෂණ ආයතනය ලාභ නොලබන සංවිධානයක් වන අතර එහි ප්‍රධාන අරමුණ වන්නේ රක්ෂණ ව්‍යාපාරයෙහි නියුක්තවන්නන්ගේ දැනුම හා කුසලතා වර්ධනය කිරීමයි. ආයතනය අරමුදල් සපයා ගන්නේ රක්ෂණ සමාග ම්වලින් පිරිනමන දායකත්වය තුළින් හා සාමාජිකයන්ගේ වාර්ෂික සාමාජික මුදල්වලිනි.

### ශ්‍රී ලංකා රක්ෂණ ආයතනයේ ප්‍රධාන අරමුණු

රක්ෂණ ක්ෂේත්‍රයේ නියුතු අයගේ පොදු සංවර්ධනය, ප්‍රගතිය, හා කාර්යක්ෂමතාව වැඩි කිරීම සඳහා අවශ්‍ය මධ්‍යම සංවිධානයක් ලෙස කටයුතු කිරීම හා ඔවුන්ගේ යහපත පිණිස මෙන්ම රක්ෂණ ව්‍යාපාරය වඩාත් කාර්යක්ෂම කිරීම හා කර්මාන්තය පිළිබඳව වෘත්තීකත්වය ලබාදීම.

රක්ෂණය පිළිබඳ වෘත්තීය සුදුසුකම් වර්ධනය කරවීමට ඩිප්ලෝමා සහ සහතික පත්‍ර පාඨමාලා පැවැත්වීම තුළින් රක්ෂණය පිළිබඳ දැනුම වර්ධනය කිරීම, ඕනෑම පිළිගත් අධ්‍යාපන ආයතනයක් හරහා රක්ෂණ ක්ෂේත්‍රයේ ඕනෑම අංශයක විෂයයන් වෘත්තීය මට්ටමින් හැදෑරීම සඳහා සහය දැක්වීමටත්, උනන්දු කිරීමටත් විභාග පැවැත්වීම.

වෘත්තීය කරුණු පිළිබඳ සාකච්ඡා සම්මන්ත්‍රණ හෝ රැස්වීම් පැවැත්වීමටත්, පර්යේෂණ පත්‍රිකා, දේශන ආදිය ඉදිරිපත් කිරීමටත් සාමාජිකයන්ට වැදගත් වන්නා වූ සිදුවීම්, වාර්තා හෝ ලැයිස්තු වැනි දේ සංස්කරණයටත් ඉඩ සැලසීම.

ශ්‍රී ලංකා රක්ෂණ ආයතනයේ සාමාජිකයන්ගේ අයිතිවාසිකම් සහ සුභසාධනය ආරක්ෂා කිරීමටත් ඔවුන්ගේ ප්‍රවර්ධනය පුළුල් කිරීමට මෙන්ම පොදුවේ ගත් කළ රක්ෂණ නිලධාරීන්ගේත්. ආයතනික සාමාජිකයන්ගේත් තත්ත්වයන් ඉහළ නැංවීම උදෙසා අවශ්‍ය වෘත්තීමය අධීක්ෂණය හා පාලනය ඇති කිරීම.

මෙම ආයතනය ලන්ඩනයේ වරලත් රක්ෂණ ආයතනයට අනුබද්ධව ඇති අතර ලන්ඩනයේ වරලත් රක්ෂණ ආයතනය ඉන්දියාවේ රක්ෂණ ආයතනය සහ ඉන්දියාවේ ජීවගණක සංගමය වැනි වෘත්තීය ආයතනවල විභාග ද මෙහෙයවනු ලබයි. රක්ෂණ කර්මාන්තයෙහි නියලෙන්නන් සඳහා සංගමය විසින් කෙටි කාලීන රක්ෂණ ඩිප්ලෝමා පාඨමාලා ද පවත්වනු ලැබේ.

රක්ෂණ නියෝජිතයන් ලෙස කටයුතු කිරීමට කැමැත්තක් දක්වන අය සඳහා පූර්ව බඳවාගැනීම් පරීක්ෂණ සිදු කිරීමේ වගකීම මණ්ඩලය විසින් මෙම ආයතනයට පවරා ඇත. රක්ෂණ ක්ෂේත්‍රයෙහි සාමාන්‍ය හා දීර්ඝ කාලීන රක්ෂණ ව්‍යාපාර පන්ති දෙවර්ගය සඳහාම ආයතනය විසින් පූර්ව බඳවා ගැනීමේ පරීක්ෂණ පවත්වනු ලැබේ.

### රක්ෂණ ඔම්බුඩ්ස්මන්

ශ්‍රී ලංකා රක්ෂණ සංගමය විසින් 2005 ජනවාරි මස, රක්ෂණ ඔම්බුඩ්ස්මන්වරයා ලෙස ආචාර්ය වික්‍රම වීරසූරිය මහතා පත් කර ඇත. ශ්‍රී ලංකා රක්ෂණ සංගමය හා රක්ෂණ ඔම්බුඩ්ස්මන්වරයා අතර ඇති කරගත් අවබෝධතා ගිවිසුම අනුව රක්ෂණ ඔප්පු හිමියන් විසින් රක්ෂණ ඔම්බුඩ්ස්මන්වරයා වෙත ඉදිරිපත් කරනු ලබන ආරාවුල් නිරාකරණය හා සමථ කිරීම සඳහා එකී පාර්ශ්වයන් දෙක විසින් තමන්ගේ උපරිමයෙන් කටයුතු කරනු ලැබේ.

### රක්ෂණ අධික්ෂකයන්ගේ ජාත්‍යන්තර සංගමය (IAIS)

රක්ෂණ අධික්ෂකයන්ගේ ජාත්‍යන්තර සංගමයේ සාමාජිකයෙක් වශයෙන් ඔවුන් විසින් ප්‍රකාශයට පත් කරනු ලබන ප්‍රකාශන මෙන්ම ප්‍රධාන රක්ෂණ ක්‍රියාපිළිවෙත් සහ සංගමයේ ක්‍රියාකාරකම් ආදිය පිළිබඳ තොරතුරු නිතිපතා මණ්ඩලයට ලැබේ. එම සංගමය විසින් නිර්දේශ කරනු ලබන සමහර ප්‍රධාන රක්ෂණ ක්‍රියා පිළිවෙත් ශ්‍රී ලංකාවේ රක්ෂණ කර්මාන්තය එලදායී ලෙස අධීක්ෂණය කරනු හා මෙහෙයවනු පිණිස මණ්ඩලය විසින් ක්‍රියාත්මක කරනු ලැබේ.

# සංඛ්‍යානමය සමාලෝචනය

## රක්ෂණ සමාගම් සඳහා කෙටි යෙදුම්

| | රක්ෂණකරු සහ එහි මව් සමාගමෙහි සම්පූර්ණ නම | වාර්ෂික වාර්තා අරමුණ සඳහා සමාගම් ලේබලය |
|---|---|---|
| 1 | ඒඅයිඒ ඉන්ෂුවරන්ස් ලංකා පීඑල්සී | ඒඅයිඒ ලයිෆ් |
| 2 | ඒඅයිජී ඉන්ෂුවරන්ස් ලිමිටඩ් | ඒඅයිජී |
| 3 | අලියාන්ස් ඉන්ෂුවරන්ස් ලංකා ලිමිටඩ් | අලියානස් ජෙනරල් |
| 4 | අලියාන්ස් ලයිෆ් ඉන්ෂුවරන්ස් ලංකා ලිමිටඩ් | අලියාන්ස් ලයිෆ් |
| 5 | අමානා තකාෆුල් පීඑල්සී | අමානා ජෙනරල් |
| 6 | අමානා තකාෆුල් ලයිෆ් ලිමිටඩ් | අමානා ලයිෆ් |
| 7 | ආර්පිකෝ ඉන්ෂුවරන්ස් පීඑල්සී | ආර්පිකෝ |
| 8 | සොෆ්ට්ලොජික් ලයිෆ් ඉන්ෂුවරන්ස් පීඑල්සී | සොෆ්ට්ලොජික් ලයිෆ් |
| 9 | ෆෙයාෆස්ට් ඉන්ෂුවරන්ස් ලිමිටඩ් | ෆෙයාෆස්ට් |
| 10 | සෙලින්කෝ ජෙනරල් ඉන්ෂුවරන්ස් ලිමිටඩ් | සෙලින්කෝ ජෙනරල් |
| 11 | සෙලින්කෝ ලයිෆ් ඉන්ෂුවරන්ස් ලිමිටඩ් | සෙලින්කෝ ලයිෆ් |
| 12 | කොන්ටිනෙන්ටල් ඉන්ෂුවරන්ස් ලංකා ලිමිටඩ් | කොන්ටිනෙන්ටල් |
| 13 | කෝපරේටිව් ඉන්ෂුවරන්ස් කම්පනි ලිමිටඩ් | කෝපරේටිව් ජෙනරල් |
| 14 | කෝප්ලයිෆ් ඉන්ෂුවරන්ස් ලිමිටඩ් | කෝප්ලයිෆ් |
| 15 | එච්එන්බී ඇෂුවරන්ස් පීඑල්සී | එච්එන්බී ලයිෆ් |
| 16 | එච්එන්බී ජෙනරල් ඉන්ෂුවරන්ස් ලිමිටඩ් | එච්එන්බී ජෙනරල් |
| 17 | ජනශක්ති ඉන්ෂුවරන්ස් පීඑල්සී | ජනශක්ති ලයිෆ් |
| 18 | ජනශක්ති ජෙනරල් ඉන්ෂුවරන්ස් ලිමිටඩ් | ජනශක්ති ජෙනරල් |
| 19 | ලයිෆ් ඉන්ෂුවරන්ස් කෝපරේෂන් (ලංකා) ලිමිටඩ් | එල්අයිසී |
| 20 | එල්ඕඑල්සී ජෙනරල් ඉන්ෂුවරන්ස් ලිමිටඩ් | එල්ඕඑල්සී ජෙනරල් |
| 21 | එල්ඕඑල්සී ලයිෆ් ඇෂුවරන්ස් ලිමිටඩ් | එල්ඕඑල්සී ලයිෆ් |
| 22 | එම්බීඑස්එල් ඉන්ෂුවරන්ස් කම්පැනි ලිමිටඩ් | එම්බීඑස්එල් |
| 23 | ජාතික රක්ෂණ භාර අරමුදල | එන්අයිටීඑෆ් |
| 24 | ඔරියන්ට් ඉන්ෂුවරන්ස් ලිමිටඩ් | ඔරියන්ට් |
| 25 | පීපල්ස් ඉන්ෂුවරන්ස් ලිමිටඩ් | පීපල්ස් |
| 26 | සීමාසහිත සණස රක්ෂණ සමාගම | සණස |
| 27 | ශ්‍රී ලංකා ඉන්ෂුවරන්ස් කෝපරේෂන් ලිමිටඩ් | එස්එල්අයිසී |
| 28 | යුනියන් ඇෂුවරන්ස් ජෙනරල් ලිමිටඩ් | යුනියන් ජෙනරල් |
| 29 | යුනියන් ඇෂුවරන්ස් පීඑල්සී | යුනියන් ලයිෆ් |

### සංඛ්‍යාමය සමාලෝචනයෙහි වගු සහ සටහන් අර්ථ දැක්වීමේදී සැලකිල්ලට ගතයුතු සටහන්

1. පුනස්ථාපිත විගණන සංඛ්‍යා (අ)
2. තාවකාලික සංඛ්‍යා (ආ)
3. ප්‍රතිරක්ෂණ වාරික ආදායම ජාතික රක්ෂණ භාර අරමුදලට පවරා දුන් සාමාන්‍ය රක්ෂණයන්හි ප්‍රතිරක්ෂණ වාරිකවල අනිවාර්ය පවරාදීම නියෝජනය කරයි.
4. ජාතික රක්ෂණ භාර අරමුදල යටතේ ක්‍රියාත්මක වූ බෝග සහ ණය ආරක්ෂණ යෝජනා ක්‍රමයෙහි ආදායම සහ වත්කම් රක්ෂණ කර්මාන්තයේ සංඛ්‍යා ආගණනයෙන් 2014 වසරේ සිට ඉවත් කර ඇත.
5. 2016 වසරේ දී ඒඅයිඒ ජෙනරල් ඉන්ෂුවරන්ස් ලංකා ලිමිටඩ් සහ ජනශක්ති ජෙනරල් ඉන්ෂුවරන්ස් ලිමිටඩ් ඒකාබද්ධ කර ඇත.
6. සොෆ්ට්ලොජික් ලයිෆ් ඉන්ෂුවරන්ස් පීඑල්සී මින් පෙර ඒෂියන් එලයන්ස් ඉන්ෂුවරන්ස් පීඑල්සි ලෙසින් හැඳින්විණ.
7. 2015 වසරේ සිට ෆෙයා ෆැක්ස් ඒෂියා ලිමිටඩ් වෙතින් ඒෂියන්ස් එලයන්ස් ජෙනරල් ඉන්ෂුවරන්ස් ලිමිටඩ් අත්පත් කරගත් අතර, ෆෙයා ෆස්ට් ඉන්ෂුවරන්ස් ලිමිටඩ් ලෙස වර්ථමානයේ හඳුන්වයි.
8. 2017 වසරේ පෙබරවාරි 28වන දින සිට බලපැවැත්වෙන පරිදි යුනියන් ජෙනරල් ලිමිටඩ්, ෆෙයා ෆස්ට් ඉන්ෂුවරන්ස් ලිමිටඩ් සමඟින් ඒකාබද්ධ කරන ලදී.
9. ඒඅයිජී ඉන්ෂුවරන්ස් ලිමිටඩ් වෙතින් ශ්‍රී ලංකා රක්ෂණ මණ්ඩලයට අවදානම් පාදක ප්‍රාග්ධන වාර්තා බාරදීමට අවශ්‍ය නොවේ.
10. 2016 වසර තුළ ජාතික රක්ෂණ භාර අරමුදල විසින් අවදානම් පාදක ප්‍රාග්ධන වාර්තා ඉදිරිපත් කර නොමැත.

## රක්ෂණ කර්මාන්තය පිළිබඳ දළ විශ්ලේෂණය


අභියෝගාත්මක වාතාවරණය නොතකා, 2016 වසර ශ්‍රී ලංකා රක්ෂණ කර්මාන්තය සම්බන්ධයෙන් ධනාත්මක සටහනකින් අවසන් වූ අතර, දිගු කාලීන සහ සාමාන්‍ය රක්ෂණ අංශවලින් ලද සමස්ත දළ ලිඛිත වාරිකය (ද.ලි.වා.) 16.27% (2015:16.22%) ක වර්ධනයක් වාර්තා වූ අතර, උත්පාදනය කරන ලද වාරික ආදායම රුපියල් මිලියන 142,969 (2015 : රුපියල් මිලියන 122,962)ක් විය. පසුගිය වර්ෂයේ මෙන්ම, 2016 වසරේ වාර්තා වූ දළ ලිඛිත වාරිකයේ වර්ධනයට හේතුවූයේ 1 වන සටහනේ දක්වා ඇති පරිදි පිළිවෙලින් 18.26% (2015:20.39%) සහ 14.73% (2015:13.18%) ක් වූ දිගු කාලීන මෙන්ම සාමාන්‍ය රක්ෂණ අංශවල වාරිකයන්ගේ ඇති වූ වැඩිවීමයි. 2016 වසරේදී, ගෝලීය දිගු කාලීන සහ සාමාන්‍ය රක්ෂණ වාරිකයන්හි වර්ධනය පිළිවෙලින් 5.4% සහ 2.4% ලෙස වාර්තා වූ අතර, විශේෂයෙන්ම නැඟී එන ආසියාවේ නැඟී එන වෙළෙඳපොළ දිගුකාලීන මෙන්ම සාමාන්‍ය රක්ෂණ අංශයන් යන දෙකෙහිම ගෝලීය වාරික වර්ධනය සඳහා ප්‍රධාන ධාවකයා විය.

සටහන : ස්විස් රී ග්ලෝබල් ඉන්ෂුවරන්ස් සමාලෝචනය 2016 සහ දර්ශනය 2017.

2016 වසරේ උත්පාදනය වූ රුපියල් මිලියන 63,495 ක දිගු කාලීන රක්ෂණ අංශයේ දළ ලිඛිත වාරිකය 2015 එම අගය වූ රුපියල් මිලියන 53,691 ට සාපේක්ෂව 18.26% ක ඉහළ යාමකි. ජීවිත රක්ෂණය පිළිබඳ දැනුවත්භාවය ඉහළයාම, විශ්‍රාමික විසඳුම් සහ ආයෝජන රක්ෂණය, දියුණු පාරිභෝගික සේවාව, ආදී ගතික පාරිභෝගික අවශ්‍යතා සපුරාලීම පිණිස නව ජීවිත රක්ෂණ ක්‍රමයන් හඳුන්වාදීම වැනි සාධක මෙම කැපී පෙනෙන වර්ධනය සඳහා හේතු විය.

රුපියල් මිලියන 79,474 ක් ලෙස වාර්තා වූ සාමාන්‍ය රක්ෂණ අංශයේ 2016 දළ ලිඛිත වාරිකය 2015 වසරේ අගය වූ රුපියල් මිලියන 69,271 ට සාපේක්ෂව 14.73% ක වර්ධනයක් පෙන්නුම් කරන ලදී. සුවිශේෂී වෙළෙඳපොල වෙත අවධානය යොමුකිරීම, නව්‍යකරණ සාමාන්‍ය රක්ෂණ නිෂ්පාදන හඳුන්වාදීම, ව්‍යවසාය අවදානම් කළමනාකරණ ක්‍රමෝපායන් ක්‍රියාත්මක කිරීම, අවදානම් තේරීම සහ මිළකරණය ආදිය සම්බන්ධයෙන් අවධානය යොමුකිරීම වැනි ක්‍රියාමාර්ග හරහා සාමාන්‍ය රක්ෂණ වෙළඳපලෙහි පවත්නා දැඩි තරගකාරිත්වය මධ්‍යයේ වසරින් වසර ස්වකීය වාරිකයන් ස්ථාවරව ඉහළ නැංවීමට සාමාන්‍ය රක්ෂණකරුවන් සමත් වී ඇත.

**රූප සටහන 1**
**රක්ෂණ කර්මාන්තයෙහි වාරික ආදායම සහ වර්ධන වේගය**




2016 දී, ජාතික රක්ෂණ භාර අරමුදල (එන්අයිටීඑෆ්) විසින් රුපියල් මිලියන 2,357 ක් වටිනා සාමාන්‍ය රක්ෂණ ව්‍යාපාරයන්හි අනිවාර්ය ප්‍රතිරක්ෂණ පැවරීම්වල ප්‍රතිරක්ෂණ වාරික ආදායමක් උත්පාදනය කර ඇත්තේ 2015 වසරේ ආදායම වූ රුපියල් මිලියන 1,738 ට සාපේක්ෂව 35.62% ක වර්ධනයක් පෙන්නුම් කරමිනි. 2016 දී, ජාතික රක්ෂණ භාර අරමුදලෙහි (එන්අයිටීඑෆ්) ප්‍රතිරක්ෂණ වාරික සැලකිය යුතු ලෙස ඉහළ නැග ඇත්තේ සාමාන්‍ය රක්ෂණ ව්‍යාපාරයන්හි පුළුල් පරාසයක විවිධ පන්තීන්ගෙන් ප්‍රතිරක්ෂණ ව්‍යාපාර පිළිගැනීම හේතුවෙනි.

2015 වසරෙහි වාර්තා වූ 4.84% ට සාපේක්ෂව සුළු අඩුවීමක් වුවද ශ්‍රී ලංකා දළ දේශීය නිෂ්පාදිතයෙහි (GDP) 4.38% ක සාමාන්‍ය වර්ධනයක් දක්නට ලැබුණි. පෙර වසරවලට සමානව දළ දේශීය නිෂ්පාදනය සඳහා ඉහළම දායකත්වය සේවා අංශය මඟින් ලබා දී තිබුණු අතර, එය 2016 වසරේදී 57% ක් වූයේ පිළිවෙලින් කර්මාන්ත, බදු අඩුකිරීම් සහන සහ කෘෂිකර්මාන්තයෙන් දළ දේශීය නිෂ්පාදනයෙන් 27.1%, 8.4% සහ 7.5% ක දායකත්වයක් ලබා දෙමිනි. ප්‍රධාන වශයෙන්ම වසර පුරා පැවති අහිතකර කාලගුණ තත්ත්වයන් හේතුවෙන් 2016 වසරේ කෘෂිකාර්මික කටයුතු 4.2% ක සෘණ වර්ධනයක් වාර්තා කර තිබුණි.

දළ දේශීය නිෂ්පාදනයෙහි ප්‍රතිශතයක් ලෙස දැක්වෙන රක්ෂණ ව්‍යාප්තිය 2016 වසරේ දී 1.21% ක් විය. 2015 වසරේ වාර්තා වූ අගය වන 1.12%ට සාපේක්ෂව 2016 වසර තුළ රක්ෂණ ව්‍යාප්තිය ඉහළ ගොස් තිබුණ ද ආසියානු කලාපයේ

වගුව 1
වාරික ආදායම සහ ව්‍යාප්තිය

| | 2012 | 2013 | 2014 (ආ) | 2015 (ආ) | 2016 (ආ) |
|---|---|---|---|---|---|
| වාරික ආදායම - දීර්ඝ කාලීන රක්ෂණ ව්‍යාපාරය (රු. මිලියන) | 37,477 | 41,676 | 44,596 | 53,691 | 63,495 |
| වාරික ආදායම - සාමාන්‍ය රක්ෂණ ව්‍යාපාරය (රු. මිලියන) | 53,213 | 58,284 | 61,202 | 69,271 | 79,474 |
| සමස්ත වාරික ආදායම - රක්ෂණ ව්‍යාපාරය (රු. මිලියන) | 90,690 | 99,960 | 105,798 | 122,962 | 142,969 |
| මුළු වාරික ආදායම් වර්ධන අනුපාතය - රක්ෂණ ව්‍යාපාරය (%) | 10.48 | 10.22 | 5.84 | 16.22 | 16.27 |
| ප්‍රතිරක්ෂණ වාරික ආදායම (රු. මිලියන) | 464 | 1,042 | 2,041 | 1,738 | 2,357 |
| ප්‍රවර්තන වෙළඳපල මිළට දළ දේශීය නිෂ්පාදනය (රු. මිලියන) | 8,732 | 9,592 | 10,448 | 10,952 | 11,839 |
| දළ දේශීය නිෂ්පාදන වර්ධන අනුපාතය% * | 9.10 | 3.40 | 4.90 | 4.84 | 4.38 |
| ව්‍යාප්තිය% (ද.දේ.නි. % ලෙස රක්ෂණ ව්‍යාපාරවල මුළු වාරිකය) | 1.04 | 1.04 | 1.01 | 1.12 | 1.21 |
| ව්‍යාප්තිය% (ද.දේ.නි. % ලෙස දීර්ඝ කාලීන රක්ෂණ ව්‍යාපාරයේ වාරික) | 0.43 | 0.43 | 0.43 | 0.49 | 0.54 |
| ව්‍යාප්තිය% (ද.දේ.නි. % ලෙස සාමාන්‍ය රක්ෂණ ව්‍යාපාරවල වාරික*) | 0.61 | 0.61 | 0.59 | 0.63 | 0.67 |
| රක්ෂණ ඝනත්වය - (මුළු වාරික ආදායම - රක්ෂණ ව්‍යාපාර/ජනගහනය) (රුපියල්) | 4,440 | 4,857 | 5,094 | 5,865 | 6,743 |
| ජනගහනය '000 (මධ්‍ය වාර්ෂික) * | 20,424 | 20,579 | 20,771 | 20,966 | 21,203 |

* මූලාශ්‍රය : ශ්‍රී ලංකා මහ බැංකුව සහ ජන හා සංඛ්‍යාලේඛණ දෙපාර්තමේන්තුව

අනිකුත් රටවල් බොහොමයකට සාපේක්ෂව එය තවමත් පහළ මට්ටමක පවතී. 2016 වසරේ දිගු කාලීන රක්ෂණ ව්‍යාපාරයන්හි ව්‍යාප්තිය 0.54% (2015: 0.49%) ක් ද, සාමාන්‍ය රක්ෂණ ව්‍යාපාරයන්හි ව්‍යාප්තිය 0.67% (2015: 0.63%) ක් ද වූ අතර, 2015 වසරේ වාර්තා වූ ව්‍යාප්තියෙහි අනුපාතයන්ට සාපේක්ෂව එම දෙවර්ගයෙහිම සුළු වැඩිවීමක් දක්නට ලැබුණි.

රක්ෂණ ඝනත්වය යන්නෙන් ජනගහනයෙහි එක් පුද්ගලයෙක් සඳහා වන රක්ෂණ වාරික ආදායම පිළිබිඹු වන අතර, එය 14.97%ක වර්ධනයක් පෙන්නුම් කරමින් 2015 වාර්තාගත රුපියල් 5,865ට සාපේක්ෂව රුපියල් 6,743ක් දක්වා ඉහළ යාමට ප්‍රධාන හේතුව වූයේ ජනගහනයෙහි සුළු වැඩිවීමට එරෙහිව වාරික ආදායම ඉහළ යාමයි.

## ජාතික රක්ෂණ භාර අරමුදලේ වගා සහ ණය ආරක්ෂණ යෝජනා ක්‍රමය

බැංකු පනත, මූල්‍ය සමාගම් පනත සහ රක්ෂණ කර්මාන්ත නියාමන පනත ප්‍රකාරව ලියාපදිංචි ව ඇති සියලුම බැංකු, මූල්‍ය සමාගම් සහ රක්ෂණ සමාගම් බෝග රක්ෂණ අයබදු සඳහා සුදුසුකම් ලබයි. ඒ අනුව, 2013 අංක 12 දරන මුදල් පනතේ 14 වන වගන්තියට අනුව මෙම ආයතනවලට වගා රක්ෂණයක් ලෙස ජාතික රක්ෂණ භාර අරමුදලට තක්සේරු වර්ෂයක් සඳහා ස්වකීය බදු ගෙවීමෙන් පසු ලාභයෙන් සියයට එකක් ගෙවිය යුතු වේ. මෙම බද්ද ජාතික රක්ෂණ භාර අරමුදල විසින් පිහිටුවා ගන්නා ලද වගා සහ ණය ආරක්ෂණ යෝජනාක්‍රමය සඳහා භාවිතා කෙරේ.

2015 වසරේ දී රැස්කරගන්නා ලද රුපියල් මිලියන 1,259 ට සාපේක්ෂව 2016 වසරේ දී ජාතික රක්ෂණ භාර අරමුදල විසින් රැස්කරගත් බදු ප්‍රමාණය රුපියල් මිලියන 1,511 කි. රැස්කරගනු ලබන බදු ප්‍රධාන වශයෙන් රජයේ සුරැකුම්පත්වල ආයෝජනය කරන අතර 2016 වසරේ දී රුපියල් 1,541 ක් විය. 2015 වසරේ වාර්තා වූ රුපියල් මිලියන 212 ට සාපේක්ෂව මෙම කොටසෙහි වත්කම් සැලකිය යුතු ලෙස වැඩි වී තිබුණි.

ජාතික රක්ෂණ භාර අරමුදල විසින් ඉදිරිපත් කරනු ලබන වගා සහ ණය ආරක්ෂණ යෝජනා ක්‍රමයෙහි ආදායම, වියදම, වත්කම් සහ වගකීම් සංඛ්‍යා ලේඛන වාර්තා විශ්ලේෂණයෙන් ඉවත් කර ඇත.

## රක්ෂණ සමාගම්වල මුළු වත්කම්

අන්තර් ඛණ්ඩ ගණුදෙනු ඉවත්කළ පසුව, දිගුකාලීන හා සාමාන්‍ය රක්ෂණකරුවන් සහ ජාතික ප්‍රතිරක්ෂණකරු වන ජාතික රක්ෂණ භාර අරමුදලට අයත් වත්කම්වලින් සමන්විත රක්ෂණ ක්ෂේත්‍රයේ සමස්ත වත්කම් ප්‍රමාණය 2016 දෙසැම්බර් 31 දිනට රුපියල් මිලියන 527,228 ක් විය. මෙය 2015 දෙසැම්බර් 31 දිනට වාර්තා කළ රුපියල් මිලියන 466,707 ක් වූ වත්කම්වලට සාපේක්ෂව 12.97% ක ඉහළ යාමකි.


දිගු කාලීන රක්ෂකයින් ක්ෂේත්‍රයේ මුළු වත්කම්වල බහුතරය අයත්කරගෙන සිටි අතර, එය 2016 දෙසැම්බර් 31 දිනට රු. මිලියන 345,675 ක් විය. දිගු කාලීන රක්ෂණ ව්‍යාපාර වත්කම් 2015 ට සාපේක්ෂව 10.54% ක වර්ධනයක් වාර්තා කළේය. සාමාන්‍ය රක්ෂණ ව්‍යාපාරයේ වත්කම් 2016 දෙසැම්බර් 31 දිනට රුපියල් මිලියන 175,745 ක් වූ අතර, (2015: රුපියල් මිලියන 151,177) 16.25% ක වර්ධනයක් වාර්තා කරන ලදී. ජාතික රක්ෂණ භාර අරමුදල 2016 දෙසැම්බර් 31 දිනට ප්‍රතිරක්ෂකයින්ට අයත්වන

### වගුව 2
### රක්ෂණ සමාගම්වල වත්කම්

| | 2012 | 2013 | 2014 (අ) | 2015 (අ) | 2016 (ආ) |
|---|---|---|---|---|---|
| දිගු කාලීන රක්ෂණය (රුපියල් මිලියන) | 190,642 | 216,275 | 247,061 | 312,713 | 345,675 |
| සාමාන්‍ය රක්ෂණය (රුපියල් මිලියන) | 137,730 | 155,636 | 174,588 | 151,177 | 175,745 |
| ප්‍රතිරක්ෂණය (රුපියල් මිලියන) | 640 | 1,453 | 2,139 | 3,604 | 5,915 |
| **එකතුව** | ***322,986** | ***365,760** | ***421,105** | ***466,707** | ***527,228** |

* අන්තර් කොටස් ගනුදෙනු ඉවත් කර ඇත.

### රූප සටහන 2
### රක්ෂණ කර්මාන්තයේ මුළු වත්කම් සහ වත්කම්වල වර්ධන අනුපාතය




රුපියල් මිලියන 5,915ක වත්කම් අයත් කරගෙන සිටි අතර, 2015 දෙසැම්බර් 31 දිනට වාර්තාකළ වත්කම්වලට සාපේක්ෂව 64.12% ක සැලකියයුතු වර්ධනයක් වාර්තා කරන ලදී. මෙහි ප්‍රමාණය රුපියල් මිලියන 3,604 ක් විය. වත්කම්වල ඉහත සඳහන් වැඩිවීමට දිගුකාලීන සහ සාමාන්‍ය රක්ෂණය සහ ප්‍රතිරක්ෂණ ව්‍යාපාරයන්හී වාර්කවල වැඩිවීම ප්‍රධාන වශයෙන් දායක වූ අතර එය රක්ෂකයින්ගේ සහ ජාතික රක්ෂණ භාර අරමුදලේ වත්කම් පදනම් පුළුල්වීමකට හේතු වී ඇත.

## රක්ෂණ සමාගම්වල වත්කම් බෙදීයාම

2015 දෙසැම්බර් 31 දිනට සහ 2016 දෙසැම්බර් 31 දිනට දීර්ඝ කාලීන රක්ෂණ, සාමාන්‍ය රක්ෂණ සහ ජාතික රක්ෂණ භාර අරමුදලෙහි ප්‍රතිරක්ෂණ කොටස් යටතේ රක්ෂණ සමාගම් අතර වත්කම් බෙදීයාම 3 වන වගුවෙන් පැහැදිලි කර ඇත. සංයුක්ත රක්ෂණකරු වන ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථාවෙහි රුපියල් මිලියන 108 ක අන්තර්-කොටස් ශේෂයක් ඉවත් කිරීමෙන් පසුව (2015 : රුපියල් මිලියන 788) 2016 දෙසැම්බර් 31වන දිනට රක්ෂණකරුවන්ගේ මුළු වත්කම් රුපියල් මිලියන 527,228 ක් විය (2015: රුපියල් මිලියන 466,707).

රක්ෂණ ව්‍යාපාරයේ වත්කම්වලින් වැඩිම කොටස ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථාව දැරූ අතර, 2016 වසරේ දී රක්ෂණ සමාගම්වල මුළු වත්කම්වලින් 33.56% කට (2014: 35,77%) හිමිකම් කියන ලද්දේ රුපියල් මිලියන 176,933 ක් (2015: රුපියල් මිලියන 166,947% වටිනා වත්කම් හිමිකර ගනිමිනි. පසුගිය වසරට සාපේක්ෂව ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථාවෙහි වත්කම්වල කොටස 2.21% කින් අඩුවී තිබුණ ද, එහි වත්කම් ප්‍රමාණය 5.98% කින් වැඩි වී තිබුණි. 2016 දෙසැම්බර් 31 වන විට ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථාව විසින් දරන ලද දීර්ඝ කාලීන රක්ෂණ ව්‍යාපාර සහ සාමාන්‍ය රක්ෂණ ව්‍යාපාර යටතේ දරන ලද වත්කම් ප්‍රමාණය පිළිවෙලින් රුපියල් මිලියන 109,732 ක් (2015: රුපියල් මිලියන 103,093) සහ රුපියල් මිලියන 67,308 ක් විය. (2015: රුපියල් මිලියන 64,642%)

සෙලින්කෝ ලයිෆ් 2016 දෙසැම්බර් 31 දිනට මුළු වත්කම්වලින් 18.3%ක් හිමිකරගෙන සිටි අතර, එම අගය රුපියල් මිලියන 96,458 (2015 : රුපියල් මිලියන 80,235) වූ අතර 20.22% ක වර්ධනයක් පෙන්නුම් කර තිබිනි. ඒ අයි ඒ ලයිෆ්, යුනියන් ලයිෆ් සහ සෙලින්කෝ ජෙනරල් පිළිවෙලින් තෙවන, සිව්වන සහ පස්වන ස්ථාන හිමිකරගෙන තිබුණු අතර එය පිළිවෙලින් මුළු වත්කම්වලින් ප්‍රතිශතයක් ලෙස 8.79%, 6.77% සහ 4.44% ලෙස 2016 දෙසැම්බර් 31 දිනට පෙන්නුම් කෙරිනි.


2016 දෙසැම්බර් 31 දිනට ඒඅයිඒ ලයිෆ් රුපියල් මිලියන 46,321 (2015: රුපියල් මිලියන 45,957) වත්කම් හිමිකර ගෙන සිටි අතර, යුනියන් ලයිෆ් සහ සෙලින්කෝ ජෙනරල් රක්ෂණය පිළිවෙලින් රුපියල් මිලියන 35,693 ක් සහ රුපියල් මිලියන 23,406 ක් (2015: රුපියල් මිලියන 31,013 සහ රුපියල් මිලියන 19,634) හිමිකර ගනු ලැබීය. 2016 දෙසැම්බර් 31 දිනට මෙම සමාගම් පහ එක්ව සමස්ත රක්ෂණ ක්ෂේත්‍රයේ වත්කම්වලින් 71.86%ක් හිමිකර ගෙන සිටි අතර, ඉතිරි රක්ෂකයින් සහ ජාතික රක්ෂණ භාර අරමුදල මුළු වත්කම්වලින් ඉතිරි 28.14% හිමිකරගෙන තිබුණි.

### වගුව 3
### රක්ෂණ සමාගම් අනුව මුළු වත්කම් විශ්ලේෂණය

| රක්ෂකයා | 2015 (අ) | | | | | 2016 (ආ) | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|
| | දීර්ඝ කාලීන රක්ෂණය (Rs.'000) | සාමාන්‍ය රක්ෂණය (Rs.'000) | ප්‍රතිරක්ෂණය (Rs. '000) | එකතුව (Rs.'000) | % | දීර්ඝ කාලීන රක්ෂණය (Rs.'000) | සාමාන්‍ය රක්ෂණය (Rs.'000) | ප්‍රතිරක්ෂණය (Rs.'000) | එකතුව (Rs.'000) | % |
| ඒඅයිඒ ලයිෆ් | 45,957,291 | | | 45,957,291 | 9.85 | 46,320,851 | | | 46,320,851 | 8.79 |
| ඒඅයිඒ ජෙනරල් | | 5,987,146 | | 5,987,146 | 1.28 | | | | | |
| ඒඅයිජී | | 205,104 | | 205,104 | 0.04 | | 124,979 | | 124,979 | 0.02 |
| අලියාන්ස් ජෙනරල් | | 4,106,848 | | 4,106,848 | 0.88 | | 5,211,062 | | 5,211,062 | 0.99 |
| අලියාන්ස් ලයිෆ් | 1,947,125 | | | 1,947,125 | 0.42 | 2,571,072 | | | 2,571,072 | 0.49 |
| අමානා ජෙනරල් | | 2,603,687 | | 2,603,687 | 0.56 | | 2,869,633 | | 2,869,633 | 0.54 |
| අමානා ලයිෆ් | 2,405,537 | | | 2,405,537 | 0.52 | 2,726,295 | | | 2,726,295 | 0.52 |
| ආර්පිකෝ | 1,160,691 | | | 1,160,691 | 0.25 | 1,592,136 | | | 1,592,136 | 0.30 |
| සොෆ්ට් ලොජික් ලයිෆ් | 9,814,621 | | | 9,814,621 | 2.10 | 9,917,606 | | | 9,917,606 | 1.88 |
| ෆෙයා ෆස්ට් | | 2,489,014 | | 2,489,014 | 0.53 | | 2,945,827 | | 2,945,827 | 0.56 |
| සෙලින්කෝ ජෙනරල් | | 19,634,062 | | 19,634,062 | 4.21 | | 23,406,292 | | 23,406,292 | 4.44 |
| සෙලින්කෝ ලයිෆ් | 80,235,165 | | | 80,235,165 | 17.19 | 96,458,087 | | | 96,458,087 | 18.30 |
| කොන්ටිනෙන්ටල් | | 2,636,838 | | 2,636,838 | 0.56 | | 3,584,797 | | 3,584,797 | 0.68 |
| කෝපරේටිව් ජෙනරල් | | 3,049,379 | | 3,049,379 | 0.65 | | 3,761,264 | | 3,761,264 | 0.71 |
| කෝප් ලයිෆ් | 1,714,017 | | | 1,714,017 | 0.37 | 1,799,701 | | | 1,799,701 | 0.34 |
| එච්එන්බී ලයිෆ් | 10,022,562 | | | 10,022,562 | 2.15 | 12,199,440 | | | 12,199,440 | 2.31 |
| එච්එන්බී ජෙනරල් | | 2,777,034 | | 2,777,034 | 0.60 | | 3,492,537 | | 3,492,537 | 0.66 |
| ජනශක්ති ලයිෆ් | 19,323,791 | | | 19,323,791 | 4.14 | 19,049,957 | | | 19,049,957 | 3.61 |
| ජනශක්ති ජෙනරල් | | 12,331,132 | | 12,331,132 | 2.64 | | 21,322,088 | | 21,322,088 | 4.04 |
| එල්අයිසී | 2,050,066 | | | 2,050,066 | 0.44 | 2,270,553 | | | 2,270,553 | 0.43 |
| එල්ඕඑල්සී ජෙනරල් | | 3,100,033 | | 3,100,033 | 0.66 | | 4,068,265 | | 4,068,265 | 0.77 |
| එල්ඕඑල්සී ලයිෆ් | 1,943,775 | | | 1,943,775 | 0.42 | 2,806,697 | | | 2,806,697 | 0.53 |
| එම්බීඑස්එල් | 539,232 | 1,386,401 | | 1,925,633 | 0.41 | 604,563 | 1,086,971 | | 1,691,534 | 0.32 |
| එන් අයි ටී එෆ් | | 8,417,578 | 3,604,151 | 12,021,729 | 2.58 | | 11,903,131 | 5,915,066 | 17,818,197 | 3.38 |
| ඔරියන්ට් | | 1,108,327 | | 1,108,327 | 0.24 | | 1,713,218 | | 1,713,218 | 0.32 |
| පීපල්ස් | | 6,642,095 | | 6,642,095 | 1.42 | | 6,718,278 | | 6,718,278 | 1.27 |
| සණස | 1,492,252 | 644,100 | | 2,136,352 | 0.46 | 1,932,832 | 521,765 | | 2,454,597 | 0.47 |
| එස්එල්අයිසී | 103,093,318 | 64,641,960 | | 166,947,465 | 35.77 | 109,732,183 | 67,308,495 | | 176,933,175 | 33.56 |
| යුනියන් ලයිෆ් | 31,013,818 | | | 31,013,818 | 6.65 | 35,693,463 | | | 35,693,463 | 6.77 |
| යුනියන් ජෙනරල් | | 9,416,163 | | 9,416,163 | 2.02 | | 15,706,231 | | 15,706,231 | 2.98 |
| **එකතුව** | **312,713,263** | **151,176,901** | **3,604,151** | **466,706,502** | **100** | **345,675,436** | **175,744,833** | **5,915,066** | **527,227,831** | **100** |

සටහන:
2016 දී රුපියල් මිලියන 108ක (2015 : රුපියල් මිලියන 788) අන්තර් - අංශ ශේෂයන් ඉවත් කිරීමෙන් පසු ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථාවේ මුළු වත්කම් ගණනය කරනු ලැබ ඇත.

### රූප සටහන 2
### රක්ෂණ කර්මාන්තයේ මුළු වත්කම් සහ වත්කම්වල වර්ධන අනුපාතය




2016 දෙසැම්බර් 31 දිනට රුපියල් මිලියන 96,458 (2015: රුපියල් මිලියන 80,235) වටිනාකමින් යුතුව මුළු වත්කම්වලින් 18.30% ක් හිමිකර ගැනීමට සෙලින්කෝ ලයිෆ් රක්ෂණයට හැකි වූ අතර එය 20.22% ක වර්ධනයක් වාර්තා කළේය. 2016 දෙසැම්බර් 31 දිනට ඒඅයිඒ ලයිෆ්, යුනියන් ලයිෆ් සහ සෙලින්කෝ ජෙනරල් රක්ෂණ පිළිවෙලින් තෙවන, සිවුවන සහ පස්වන ස්ථාන හිමිකර ගත්තේ සමස්ත කර්මාන්තයේ වත්කම් වලින් 8.79%, 6.77% සහ 4.44% හිමිකර ගනිමිනි. රුපියල් මිලියන 31,014 ක් සහ රුපියල් මිලියන 19,656 ක් වටිනා වත්කම් දැරූ යුනියන් ලයිෆ් සහ ජනශක්ති ලයිෆ්

**වගුව 4**
**රක්ෂණ සමාගම්වල කොටස් හිමියන්ගේ මුළු අරමුදල්**

| රක්ෂකයා | 2015 (අ) | | 2016 (ආ) | | | |
|---|---|---|---|---|---|---|
| | සමස්ත කොටස් හිමියන්ගේ මුළු අරමුදල් (රු.'000) | % | ප්‍රකාශිත ප්‍රාග්ධනය (රු.'000) | මුළු සංචිත (රු.'000) | සමස්ත කොටස් හිමියන්ගේ මුළු අරමුදල (රු.'000) | % |
| ඒඅයිඒ ලයිෆ් | 6,362,871 | 4.67 | 511,922 | 4,849,062 | 5,360,984 | 3.90 |
| ඒඅයිඒ ජෙනරල් | 1,930,279 | 1.42 | | | | |
| ඒඅයිජී | (168,098) | (0.12) | 812,215 | (751,090) | 61,125 | 0.04 |
| අලියාන්ස් ජෙනරල් | 986,717 | 0.72 | 500,000 | 473,471 | 973,471 | 0.71 |
| අලියාන්ස් ලයිෆ් | 214,407 | 0.16 | 739,624 | (586,985) | 152,638 | 0.11 |
| අමානා ජෙනරල් | 1,693,459 | 1.24 | 1,860,001 | (82,163) | 1,777,838 | 1.29 |
| අමානා ලයිෆ් | 515,594 | 0.38 | 500,000 | 26,119 | 526,119 | 0.38 |
| ආර්පිකෝ | 647,253 | 0.48 | 675,565 | 18,245 | 693,810 | 0.50 |
| සොෆ්ට් ලොජික් ලයිෆ් | 2,437,935 | 1.79 | 1,062,500 | 899,667 | 1,962,167 | 1.43 |
| ෆෙයා ෆස්ට් | 585,389 | 0.43 | 1,400,000 | (583,433) | 816,567 | 0.59 |
| සෙලින්කෝ ජෙනරල් | 7,882,870 | 5.79 | 500,200 | 8,290,869 | 8,791,069 | 6.40 |
| සෙලින්කෝ ලයිෆ් | 9,446,370 | 6.94 | 500,001 | 11,411,827 | 11,911,828 | 8.67 |
| කොන්ටිනෙන්ටල් | 1,032,611 | 0.76 | 750,000 | 444,534 | 1,194,534 | 0.87 |
| කෝපරේටිව් ජෙනරල් | 1,515,717 | 1.11 | 1,115,368 | 549,990 | 1,665,358 | 1.21 |
| කෝප්ලයිෆ් | 537,746 | 0.39 | 500,000 | (43,798) | 456,202 | 0.33 |
| එච්එන්බී ලයිෆ් | 2,511,343 | 1.84 | 1,171,875 | 1,703,455 | 2,875,330 | 2.09 |
| එච්එන්බී ජෙනරල් | 922,601 | 0.68 | 1,150,000 | (178,272) | 971,728 | 0.71 |
| ජනශක්ති ලයිෆ් | 7,756,986 | 5.70 | 4,853,752 | 3,213,237 | 8,066,989 | 5.87 |
| ජනශක්ති ජෙනරල් | 4,485,180 | 3.29 | 5,878,017 | 2,078,105 | 7,956,122 | 5.79 |
| එල්අයිසී | 683,448 | 0.50 | 500,000 | 154,645 | 654,645 | 0.48 |
| එල්ඕඑල්සී ජෙනරල් | 811,870 | 0.60 | 700,000 | 311,703 | 1,011,703 | 0.74 |
| එල්ඕඑල්සී ලයිෆ් | 262,770 | 0.19 | 800,000 | (216,730) | 583,270 | 0.42 |
| එම්බීඑස්එල් | 333,209 | 0.24 | 1,080,022 | (988,123) | 91,899 | 0.07 |
| එන් අයි ටී එෆ් | 8,654,939 | 6.36 | | 7,887,578 | 7,887,578 | 5.74 |
| ඔරියන්ට් | 517,290 | 0.38 | 825,000 | (207,455) | 617,545 | 0.45 |
| පීපල්ස් | 2,250,995 | 1.65 | 1,350,000 | 1,278,367 | 2,628,367 | 1.91 |
| සණස | 850,573 | 0.62 | 1,042,846 | 324,771 | 1,367,617 | 1.00 |
| එස්එල්අයිසී | 63,677,120 | 46.77 | 6,000,000 | 52,635,550 | 58,635,550 | 42.67 |
| යුනියන් ලයිෆ් | 3,464,928 | 2.54 | 1,000,000 | 2,866,192 | 3,866,192 | 2.81 |
| යුනියන් ජෙනරල් | 3,346,435 | 2.46 | 3,131,949 | 715,354 | 3,847,303 | 2.80 |
| **එකතුව** | **136,150,806** | **100** | **40,910,856** | **96,494,691** | **137,405,547** | **100** |

මුළු වත්කම්වලින් 6.67% කට හා 4.23% කට හිමිකම් පාන ලද්දේ රක්ෂණ කර්මාන්තයේ වත්කම් හිමිකාරත්වය අනුව හතරවන හා පස්වන ස්ථාන දිනා ගනිමිනි.


## රක්ෂණ සමාගම්වල කොටස් හිමියන්ගේ අරමුදල්

රක්ෂණ සමාගම්වල මුළු කොටස් හිමියන්ගේ අරමුදල්වල 2015 දෙසැම්බර් මස 31 දිනට වාර්තා කරන ලද රුපියල් මිලියන 136,151 ට සාපේක්ෂව 2016 දෙසැම්බර් මස 31 දිනට රුපියල් මිලියන 137,406 ක් වී ඇති බව 4 වන වගුවෙන් නිරූපනය කරයි. 2015 වර්ෂය අවසානය හා සැසැඳීමේදී මුළු කොටස් හිමියන්ගේ අරමුදල්වල 0.92% ක සුළු වැඩිවීමක් 2016 වර්ෂය අවසානයේ වාර්තා කර ඇත. 2016 දෙසැම්බර් 31 වන විට මුළු කොටස් හිමියන්ගේ අරමුදල් රුපියල් මිලියන 40,911 ක ප්‍රකාශිත ප්‍රාග්ධනයෙන් සහ රුපියල් මිලියන 96,495 ක සංචිතයන්ගෙන් යුක්ත විය.

පෙර වසර මෙන්, එස් එල් අයි සී මුළු කොටස් හිමියන්ගේ අරමුදල්වලින් විශාලතම කොටස හිමිකරගත් අතර, එය 2016 දෙසැම්බර් මස 31 දිනට රුපියල් මිලියන 58,636 ක් (2015: රුපියල් මිලියන 63,677) වූ අතර, සමස්ත රක්ෂණ කර්මාන්තයේ මුළු කොටස් හිමියන්ගේ අරමුදල්වලින් 42.67% කට (2015:46.77%) දායක

විය. කෙසේවෙතත්, එස් එල් අයි සී කොටස් හිමියන්ගේ අරමුදල් 2015 වසර අවසානයට සාපේක්ෂව 2016 වසර අවසානයේදී 7.92% කින් පහත වැටී ඇති අතර, එයට රඳවාගත් ඉපයීම්වල අඩුවීම ප්‍රධාන වශයෙන් හේතු විය. 2016 දෙසැම්බර් මස 31 දිනට එස් එල් අයි සප්‍රකාශිත ප්‍රාග්ධනය රුපියල් මිලියන 6,000 ක් වූ අතර මුළු සංචිත රුපියල් මිලියන 52,636 ක් විය. සෙලින්කෝ ලයිෆ් සහ සෙලින්කෝ ජෙනරල් පිළිවෙලින් මුළු කොටස් හිමියන්ගේ අරමුදලින් 8.67%කට සහ 6.40%කට දායක වූ අතර, 2016 දෙසැම්බර් මස 31 දිනට එහි අගයන් පිළිවෙලින් රුපියල් මිලියන 11,912 කට සහ රුපියල් මිලියන 8,791 කට (2015: පිළිවෙලින් රුපියල් මිලියන 9,446 සහ රුපියල් මිලියන 7,883) හිමිකම් පෑවේ මුළු කොටස් හිමියන්ගේ අරමුදල්වල දෙවන සහ තෙවන ස්ථාන හිමි කර ගනිමිනි. 2016 දෙසැම්බර් 31 දිනට ජනශක්ති ලයිෆ් සහ ජනශක්ති ජෙනරල් මුළු රක්ෂණ කර්මාන්තයේ කොටස් හිමියන්ගේ අරමුදලින් පිළිවෙලින් 5.87% ක් සහ 5.79% ක් හිමිකර ගනිමින් එනම් පිළිවෙලින් රුපියල් මිලියන 8,067 ක් සහ රුපියල් මිලියන 7,956 ක් (2015: පිළිවෙලින් රුපියල් මිලියන 7,757 සහ රුපියල් මිලියන 4,485) හිමිකර ගනිමින් සමස්ත කොටස් හිමියන්ගේ අරමුදල්වල හතරවැනි සහ පස්වැනි තැනට පත්විය.

රූප සටහන 4
2016 දෙසැම්බර් 31 දිනට ප්‍රධාන මූල්‍ය අංශ අතර මුළු වත්කම් බෙදීයාම




## ප්‍රධාන මූල්‍ය අංශ අතර මුළු වත්කම් බෙදීයාම

2016 දෙසැම්බර් මස 31 දිනට, ආර්ථිකයේ ප්‍රධාන මූල්‍ය අංශ වල මුළු වත්කම් ප්‍රමාණය රුපියල් බිලියන 15,411.4 ක් වූ අතර 2015 දෙසැම්බර් 31 දිනට වාර්තා කළ රුපියල් බිලියන 13,830.8 ක් වූ වත්කම් ප්‍රමාණයට වඩා 11.43% කින් වර්ධනය වී ඇත. මූල්‍ය අංශයට අයත් වත්කම්වලින් විශාල කොටස බැංකු අංශය විසින් හිමිකර ගත් අතර, එය මුළු වත්කම්වලින් 68.6% කි. 2016 දෙසැම්බර් මස 31 දිනට රුපියල් බිලියන 2,537.2 ක් වූ වත්කම් හිමිකර ගනිමින් මූල්‍ය අංශවල මුළු වත්කම්වලින් 16.5% ක් ගිවිසුම්ගත ඉතුරු කිරීමේ ආයතන විසින් දරන ලද අතර, පසුගිය වසර අවසානයට වාර්තා කරන ලද රුපියල් බිලියන 2,257.5 ට සාපේක්ෂව 12.39% ක වැඩිවීමක් වාර්තා කර ඇත. 2016 දෙසැම්බර් මස 31 දිනට තැන්පතු භාර ගන්නා අනෙකුත් මූල්‍ය ආයතන මූල්‍ය අංශවල මුළු වත්කම්වලින් 8.1% ක් නියෝජනය කළ අතර, විශේෂිත මූල්‍ය ආයතන මූල්‍ය අංශවල මුළු වත්කම්වලින් 3.4% කට දායක විය. 2016 දෙසැම්බර් මස 31 දිනට රුපියල් බිලියන 527.2 ක (2015: රුපියල් බිලියන 466.7) වත්කම් වාර්තා කරමින් රක්ෂණ අංශය ප්‍රධාන මූල්‍ය අංශවල මුළු වත්කම්වලින් 3.4% කට (2015 : 3.4%) දායක වී ඇත.

වගුව 05
ප්‍රාග්ධන මූල්‍ය අංශ අතර මුළු වත්කම් බෙදීයාම

| මූල්‍ය අංශ | වත්කම් බෙදීයාම | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|
| | 2012 | | 2013 | | 2014 | | 2015 | | 2016 | |
| | රු. බිලියන | % | රු. බිලියන | % | රු. බිලියන | % | රු. බිලියන | % | රු. බිලියන | % |
| බැංකු අංශය | 6,377.0 | 70.3 | 7,187.5 | 69.6 | 8,442.0 | 70.3 | 9,503.7 | 68.7 | 10,575.8 | 68.6 |
| තැන්පතු භාර ගන්නා අනෙකුත් මූල්‍ය ආයතන | 621.2 | 6.9 | 756.4 | 7.3 | 857 | 7.1 | 1044.2 | 7.5 | 1246.7 | 8.1 |
| විශේෂිත මූල්‍ය ආයතන | 310.4 | 3.4 | 378 | 3.7 | 441 | 3.7 | 557.8 | 4.0 | 522.8 | 3.4 |
| ගිවිසුම්ගත ඉතිරි කිරීමේ ආයතන | 1,429.6 | 15.8 | 1,632.5 | 15.8 | 1,853.6 | 15.4 | 2,257.5 | 16.3 | 2,537.2 | 16.5 |
| රක්ෂණ සමාගම් | 323.0 | 3.6 | 365.8 | 3.6 | 421.1(a) | 3.5 | 466.7 (a) | 3.4 | 527.2 (b) | 3.4 |
| **එකතුව** | **9,061.2** | **100** | **10,320.2** | **100** | **12,015.0** | **100.0** | **13,830.8** | **100.0** | **15,411.4** | **100.0** |

මූලාශ්‍රය: ශ්‍රී ලංකා මහ බැංකුව
සටහන: රක්ෂණ සමාගම්වලින් ලද දත්ත මත පදනම් වී රක්ෂණ සමාගම්වල වත්කම් පුනස්ථාපනය කරන ලදී.

## රක්ෂණ සමාගම්වල ශාඛා, සේවකයින් සහ නියෝජිතයින් පිළිබඳ විශ්ලේෂණය

දිවයින පුරා විසිරී සිටින ගනුදෙනුකරුවන් කරා ළඟාවීම පිණිස ශාඛා ජාල සහ නියෝජිතයින් වැනි විවිධ බෙදාහැරීමේ මාර්ග රක්ෂණ සමාගම් විසින් භාවිතා කරනු ලැබේ. 06 වගුවේ දක්වා ඇති පරිදි, 2016 දෙසැම්බර් මස 31 දිනට ශාඛා 1971 ක් ක්‍රියාත්මක වූ අතර, එය 2015 දෙසැම්බර් මස 31 දිනට පැවති ශාඛා 1,872 ට සාපේක්ෂව සැසැඳීමේදී 5.29% ක වර්ධනයකි. විශාලතම ශාඛා ප්‍රමාණය බස්නාහිර පළාතේ පිහිටා තිබුණි. එහි ගණන 657 ක් වූ අතර දිවයින පුරා පිහිටි සමස්ත ශාඛා සංඛ්‍යාවෙන් 33.33% ක් විය. දකුණු හා වයඹ පළාත් පිළිවෙලින් ශාඛා 234 ක් සහ 196 ක් සහිතව දෙවැනියට සහ තෙවැනියට විශාලතම ශාඛා ජාලය ඇති පළාත් වූ අතර, අවම ශාඛා සංඛ්‍යාව ඌව පළාතට හිමි වූ අතර එහි ශාඛා ගණන 120කි. උතුරු සහ නැගෙනහිර පළාත්වල ශාඛා ජාලය රටෙහි උතුරු සහ නැගෙනහිර පළාත්වල සිදුවූ පශ්චාත් යුධ සංවර්ධනය පිළිබිඹු කරමින් 2016 දී පිළිවෙලින් 15.11% කින් සහ 6.45% කින් වැඩි වී තිබුණි. 2015 දී ක්‍රියාත්මක වූ ශාඛා සංඛ්‍යාව 188 සිට 178 දක්වා අඩු වූ වයඹ පළාත් හැර රට තුළ සෑම පළාතකම ශාඛාවන් 2016 වසරේදී වැඩි වී ඇත.

සියලුම රක්ෂණ සමාගම්වල සේවය කරන ලද මුළු සේවක සංඛ්‍යාව 6.73% ක වර්ධනයක් වාර්තා කරමින් 2016 දෙසැම්බර් මස 31 දිනට 16,896 (2015: 15,830)ක් විය. සියලුම රක්ෂණ සමාගම්වල සේවය කරන ලද මුළු සේවක සංඛ්‍යාවෙන්, 2016 දෙසැම්බර් මස 31 දිනට සේවකයින් 10,949 ක් (2015: 10,484) බස්නාහිර පළාතේ ස්ථාපිතව සිටි අතර, එහි අගය 64.80% (2015: 66.23%) කි. 2015 වසරට සාපේක්ෂව වැඩිවීමක් වාර්තා කරමින්, 2016 දෙසැම්බර් මස 31 දිනට දකුණු හා වයඹ පළාත් තුළ පිළිවෙලින් සේවකයින් 1,088 ක් සහ 880 ක් (2015 : පිළිවෙලින් 986ක් සහ 841ක්) සේවය කරන ලදී.


**වගුව 06**

**2015 සහ 2016 දෙසැම්බර් 31ට ක්‍රියාත්මක වූ ශාඛා, සේවකයින් සහ නියෝජිතයින් සංඛ්‍යාව**

| පළාත | ශාඛා සංඛ්‍යාව | | සේවකයින් සංඛ්‍යාව | | නියෝජිතයින් සංඛ්‍යාව | |
|---|---|---|---|---|---|---|
| | 2015 | 2016 | 2015 | 2016 | 2015 | 2016 |
| මධ්‍යම පළාත | 178 | 196 | 841 | 880 | 4,433 | 4,245 |
| නැගෙනහිර පළාත | 124 | 132 | 480 | 553 | 2,201 | 2,223 |
| උතුරු මැද පළාත | 132 | 145 | 579 | 617 | 2,642 | 2,520 |
| වයඹ පළාත | 188 | 178 | 883 | 919 | 4,326 | 4,094 |
| උතුරු පළාත | 139 | 160 | 430 | 570 | 3,335 | 3,387 |
| සබරගමුව පළාත | 140 | 149 | 687 | 842 | 2,845 | 2,745 |
| දකුණු පළාත | 232 | 234 | 986 | 1,088 | 4,827 | 4,915 |
| ඌව පළාත | 108 | 120 | 460 | 478 | 2,207 | 2,422 |
| බස්නාහිර පළාත | 631 | 657 | 10,484 | 10,949 | 17,333 | 17,265 |
| **එකතුව** | **1,872** | **1,971** | **15,830** | **16,896** | **44,149** | **43,816** |

**රූප සටහන 5**

**2016 දෙසැම්බර් 31 දිනට ක්‍රියාත්මක වූ ශාඛා, සේවකයින් සහ නියෝජිතයින් සංඛ්‍යාව**





අඩුම සේවක සංඛ්‍යාව වන 478 ඌව පළාතින් වාර්තා වූ අතර, එය රක්ෂණ සමාගම්වල සේවය කරන ලද මුළු සේවක සංඛ්‍යාවෙන් 2.83% කි. 2015 වසරට සාපේක්ෂව 2016 වසරේදී රටෙහි සෑම පළාතකම සේවය කරන සේවක සංඛ්‍යාව වැඩි වී ඇති බව සැලකිය යුතුය.

රක්ෂණ සමාගම්වලට සම්බන්ධව සේවය කළ නියෝජිතයින්ගේ මුළු සංඛ්‍යාව 2016 දෙසැම්බර් මස 31 දිනට 43,816 ක් වූ අතර, 2015 දෙසැම්බර් මස 31 දිනට සේවය කළ 44,149 ක් වූ නියෝජිතයින්ට සාපේක්ෂව 0.75% ක සුළු පහත වැටීමක් පෙන්නුම් කරයි. පෙර වසරවල මෙන්, නියෝජිතයින්ගේ

ඉහළම සංඛ්‍යාව බස්නාහිර පළාතේ සේවය කරනු ලැබූ අතර 2016 දෙසැම්බර් මස 31 දිනට එය 17,265 ක් (2015 : 17,333) බවට පත්වෙමින් රක්ෂණ සමාගම්වල මුළු නියෝජිත බලකායෙන් 39.40% ක් නියෝජනය කරන ලදී. නැගෙනහිර පළාතෙන් අඩුම නියෝජිතයින් සංඛ්‍යාවක් වාර්තා වූ අතර, 2016 දෙසැම්බර් මස 31 දිනට එය 2,223 (2015 : 2,201)ක් විය. 6 වන වගුවෙන් පෙන්නුම් කරන සැලකිය යුතු කරුණ වන්නේ දිවයින පුරා අනෙකුත් පළාත් හා සැසැඳීමේදී, රක්ෂණ සමාගම්වල ශාඛාවන්ගෙන්, සේවකයින්ගෙන් සහ නියෝජිතයින්ගෙන් විශාල කොටස බස්නාහිර පළාත් තුල සංකේන්ද්‍රණය වීමයි.

**රූප සටහන 6**
**රක්ෂණ සමාගම්වල බෙදා හැරීමේ මාර්ග**




| | දීර්ඝ කාලීන 2015 (අ) | සාමාන්‍ය 2015 (අ) | දීර්ඝ කාලීන 2016 (ආ) | සාමාන්‍ය 2016 (ආ) |
|---|---|---|---|---|
| නියෝජිතයින් | 89.90 | 29.06 | 87.41 | 25.73 |
| තැරැව්කරුවන් | 0.42 | 18.48 | 0.51 | 17.89 |
| සෘජු | 4.81 | 35.61 | 6.18 | 40.01 |
| බැංකු රක්ෂණය | 3.98 | 3.62 | 4.91 | 3.50 |
| වෙනත් | 0.88 | 13.23 | 0.99 | 12.87 |

## රක්ෂණ සමාගම්වල බෙදා හැරීමේ මාර්ග

6 වන රූප සටහන මඟින් පෙන්වා දෙන පරිදි, රක්ෂකයින් විසින් ස්වකීය පාර්භෝගිකයින්ට ලඟාවීම පිණිස නියෝජිතයින්, තැරැව්කරුවන්, සෘජු අලෙවිකරණය, බැංකු රක්ෂණ වැනි බෙදාහැරීමේ මාර්ග සහ අනෙකුත් බෙදාහැරීමේ මාර්ග භාවිතා කරයි. දීර්ඝ කාලීන රක්ෂණ වෙළෙඳපොළේ ප්‍රධාන බෙදාහැරීම් මාර්ගය ලෙස නියෝජිතයින් කටයුතු කරයි. 2016 දී, නියෝජිතයින් දීර්ඝ කාලීන රක්ෂණ ව්‍යාපාරයේ දළ ලිඛිත වාරිකයෙන් 87.41% ක් (2015 : 89.90%) උත්පාදනය කර තිබුණි. සෘජු අලෙවිකරණය, සහ බැංකු රක්ෂණ (bancassurance) දීර්ඝකාලීන රක්ෂණ ව්‍යාපාරවල අනෙකුත් වැදගත් බෙදාහැරීම් මාර්ග වූ අතර, 2016 වසරේදී දළ ලිඛිත වාරිකයෙන් පිළිවෙලින් 6.18% ක් සහ 4.91% ක් (2015 : පිළිවෙලින් 4.81% ක් සහ 3.98% ක්) උත්පාදනය කලේය. අනෙකුත් බෙදාහැරීමේ මාර්ග සහ තැරැව්කරුවන් දීර්ඝකාලීන රක්ෂණ ව්‍යාපාරයෙන් උත්පාදනය කර තිබුණේ 0.99% ක සහ 0.51% ක ප්‍රමාණයක් පමණි.

සාමාන්‍ය රක්ෂණ ව්‍යාපාරයෙහි සෘජු අලෙවිකරණය, නියෝජිතයින් සහ තැරැව්කාර සමාගම් වැනි ප්‍රධාන බෙදාහැරීමේ මාර්ග තුනක් පවතින අතර, 2016 දී එම මාර්ග පිළිවෙලින් 40.01%, 25.73% සහ 17.89% ක් (2015: 35.61%, 29.06% සහ 18.48%) දළ ලිඛිත වාරිකයන් උත්පාදනය කර ඇත. අනෙකුත් බෙදාහැරීමේ මාර්ග 2015 දී වාර්තා කළ 13.23% ට වඩා සුළු අඩුවීමක් සහිතව 2016 දී සාමාන්‍ය රක්ෂණයේ දළ ලිඛිත වාරිකයෙන් 12.87% ක් උත්පාදනය කර තිබුණි. බැංකු රක්ෂණ මඟින් සාමාන්‍ය රක්ෂණයේ දළ ලිඛිත වාරිකයෙන් 2015 වසරේදී උත්පාදනය කළ 3.62% ට ඉතා සමීප අගයකින් එනම් 3.5% ක් උත්පාදනය කර ඇත.

## දීර්ඝ කාලීන රක්ෂණ ව්‍යාපාරය

### දළ ලිඛිත වාරික ආදායම

දීර්ඝ කාලීන රක්ෂණ ව්‍යාපාරය රුපියල් මිලියන 63,495 ක (2015 : රුපියල් මිලියන 53,691) දළ ලිඛිත වාරික ආදායමක් උත්පාදනය කරමින් සහ 18.26% ක සුවිශේෂී වර්ධනයක් වාර්තා කරමින් 2016 දී යහපත් අයුරින් කටයුතු කර ඇත. නමුදු, 2015 දී අත්කර ගත් 20.40% ක වර්ධනයට සාපේක්ෂව මෙය සුළු පහත වැටීමකි.

සෙලින්කෝ ලයිෆ් 2016 දී රුපියල් මිලියන 15,028 ක (2015: රුපියල් මිලියන 13,457) දළ ලිඛිත වාරික ආදායමක් උත්පාදනය කරමින් දීර්ඝ කාලීන රක්ෂණ වෙළඳපල තුළ වෙළඳපොල ප්‍රමුඛයා ලෙස තවදුරටත් ඉදිරියෙන් සිටි අතර, මුළු දළ ලිඛිත වාරික ආදායමෙන් 23.67% ක් (2015:25.06%) සඳහා දායක විය. කෙසේවෙතත්, සෙලින්කෝ ලයිෆ් වෙළඳපොල කොටස පසුගිය වසර තුන තුළ ක්‍රමයෙන් පහත වැටී ඇත. එස්එල්අයිසී සහ ඒඅයිඒ ලයිෆ් පිළිවෙලින් 18.73% ක සහ 15.91% ක වෙළඳපොල කොටසක් සහිතව රුපියල් මිලියන 11,894 ක් (2015:රුපියල් මිලියන 10,470) සහ රුපියල් මිලියන 10,104 ක් (2015:රුපියල් මිලියන 8,433) වූ දළ ලිඛිත වාරික ආදායමක් වාර්තා කරමින් 2016 දී දළ ලිඛිත වාරික ආදායම අනුව ජීවිත රක්ෂණ වෙළඳපොළේ දෙවැනි තෙවැනි ස්ථාන දිනාගැනීමට සමත්ව ඇත. එස් එල් අයි සී වෙළඳපොල කොටස 2016 දී 0.77% කින් පහත වැටුණ අතර, ඒඅයිඒ ලයිෆ් වෙත එහි වෙළඳපොල කොටස 0.2% කින් සුළු වශයෙන් වැඩි කර ගැනීමට හැකි වී ඇත. යුනියන් ලයිෆ් සහ සොෆ්ට්ලෝජික් ලයිෆ් පිළිවෙලින් රුපියල් මිලියන 8,271 ක (2015:රුපියල් මිලියන 6,964) සහ රුපියල් මිලියන 5,636 ක (2015:රුපියල් මිලියන 4,091) දළ ලිඛිත වාරික වටිනාමක් උපයාගෙන ඇති අතර, පසුගිය වසරට සමානව දීර්ඝ කාලීන රක්ෂණ වෙළඳපල තුළ


**වගුව 7**

**සමාගම් අනුව දළ ලිඛිත වාරික ආදායම සහ වෙළඳපොල කොටස - දීර්ඝකාලීන රක්ෂණ ව්‍යාපාරය**

| රක්ෂකයා | 2012 | | 2013 | | 2014 | | 2015 (a) | | 2016 (b) | |
|---|---|---|---|---|---|---|---|---|---|---|
| | වාරික ආදායම (Rs.'000) | වෙළඳපොළ කොටස (%) | වාරික ආදායම (Rs.'000) | වෙළඳපොළ කොටස (%) | වාරික ආදායම (Rs.'000) | වෙළඳපොළ කොටස (%) | වාරික ආදායම (Rs.'000) | වෙළඳපොළ කොටස (%) | වාරික ආදායම (Rs.'000) | වෙළඳපොළ කොටස (%) |
| ඒඅයිඒ ලයිෆ් | 6,495,863 | 17.33 | 6,863,047 | 16.47 | 7,266,574 | 16.29 | 8,433,333 | 15.71 | 10,103,915 | 15.91 |
| අලියාන්ස් ලයිෆ් | 532,142 | 1.42 | 828,790 | 1.99 | 823,456 | 1.85 | 919,144 | 1.71 | 1,040,272 | 1.64 |
| අමානා ලයිෆ් | 364,759 | 0.97 | 542,986 | 1.30 | 679,029 | 1.52 | 928,294 | 1.73 | 843,899 | 1.32 |
| ආර්පිකෝ | 101,900 | 0.27 | 206,494 | 0.50 | 297,439 | 0.67 | 482,447 | 0.90 | 745,386 | 1.17 |
| සොෆ්ට්ලොජික් ලයිෆ් | 2,034,084 | 5.43 | 2,520,283 | 6.05 | 3,048,148 | 6.84 | 4,091,042 | 7.62 | 5,635,701 | 8.87 |
| සෙලින්කෝ ලයිෆ් | 10,829,470 | 28.90 | 11,122,906 | 26.69 | 12,002,524 | 26.91 | 13,456,828 | 25.06 | 15,027,600 | 23.67 |
| කෝප් ලයිෆ් | 312,056 | 0.83 | 337,623 | 0.81 | 402,046 | 0.90 | 494,598 | 0.92 | 462,159 | 0.73 |
| එන්එච්බී ලයිෆ් | 1,500,028 | 4.00 | 2,014,547 | 4.83 | 2,342,867 | 5.25 | 2,788,715 | 5.19 | 3,554,078 | 5.60 |
| ජනශක්ති ලයිෆ් | 2,025,075 | 5.40 | 2,193,662 | 5.26 | 2,170,419 | 4.87 | 2,550,782 | 4.75 | 2,943,963 | 4.64 |
| එල්අයිසී | 303,344 | 0.81 | 322,268 | 0.77 | 348,767 | 0.78 | 386,885 | 0.72 | 474,312 | 0.75 |
| එල්ඕඑල්සී ලයිෆ් | 106,238 | 0.28 | 274,798 | 0.66 | 592,422 | 1.33 | 1,209,578 | 2.25 | 1,896,558 | 2.99 |
| එම්බීඑස්එල් | 192,780 | 0.51 | 251,720 | 0.60 | 294,299 | 0.66 | 203,235 | 0.38 | 235,533 | 0.37 |
| සණස | 203,616 | 0.54 | 283,975 | 0.68 | 260,867 | 0.58 | 311,434 | 0.58 | 367,649 | 0.58 |
| එස්එල්අයිසී | 7,369,031 | 19.66 | 8,397,718 | 20.15 | 8,121,159 | 18.21 | 10,470,079 | 19.50 | 11,893,640 | 18.73 |
| යුනියන් ලයිෆ් | 5,106,323 | 13.63 | 5,515,063 | 13.23 | 5,945,499 | 13.33 | 6,964,390 | 12.97 | 8,270,751 | 13.03 |
| **එකතුව** | 37,476,709 | 100 | 41,675,880 | 100 | 44,595,516 | 100 | 53,690,783 | 100 | 63,495,416 | 100 |
| **වර්ධන අනුපාතය** (%) | 6.58 | | 11.20 | | 7.01 | | 20.40 | | 18.26 | |

**රූප සටහන 7**

**2016 දෙසැම්බර් 31 දිනෙන් අවසන්වන වසර සඳහා සමාගම් වශයෙන් දළ ලිඛිත වාරිකයන්හි වෙළඳපොල පංගුව - දීර්ඝ කාලීන රක්ෂණ ව්‍යාපාරය**





හතරවැනි සහ පස්වැනි විශාලතම වෙළඳපොල කොටස අත්කරගෙන ඇත. 2016 දී යුනියන් ලයිෆ් සහ සොෆ්ට්ලෝජික් ලයිෆ් විසින් අත්කර ගත් වෙළඳපොල කොටස පිළිවෙලින් 13.03% ක් සහ 8.87% ක් ලෙස වාර්තා කර ඇත. සොෆ්ට්ලෝජික් ලයිෆ් වෙළඳපොල කොටස පසුගිය වසර පහ තුළ ක්‍රමයෙන් වර්ධනය වී ඇති අතර, එයට ප්‍රධාන වශයෙන් විවිධ පාරිභෝගික අවශ්‍යතාවන් සපුරාලීම සඳහා නව්‍යකරණ ජීවිත රක්ෂණ නිෂ්පාදන හඳුන්වාදීම හේතු විය.

## ඉහළම දළ ලිඛිත වාරික ආදායමක් ජනනය කළ ප්‍රමුඛතම සමාගම් පහ සහ අනිකුත් රක්ෂණකරුවන්ගේ වෙළඳපොල කොටස - දීර්ඝ කාලීන රක්ෂණ ව්‍යාපාරය

8 වැනි රූප සටහනේ දක්වා ඇති පරිදි, සෙලින්කෝ ලයිෆ්, එස්එල්අයිසී, ඒඅයිඒ ලයිෆ්, යුනියන් ලයිෆ් සහ සොෆ්ට්ලොජික් ලයිෆ් 2016 වසර තුළ දීර්ඝකාලීන රක්ෂණ ව්‍යාපාරය තුළ ප්‍රධාන වෙළඳපොල කොටස අත්කරගෙන ඇත. මෙම ප්‍රධාන දළ ලිඛිත වාරික උපයන්නන් පස්දෙනා විසින් සාමුහිකව 2016 වාර්තා කළ සමස්ත දීර්ඝකාලීන රක්ෂණ වාරික අරමුදලින් 80.21% ක් සඳහා දායකත්වය සපයා ඇති අතර එය 2015 දී වාර්තා කළ 80.86% ට බොහෝ දුරට සමාන වේ. දීර්ඝකාලීන රක්ෂණ ව්‍යාපාරය තුළ ඉතිරි රක්ෂණකරුවන් දසදෙනා දීර්ඝකාලීන රක්ෂණ ව්‍යාපාරයේ දළ ලිඛිත වාරිකවලින් 19.79% ක් (2015:19.14%) උත්පාදනය කර ඇත. දීර්ඝකාලීන රක්ෂණ වෙළඳපොලෙහි

**රූප සටහන 8**
**2012 සිට 2016 දක්වා වූ වසර සඳහා ප්‍රමුඛතම සමාගම් පහේ සහ අනෙක් රක්ෂකයන්ගේ වෙළඳපොළ කොටස - දීර්ඝ කාලීන රක්ෂණ ව්‍යාපාරය**




| | සෙලින්කෝ ලයිෆ් | එස්එල්අයිසී | ඒඅයිඒ ලයිෆ් | යුනියන් ලයිෆ් | සොෆ්ට්ලොජික් ලයිෆ් | වෙනත් |
|---|---|---|---|---|---|---|
| 2012 | 28.90 | 19.66 | 17.33 | 13.63 | 5.43 | 15.05 |
| 2013 | 26.69 | 20.15 | 16.47 | 13.23 | 6.05 | 17.41 |
| 2014 | 26.92 | 18.21 | 16.29 | 13.33 | 6.84 | 18.41 |
| 2015(ස) | 25.06 | 19.50 | 15.71 | 12.97 | 7.62 | 19.14 |
| 2016(අ) | 23.67 | 18.73 | 15.91 | 13.03 | 8.87 | 19.79 |

අනිකුත් රක්ෂණකරුවන්ගේ වෙළඳපොල කොටස 8 වන රූප සටහනේ දැක්වෙන පරිදි පසුගිය වසර පහ තුළ ක්‍රමයෙන් වැඩි වී ඇත.


## රක්ෂණ සමාගම් විසින් දැරීමට සිදු වූ හිමිකම්පෑම් - දීර්ඝ කාලීන රක්ෂණ ව්‍යාපාරය

දිගුකාලීන රක්ෂකයින් විසින් දරන ලද මුළු හිමිකම්පෑම් 2016 දී රුපියල් මිලියන 22,622 ක් වූ අතර, එය 2015 දී දරන ලද රුපියල් මිලියන 20,934 ට සාපේක්ෂව 8.06% ක වැඩිවීමකි. 9 වැනි රූප සටහනේ දැක්වෙන පරිදි, දරන ලද මුළු හිමිකම් පෑම් ඔප්පුහිමියන්ට ගෙවන ලද අකර්මන්‍යතා ප්‍රතිලාභ, මරණ ප්‍රතිලාභ, පවාරණ, කල්පිරීමේ ප්‍රතිලාභ සහ අනෙකුත් ප්‍රතිලාභවලින් සමන්විත වේ. 2016 දී දරන ලද මුළු හිමිකම්පෑම්වලින්, කල්පිරීමේ ප්‍රතිලාභ 56.20% ක් නියෝජනය කළ අතර, එය 2015 දී වාර්තා කළ 55.83% ට සාපේක්ෂව වැඩිවීමකි. 2016 දී දරන ලද පවාරණ ප්‍රතිලාභ රුපියල් මිලියන 5,296 ක් වූ අතර 2015 දී දරන ලද රුපියල් මිලියන 5,268 ට සාපේක්ෂව සුළු වැඩිවීමකි. 2016 දී දරන ලද අනෙකුත් ප්‍රතිලාභ, මරණ ප්‍රතිලාභ සහ අකර්මන්‍යතා ප්‍රතිලාභ පිළිවෙලින් රුපියල් මිලියන 2,473 ක්, රුපියල් මිලියන 1,550 ක් සහ රුපියල් මිලියන 591 ක් විය. මරණ ප්‍රතිලාභ 2015 වසරට සාපේක්ෂව පහත වැටී ඇති අතර, අනෙකුත් සියලුම වර්ගවල ප්‍රතිලාභ 2015 වසරට සාපේක්ෂව වැඩි වී ඇත.

## රක්ෂණ සමාගම් විසින් දැරීමට සිදු වූ හිමිකම්පෑම් සංඛ්‍යාව - දීර්ඝ කාලීන රක්ෂණ ව්‍යාපාරය

8 වගුවෙන් පෙන්නුම් කරන පරිදි, 2016 වසර තුළදී රක්ෂණ සමාගම් විසින් දරන ලද මුළු හිමිකම් සංඛ්‍යාව 316,424 කි (2015 : 296,640). මෙම මුළු හිමිකම්පෑම්වලින්, අනෙකුත් ප්‍රතිලාභ හිමිකම්පෑම් 129,241 ක්ද, කල්පිරීමේ ප්‍රතිලාභ හිමිකම්පෑම් 122,788 ක්ද, පවාරණ ප්‍රතිලාභ හිමිකම්පෑම් 46,484 ක්ද, අකර්මන්‍යතා ප්‍රතිලාභ 9,493 ක්ද, සහ මරණ ප්‍රතිලාභ හිමිකම්පෑම් 8,418 ක්ද විය. අවමංගල්‍ය වියදම්, බරපතල රෝග සහ ප්‍රවර්තන ප්‍රතිලාභ වැනි අනෙකුත් ප්‍රතිලාභ හිමිකම්පෑම් 2016 වසරේ මුළු හිමිකම්පෑම්වලින් 40.84% කට (2015 : 37.87%) දායක විය. කල්පිරීමේ ප්‍රතිලාභ හිමිකම්පෑම් 2016 වසරේ මුළු හිමිකම්පෑම්වලින් 38.80% කට (2015 : 40.68%) දායක විය. අනෙකුත් ප්‍රතිලාභ හිමිකම්පෑම් සහ කල්පිරීමේ හිමිකම්පෑම් එකතුව මුළු හිමිකම්පෑම්වලින් 79.65% කට දායක විය. 2016 දී 32.58% කින් පහත වැටුණු අකර්මන්‍යතා හිමිකම්පෑම් හැර 2016 දී සියලුම වර්ගයේ දිගුකාලීන රක්ෂණ හිමිකම්පෑම් වැඩිවී ඇති බව සැලකිය යුතුය.

**රූප සටහන 9**
**රක්ෂණ සමාගම් විසින් දරන ලද හිමිකම්පෑම් - දීර්ඝ කාලීන රක්ෂණ ව්‍යාපාරය**




| | 2012 | 2013 | 2014 | 2015 (ස) | 2016 (අ) |
|---|---|---|---|---|---|
| අකර්මන්‍යතා ප්‍රතිලාභ | 77,717 | 45,457 | 436,518 | 430,617 | 591,147 |
| මරණ | 789,166 | 1,358,337 | 1,889,289 | 1,640,801 | 1,549,791 |
| පවාරණ | 2,823,924 | 5,677,638 | 7,184,611 | 5,267,864 | 5,295,957 |
| කල්පිරීමේ ප්‍රතිලාභ | 7,860,715 | 9,839,833 | 9,754,751 | 11,687,811 | 12,712,720 |
| වෙනත් | 1,920,859 | 1,388,698 | 1,378,929 | 1,906,560 | 2,472,666 |

වගුව 8

රක්ෂණ හිමිකම්පෑම් සංඛ්‍යාව - දීර්ඝ කාලීන රක්ෂණ ව්‍යාපාරය

| | 2012 | 2013 | 2014 | 2015 | 2016 |
|---|---|---|---|---|---|
| අකර්මන්‍යතා ප්‍රතිලාභ | 578 | 6,980 | 8,120 | 14,081 | 9,493 |
| මරණ | 4,358 | 5,284 | 5,795 | 6,747 | 8,418 |
| පවාරණ | 24,631 | 41,964 | 46,312 | 42,814 | 46,484 |
| කල්පිරීමේ ප්‍රතිලාභ | 102,465 | 102,050 | 107,353 | 120,661 | 122,788 |
| වෙනත් ප්‍රතිලාභ | 51,773 | 99,257 | 84,835 | 112,337 | 129,241 |
| **එකතුව** | **183,805** | **255,535** | **252,415** | **296,640** | **316,424** |

## දීර්ඝ කාලීන රක්ෂණ ව්‍යාපාරයේ වත්කම්

දීර්ඝ කාලීන රක්ෂණ ව්‍යාපාරයේ මුළු වත්කම් ප්‍රමාණය 9 වගුවෙන් පෙන්නුම් කරන පරිදි 2015 දෙසැම්බර් 31 දිනට වාර්තා කළ රුපියල් මිලියන 312,713 ට සාපේක්ෂව 2016 දෙසැම්බර් 31 දිනට රුපියල් මිලියන 345,675 ක් විය. දීර්ඝ කාලීන රක්ෂණ ව්‍යාපාරයේ වත්කම් 2015 ට සාපේක්ෂව 2016 දී 10.54% කින් වර්ධනය වී ඇත.

2016 දෙසැම්බර් 31 දිනට දරන ලද මුළු වත්කම්වලින්, රුපියල් මිලියන 162,232 ක් (2015:රුපියල් මිලියන 137,144) රජයේ ණය සුරැකුම්පත්වල ආයෝජනය කර ඇත. මෙය දීර්ඝ කාලීන රක්ෂකයින්ගේ මුළු වත්කම් කළඹ තුල 46.93% ක් (2015:43.86%) වන අතර 2015 අවසානයට සාපේක්ෂව 2016 අවසානයට 18.29% කින් වැඩිවී ඇත. දිගුකාලීන රක්ෂකයින් විසින් පනත යටතේ අවශ්‍ය කරන පරිදි දිගුකාලීන රක්ෂණ අරමුදල් ආයෝජනවලින් අවම වශයෙන් 30% ක් වන අවම ව්‍යවස්ථාපිත ආයෝජනය කිරීමේ අවශ්‍යතාවයට අනුකූලව රජයේ සුරැකුම්පත්වල ආයෝජනය කර ඇත. එමෙන්ම මණ්ඩලය විසින් නිකුත් කළ නීර්ණය කිරීමේ අංක 1 ට අනුකූලව, රක්ෂකයින් විසින් දිගුකාලීන රක්ෂණ අරමුදලේ ඉතිරි වත්කම් ආයෝජනය කිරීම අවශ්‍ය කෙරේ.

සංස්ථා ණය, ස්කන්ධ සහ තැන්පතුවල ආයෝජන දිගුකාලීන රක්ෂකයින්ගේ අනෙකුත් ප්‍රධාන වත්කම් වර්ග නියෝජනය කළ අතර, 2016 දෙසැම්බර් 31 දිනට මුළු වත්කම්වලින් පිළිවෙලින් 20.65% ක්, 12.45% ක් සහ 8.17% ක් නියෝජනය කරන ලදී. 2016 දෙසැම්බර් 31 දිනට සංස්ථා ණය රුපියල් මිලියන 71,375 දක්වා වන 36.51% ක වර්ධනයක් 2015 දෙසැම්බර් 31 දින සිට වාර්තා කර ඇත. 2015 දෙසැම්බර් 31 දිනට වාර්තා කළ සංස්ථා ණය ප්‍රමාණය රුපියල් මිලියන 52,284 ක් වේ.

වගුව 9


2015 සහ 2016 දෙසැම්බර් 31 දිනට වත්කම් සංකේන්ද්‍රගතවීම - දීර්ඝ කාලීන රක්ෂණ ව්‍යාපාරය

| වත්කම් වර්ගය | 2015 (අ) | | 2016 (ආ) | |
|---|---|---|---|---|
| | රු.'000 | % | රු.'000 | % |
| රාජ්‍ය ණය සුරැකුම්පත් | 137,144,420 | 43.86 | 162,232,470 | 46.93 |
| ස්කන්ධ | 47,794,233 | 15.28 | 43,034,584 | 12.45 |
| සංස්ථා ණය | 52,284,234 | 16.72 | 71,374,515 | 20.65 |
| ඉඩම් හා ගොඩනැගිලි | 7,595,272 | 2.43 | 9,825,371 | 2.84 |
| තැන්පතු | 39,231,457 | 12.55 | 28,243,650 | 8.17 |
| ඒකක භාර | 2,393,458 | 0.77 | 1,939,392 | 0.56 |
| රක්ෂණ ඔප්පු මත ණය | 5,349,620 | 1.71 | 5,878,223 | 1.70 |
| වෙනත් වත්කම් | 18,377,218 | 5.87 | 20,681,724 | 5.99 |
| මුදල් හා මුදල් සමාන දෑ | 2,543,353 | 0.81 | 2,465,505 | 0.71 |
| **එකතුව** | **312,713,263** | **100** | **345,675,434** | **100** |

රක්ෂණ පරිපාලිතයන්හී සිදුකළ රුපියල් මිලියන 6.8ක් වූ ආයෝජනද ස්කන්ධ ආයෝජනයට ඇතුළත් කර ඇත.

රූප සටහන 10

2015 සහ 2016 දෙසැම්බර් 31 දිනට වත්කම් සංකේන්ද්‍රගතවීම - දීර්ඝ කාලීන රක්ෂණ ව්‍යාපාරය



කොටස් වෙළෙඳපොළෙහි සාපේක්ෂව දුර්වල කාර්යසාධනය පිළිබිඹු කරමින් 2015 දෙසැම්බර් 31 දිනට රුපියල් මිලියන 47,794 ක් වූ ස්කන්ධවල ආයෝජනයට වඩා 9.96% ක අඩුවීමක් වාර්තා කරමින් 2016 දෙසැම්බර් 31 දිනට ස්කන්ධවල ආයෝජන රුපියල් මිලියන 43,034 ක් විය. 2016 දෙසැම්බර් 31 දිනට තැන්පතු වල වටිනාකම රුපියල් මිලියන 28,244 ක් වූ අතර 2015 දෙසැම්බර් 31 දිනට වාර්තා කළ රුපියල් මිලියන 39,231 ක් වටිනා තැන්පතුවලට සාපේක්ෂව 28.01% ක සැලකිය යුතු පහත වැටීමක් වාර්තා කරන ලදී.

රජයේ සුරැකුම්පත්, සංස්ථා ණය, ස්කන්ධ සහ තැන්පතුවල වැනි ප්‍රධාන ආයෝජන වර්ග දිගුකාලීන රක්ෂණ ව්‍යාපාරයේ මුළු වත්කම්වලින් 88.2% ක් (2015:88.41%) සඳහා සාමුහිකව දායක වී ඇති අතර ඉතිරි 11.8% (2015:11.59%) සඳහා ඉඩම් සහ ගොඩනැගිලි, අනෙකුත් වත්කම්, රක්ෂණ ඔප්පු මත ණය යනාදිය දායක වී ඇත.

## දීර්ඝ කාලීන රක්ෂණ ව්‍යාපාරයේ ආයෝජන ආදායම

10 වගුවෙන් පෙන්නුම් කරන පරිදි, දිගුකාලීන රක්ෂණ ව්‍යාපාරයේ ආයෝජනවලින් උපයන ලද මුළු ආදායම 2016 වසරේදී රුපියල් මිලියන 27,652 ක් (2015 : රුපියල් මිලියන 23,370) වූ අතර 2015 වසරට වඩා 18.32% ක වර්ධනය පෙන්නුම් කරන ලදී. දිගුකාලීන රක්ෂණ ව්‍යාපාරයේ සාමාන්‍ය ආයෝජනය 17.98% ක වැඩිවීමක් වාර්තා කරමින් 2016 වසර තුළ සාමාන්‍ය ආයෝජන රුපියල් මිලියන 287,291ක් (2015 : රුපියල් මිලියන 243,507)ක් විය. දිගුකාලීන රක්ෂකයින්ගේ සාමාන්‍ය ආයෝජන ඵලදාව 2015 දී උපයන ලද 9.60% ට සාපේක්ෂව සම මට්ටමක පවතිමින් 9.63% ක අගයක් වාර්තා විය.

ආයෝජනවලින් විශාල කොටස නියෝජනය කරන රජයේ ණය සුරැකුම්පත්වල ආයෝජනය 2016 දී 11.67% ක (2015:10.71%) ආයෝජන ඵලදාවක් උපයාගෙන ඇති අතර, 2015 ට සාපේක්ෂව සුළු වැඩිවීමක් වාර්තා කරන ලදී. ස්කන්ධවලින් උපයන ලද ආයෝජන ආදායම 94.14% ක ප්‍රබල පහළ වැටීමක් වාර්තා කරමින් 2016 දී රුපියල් මිලියන 66 ක (2015:රුපියල් මිලියන 1,126) අගයක් පෙන්නුම් කර ඇත. කොටස් හුවමාරුවේ දුර්වල කාර්යසාධනය පිළිබිඹු කරමින් ඉහත පහළ යාමට ප්‍රධාන හේතුව ලෙස සමාගම් විසින් ලැබූ ප්‍රාග්ධන අලාභ වූ රුපියල් මිලියන 1,003 දැක්විය හැක. දිගුකාලීන රක්ෂකයින්ගේ ලාභාංශ ආදායම 2016 දී රුපියල් මිලියන 1,070ක් වූ අතර 2015 දී වාර්තා කළ

**වගුව 10**

**සවිස්තරාත්මක සාමාන්‍ය ආයෝජනය සහ ආයෝජන ආදායම - දීර්ඝ කාලීන රක්ෂණ ව්‍යාපාරය**

| වර්ගීකරණය | 2015 (a) | | | 2016 (b) | | |
|---|---|---|---|---|---|---|
| | ආයෝජන ආදායම (රු. '000) | සාමාන්‍ය ආයෝජනය (රු. '000) | ආයෝජන ඵලදා අනුපාතිකය (%) | ආයෝජන ආදායම (රු. '000) | සාමාන්‍ය ආයෝජනය (රු. '000) | ආයෝජන ඵලදා අනුපාතිකය (%) |
| **රජයේ ණය සුරැකුම්පත්** | 13,290,740 | 124,148,732 | 10.71 | 17,465,206 | 149,688,445 | 11.67 |
| - භාණ්ඩාගාර බැඳුම්කර | 11,970,779 | | | 15,977,679 | | |
| - භාණ්ඩාගාර බිල්පත් | 87,053 | | | 113,045 | | |
| - වෙනත් (රිපෝ) | 1,232,908 | | | 1,374,481 | | |
| **ස්කන්ධ** | 1,126,509 | 19,404,953 | 5.81 | 66,180 | 25,397,883 | 0.26 |
| - ප්‍රාග්ධන ලාභ/ පාඩු | (229,010) | | | (1,003,896) | | |
| - ලාභාංශ | 1,355,519 | | | 1,070,076 | | |
| **සංස්ථා ණය** | 4,983,436 | 46,513,842 | 10.71 | 6,712,215 | 61,829,374 | 10.86 |
| - ණයකර | 4,981,814 | | | 6,663,836 | | |
| - වාණිජමය පත්‍රිකා සහ වෙනත් | 1,622 | | | 48,379 | | |
| **ඉඩම් හා ගොඩනැගිලි** | 59,670 | 6,752,377 | 0.88 | 72,101 | 8,710,321 | 0.83 |
| **තැන්පතු** | 3,692,445 | 38,352,681 | 9.63 | 3,076,907 | 33,737,553 | 9.12 |
| - බැංකු | 3,434,582 | | | 2,852,632 | | |
| - මූල්‍ය ආයතන | 257,863 | | | 224,276 | | |
| **ඒකක භාර** | 115,364 | 2,307,124 | 5.00 | 88,530 | 2,166,425 | 4.09 |
| **ජීවිත රක්ෂණ ඔප්පු මත ණය** | 104,908 | 5,484,510 | 1.91 | 174,662 | 5,569,566 | 3.14 |
| **වෙනත්** | (3,432) | 542,365 | (0.63) | (3,970) | 191,702 | (2.07) |
| **එකතුව** | **23,369,639** | **243,506,586** | **9.60** | **27,651,831** | **287,291,269** | **9.63** |

රුපියල් මිලියන 1,355 ට සාපේක්ෂව 21.03% ක පහල වැටීමක් වාර්තා කරන ලදී.


2016 දී (රුපියල් මිලියන 61,829 ක (2015:රුපියල් මිලියන 46,514) සාමාන්‍ය සංස්ථා ණය ආයෝජන වෙනුවෙන් රුපියල් මිලියන 6,712 ක (2015: රුපියල් මිලියන 4,983) ආයෝජන ආදායමක් උපයනු ලැබූ අතර, එහි ආයෝජන ඵලදා අනුපාතිකය 10.86% ක් (2015:10.71%) විය.

තැන්පතු, 2015 දී උපයන ලද 9.36% ට සාපේක්ෂව 2016 දී 9.12% ක ආයෝජන ඵලදා අනුපාතයක් උපයනු ලැබූ අතර, ඉන් 2015 දී පොළී ආදායම තුළ උපයන ලද රුපියල් මිලියන 3,692 සිට 2016 දී රුපියල් මිලියන 3,077 දක්වා පහළ වැටීමක් පෙන්නුම් කරයි. ඒකක භාර සහ ඔප්පු මත ණය පිළිවෙලින් 4.09% ක (2015:5.00%) සහ 3.14% ක (2015:1.91%) ආයෝජන ඵලදා අනුපාත සහිතව 2016 දී සාපේක්ෂව අඩු ආයෝජන ආදායම් උපයන ලදී.

## නිකුත් කරන ලද ජීවිත රක්ෂණ ඔප්පු සංඛ්‍යාව හා බලපවත්නා ජීවිත රක්ෂණ ඔප්පු සංඛ්‍යාව - දීර්ඝ කාලීන රක්ෂණ ව්‍යාපාරය

2016 වසර තුළ, දිගුකාලීන රක්ෂකයින් විසින් නව ජීවිත රක්ෂණ ඔප්පු 662,701 ක් නිකුත් කරන ලැබූ අතර, එය 2015 දී නිකුත් කළ 740,511 ක් වූ නව ඔප්පුවලට සාපේක්ෂව 10.51% ක පහත වැටීමකි. ඒ අනුව 2016 වසර අවසාන වන විටදී බලාත්මකව පැවති මුළු ජීවිත රක්ෂණ ඔප්පු ප්‍රමාණය 2,895,542 (2015:2,889,763) කි. 11 රූප සටහනේ දැක්වෙන පරිදි, බලාත්මකව පැවති මුළු ජීවිත රක්ෂණ ඔප්පු ප්‍රමාණය පසුගිය වසර පහ තුළ ක්‍රමානුකූලව වැඩිවී ඇති අතර, දිගුකාලීන රක්ෂණ ව්‍යාපාරය රට තුළ ව්‍යාප්තියෙහි ප්‍රතිශතය පෙන්නුම් කෙරේ. 13.8% ක් වූ මුළු ජනගහනයේ ප්‍රතිශතයක් ලෙස වූ ජීවිත රක්ෂණ සංඛ්‍යාව, 2016 වන විට සුළු පහළ බැසීමක් පෙන්නුම් කර ඇත. එය 2016 වන විට 13.7% ක් විය. එමෙන්ම, ශ්‍රම බලකායේ ප්‍රතිශතයක්

**රූප සටහන 11**
**නිකුත් කරන ලද ජීවිත රක්ෂණ ඔප්පු සංඛ්‍යාව හා බලපවත්නා ජීවිත රක්ෂණ ඔප්පු සංඛ්‍යාව - දීර්ඝ කාලීන රක්ෂණ ව්‍යාපාරය**




| | 2012 | 2013 | 2014 | 2015 (a) | 2016 (b) |
|---|---|---|---|---|---|
| නිකුත් කරන ලද නව ජීවිත රක්ෂණ ඔප්පු සංඛ්‍යාව | 514,516 | 546,292 | 545,303 | 740,511 | 662,701 |
| බලපවත්නා ජීවිත රක්ෂණ ඔප්පු සංඛ්‍යාව | 2,438,340 | 2,477,695 | 2,604,667 | 2,889,763 | 2,895,542 |
| බලපවත්නා ජීවිත රක්ෂණ ඔප්පු සංඛ්‍යාව මුළු ජනගහනයෙහි ප්‍රතිශතයක් ලෙස* | 11.9 | 12.0 | 12.5 | 13.8 | 13.7 |
| බලපවත්නා ජීවිත රක්ෂණ ඔප්පු සංඛ්‍යාව මුළු ශ්‍රම බලකායෙහි ප්‍රතිශතයක් ලෙස* | 28.8 | 28.1 | 29.6 | 33.6 | 36.2 |


*මූලාශ්‍රය - වසර මැද ශ්‍රම බලකාය සහ ජනගහනය - ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව

ලෙස ජීවිත රක්ෂණ ඔප්පුවල සංඛ්‍යාව 2015 දී වාර්තා කළ 33.6% සිට 2016 දී 36.2% දක්වා වැඩිවී ඇත. මෙම සංඛ්‍යා ලේඛනවලින් රටතුළ ජීවිත රක්ෂණ අවබෝධය පිළිබඳ අවම මට්ටම සහ ජීවිත රක්ෂකයින්ට රටතුළ ජීවිත රක්ෂණ ව්‍යාපාරය තවදුරටත් සංවර්ධනය කරන ව්‍යාපෘති කිරීමට ඇති හැකියාව පෙන්නුම් කරයි. .

## රක්ෂණ ඔප්පු අවලංගුවීම් - දීර්ඝ කාලීන රක්ෂණ ව්‍යාපාරය

2016 වසර තුළ, 2015 වසරේදී වාර්තා කළ අවලංගු වූ නව ජීවිත රක්ෂණ ඔප්පු 93,008 ට සාපේක්ෂව 3.76% ක වැඩිවීමක් වාර්තා කරමින් නව ජීවිත රක්ෂණ ඔප්පු 96,502 ක් අවලංගු වී තිබුණි. එමෙන්ම, 2015 දී වාර්තා කළ අවලංගුවීම් 364,567 ට සාපේක්ෂව

**රූප සටහන 12**
**2012 සිට 2016 දක්වා අවලංගු වූ රක්ෂණ ඔප්පු සංඛ්‍යාව සහ රක්ෂණ ඔප්පු අවලංගු වීමේ අනුපාතය - දීර්ඝ කාලීන රක්ෂණ ව්‍යාපාරය**




| | 2012 | 2013 | 2014 | 2015 (a) | 2016 (b) |
|---|---|---|---|---|---|
| අවලංගු වූ නව රක්ෂණ ඔප්පු | 94,936 | 107,906 | 103,500 | 93,008 | 96,502 |
| අවලංගු වූ මුළු රක්ෂණ ඔප්පු | 332,707 | 366,506 | 362,664 | 364,567 | 403,423 |
| අවලංගු වූ නව රක්ෂණ ඔප්පු ප්‍රමාණය නිකුත් කරන ලද නව රක්ෂණ ඔප්පු ප්‍රමාණයේ ප්‍රතිශතයක් ලෙස | 18.45 | 19.75 | 18.98 | 12.56 | 14.56 |
| අවලංගු වූ මුළු රක්ෂණ ඔප්පු ප්‍රමාණය බලපවත්නා මුළු රක්ෂණ ඔප්පු ප්‍රමාණයේ ප්‍රතිශතයක් ලෙස | 13.64 | 14.79 | 13.92 | 12.62 | 13.93 |

10.66% කින් වර්ධනය වෙමින් අවලංගු වූ මුළු ඔප්පු සංඛ්‍යාව 403,423 ක් විය. 12 රූප සටහනේ දැක්වෙන පරිදි, 2016 දී නිකුත් කළ නව රක්ෂණ ඔප්පුවල ප්‍රතිශතයක් ලෙස අවලංගු වූ නව රක්ෂණ ඔප්පු සංඛ්‍යාව 2015 දී වාර්තා කළ 12.56% ට සාපේක්ෂව වැඩිවීමක් වාර්තා කරමින් එම අගය 14.56% ක් විය. බලාත්මකව පවතින මුළු ඔප්පු සංඛ්‍යාවේ ප්‍රතිශතයක් ලෙස මුළු රක්ෂණ ඔප්පු අවලංගුවීම් 2015 දී වාර්තා කළ 12.62% ට සාපේක්ෂව 2016 දී 13.93% ක් විය.

## රක්ෂණ සමාගම්වල නුබුන්වත්භාවය - දීර්ඝ කාලීන රක්ෂණ ව්‍යාපාරය

2015 ණය ගෙවීමේ හැකියාවේ සීමා (අවදානම් පදනම් ප්‍රාග්ධනය) රීති 2016 ජනවාරි 01 දින සිට බලාත්මක විය. අවදානම් පදනම් ප්‍රාග්ධන නියමයන් යටතේ, රක්ෂකයින් විසින් අවම වශයෙන් රුපියල් මිලියන 500ක පූර්ණ පවත්නා ප්‍රාග්ධනයක් සහ 120% ක ප්‍රමාණවත් ප්‍රාග්ධන අනුපාතයක් පවත්වාගැනීම අනිවාර්ය වේ. 11 වගුවෙන් 2016 දෙසැම්බර් 31 දිනට දිගු කාලීන රක්ෂණ සමාගම්වල ප්‍රමාණවත් ප්‍රාග්ධන අවශ්‍යතා පිළිබිඹු කරන අතර පූර්ණ පවත්නා ප්‍රාග්ධනය (TAC), නියමිත අවදානම් ප්‍රාග්ධනය (RCR), පවාරණ වටිනාකම් ප්‍රාග්ධන ගාස්තුව (SVCC) සහ ප්‍රමාණවත් ප්‍රාග්ධන අනුපාතය (CAR) පැහැදිලි කරයි.

එච්බීඑස්එල් හැර සියලුම දිගුකාලීන රක්ෂකයින් 2016 දෙසැම්බර් 31 දිනට රුපියල් මිලියන 500ක අවම අවශ්‍යතාවයට වඩා පූර්ණ පවත්නා ප්‍රාග්ධනයක් පවත්වා ගෙන ඇත. එමනිසා, එච්බීඑස්එල් රක්ෂණ සමාගම 2016 දෙසැම්බර් 31 දිනට පූර්ණ පවත්නා ප්‍රාග්ධන අවශ්‍යතාවට අනුකූල වී නොමැති අතර, මණ්ඩලය විසින් නිකුත් කළ බලාත්මක ක්‍රමෝපාය පරිදි අවශ්‍ය පියවර ගෙන ඇත. සියලුම රක්ෂණ සමාගම් 2016 දෙසැම්බර් 31 දිනට 120% ක අවම ප්‍රමාණවත් ප්‍රාග්ධන අනුපාත අවශ්‍යතාව පවත්වාගෙන ඇති අතර එච්බීඑස්එල් හැර සියලුම සමාගම්

**වගුව 11**

**2016 දෙසැම්බර් 31 දිනට සමාගම් අනුව නුබුන්වත්භාවය පිළිබඳ විශ්ලේෂණය - දීර්ඝ කාලින රක්ෂණ ව්‍යාපාරය**

| රක්ෂකයා | 2016 දෙසැම්බර් 31 දිනට (අ) | | | |
|---|---|---|---|---|
| | පූර්ණ පවත්නා ප්‍රාග්ධනය (රු.'000) | නියමිත අවදානම් ප්‍රාග්ධනය (රු.'000) | පවාරණ වටිනාකමේ ප්‍රාග්ධන ගාස්තුව (රු.'000) | ප්‍රමාණවත් ප්‍රාග්ධන අනුපාතය (%) |
| ඒඅයිඒ ලයිෆ් | 21,107,662 | 3,755,882 | 5,853,682 | 361 |
| අලියාන්ස් ලයිෆ් | 904,050 | 299,909 | 110,061 | 301 |
| අමානා ලයිෆ් | 558,175 | 295,943 | - | 189 |
| ආර්පිකෝ | 1,232,234 | 211,019 | 63,453 | 584 |
| සොෆ්ට්ලොජික් ලයිෆ් | 8,570,469 | 2,761,510 | 4,386,958 | 195 |
| සෙලින්කෝ ලයිෆ් | 43,094,498 | 12,847,731 | - | 335 |
| කෝප්ලයිෆ් | 710,201 | 358,399 | - | 198 |
| එච්එන්බී ලයිෆ් | 5,274,682 | 1,058,500 | 1,185,311 | 445 |
| ජනශක්ති ලයිෆ් | 4,128,936 | 1,540,195 | - | 268 |
| එල්අයිසී | 664,289 | 201,984 | 44,722 | 329 |
| එල්ඕඑල්සී ලයිෆ් | 887,316 | 392,696 | - | 226 |
| එම්බීඑස්එල් | 105,905 | 73,229 | - | 145 |
| සණස | 962,477 | 175,114 | 481,480 | 200 |
| එස්එල්අයිසී | 76,297,822 | 18,502,136 | 4,591,874 | 412 |
| යුනියන් ලයිෆ් | 14,346,884 | 3,492,978 | - | 411 |
| එකතුව/ මුළු එකතුව | **178,845,599** | **45,967,226** | **16,717,540** | **307** |

160% ඉක්මවමින් ප්‍රමාණවත් ප්‍රාග්ධන අනුපාතයක් වාර්තා කර ඇත. දිගුකාලීන රක්ෂකයින්ගේ සාමාන්‍ය ප්‍රමාණවත් ප්‍රාග්ධන අනුපාතය 2016 දෙසැම්බර් 31 දිනට 307% දක්වා වැඩි වී ඇත.

## රක්ෂණ සමාගම්වල ලබාගතහැකි පූර්ණ පවත්නා ප්‍රාග්ධන අවශ්‍යතාව - දීර්ඝ කාලීන රක්ෂණ ව්‍යාපාරය

12 වගුවෙන් 2016 දෙසැම්බර් 31 දිනට දිගුකාලීන රක්ෂකයින්ට අයත් වන්නා වූ පූර්ණ පවත්නා ප්‍රාග්ධනයේ සංයුතිය විස්තර කරයි. 2015 ණය ගෙවීමේ හැකියාවේ සීමා (අවදානම පදනම් ප්‍රාග්ධනය) රීති යටතේ, පූර්ණ පවත්නා ප්‍රාග්ධනය ගණනය කරනු ලබන්නේ පළමු පෙළ ප්‍රාග්ධනය හා දෙවන පෙළ ප්‍රාග්ධනය, එකතු කරමින් අඩුකිරීම් ලෙස විශේෂයෙන් දක්වා ඇති අයිතම අඩුකිරීමෙනි. නියමය පරිදි, දෙවන පෙළ ප්‍රාග්ධනය, පළමු පෙළ ප්‍රාග්ධනයෙන් 50% ඉක්මවිය නොහැක. දිගුකාලීන රක්ෂණ සමාගම්වල පූර්ණ පවත්නා ප්‍රාග්ධනය සමස්තයක් වශයෙන් රුපියල් මිලියන 178,846 වී ඇති අතර, එය රුපියල් මිලියන 197,663 ක් වූ පළමු පෙළ ප්‍රාග්ධනය, රුපියල් මිලියන 2,129 ක් වූ දෙවන පෙළ ප්‍රාග්ධනය සහ රුපියල් මිලියන 20,946 ක් වූ අඩුකිරීම් වලින් සමන්විත වේ.

පළමු පෙළ ප්‍රාග්ධනය නිකුත්කළ සහ සම්පූර්ණයෙන් ගෙවන ලද සාමාන්‍ය කොටස් හා කොටස් අධිමිල, ප්‍රාග්ධන සංචිත, ගෙවූ සමුච්චිත නොවූ නිදහස්කළ නොහැකි වරණීය කොටස් යනාදියෙන් සමන්විත වන අතර, දෙවන පෙළ ප්‍රාග්ධනය සමුච්චිත නිදහස් කළ නොහැකි වරණීය කොටස් සහ නිදහස් කළ හැකි වරණීය කොටස් යනාදියෙන් සමන්විත වේ. ණය ගෙවීමේ හැකියාවේ සීමා (අවදානම පදනම් ප්‍රාග්ධනය) රීති යටතේ, විශේෂයෙන් දක්වා ඇති අඩුකිරීම් සඳහා නිදසුන් කිහිපයක් ලෙස කීර්තිනාමය, නොපිළිගතහැකි ඉඩම් සහ ගොඩනැගිලි, අනෙකුත් නිශ්චල දේපල, පිරියත සහ උපකරණ, ලැබිය යුතු බදු යනාදිය දැක්විය හැකිය.

## රක්ෂණ සමාගම්වලට නියමිත අවදානම් ප්‍රාග්ධනය (RCR) පිළිබඳ සැසැඳීම් - දීර්ඝ කාලීන රක්ෂණ ව්‍යාපාරය

13 වගුවෙන්, 2016 දෙසැම්බර් 31 දිනට සමාගම් අනුව නියමිත අවදානම් ප්‍රාග්ධනය පිළිබඳ විශ්ලේෂණය පෙන්නුම් කරන අතර, 2015 ණය ගෙවීමේ හැකියාවේ සීමා අවදනම් පදනම් ප්‍රාග්ධන රීති යටතේ ගණනය කළ ප්‍රධාන අවදානම් වර්ගීකරණයන්ගෙන් එය සමන්විත වේ. වෙළඳපොල අවදානම, වගකීම් අවදානම සහ සම්බන්ධතා අවදානම දිගුකාලීන රක්ෂකයින්ගේ ප්‍රධාන අවදානම් වර්ගීකරණයන්ව පැවතුණි. දිගුකාලීන රක්ෂකයින්ගේ මුළු වෙළඳපොල අවදානම රුපියල් මිලියන 36,078 ක් ව පැවති අතර, වගකීම් අවදානම සහ සම්බන්ධතා අවදානම පිළිවෙලින් රුපියල් මිලියන 12,999 ක් සහ රුපියල් මිලියන 4,388 ක් ව පැවතුණි. විවිධාංගීකරණයෙන් පසු, වෙළඳපොල අවදානම මුළු අවදානම් ප්‍රාග්ධන අයකිරීම් වලින් 78.49% ක් සඳහා දායක වූ අතර, එයට පසුව වගකීම් අවදානම සහ සම්බන්ධතා අවදානම මුළු අවදානම් ප්‍රාග්ධන අයකිරීම් වලින් පිළිවෙලින් 26.76% ක් සහ 9.55% කින් දායක වී ඇත. මෙහෙයුම් අවදානම් ප්‍රාග්ධන අයකිරීම් සහ ණය අවදානම් ප්‍රාග්ධන අයකිරීම් මුළු අවදානම් අයකිරීම් වලින් පිළිවෙලින් 7.40% ක් සහ 6.64% ක් නියෝජනය කරන ලදී. ප්‍රතිරක්ෂණ අවදානම් මුළු අවදානම් අයකිරීම් වලින් 0.04%ක් නියෝජනය කළේය.

**වගුව 12**
**2016 දෙසැම්බර් 31 දිනට සමාගම් අනුව පූර්ණ පවත්නා ප්‍රාග්ධනය පිළිබඳ විශ්ලේෂණය - දීර්ඝ කාලීන රක්ෂණ ව්‍යාපාරය**

| රක්ෂකයා | 2016 දෙසැම්බර් 31 දිනට (ආ) | | | |
|---|---|---|---|---|
| | පළමු පෙළ ප්‍රාග්ධනය (රු.000) | දෙවන පෙළ ප්‍රාග්ධනය (රු.000) | අඩු කිරීම් (රු.000) | පූර්ණ පවත්නා ප්‍රාග්ධනය (රු.000) |
| ඒඅයිඒ ලයිෆ් | 22,311,313 | 706,096 | 1,909,747 | 21,107,662 |
| අලියාන්ස් ලයිෆ් | 1,016,314 | - | 112,264 | 904,050 |
| අමානා ලයිෆ් | 599,272 | 2,169 | 43,266 | 558,175 |
| ආර්පිකෝ | 1,315,661 | - | 83,426 | 1,232,234 |
| සොෆ්ට්ලොජික් ලයිෆ් | 9,382,070 | 24,903 | 836,504 | 8,570,469 |
| සෙලින්කෝ ලයිෆ් | 49,142,742 | 164,078 | 6,212,323 | 43,094,498 |
| කෝප්ලයිෆ් | 819,473 | 28,298 | 137,570 | 710,201 |
| එච්එන්බී ලයිෆ් | 7,182,455 | - | 1,907,773 | 5,274,682 |
| ජනශක්ති ලයිෆ් | 11,151,926 | - | 7,022,990 | 4,128,936 |
| එල්අයිසී | 771,618 | - | 107,329 | 664,289 |
| එල්ඕඑල්සී ලයිෆ් | 1,038,669 | - | 151,353 | 887,316 |
| එම්බීඑස්එල් | 119,013 | - | 13,108 | 105,905 |
| සණස | 1,148,629 | 1,221 | 187,373 | 962,477 |
| එස්එල්අයිසී | 76,829,505 | 47,562 | 579,245 | 76,297,822 |
| යුනියන් ලයිෆ් | 14,834,023 | 1,154,364 | 1,641,503 | 14,346,884 |
| **එකතුව** | **197,662,681** | **2,128,692** | **20,945,774** | **178,845,599** |

**වගුව 13**
**2016 දෙසැම්බර් 31 දිනට සමාගම් අනුව නියමිත අවදානම් ප්‍රාග්ධනය පිළිබඳ විශ්ලේෂණය - දීර්ඝ කාලීන රක්ෂණ ව්‍යාපාරය**

| රක්ෂකයා | 2016 දෙසැම්බර් 31 දිනට (ආ) | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|
| | ණය අවදානම (රු.'000) | සම්බන්ධතා අවදානම (රු.'000) | වෙළෙඳපොල අවදානම (රු.'000) | ප්‍රතිරක්ෂණ අවදානම (රු.'000) | වගකීම් අවදානම (රු.'000) | මෙහෙයුම් අවදානම (රු.'000) | විවිධාංගීකරණයට පෙර මුළු අවදානම් ප්‍රාග්ධන අයකිරීම (රු.'000) | විවිධාංගීකරණයට පසු මුළු අවදානම් ප්‍රාග්ධන අයකිරීම (රු.'000) |
| ඒඅයිඒ ලයිෆ් | 522,912 | 767,887 | 2,030,977 | - | 1,690,531 | 463,209 | 5,475,515 | 3,755,882 |
| අලියානස් ලයිෆ් | 2,383 | 26,590 | 237,185 | 151 | 135,930 | 23,405 | 425,645 | 299,909 |
| අමානා ලයිෆ් | 27,764 | 196,859 | 65,729 | 966 | 44,432 | 27,250 | 363,000 | 295,943 |
| ආර්පිකෝ | 18,054 | 122,189 | 69,027 | 108 | 21,027 | 15,737 | 246,142 | 211,019 |
| සොෆ්ට්ලොජික් ලයිෆ් | 65,587 | 298,230 | 1,846,349 | - | 1,652,722 | 98,046 | 3,960,933 | 2,761,510 |
| සෙලින්කෝ ලයිෆ් | 888,650 | 504,103 | 11,231,956 | 10,420 | 2,129,986 | 938,552 | 15,703,667 | 12,847,731 |
| කෝප්ලයිෆ් | 26,005 | 27,078 | 281,091 | - | 129,581 | 17,905 | 481,660 | 358,865 |
| එච්එන්බී ලයිෆ් | 124,489 | 279,699 | 410,127 | 974 | 664,619 | 118,356 | 1,598,264 | 1,058,500 |
| ජනශක්ති ලයිෆ් | 252,149 | 391,641 | 807,429 | 332 | 480,274 | 185,849 | 2,117,673 | 1,540,195 |
| එල්අයිසී | 17,884 | 31,769 | 143,027 | 86 | 56,344 | 21,541 | 270,651 | 201,984 |
| එල්ඕඑල්සී ලයිෆ් | 1,072 | 1,490 | 305,867 | 3,349 | 237,107 | 28,020 | 576,905 | 392,696 |
| එම්බීඑස්එල් | 4,306 | 16,065 | 13,324 | - | 64,742 | 5,966 | 104,403 | 73,229 |
| සණස | 33,918 | 6,138 | 132,674 | 931 | 12,410 | 18,792 | 204,862 | 175,114 |
| එස්එල්අයිසී | 881,248 | 1,435,350 | 15,814,201 | - | 3,523,200 | 1,090,956 | 22,744,956 | 18,502,136 |
| යුනියන් ලයිෆ් | 184,021 | 282,811 | 2,688,718 | 357 | 1,456,248 | 347,117 | 4,959,272 | 3,492,978 |
| **එකතුව** | **3,050,441** | **4,387,899** | **36,077,682** | **17,673** | **12,299,153** | **3,400,699** | **59,233,546** | **45,967,692** |

# සාමාන්‍ය රක්ෂණ ව්‍යාපාරය

## දළ ලිඛිත වාරික ආදායම

2016 දී, සාමාන්‍ය රක්ෂණ වෙළඳපොල තුළ ශක්තිමත්ව තරඟ කරන සක්‍රීය රක්ෂණ සමාගම් දහහතක් තිබුණි. මෙම වසර ඉදිකිරීම් ක්ෂේත්‍රයේ වර්ධනය, මොටර්රථ සඳහා වඩා ඉහළ තීරුබදු පැනවීම, ජනවිකාශ විතැන්වීම, අහිතකර කාලගුණික තත්ත්වයන්, සහ ජංගම ආකාරයෙන් ලබාදෙන රක්ෂණය යනාදිය හේතු කොට ගෙන සාමාන්‍ය රක්ෂකයින් සඳහා අවස්ථා, ප්‍රවනතා සහ අභියෝගවලින් පිරුණු වසරක් වූ අතර, එය ඔවුන්ගේ ප්‍රතිරක්ෂණ වැඩසටහන් පරීක්ෂා කිරීමට ලක් කෙරිණ. සාමාන්‍ය රක්ෂණ වෙළඳපොල අතර තරඟය සාමාන්‍ය රක්ෂණ සමාගම් අතර සිදුවූ අත්පත් කර ගැනීම් සහ ඒකාබද්ධ කිරීම් තුළින් තවදුරටත් වැඩි කරන ලදී. ෆෙයා ෆස්ට් ඒෂියා සමාගම පිළිවෙලින් 2015 සහ 2016 වසර තුළ යූනියන් ජෙනරල් හි විශාල කොටසක් හිමිකර ගනිමින් සහ ඒෂියන් එලායන්ස් ජෙනරල් හී කොටස්වලින් 100% ක ප්‍රතිශතයක් අත්පත්කර ගනිමින් සාමාන්‍ය රක්ෂණ වෙළඳපොල තුළට ඇතුළත් විය.

සාමාන්‍ය රක්ෂණ ව්‍යාපාරය වාර්ෂිකව 14.73% ක (2015:13.18%) වර්ධන අනුපාතයක් වාර්තා කරමින් 2016 වසර තුළදී වර්ධිත කාර්යසාධනයක් පෙන්නුම් කළේය. එමෙන්ම, සාමාන්‍ය රක්ෂණ ව්‍යාපාරය 2015 වසර තුළ වාර්තා කරන ලද රුපියල් මිලියන 69,271 කට සාපේක්ෂව රුපියල් මිලියන 79,474 ක දළ ලිඛිත වාරික ආදායමක් වාර්තා කරමින් රක්ෂණ ආදායමට ධනාත්මකව දායක වී ඇත.


14 සහ 15 වගුවෙන් පෙන්වා දෙන පරිදි, සෙලින්කෝ ජෙනරල් රක්ෂණ සමාගම, ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථාව සුළු වශයෙන් පසුකරමින් වෙළඳපොල නායකයා බවට පත්වූ අතර, රුපියල් මිලියන 15,277 ක දළ ලිඛිත වාරික ආදායමක් වාර්තා කරන ලදී. එමෙන්ම, එම සමාගම 19.22% ක (2015:18.65%) වෙළඳපොල කොටසක් ග්‍රහනය කර ගන්නා ලද අතර 2015 වසරේදී වාර්තා කළ රුපියල් මිලියන 12,922 ට සාපේක්ෂව වාරික ආදායමෙහි 18.22% ක වර්ධනයක් පෙන්නුම් කළේය. ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථාව 2016 වසරේදී රුපියල් මිලියන 15,178 ක (2015:රුපියල් මිලියන 13,583) දළ ලිඛිත වාරික ආදායමක් සහ 19.10% ක වෙළඳපොල කොටසක් වාර්තා කරමින් දෙවන විශාලතම වෙළඳපොල කොටස අත්කර ගන්නා ලදී. ජනශක්ති ජෙනරල් රක්ෂණ සමාගම ඒඅයිඒ ලයිෆ් අත්පත් කර ගැනීමත් සමඟ තවදුරටත් ස්වකීය ව්‍යාපාරය අඛණ්ඩව පුළුල් කරන ලද අතර, 2016 දී රුපියල් මිලියන 10,138 දක්වා දළ ලිඛිත වාරික ආදායම වර්ධනය කර ගෙන ඇත.

**වගුව 14**

**සමාගම් අනුව දළ ලිඛිත වාරික සහ වෙළෙඳ පොළ කොටස - සාමාන්‍ය රක්ෂණ ව්‍යාපාරය**

| රක්ෂකයා | 2012 | | 2013 | | 2014(අ) | | 2015 (අ) | | 2016 (අ) | |
|---|---|---|---|---|---|---|---|---|---|---|
| | වාරිකය (රු.'000) | වෙළෙඳ පොළ කොටස (%) | වාරිකය (රු.'000) | වෙළෙඳ පොළ කොටස (%) | වාරිකය (රු.'000) | වෙළෙඳ පොළ කොටස (%) | වාරිකය (රු.'000) | වෙළෙඳ පොළ කොටස (%) | වාරිකය (රු.'000) | වෙළෙඳ පොළ කොටස (%) |
| ඒඅයිඒ ජෙනරල් | 2,143,252 | 4.03 | 2,428,675 | 4.17 | 2,655,577 | 4.34 | 3,297,840 | 4.76 | | |
| ඒඅයිජී | 819,448 | 1.54 | 880,060 | 1.51 | 414,805 | 0.68 | 3,141 | 0.00 | (279) | -0.00 |
| අලියාන්ස් ජෙනරල් | 1,397,127 | 2.63 | 1,964,907 | 3.37 | 2,723,406 | 4.45 | 3,244,844 | 4.68 | 4,247,691 | 5.34 |
| අමානා ජෙනරල් | 1,125,838 | 2.12 | 1,432,135 | 2.46 | 1,285,418 | 2.10 | 1,438,732 | 2.08 | 1,474,186 | 1.85 |
| ෆෙයාර්ෆස්ට් ජෙනරල් | 1,133,240 | 2.13 | 1,556,386 | 2.67 | 1,638,126 | 2.68 | 1,908,901 | 2.76 | 2,361,614 | 2.97 |
| සෙලින්කෝ ජෙනරල් | 10,434,917 | 19.61 | 10,311,479 | 17.69 | 11,431,680 | 18.68 | 12,921,561 | 18.65 | 15,276,512 | 19.22 |
| කොන්ටිනන්ටල් | 1,545,225 | 2.90 | 1,330,515 | 2.28 | 1,761,747 | 2.88 | 2,309,413 | 3.33 | 3,087,793 | 3.89 |
| කොපරේටිව් ජෙනරල් | 1,135,011 | 2.13 | 1,272,941 | 2.18 | 1,358,932 | 2.22 | 1,691,705 | 2.44 | 2,420,130 | 3.05 |
| එච්එන්බී ජෙනරල් | 1,635,306 | 3.07 | 1,767,361 | 3.03 | 2,182,915 | 3.57 | 2,577,224 | 3.72 | 2,982,385 | 3.75 |
| ජනශක්ති ජෙනරල් | 5,773,429 | 10.85 | 6,318,626 | 10.84 | 6,491,556 | 10.61 | 7,406,160 | 10.69 | 10,137,864 | 12.76 |
| එල්ඕඑල්සී ජෙනරල් | 1,295,133 | 2.43 | 1,485,521 | 2.55 | 1,815,486 | 2.97 | 2,476,961 | 3.58 | 3,096,834 | 3.90 |
| එම්බීඑස්එල් | 1,049,147 | 1.97 | 1,132,789 | 1.94 | 961,225 | 1.57 | 1,159,208 | 1.67 | 972,976 | 1.22 |
| එන්.අයි.ටී.එෆ්. | 3,518,528 | 6.61 | 4,973,357 | 8.53 | 5,295,759 | 8.65 | 4,961,413 | 7.16 | 6,329,318 | 7.96 |
| ඔරියන්ට් | 308,547 | 0.58 | 355,001 | 0.61 | 491,127 | 0.80 | 746,935 | 1.08 | 810,728 | 1.02 |
| පීපල්ස් | 2,795,448 | 5.25 | 3,085,041 | 5.29 | 3,286,063 | 5.37 | 3,637,404 | 5.25 | 4,121,918 | 5.19 |
| සණස | 308,142 | 0.58 | 322,592 | 0.55 | 344,041 | 0.56 | 349,527 | 0.50 | 414,294 | 0.52 |
| එස්එල්අයිසී | 12,359,188 | 23.23 | 12,549,763 | 21.53 | 12,113,994 | 19.79 | 13,583,222 | 19.61 | 15,177,984 | 19.10 |
| යූනියන් ජෙනරල් | 4,436,052 | 8.34 | 5,116,966 | 8.78 | 4,950,741 | 8.09 | 5,557,189 | 8.02 | 6,561,571 | 8.26 |
| **මුළු** | **53,212,978** | **100** | **58,284,115** | **100** | **61,202,599** | **100** | **69,271,380** | **100** | **79,473,521** | **100** |
| වර්ධන අනුපාතය (%) | **13.39** | | **9.53** | | **5.01** | | **13.18** | | **14.73** | |

රූප සටහන 13
2016 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා සාමාන්‍ය රක්ෂණ ව්‍යාපාරය තුළ සමාගම් අනුව දළ ලිඛිත වාරිකවල වෙළෙඳ පොළ කොටස




## දළ ලිඛිත වාරික ආදායම ජනනය කිරීම අතින් ප්‍රමුඛතම සමාගම් පහේ සහ අනෙක් රක්ෂකයන්ගේ වෙළඳපොළ පංගුව - සාමාන්‍ය රක්ෂණ ව්‍යාපාරය

පසුගිය වසර පහ තුළ සාමාන්‍ය රක්ෂණ ව්‍යාපාරයේ ප්‍රමුඛතම වෙළඳපොළ කොටස වාර්තා කරන ලද සමාගම් පහ සහ අනෙක් රක්ෂකයින් වාර්තා කළ වෙළඳපොළ කොටස පිළිබඳ විස්තර 14 වන රූප සටහනින් නිරූපණය වේ. සාමාන්‍ය රක්ෂණ ව්‍යාපාරයේ සමාගම් අතර දැඩි තරඟකාරිත්වය හමුවේ වුවද, සෙලින්කෝ ජෙනරල් සහ එස්. එල්. අයි. සී. 2016 දී 38.32% ක වෙළඳපොළ කොටසක් ලබාගෙන ඇත. සෙලින්කෝ ජෙනරල් ඔවුන්ගේ වෙළෙඳපොළ කොටස තවදුරටත් පුළුල් කළ අතර, 2016 දී 19.22% ක විශාලතම වෙළඳපොළ කොටස අත්කර ගැනීමට හැකි වී ඇත.


යුනියන් ජෙනරල් රක්ෂණය රුපියල් මිලියන 6,562 ක (2015: රුපියල් මිලියන 5,557) දළ ලිඛිත වාරික ආදායමක් සමඟ 2016 දී 8.26% ක (2015:8.02%) වෙළඳපොල කොටසක් අත්පත් කර ගනිමින් හතරවැනි විශාලතම වෙළඳපොල සමාගම බවට පත්විය.

ජාතික රක්ෂණ භාර අරමුදල 2016 දී රුපියල් මිලියන 6,329 ක (2015: රුපියල් මිලියන 4,961) දළ ලිඛිත වාරික ආදායමක් උපයාගනිමින් 7.96% ක් වන පස්වැනි විශාලතම වෙළඳපොල කොටස අත්කර ගැනීම සඳහා වර්ධිත කාර්යසාධනයක් පෙන්නුම් කරන ලදී. ඒ අනුව, ඔවුන්ගේ වාරික ආදායම වාර්ෂිකව 27.58% කින් වර්ධනය වී ඇත.

අලියාන්ස් ජෙනරල් රක්ෂණ සමාගම සහ පීපල්ස් රක්ෂණ සමාගමට 2016 වසරේදී පිළිවෙලින් 5.34% ක (2015:4.68%) සහ 5.19% ක වෙළඳපොල කොටසක් අත්කර ගැනීමට හැකි වී ඇත.

2015 දී වාර්තා කළ දළ ලිඛිත වාරික ආදායමට සාපේක්ෂව 2016 වසරේදී කෝපරේටිව් ජෙනරල් රක්ෂණය, කොන්ටිනන්ටල් ජෙනරල් රක්ෂණය සහ අලියාන්ස් ජෙනරල් රක්ෂණ සමාගම්වල වේගවත් වර්ධනයක් දැකිය හැකි විය. මෙම සමාගම් තුන 2016 වසරේදී වාර්තාකළ දළ ලිඛිත වාරික ආදායමට සාපේක්ෂව 30%ක වැඩි වර්ධනයක් අත්කර ගෙන ඇත.

රූප සටහන 14
2012 වසරේ සිට 2016 වසර දක්වා ප්‍රමුඛතම සමාගම් පහේ සහ අනෙක් රක්ෂකයන්ගේ වෙළඳපොළ කොටස - සාමාන්‍ය රක්ෂණ ව්‍යාපාරය




| | සෙලින්කෝ | එස්එල්අයිසී | ජනශක්ති | යුනියන් | ජාතික රක්ෂණ භාර අරමුදල (ආ) | වෙනත් රක්ෂකයින් |
|---|---|---|---|---|---|---|
| 2012 | 19.61 | 23.23 | 10.85 | 8.34 | 6.61 | 31.37 |
| 2013 | 17.69 | 21.53 | 10.84 | 8.78 | 8.53 | 32.62 |
| 2014 (ආ) | 18.68 | 19.79 | 10.61 | 8.09 | 8.65 | 34.18 |
| 2015 (ආ) | 18.65 | 19.61 | 10.69 | 8.02 | 7.16 | 35.86 |
| 2016 (ආ) | 19.22 | 19.10 | 12.76 | 8.26 | 7.96 | 32.70 |

එස්. එල්. අයි. සී. වාරික ආදායම 11.74% කින් වර්ධනය වුවත් 2015 දී වාර්තා කළ 19.61%ට සාපේක්ෂව 2016 දී 19.10% දක්වා සුළු පහත වැටීමක් තිබූ අතර, එය දෙවන ස්ථානය දක්වා යාමට හේතු විය. ජනශක්ති ජෙනරල් 2015 දී 10.69% හා සැසැඳීමේදී 2016 වසරේදී 12.76% ක වෙළඳපොළ කොටසක් අත්කර ගනිමින් එහි වෙළඳපොළ කොටස තවදුරටත් ශක්තිමත් කර ගෙන ඇත.

යුනියන් ජෙනරල් 8.26% ක (2015:8.02%) වෙළඳපොළ කොටසක් සහිතව ධනාත්මක අයුරින් වර්ධනය වී ඇති අතර, හතරවැනි විශාලතම සමාගම බවට පත්විය. එච් අයි ටී එච් 7.96% ක (2015 : 7.16%) වෙළඳපොළ කොටසක් අත්කර ගනිමින් සාමාන්‍ය රක්ෂණ ව්‍යාපාරය තුළ පස්වැනි ස්ථානය හිමිකර ගැනීමට හැකිවී ඇත. මෙම ප්‍රධාන සමාගම් පහ එක්ව මුළු දළ ලිඛිත වාරිකවලින් 67.30% කට දායක වී ඇත. ජනශක්ති ජෙනරල් සමඟ ඒඅයිඒ ජෙනරල් ඒකාබද්ධ වීම ප්‍රධාන වශයෙන් හේතු කොට ගෙන අනෙකුත් රක්ෂණ සමාගම්වල එකතුකළ වෙළඳ පොළ කොටස 32.70% දක්වා වාර්ෂිකව 3.16% කින් පහත වැටී ඇත.

## දළ ලිඛිත වාරික ආදායම රක්ෂණ උප-වර්ග අනුව විශ්ලේෂණය - සාමාන්‍ය රක්ෂණ ව්‍යාපාරය

2012 සිට 2016 වසර දක්වා කාලපරිච්ඡේදය තුළ දළ ලිඛිත වාරික ආදායම පිළිබඳ උපවර්ග අනුව විශ්ලේෂණය 15 වැනි වගුව සහ 15 වැනි රූපසටහනෙන් නිරූපණය කරයි. ගිනි, මුහුදු, මෝටර් රථවාහන, සෞඛ්‍ය, විවිධ රක්ෂණය සහ වර්ජන, කැරලි කෝලාහල, සිවිල් කැලඹීම් හා ත්‍රස්තවාදය (SRCC & T) මෙහිදී උපවර්ග ලෙස සලකන ලදී.

**වගුව 15**


**දළ ලිඛිත වාරික ආදායම රක්ෂණ උප-වර්ග අනුව විශ්ලේෂණය - සාමාන්‍ය රක්ෂණ ව්‍යාපාරය**

| පන්තිය | දළ ලිඛිත වාරික ආදායම (රු.'000) | | | | |
|---|---|---|---|---|---|
| | 2012 | 2013 | 2014 (අ) | 2015 (අ) | 2016 (ආ) |
| ගිනි | 5,474,094 | 6,303,725 | 6,353,292 | 6,604,074 | 7,448,714 |
| මුහුදු | 1,927,096 | 1,796,969 | 1,911,944 | 1,996,862 | 2,082,933 |
| මෝටර් රථවාහන | 31,844,102 | 33,331,917 | 35,786,941 | 42,622,205 | 49,287,639 |
| සෞඛ්‍ය | 5,948,640 | 7,292,091 | 7,593,386 | 8,534,364 | 9,971,746 |
| විවිධ | 5,737,870 | 7,015,630 | 6,721,836 | 6,495,454 | 7,149,163 |
| **උප එකතුව** | **50,931,801** | **55,740,332** | **58,367,399** | **66,252,959** | **75,940,195** |
| SRCC හා T | 2,281,177 | 2,543,783 | 2,835,200 | 3,018,421 | 3,533,326 |
| **එකතුව** | **53,212,978** | **58,284,115** | **61,202,599** | **69,271,380** | **79,473,521** |

| පන්තිය | වර්ධනය (%) | | | | |
|---|---|---|---|---|---|
| | 2012 | 2013 | 2014 (අ) | 2015 (අ) | 2016 (ආ) |
| ගිනි | 1.75 | 15.16 | 0.79 | 3.95 | 12.79 |
| මුහුදු | 14.72 | (6.75) | 6.40 | 4.44 | 4.31 |
| මෝටර් රථවාහන | 16.40 | 4.67 | 7.37 | 19.10 | 15.64 |
| සෞඛ්‍ය | 5.57 | 22.58 | 4.13 | 12.39 | 16.84 |
| විවිධ | 5.66 | 22.27 | (4.19) | (3.37) | 10.06 |
| **උප එකතුව** | **13.38** | **9.44** | **4.71** | **13.51** | **14.62** |
| SRCC හා T | 13.69 | 11.51 | 11.46 | 6.46 | 17.06 |
| **එකතුව** | **13.39** | **9.53** | **5.01** | **13.18** | **14.73** |

| පන්තිය | ප්‍රතිශත කොටස (%) | | | | |
|---|---|---|---|---|---|
| | 2012 | 2013 | 2014 (අ) | 2015 (අ) | 2016 (ආ) |
| ගිනි | 10.29 | 10.82 | 10.38 | 9.53 | 9.37 |
| මුහුදු | 3.62 | 3.08 | 3.12 | 2.88 | 2.62 |
| මෝටර් රථවාහන | 59.84 | 57.19 | 58.47 | 61.53 | 62.02 |
| සෞඛ්‍ය | 11.18 | 12.51 | 12.41 | 12.32 | 12.55 |
| විවිධ | 10.78 | 12.04 | 10.98 | 9.38 | 9.00 |
| **උප එකතුව** | **95.71** | **95.64** | **95.37** | **95.64** | **95.55** |
| SRCC හා T | 4.29 | 4.36 | 4.63 | 4.36 | 4.45 |
| **එකතුව** | **100** | **100** | **100** | **100** | **100** |

**රූප සටහන 15**
**2012 සිට 2016 දක්වා දළ ලිඛිත වාරික ආදායම රක්ෂණ උප-වර්ග අනුව විශ්ලේෂණය - සාමාන්‍ය රක්ෂණ ව්‍යාපාරය**




| | 2012 | 2013 | 2014 (අ) | 2015 (අ) | 2016 (ආ) |
|---|---|---|---|---|---|
| SRCC හා T | 4.29 | 4.36 | 4.63 | 4.36 | 4.45 |
| විවිධ | 10.78 | 12.04 | 10.98 | 9.38 | 9.00 |
| සෞඛ්‍ය | 11.18 | 12.51 | 12.41 | 12.32 | 12.55 |
| මෝටර් රථවාහන | 59.84 | 57.19 | 58.47 | 61.53 | 62.02 |
| මුහුදු | 3.62 | 3.08 | 3.12 | 2.88 | 2.62 |
| ගිනි | 10.29 | 10.82 | 10.38 | 9.53 | 9.37 |
| කර්මාන්ත වර්ධනය | 13.39 | 9.53 | 5.01 | 13.18 | 14.73 |

සාමාන්‍ය රක්ෂණ ව්‍යාපාරය තුළ ගාමක බලවේගය ලෙස මෝටර් රථවාහන රක්ෂණ ව්‍යාපාරය මුළු දළ ලිඛිත වාරික ආදායමෙන් 62.02%ක් නියෝජනය කරන ලදී. මෝටර් රථවාහන රක්ෂණ ව්‍යාපාරයේ මුළු දළ ලිඛිත වාරික ආදායම 2015 දී පැවති රුපියල් මිලියන 42,622 සිට 2016 දී රුපියල් මිලියන 49,288 දක්වා වැඩි වී ඇත. මෝටර් රථ සඳහා තීරුබදු පැනවීමත් සමඟ, මිල ගණන්වල සිදු වූ වැඩිවීම 2016 දී 15.64% ක මෝටර් රථ වාරික ආදායම සඳහා ප්‍රධාන වශයෙන් දායක වී ඇත. එසේවුවත්, මූල්‍ය පහසුකම් ලබාගැනීමේදී වූ දැඩි කොන්දේසි සමඟ 2015 වාර්තා කළ 19.10% ට සාපේක්ෂව මෝටර් රථවාහන රක්ෂණ ව්‍යාපාරයේ වර්ධන අනුපාතයෙහි පහළ වැටීමක් තිබුණි.

පුද්ගලික අංශයේ දායකත්වයේ වර්ධනයත් සමඟ, සෞඛ්‍යාරක්ෂක අංශය සහ වයස්ගත ජනගහනය මෑත කාලය තුළ සෞඛ්‍ය රක්ෂණ නිෂ්පාදන සඳහා බොහෝ අවස්ථාවන් නිර්මාණය කර ඇත. සෞඛ්‍ය හා ශල්‍යකර්ම, සාමාන්‍ය රක්ෂණ වෙළෙඳපොලේ දෙවන විශාලතම උප පන්තිය වන අතර වාර්ෂිකව 16.84% කින් වර්ධනය වී දළ ලිඛිත වාරික ආදායමට රුපියල් මිලියන 9,972 කින් (2015: රුපියල් මිලියන 8,534) දායක වී ඇත. රාජ්‍ය අංශයේ සේවකයින්ට හඳුන්වා දෙන ලද ජාතික රක්ෂණ භාර අරමුදලේ අග්‍රහාර සෞඛ්‍ය රක්ෂණ යෝජනා ක්‍රමය සෞඛ්‍ය උප පන්ති සඳහා 2015 දී හා 2016 දි පිළිවෙලින් රුපියල් මිලියන 1,954 කින් හා රුපියල් මිලියන 1637 කින් දායක වී ඇත.

ගිනි රක්ෂණය 2015 දී පැවති 3.95% ට සාපේක්ෂව 12.79% ක වර්ධන අනුපාතයක් වාර්තා කරමින් දළ ලිඛිත වාරික ආදායමට ධනාත්මකව දායක වී ඇත. 2016 දී, ගිනි රක්ෂණ ව්‍යාපාරය රුපියල් මිලියන 7,449 ක (2015: රුපියල් මිලියන 6,604) දළ ලිඛිත වාරික ආදායමක් උපයාගෙන ඇත. මෑතදී මුහුණදුන් ස්වභාවික ආපදාවන් සමඟ ස්වභාවික ආපදාවන් සම්බන්ධ අවදානම රක්ෂණය කිරීමට ඉල්ලුම නිර්මාණය විය. දළ ලිඛිත වාරික ආදායමට විවිධ රක්ෂණ ව්‍යාපාරයේ දායකත්වය රුපියල් මිලියන 7,149 ක් වූ අතර 2016 දී මුළු ලිඛිත වාරික ආදායමෙන් 9.00% ක් නියෝජනය කරන ලදී. මුහුදු රක්ෂණ ව්‍යාපාරයේ දළ ලිඛිත වාරික ආදායම 2015 වසරට සාපේක්ෂව 2016 වසරේදී 4.31% කින් සුළු වශයෙන් වර්ධනය වී ඇත.

2016 වසරේදී ජාතික රක්ෂණ භාර අරමුදලේ වැඩවර්ජන, කැරලිකෝලහල,

**වගුව 16**
**2015 හා 2016 සඳහා රක්ෂණ ව්‍යාපාරයේ විවිධ රක්ෂණ උප-පන්තියේ දළ ලිඛිත වාරික ආදායම කාණ්ඩ අනුව විශ්ලේෂණය**

| කාණ්ඩය | දළ ලිඛිත වාරික ආදායම (රු. '000) | |
|---|---|---|
| | 2015 (අ) | 2016 (ආ) |
| හිමිකම් අයිතිය | 415,571 | 494,808 |
| පුද්ගලික අනතුරු | 1,430,133 | 1,511,589 |
| කොන්ත්‍රාත්කරුගේ සියලු අවදානම් | 221,761 | 31,073 |
| වෘත්තීය හානිරක්ෂණය | 174,138 | 183,392 |
| වාරිකා රක්ෂණය | 383,737 | 432,136 |
| විශ්වාසනා ඇපය | 160,492 | 115,482 |
| සොර බිය | 252,501 | 340,621 |
| සේප්පුවේ ඇති මුදල් ඇතුළු මාර්ගස්ථ මුදල් | 400,750 | 434,201 |
| මාර්ගස්ථ භාණ්ඩ | 75,097 | 81,776 |
| නිෂ්පාදන වගකීම | 58,066 | 124,342 |
| මහජන වගකීම | 244,081 | 384,272 |
| බැංකුකරුවන්ගේ හානිරක්ෂණය | 343,449 | 396,791 |
| ගුවන්යානා බඳ | 649,067 | 681,071 |
| කම්කරු වන්දි | 477,939 | 535,430 |
| වෙනත් | 1,535,640 | 1,767,912 |
| **උප එකතුව** | **6,822,422** | **7,514,896** |
| අඩුකළා - ජාතික රක්ෂණ භාර අරමුදල සඳහා වන වර්ජන, කැරලි කෝලාහල, සිවිල් කැලඹීම් හා ත්‍රස්තවාදය මුළු වාරික ආදායම | (308,223) | (341,091) |
| සහභාග-රක්ෂකයින්ගේ වාරික අදායම (SRCC හා T) | (18,745) | (24,643) |
| **මුළු විවිධ රක්ෂණ දළ ලිඛිත වාරික ආදායම** | **6,495,454** | **7,149,162** |

සිවිල් අරගල සහ ත්‍රස්තවාදයෙන් ඇතිවන අවදානම් ආවරණය කිරීම සඳහා එකතුකළ වාරික මුදල 2015 වසරට සාපේක්ෂව 17.06% කින් වර්ධනය වී ඇත.

## විවිධ රක්ෂණ ව්‍යාපාරයේ දළ ලිඛිත වාරික වර්ගය අනුව විශ්ලේෂණය

2015 සහ 2016 වසර තුළදී, විවිධ රක්ෂණ ව්‍යාපාරය යටතේ වර්ගීකරණය කළ විවිධ රක්ෂණ අංශ විසින් උපයන ලද දළ ලිඛිත වාරික 16 වගුවෙන් පෙන්නුම් කෙරේ.

16 වගුවෙන් පෙන්නුම් කරන පරිදි, අදාළ ගැලපීම් සිදුකිරීමෙන් පසු විවිධ රක්ෂණ ව්‍යාපාරයෙන් උත්පාදනය කළ මුළු දළ ලිඛිත වාරිකය (2015 වසරේදී රුපියල් මිලියන 6,495) රුපියල් මිලියන 7,149 ක් විය. ඒ අනුව, විවිධ පන්තිවල මුළු වාරික ආදායම 10.06% කින් වර්ධනය වී ඇත.

විවිධ රක්ෂණ ව්‍යාපාරය යටතේ සැලකිය යුතු ව්‍යාපාර වර්ගීකරණයක් වන පුද්ගලික අනතුරු 5.70% ක සුළු වර්ධනයක් වාර්තා කරන ලදී. වාරිකා රක්ෂණය, බැංකුකරුවන්ගේ හානි රක්ෂණය සහ කම්කරු වන්දි රක්ෂණය වැනි විවිධ රක්ෂණ ව්‍යාපාර වර්ගීකරණ කිහිපයක් සඳහා වාර්ෂිකව මධ්‍යස්ථ වර්ධනයක් දැකිය හැකි විය. නිෂ්පාදන වගකීම සහ මහජන වගකීමේ පන්තිවල සැලකිය යුතු වර්ධනයක් තිබුණු අතර එය පිළිවෙලින් රුපියල් මිලියන 124 ක් (2015:රුපියල් මිලියන 58) සහ රුපියල් මිලියන 384 (2015:රුපියල් මිලියන 244) ක් විය. මුළු විවිධ රක්ෂණ උප පන්තියේ දළ ලිඛිත වාරිකයෙන් සැලකිය යුතු ප්‍රමාණයක් නියෝජනය කරන ගුවන්යානා බඳ රක්ෂණය 2015 වසර හා සැසැඳීමේදී 4.93% කින් සුළු වශයෙන් වැඩි වී ඇත.

අනෙකුත් කාණ්ඩ යටතේ කරගෙන යන ව්‍යාපාර වෙනත් ව්‍යාපාර ලෙස කණ්ඩායම් ගත කරනු ලබන අතර නැව්බඳ සියළු අවදානම්, පුද්ගලික රක්ෂණ නිෂ්පාදන සහ ජාතික රක්ෂණ භාර අරමුදලේ ජාතික ස්වාභාවික ආපදා රක්ෂණ යෝජනා ක්‍රමය ප්‍රධාන වශයෙන් මේ කාණ්ඩය නියෝජනය කරයි. ජාතික රක්ෂණ භාර අරමුදලේ ජාතික ස්වාභාවික ආපදා රක්ෂණ යෝජනා ක්‍රමය වෙනත් රක්ෂණ කාණ්ඩය යටතේ රුපියල් මිලියන 300ක් විය.

## දළ ලිඛිත වාරික ආදායම, ප්‍රතිරක්ෂණ වාරික ආදායම සහ රක්ෂකයන් විසින් රඳවා ගැනීම - සාමාන්‍ය රක්ෂණ ව්‍යාපාරය

2012 සිට 2016 වසර දක්වා ප්‍රතිරක්ෂණය පිළිබඳ විස්තර සහ සාමාන්‍ය රක්ෂණ ව්‍යාපාරයේ ප්‍රධාන පන්ති සඳහා රක්ෂණ සමාගම් විසින් දළ ලිඛිත වාරික ආදායමේ රඳවා ගැනීමේ මට්ටම් 17 වැනි වගුව සහ 16 වැනි රූපසටහන මගින් නිරූපණය වේ.


17 වැනි වගුවේ පෙන්වා දෙන පරිදි, 2016 වසරේදී සාමාන්‍ය රක්ෂණ ව්‍යාපාරයේ දළ ලිඛිත වාරික ආදායම (SRCC හා T රහිතව) වූ රුපියල් මිලියන 75,940න් 84.34% ක් සමස්ත රඳවා ගැනීමේ අනුපාතය විය. පුළුල්ව බලන කල, සමස්ත රඳවාගැනීමේ මට්ටම පසුගිය වසර පහ තුළ සුළු වශයෙන් වර්ධනය වී ඇත. ජාතික රක්ෂණ භාර අරමුදලට අනිවාර්ය පැවරුම් ඇතුළුව මුළු ප්‍රතිරක්ෂණ ස්ථාපනය 2016 දී රුපියල් මිලියන 11,890ක් (2015:රුපියල් මිලියන 10,419) විය.

විශාල වශයෙන් මෝටර් රථවාහන රක්ෂණ ව්‍යාපාරය මත රඳා පවත්නා සාමාන්‍ය රක්ෂණ ව්‍යාපාරයේ අවදානම රක්ෂණ සමාගම් විසින් පොදුවේ රඳවා ගනු ලබයි. ඒ අනුව, මෝටර් රථවාහන උප පන්තියේ රඳවා ගැනීම 97.49% ක් ලෙස ඉහළ අගයක් ගන්නා අතර පසුගිය වසර පහ තුළ ස්ථාවර මට්ටමක පැවතුණි.

ගිනි රක්ෂණ උපපන්තිය ගිනි දළ ලිඛිත වාරික ආදායමෙන් 80.25% ක ඉහළම පැවරුම් අනුපාතයක් වාර්තා කරන ලදී. 2016 දී, සාමාන්‍ය රක්ෂණ ව්‍යාපාරයට බලපාන ලද ප්‍රධාන සිදුවීමක් වූයේ රටේ බොහෝ ප්‍රදේශවල විශාල අලාභ ඇතිකළ ගංවතුර සහ නායයාමයි. එසේවුවත්, ගිනි රක්ෂණය යටතේ ආවරණය කෙරෙන මෙම ස්වභාවික ආපදාවේ අවදානම ප්‍රතිරක්ෂකයින් විසින් ප්‍රධාන වශයෙන් බෙදාගෙන දරා ඇති බැවින් සාමාන්‍ය රක්ෂණය සඳහා කළමනාකරණය කළ හැකි අභියෝග යක් බවට පත්විය.

මුහුදු රක්ෂණ ව්‍යාපාරයද ඉහළ අවදානම් වර්ගීකරණයක් වශයෙන් සලකා ප්‍රතිරක්ෂණය කෙරේ. මුහුදු රක්ෂණ ව්‍යාපාරයේ පවරාදීමේ මට්ටම 2016 දී රුපියල් මිලියන 2,083 ක් වූ දළ ලිඛිත වාරික ආදායමෙන් 57.99% ක් විය.

**රූප සටහන 16**
**ප්‍රතිරක්ෂණ වාරිකය සහ රක්ෂකයන් විසින් රඳවා ගනු ලැබීම - සාමාන්‍ය රක්ෂණ ව්‍යාපාරය**



**වගුව 17**

**දළ ලිඛිත වාරික ආදායම, ප්‍රතිරක්ෂණ වාරික ආදායම සහ රක්ෂකයන් විසින් රඳවා ගනු ලැබීම - සාමාන්‍ය රක්ෂණ ව්‍යාපාරය**

| පන්තිය | දළ ලිඛිත වාරික ආදායම (රු.'000) | | | | |
|---|---|---|---|---|---|
| | 2012 | 2013 | 2014 (අ) | 2015 (අ) | 2016 (ආ) |
| ගිනි | 5,474,094 | 6,303,725 | 6,353,292 | 6,604,074 | 7,448,714 |
| මුහුදු | 1,927,096 | 1,796,969 | 1,911,944 | 1,996,862 | 2,082,933 |
| මෝටර් රථවාහන | 31,844,102 | 33,331,917 | 35,786,941 | 42,622,205 | 49,287,639 |
| සෞඛ්‍ය | 5,948,640 | 7,292,091 | 7,593,386 | 8,534,364 | 9,971,746 |
| විවිධ | 5,737,870 | 7,015,630 | 6,721,836 | 6,495,454 | 7,149,163 |
| **උප එකතුව** | **50,931,801** | **55,740,332** | **58,367,399** | **66,252,959** | **75,940,195** |
| SRCC හා T | 2,281,177 | 2,543,783 | 2,835,200 | 3,018,421 | 3,533,326 |
| **එකතුව** | **53,212,978** | **58,284,115** | **61,202,599** | **69,271,380** | **79,473,521** |

| පන්තිය | ප්‍රතිරක්ෂක වාරික ආදායම (රු.'000) | | | | |
|---|---|---|---|---|---|
| | 2012 | 2013 | 2014 (අ) | 2015 (අ) | 2016 (ආ) |
| ගිනි | 4,140,877 | 4,823,731 | 5,075,545 | 5,137,042 | 5,977,635 |
| මුහුදු | 1,326,369 | 998,976 | 1,171,768 | 1,154,511 | 1,207,948 |
| මෝටර් රථවාහන | 478,478 | 864,394 | 636,603 | 1,115,036 | 1,237,867 |
| සෞඛ්‍ය | | | | | |
| විවිධ | 2,752,627 | 2,700,309 | 2,634,795 | 3,012,362 | 3,466,989 |
| **මුළු ප්‍රතිරක්ෂක වාරික ආදායම** | **8,698,351** | **9,387,410** | **9,518,711** | **10,418,951** | **11,890,438** |

| පන්තිය | රඳවා ගැනීම (රු.'000) | | | | |
|---|---|---|---|---|---|
| | 2012 | 2013 | 2014 (අ) | 2015 (අ) | 2016 (ආ) |
| ගිනි | 1,333,216 | 1,479,994 | 1,277,747 | 1,467,033 | 1,471,080 |
| මුහුදු | 600,727 | 797,994 | 740,176 | 842,351 | 874,985 |
| මෝටර් රථවාහන | 31,365,623 | 32,467,523 | 35,150,338 | 41,507,169 | 48,049,772 |
| සෞඛ්‍ය | | | | | |
| විවිධ | 8,933,884 | 11,607,412 | 11,680,427 | 12,017,455 | 13,653,920 |
| **මුළු ශුද්ධ ලිඛිත වාරික ආදායම** | **42,233,450** | **46,352,923** | **48,848,688** | **55,834,008** | **64,049,757** |

| පන්තිය | දළ ලිඛිත වාරික ආදායමේ ප්‍රතිශතයක් ලෙස රඳවා ගැනීම (%) | | | | |
|---|---|---|---|---|---|
| | 2012 | 2013 | 2014 (අ) | 2015 (අ) | 2016 (ආ) |
| ගිනි | 24.36 | 23.48 | 20.11 | 22.21 | 19.75 |
| මුහුදු | 31.17 | 44.41 | 38.71 | 42.18 | 42.01 |
| මෝටර් රථවාහන | 98.50 | 97.41 | 98.22 | 97.38 | 97.49 |
| සෞඛ්‍ය | | | | | |
| විවිධ | 76.45 | 81.13 | 81.59 | 79.96 | 79.75 |
| **සමස්ත රඳවාගැනීමේ අනුපාතය** | **82.92** | **83.16** | **83.69** | **84.27** | **84.34** |

ප්‍රතිරක්ෂණ විස්තර ජාතික රක්ෂණ භාර අරමුදලේ SRCC හා T වාරික සඳහා අදාළ නොවේ.

පෙර වසර හා සමානව, සෞඛ්‍ය රක්ෂණය ඇතුළු විවිධ රක්ෂණ පන්තිය ඉහළ රඳවා ගැනීමක් වාර්තා කරන ලද අතර 2016 දී එම අනුපාතය දළ ලිඛිත වාරික ආදායමෙන් 79.75% ක් විය. විවිධ රක්ෂණ උපපන්තියේ 58.24% ක් නියෝජනය කරන සෞඛ්‍ය රක්ෂණ ව්‍යාපාරයේ රඳවාගැනීම පසුගිය වසර පහ තුළ 94% ට ඉහළින් පැවතින.

## ශුද්ධ ඉපැයූ වාරික ආදායම, දැරූ ශුද්ධ හිමිකම්පෑම් සහ ශුද්ධ වියදම් - සාමාන්‍ය රක්ෂණ ව්‍යාපාරය

18 වැනි වගුවේ සහ 17 රූපසටහනේ දක්වා ඇති පරිදි, SRCC හා T ඇතුළුව සාමාන්‍ය රක්ෂණ ව්‍යාපාරයේ මුළු ශුද්ධ ඉපැයූ වාරික ආදායම 2015 වසරේ දී වාර්තා කල රු. මිලියන 54,296 ට සාපේක්ෂව රුපියල් මිලියන 62,729ක් විය. දළ ලිඛිත වාරික ආදායමේ වර්ධනය ශුද්ධ ඉපයූ වාරික ආදායමේ වාර්තා වූ 15.53% වර්ධනය සඳහා ඉවහල් වී ඇත.

එනම්, හිමිකම්පෑම් අනුපාතිකය ශුද්ධ ඉපැයූ වාරික ආදායමේ (SRCC හා T රහිත) ප්‍රතිශතයක් ලෙස දරන ලද ශුද්ධ හිමිකම්පෑම් 2016 දී 68.99% ක් විය. 2015 වසරට වඩා 3.94% කින් ශුද්ධ

**වගුව 18**

**ශුද්ධ ඉපැයූ වාරික ආදායම, දැරූ ශුද්ධ හිමිකම්පෑම්, ශුද්ධ හිමිකම්පෑම් අනුපාතිකය, ශුද්ධ වියදම් අනුපාතිකය සහ ශුද්ධ ඒකාබද්ධ අනුපාතිකය - සාමාන්‍ය රක්ෂණ ව්‍යාපාරය**

| පන්තිය | ශුද්ධ ඉපැයූ වාරික ආදායම (රු.'000) | | | | |
|---|---|---|---|---|---|
| | 2012(අ) | 2013 (අ) | 2014 (අ) | 2015(අ) | 2016 (ආ) |
| ගිනි | 1,452,556 | 1,405,887 | 1,241,985 | 1,283,463 | 1,163,958 |
| මුහුදු | 546,598 | 806,277 | 753,643 | 797,026 | 866,027 |
| මෝටර් රථවාහන | 29,499,705 | 31,346,284 | 33,826,829 | 37,958,834 | 44,563,153 |
| සෞඛ්‍ය | 8,192,094 | 5,204,603 | 7,079,162 | 8,071,777 | 9,281,651 |
| විවිධ | | 5,640,974 | 4,402,900 | 3,270,599 | 3,579,810 |
| **උප එකතුව** | **39,690,954** | **44,404,025** | **47,304,518** | **51,381,699** | **59,454,599** |
| SRCC හා T | 2,185,222 | 2,406,477 | 2,692,730 | 2,914,630 | 3,274,297 |
| **එකතුව** | **41,876,175** | **46,810,502** | **49,997,248** | **54,296,329** | **62,728,895** |

| පන්තිය | දැරූ ශුද්ධ හිමිකම්පෑම් (රු.'000) | | | | |
|---|---|---|---|---|---|
| | 2012(අ) | 2013(අ) | 2014(අ) | 2015(අ) | 2016 (ආ) |
| ගිනි | 506,092 | 810,281 | 717,626 | 300,439 | 1,102,964 |
| මුහුදු | 321,562 | 432,748 | 266,560 | 209,845 | 254,417 |
| මෝටර් රථවාහන | 18,351,251 | 19,514,319 | 20,281,109 | 24,274,415 | 29,248,879 |
| සෞඛ්‍ය | 6,386,324 | 4,029,410 | 6,252,704 | 6,958,816 | 8,172,403 |
| විවිධ | | 2,133,310 | 1,522,689 | 1,677,736 | 2,237,849 |
| **උප එකතුව** | **25,565,230** | **26,920,068** | **29,040,687** | **33,421,251** | **41,016,513** |
| SRCC හා T | 12,565 | - | 56,897 | 780 | (1,286) |
| **එකතුව** | **25,577,795** | **26,920,068** | **29,097,585** | **33,422,031** | **41,015,227** |

| පන්තිය | ශුද්ධ හිමිකම්පෑම් අනුපාතිකය (%) | | | | |
|---|---|---|---|---|---|
| | 2012(අ) | 2013(අ) | 2014(අ) | 2015(අ) | 2016 (ආ) |
| ගිනි | 34.84 | 57.63 | 57.78 | 23.41 | 94.76 |
| මුහුදු | 58.83 | 53.67 | 35.37 | 26.33 | 29.38 |
| මෝටර් රථවාහන | 62.21 | 62.25 | 59.96 | 63.95 | 65.63 |
| සෞඛ්‍ය | 77.96 | 77.42 | 88.33 | 86.21 | 88.05 |
| විවිධ | | 37.82 | 34.58 | 51.30 | 62.51 |
| **උප එකතුව** | **64.41** | **60.63** | **61.39** | **65.05** | **68.99** |
| SRCC හා T | 0.57 | - | 2.11 | 0.03 | (0.04) |
| **එකතුව** | **61.08** | **57.51** | **58.20** | **61.55** | **65.38** |

| විස්තරය | ශුද්ධ වියදම් (රු.'000) | | | | |
|---|---|---|---|---|---|
| | 2012(අ) | 2013(අ) | 2014(අ) | 2015(අ) | 2016(ආ) |
| SRCC සහ T (ඇ) හැර සාමාන්‍ය රක්ෂණ ව්‍යාපාරයේ සියලුම උප පන්ති සඳහා ශුද්ධ වියදම් | 14,807,142 | 17,359,623 | 19,524,543 | 19,134,713 | 21,603,696 |
| SRCC හා T (c) | 386,071 | 414,422 | 466,435 | 486,985 | 653,529 |
| **එකතුව** | **15,193,213** | **17,774,045** | **19,990,978** | **19,621,698** | **22,257,224** |


| විස්තරය | ශුද්ධ වියදම් අනුපාතිකය (%) | | | | |
|---|---|---|---|---|---|
| | 2012(අ) | 2013(අ) | 2014(අ) | 2015(අ) | 2016(ආ) |
| SRCC සහ T (ඇ) හැර සාමාන්‍ය රක්ෂණ ව්‍යාපාරයේ සියලුම උප පන්ති සඳහා ශුද්ධ වියදම් අනුපාතය | 37.31 | 39.09 | 41.27 | 37.24 | 36.34 |
| **සාමාන්‍ය රක්ෂණ ව්‍යාපාරයේ ශුද්ධ වියදම් අනුපාතය** | 36.28 | 37.97 | 39.98 | 36.14 | 35.48 |

| විස්තරය | ශුද්ධ ඒකාබද්ධ අනුපාතිකය (%) | | | | |
|---|---|---|---|---|---|
| | 2012(අ) | 2013(අ) | 2014(අ) | 2015(අ) | 2016 (ආ) |
| SRCC සහ T හැර සාමාන්‍ය රක්ෂණ ව්‍යාපාරයේ සියලුම උප පන්ති සඳහා ශුද්ධ ඒකාබද්ධ අනුපාතය | 101.72 | 99.72 | 102.67 | 102.29 | 105.32 |
| සාමාන්‍ය රක්ෂණ ව්‍යාපාරයේ ශුද්ධ ඒකාබද්ධ අනුපාතය | 97.36 | 95.48 | 98.18 | 97.69 | 100.87 |

හිමිකම්පෑම් අනුපාතිකයෙහි වැඩිවීම ගිනි රක්ෂණය යටතේ වර්ගීකරණය කළ 2016 වසරේදී වූ ගංවතුර හිමිකම්පෑම් සමඟ බොහෝදුරට පැහැදිලි කළ හැකිය. 2015 දී 23.41% ක හිමිකම්පෑම් අනුපාතිකයක් වාර්තා කළ ගිනි රක්ෂණ ව්‍යාපාරය ගංවතුර හිමිකම්පෑම් හේතු කොට ගෙන 2016 දී 94.76% දක්වා ප්‍රබල ආකාරයෙන් වැඩි වී ඇත.

**රූප සටහන 17**

**ශුද්ධ ඉපැයූ වාරික ආදායම, දැරූ ශුද්ධ හිමිකම්පෑම්, ශුද්ධ වියදම්, ශුද්ධ හිමිකම්පෑම් අනුපාතිකය සහ ශුද්ධ ඒකාබද්ධ අනුපාතිකය - සාමාන්‍ය රක්ෂණ ව්‍යාපාරය**




පසුගිය වසර කිහිපය හා සමානව, සාමාන්‍ය රක්ෂණ ව්‍යාපාරයේ ගාමක බලවේගය ලෙස මෝටර් රථවාහන රක්ෂණ ව්‍යාපාරය 2016 දී රුපියල් මිලියන 29,249 ක (2015:රුපියල් මිලියන 24,274) ඉහළම හිමිකම්පෑම් අගයක් වාර්තා කරන ලදී. තෙවන පාර්ශ්ව හිමිකම්පෑම් ඇතුළුව මෝටර් රථවාහන හිමිකම්පෑම් 2016 දී SRCC හා T රහිතව දරන ලද මුළු හිමිකම්පෑම්වලින් 71.31% ක් නියෝජනය කරන ලදී. මෝටර් රථවාහන හිමිකම්පෑම් අනුපාතයේ සාමාන්‍යය පසුගිය වසර පහ තුළ 62.80%ක් විය.

සෞඛ්‍ය රක්ෂණ ව්‍යාපාරයේ ඉහළ පිරිවැය සියලුම රක්ෂණ සමාග ම්වලට අභියෝගයක් වූ අතර, සෞඛ්‍ය රක්ෂණ ව්‍යාපාරයේ ශුද්ධ හිමිකම්පෑම් අනුපාතිකය 2016 දී 88.05% ක ඉහළ අගයක තිබුණි. සෞඛ්‍ය උප පන්ති සඳහා දරන ලද ශුද්ධ හිමිකම්පෑම් පසුගිය වසර හතර තුළ දෙගුණ වී ඇත.

පෙර වසර හා සමානව, මුහුදු රක්ෂණ ව්‍යාපාරය අනෙකුත් උප වර්ග වලට සාපේක්ෂව 29.38% ක (2015 : 26.33%) අවම හිමිකම්පෑම් අනුපාතිකයක් වාර්තා කරන ලදී. විවිධ හිමිකම්පෑම්ද සැලකිය යුතු පරිදි වැඩි වූ අතර 2015 දී වාර්තා කළ 51.30% හා සැසැඳීමේදී 2016 දී 62.51% ක් වාර්තා කර ඇත.

2016 දී සාමාන්‍ය රක්ෂණ සමාගම් පසුගිය වසර පහ තුළ රුපියල් මිලියන 22,257ක ඉහළම වියදම් (SRCC හා T ඇතුළුව) අගය වාර්තා කර ඇත. ශුද්ධ වියදම් 2015 ට සාපේක්ෂව 13.43% කින් වැඩිවී ඇත. ජාතික රක්ෂණ භාර අරමුදලේ SRCC හා T සඳහා සලකා බලනු ලබන ශුද්ධ වියදම් 2016 දී රුපියල් මිලියන 654 දක්වා 34.20% කින් සැලකිය යුතු ලෙස වැඩි වී ඇත.

2015 දී පැවති 97.69% ට සාපේක්ෂව 2016 දී 100.87% දක්වා ක්ෂේත්‍රයේ ඒකාබද්ධ අනුපාතය වඩාත් දුර්වල වීමට ඉහළ හිමිකම්පෑම් අනුපාතිකය බලපා ඇත. සාමාන්‍ය රක්ෂණ ව්‍යාපාර ක්ෂේත්‍රයේ ඒකාබද්ධ අනුපාතය SRCC හා T රහිතව තවදුරටත් දුර්වල තත්ත්වයට පත්වී ඇත. ඒ අනුව එම අගය 105.32%ක් ලෙස වාර්තා විය. සාමාන්‍ය රක්ෂණ සමාගම්වල මූල්‍ය කාර්යසාධනය පිඩාවට පත් කළ ඉහළ ඒකාබද්ධ අනුපාතය 2016 දී උත්පාදනය කළ ආයෝජන ආදායම සමඟ යම් තරමකින් පාලනය කරන ලදී.

## දළ ලිඛිත වාරික ආදායම නියෝජනය කරන රක්ෂණ ඔප්පු සංඛ්‍යාව - සාමාන්‍ය රක්ෂණ ව්‍යාපාරය

19 වැනි වගුවෙන් නිරූපණය කරන පරිදි, දළ ලිඛිත වාරික ආදායම උත්පාදනයට දායක වූ සාමාන්‍ය රක්ෂණ ව්‍යාපාරයේ විවිධ උප-පන්තිවලට අයත් මුළු රක්ෂණ ඔප්පු සංඛ්‍යාව 2016 දී 5,8742,022 ක් විය. සාමාන්‍ය රක්ෂණ ඔප්පුවල මුළු සංඛ්‍යාව 2015 ට සාපේක්ෂව 2016 වසරේ දී 675,224 කින් ඉහළ ගොස් ඇත. තෙවන පාර්ශ්ව රක්ෂණ ඔප්පු 2,619,902 කින් සහ විස්තීරණ රක්ෂණ ඔප්පු 2,517,583 කින් සමන්විත වන රථවාහන රක්ෂණ උප පන්තිය සමස්ත ඔප්පුවලින් විශාල කොටස නියෝජනය කරන ලදී. තෙවන පාර්ශ්ව රක්ෂණ ඔප්පු සැලකිය යුතු සංඛ්‍යාව දෙස බැලීමේදී, රක්ෂණය ලබා ගනු ලබන්නේ එහි අවදානම ආවරණය කිරීමට වඩා නීතිමය අවශ්‍යතාව සපුරාලීමට බව පෙනී යයි. රක්ෂණ ව්‍යාපාරයේ විවිධ උප-පන්තිවලට අයත් රක්ෂණ ඔප්පු සංඛ්‍යාව 2015ට සාපේක්ෂව 2016 දී වැඩි වී ඇත.

**වගුව 19**

**දළ ලිඛිත වාරික ආදායම නියෝජනය කරන රක්ෂණ ඔප්පු සංඛ්‍යාව- සාමාන්‍ය රක්ෂණ ව්‍යාපාරය**

| | 2012 | 2013 | 2014 | 2015 | 2016 |
|---|---|---|---|---|---|
| ගිනි | 186,478 | 177,749 | 188,578 | 227,800 | 249,479 |
| මුහුදු | 154,528 | 158,893 | 186,447 | 190,720 | 192,276 |
| මෝටර් රථවාහන | 3,473,925 | 3,795,059 | 4,004,162 | 4,531,187 | 5,137,485 |
| තුන්වැනි පාර්ශ්ව පමණක් | 1,997,502 | 2,126,037 | 2,229,153 | 2,460,596 | 2,619,902 |
| විස්තීරණ | 1,476,423 | 1,669,022 | 1,775,009 | 2,070,591 | 2,517,583 |
| සෞඛ්‍ය | 10,262 | 11,609 | 13,716 | 15,053 | 16,277 |
| විවිධ | 215,828 | 186,131 | 204,285 | 202,038 | 246,505 |
| **එකතුව** | **4,041,021** | **4,329,441** | **4,597,188** | **5,166,798** | **5,842,022** |

## සාමාන්‍ය රක්ෂණ ව්‍යාපාරයේ වත්කම්

2016 දෙසැම්බර් 31 දිනට සාමාන්‍ය රක්ෂණ ව්‍යාපාරයේ වත්කම්වල සංකේන්ද්‍රණය 20 වගුවෙන් සහ 18 රූප සටහනින් පෙන්නුම් කරයි. 2016 වසරේ දෙසැම්බර් 31 දිනට සාමාන්‍ය රක්ෂණ ව්‍යාපාරයේ මුළු වත්කම් රු. මිලියන 175,745 ක් (2015 : රු. මිලියන 151,177) වූ අතර 2015 වසරේ දෙසැම්බර් 31 දිනට වාර්තා කළ මුළු වත්කම් වටිනාකම හා සැසඳීමේ දී 16.25% ක වැඩිවීමක් වාර්තා කර ඇත.


ලැබිය යුතු ප්‍රතිරක්ෂණ 2016 දී සාමාන්‍ය රක්ෂණ ව්‍යාපාරයේ වත්කම්වල වර්ධනයට හේතු වී ඇත. ස්වභාවික ආපදාවන්ගෙන් දරන ලද හිමිකම්පෑම් සහ අනෙකුත් විශාල ගිනි හිමිකම්පෑම් සමඟ ලැබිය යුතු ප්‍රතිරක්ෂණ 2015 ට සාපේක්ෂව 180% කට වැඩි ප්‍රමාණයකින් ඉහළ ගොස් ඇත. ඒ අනුව, 2015 දී මුළු වත්කම්වලින් 4.63% ක් පමණක් නියෝජනය කළ ලැබිය යුතු ප්‍රතිරක්ෂණ 2016 දී මුළු වත්කම්වලින් 11.18% දක්වා වැඩි වී ඇත.

එමෙන්ම, 2016 දී ජාතික රක්ෂණ භාර අරමුදල ජාතික ස්වභාවික ආපදා යෝජනා ක්‍රමය මත රුපියල් මිලියන 2,600 ක් වූ ලැබිය යුතු ප්‍රතිරක්ෂණ වාර්තා කර ඇත.

රජයේ සුරැකුම්පත්, ලැයිස්තුගත ස්කන්ධ (පරිපාලිත සමාගම් සහ ආශ්‍රිත සමාගම් හැර) සංස්ථා ණය, තැන්පතු සහ ඒකක භාර තුළ ප්‍රධාන මූල්‍ය ආයෝජනයන්හී මුළු වටිනාකම 2015 දී වාර්තා කළ රුපියල් මිලියන 81,896 සිට 2016 දී රුපියල් මිලියන 81,333 දක්වා සුළු වශයෙන් පහත වැටී ඇත.

රජයේ සුරැකුම්පත්වල ආයෝජනය සාමාන්‍ය රක්ෂණ ව්‍යාපාරයේ ප්‍රධාන ආයෝජන වර්ගීකරණය වශයෙන් පැවති අතර, වාර්ෂිකව සුළු වර්ධනයක් වාර්තා කරමින් 2016 දෙසැම්බර් 31 දිනට රුපියල් මිලියන 40,024 ක් (2015 : රුපියල් මිලියන 37,945) ක් විය. පනතෙන් දක්වා ඇති ආකාරයට රක්ෂණ සමාගම් තාක්ෂණික සංචිතවල ආයෝජනවලින් අවම වශයෙන් 20% ක්

**රූපසටහන 18**
**සාමාන්‍ය රක්ෂණ ව්‍යාපාරයේ වත්කම් සංකේන්ද්‍රගතවීම - 2015 සහ 2016 දෙසැම්බර් 31 දිනට**




**වගුව 20**
**2015 සහ 2016 දෙසැම්බර් 31 දිනට වත්කම් සංකේන්ද්‍රගතවීම - සාමාන්‍ය රක්ෂණ ව්‍යාපාරය**

| වත්කම් වර්ගය | 2015 (අ) | | 2016 (ආ) | |
|---|---|---|---|---|
| | රු.'000 | % | රු.'000 | % |
| රජයේ ණය සුරැකුම්පත් | 37,945,076 | 25.10% | 40,023,689 | 22.77% |
| ස්කන්ධ | 38,857,477 | 25.70% | 38,671,251 | 22.00% |
| සංස්ථා ණය | 8,875,048 | 5.87% | 11,653,728 | 6.63% |
| ඉඩම් හා ගොඩනැගිලි | 9,205,309 | 6.09% | 11,929,216 | 6.79% |
| තැන්පතු | 14,252,282 | 9.43% | 10,991,819 | 6.25% |
| ඒකක භාර | 1,830,044 | 1.21% | 1,142,394 | 0.65% |
| රත්රන්වල ආයෝජන | 2,491 | 0.00% | 2,706 | 0.00% |
| ලැබිය යුතු ප්‍රතිරක්ෂණය | 6,994,637 | 4.63% | 19,656,806 | 11.18% |
| ඔප්පුහිමියන්ගෙන් හා අතරමැදියන්ගෙන් ලැබිය යුතු වාරික ආදායම | 15,067,357 | 9.97% | 17,623,296 | 10.03% |
| දේපළ පිරියත හා උපකරණ | 3,923,283 | 2.60% | 4,725,025 | 2.69% |
| අනෙකුත් වත්කම් | 11,823,451 | 7.82% | 16,819,619 | 9.57% |
| මුදල් හා මුදලට සමාන දෑ | 2,400,448 | 1.59% | 2,505,284 | 1.43% |
| **එකතුව** | **151,176,903** | **100%** | **175,744,834** | **100%** |

හෝ රජයේ සුරැකුම්පත්වල ආයෝජනය කරන බවටත් ඉතිරි වත්කම් නීර්ණය කිරීමේ අංක 1 ප්‍රකාරව සිදු කරන බවටත් මණ්ඩලය විසින් වසර පුරාම වගබලා ගන්නා ලදී.

ස්කන්ධ ආයෝජන 2016 දී 22% ක් (2015 : 25.70%) නියෝජනය කළ අතර, එය රුපියල් මිලියන 38.671 ක් (2015 රුපියල් මිලියන 38,857) විය. පිළිවෙලින් රුපියල් මිලියන 21,012 ක් සහ රුපියල් මිලියන 138 ක් වූ පරිපාලිත සමාගම්වල සහ ආශ්‍රිත සමාගම්වල ආයෝජනවලින් ස්කන්ධ ආයෝජන සමන්විත විය. රුපියල් මිලියන 850 ක් වූ වියුක්ත සමාගම්වල ආයෝජන වෙන් කිරීමේ ක්‍රියාවලියේ ප්‍රතිඵලයක් ලෙස පාලිත සමාගම්වල ආයෝජනවලට ඇතුළත් කර ඇත.

සංස්ථා ණය තවදුරටත් ප්‍රධාන ආයෝජන වර්ගීකරණයක්ව පැවති අතර, වාර්ෂිකව 31.31% කින් වර්ධනය වී ඇත. තැන්පතු සහ ඒකකභාරවල ආයෝජන වාර්ෂිකව පිළිවෙලින් 22.88% කින් හා 37.58% කින් සැලකිය යුතු ලෙස පහත වැටී ඇත.

2016 දී රුපියල් මිලියන 17,623 ක් වූ ලැබිය යුතු වාරික ආදායම සාමාන්‍ය රක්ෂණ ව්‍යාපාරයේ මුළු වත්කම්වලින් 10.03%ක් නියෝජනය කරන අතර 2015 වසරට සාපේක්ෂව 16.96%කින් වැඩිවී ඇත.

## සාමාන්‍ය රක්ෂණ ව්‍යාපාරයේ ආයෝජන ආදායම

2016 සහ 2015 වසර සඳහා සවිස්තරාත්මක ආයෝජන ආදායම සහ ආයෝජනයේ සාමාන්‍යය පිළිබඳ විස්තර 21 වැනි වගුවෙන් පෙන්වා දේ. සාමාන්‍ය රක්ෂණ ව්‍යාපාරයේ සාමාන්‍ය ආයෝජනය 2016 දී රුපියල් මිලියන 115,644 ක් වූ අතර 2015 දී වාර්තා කළ රුපියල් මිලියන 120,121 ට සාපේක්ෂව 3.37% කින් එය අඩුවී ඇත. 2016 වසර තුළ පැවති අභියෝගාත්මක ආර්ථික කොන්දේසි සමඟ, සාමාන්‍ය රක්ෂණ වෙළෙඳපොල රුපියල් මිලියන 13,802ක (2015:රුපියල් මිලියන 6,785) ආයෝජන ආදායමක් වාර්තා කළ අතර එය 11.94% ක (2015:5:65%) සමස්ත ආයෝජන ආදායමකට හේතු වී ඇත.

ආයෝජන ආදායමෙහි වර්ධනයට 2016 දී ස්කන්ධ ආයෝජනයෙන් උපයන ලද රුපියල් මිලියන 8,315 ක ලාභාංශ ආදායම ප්‍රධාන වශයෙන් හේතු විය. මෙම ලාභාංශ ආදායම රක්ෂකයෙකුගේ ලැයිස්තුගත නොකළ පරිපාලිත සමාගමේ ආයෝජනයෙන් වාර්තා කරන ලදී. ඉහත සඳහන් ලාභාංශ ආදායම හැර, සමස්ත ලැයිස්තුගත ස්කන්ධ වෙළෙඳපොල 2016 දී දුර්වල කාර්යසාධනයක් පෙන්වන ලදී. ආයතනික ණය තවදුරටත් 10.63% ක ආයෝජන ඵලදාවක් සමඟ ආකර්ශනියව පැවතිණ. ආයතනික ණයවල සාමාන්‍ය ආයෝජනය 2015 දී වාර්තා කළ රුපියල් මිලියන 8,420 ට සාපේක්ෂව 2016 දී රුපියල් මිලියන 10,264 දක්වා වැඩි වී ඇත.

සාමාන්‍ය රක්ෂණ ව්‍යාපාරයේ විශාලතම අයෝජන කාණ්ඩය වූයේ රුපියල් මිලියන 41,373 ක (2015:රුපියල් මිලියන 37,141) ආයෝජන ඵලදාවක් වාර්තා කළ රජයේ සුරැකුම්පත්වල ආයෝජන කිරීමයි. එකී ආයෝජනයෙන් උත්පාදිත ආදායම රුපියල් මිලියන

**වගුව 21**
**සවිස්තරාත්මක ආයෝජන ආදායම සහ සාමාන්‍ය ආයෝජන - සාමාන්‍ය රක්ෂණ ව්‍යාපාරය**

| වර්ගය | 2015 (අ) | | | 2016 (අ) | | |
|---|---|---|---|---|---|---|
| | ආයෝජිත ආදායම (රු. '000) | සාමාන්‍ය ආයෝජන (රු. '000) | ආයෝජන ඵලදා අනුපාතය (%) | ආයෝජිත ආදායම (රු. '000) | සාමාන්‍ය ආයෝජන (රු. '000) | ආයෝජන ඵලදා අනුපාතය (%) |
| **රජයේ ණය සුරැකුම්පත්** | 2,781,455 | 37,141,315 | 7.79 | 3,606,681 | 41,373,424 | 8.72 |
| - භාණ්ඩාගාර බැඳුම්කර | 1,752,572 | | | 2,280,620 | | |
| - භාණ්ඩාගාර බිල්පත් | 269,009 | | | 389,743 | | |
| - වෙනත් (රිපෝ) | 759,874 | | | 936,318 | | |
| **ස්කන්ධ** | 1,193,471 | 43,368,459 | 2.75 | 7,592,784 | 38,764,364 | 19.59 |
| - ප්‍රාග්ධන ලාභ/ අලාභ | 95,623 | | | (721,850) | | |
| - ලාභාංශ | 1,097,848 | | | 8,314,634 | | |
| **සංස්ථා ණය** | 973,871 | 8,420,483 | 11.57 | 1,091,382 | 10,264,388 | 10.63 |
| - ණයකර | 952,410 | | | 1,069,242 | | |
| - වාණිජ පත්‍රිකා හා වෙනත් | 21,460 | | | 22,140 | | |
| **ඉඩම් හා ගොඩනැගිලි** | 6,050 | 10,600,939 | 0.06 | 5,000 | 10,567,263 | 0.05 |
| **තැන්පතු** | 1,042,428 | 17,504,150 | 5.96 | 1,055,745 | 12,622,051 | 8.36 |
| - බැංකු | 815,653 | | | 867,690 | | |
| - මූල්‍ය සමාගම් | 226,775 | | | 188,055 | | |
| **ඒකක භාරය** | 142,907 | 2,096,078 | 6.82 | 93,396 | 1,486,219 | 6.28 |
| **රත්රන්** | - | 56,491 | - | - | 2,599 | |
| **වෙනත්** | 644,947 | 933,475 | 69.09 | 357,120 | 563,319 | 63.40 |
| **එකතුව** | **6,785,129** | **120,121,390** | **5.65** | **13,802,108** | **115,643,627** | **11.94** |

**වගුව 22**

**2016 දෙසැම්බර් 31වන දිනට රක්ෂණ සමාගම්වල නුබුන්වත්බව සමාගම් අනුව විශ්ලේෂණය - සාමාන්‍ය රක්ෂණ ව්‍යාපාරය**

| රක්ෂකයා | 2016 දෙසැම්බර් 31වන දිනට (ඇ) | | |
|---|---|---|---|
| | පූර්ණ පවත්නා ප්‍රාග්ධනය -TAC (රු. 000) | නියමිත අවදානම් ප්‍රාග්ධනය - RCR (රු. 000) | ප්‍රමාණවත් ප්‍රාග්ධන අනුපාතය – CAR (%) |
| අලියාන්ස් ජෙනරල් | 716,952 | 561,811 | 128% |
| අමානා ජෙනරල් | 642,596 | 230,434 | 279% |
| ෆෙයාර්ෆස්ට් | 693,250 | 500,678 | 138% |
| සෙලින්කෝ ජෙනරල් | 4,927,626 | 2,881,910 | 171% |
| කොන්ටිනෙන්ටල් | 981,939 | 362,136 | 271% |
| කොපරේටිව් ජෙනරල් | 947,299 | 694,984 | 136% |
| එච්එන්බී ජෙනරල් | 745,532 | 444,704 | 168% |
| ජනශක්ති ජෙනරල් | 5,303,227 | 2,870,381 | 185% |
| එල්ඕඑල්සී ජෙනරල් | 1,087,551 | 546,416 | 199% |
| එම්බීඑස්එල් | (112,016) | 393,947 | -28% |
| ඔරියන්ට් | 524,830 | 219,733 | 239% |
| පීපල්ස් | 2,642,587 | 817,615 | 323% |
| සණස | 144,816 | 81,599 | 177% |
| එස්එල්අයිසී | 24,371,298 | 13,970,143 | 174% |
| යුනියන් ජෙනරල් | 1,894,126 | 1,280,347 | 148% |
| **එකතුව** | **45,511,612** | **25,856,839** | **181%** |

3,607 ක් (2015:රුපියල් මිලියන 2,781) වූ අතර 2015 දී වාර්තා කළ 7.49%ට වඩා සුළු වැඩිවීමක් සමගින් 8.72% ක සමස්ත ආයෝජන ඵලදාවක් සඳහා හේතු විය.

බැංකු සහ මූල්‍ය ආයතනවල තැන්පතුවල සාමාන්‍ය ආයෝජනය රු. මිලියන 12,622 ක් වූ අතර 2015 වසරේ දී වාර්තා කළ රු. මිලියන 17,504 හා සැසඳීමේ දී සැලකිය යුතු ලෙස අඩුවී ඇත. තැන්පතුවලින් රුපියල් මිලියන 1,056 ක (2016: රු. මිලියන 1,042) ආයෝජන ආදායමක් උත්පාදනය කළ අතර පොලී අනුපාතවල වැඩිවීමත් සමඟ 2016 දී 8.36% ක (2015:5.96%) ආයෝජන ඵලදාවක් වාර්තා කරන ලදී.

## රක්ෂණ සමාගම්වල නුබුන්වත්භාවය - සාමාන්‍ය රක්ෂණ ව්‍යාපාරය

2016 දී, ශ්‍රී ලංකා රක්ෂණ මණ්ඩලය විසින් අධීක්ෂණ හා නියාමන පාලන වැඩපිළිවෙල ශක්තිමත් කිරීමේ අරමුණ ඇතිව අවදානම පදනම් ප්‍රාග්ධන වැඩපිළිවෙල ක්‍රියාත්මක කරන ලදී.

22 වැනි වගුව මගින් 2016 දෙසැම්බර් 31 දිනට සාමාන්‍ය රක්ෂණ ව්‍යාපාරයේ පූර්ණ පවත්නා ප්‍රාග්ධනය (TAC), නියමිත අවදානම් ප්‍රාග්ධනය (RCR) හා ප්‍රමාණවත් ප්‍රාග්ධන අනුපාතය (CAR) පිළිබඳ විස්තර ලබා දේ. ක්ෂේත්‍රයේ සාමාන්‍ය ප්‍රමාණවත් ප්‍රාග්ධන අනුපාතය 2016 දෙසැම්බර් 31 දිනට 181% ක් විය. සමාගම් දෙකක් හැර සියලුම රක්ෂණ සමාගම් 2016 දෙසැම්බර් 31 දිනට 120% ක අවම ප්‍රමාණවත් ප්‍රාග්ධන අනුපාතය සහ රුපියල් මිලියන 500ක අවම පූර්ණ පවත්නා ප්‍රාග්ධන අවශ්‍යතාවයට අනුකූල වී ඇත.

**වගුව 23**

**2016 දෙසැම්බර් 31 දිනට පූර්ණ පවත්නා ප්‍රාග්ධනය (TAC) සමාගම් අනුව විශ්ලේෂණය සාමාන්‍ය රක්ෂණ ව්‍යාපාරය**

| රක්ෂකයා | 2016 දෙසැම්බර් 31වන දිනට (ඇ) | | | |
|---|---|---|---|---|
| | පළමු පෙළ ප්‍රාග්ධනය (රු. 000) | දෙවන පෙළ ප්‍රාග්ධනය (රු. 000) | අඩුකිරීම් (රු. 000) | පූර්ණ පවත්නා ප්‍රාග්ධනය (රු. 000) |
| අලියාන්ස් ජෙනරල් | 999,002 | - | 282,050 | 716,952 |
| අමානා ජෙනරල් | 1,713,037 | 234,332 | 1,304,773 | 642,596 |
| ෆෙයාර්ෆස්ට් | 835,174 | - | 141,924 | 693,250 |
| සෙලින්කෝ ජෙනරල් | 8,844,082 | - | 3,916,456 | 4,927,626 |
| කොන්ටිනෙන්ටල් | 1,185,551 | - | 203,612 | 981,939 |
| කෝපරේටිව් ජෙනරල් | 1,482,620 | 252,906 | 788,228 | 947,299 |
| එච්එන්බී ජෙනරල් | 931,186 | - | 185,654 | 745,532 |
| ජනශක්ති ජෙනරල් | 7,441,407 | 130,046 | 2,268,227 | 5,303,227 |
| එල්ඕඑල්සී ජෙනරල් | 1,175,044 | - | 87,493 | 1,087,551 |
| එම්බීඑස්එල් | 62,351 | (16,373) | 157,994 | (112,016) |
| ඔරියන්ට් | 608,852 | - | 84,022 | 524,830 |
| පීපල්ස් | 2,714,485 | - | 71,899 | 2,642,587 |
| සණස | 254,324 | 2,873 | 112,381 | 144,816 |
| එස්එල්අයිසී | 40,464,696 | 8,200,354 | 24,293,751 | 24,371,298 |
| යුනියන් ජෙනරල් | 3,962,665 | - | 2,068,539 | 1,894,126 |
| **එකතුව** | **72,674,477** | **8,804,139** | **35,967,005** | **45,511,611** |

**වගුව 24**

**2016 දෙසැම්බර් 31 දිනට නියමිත අවදානම් ප්‍රාග්ධනය සමාගම් අනුව විශ්ලේෂණය - සාමාන්‍ය රක්ෂණ ව්‍යාපාරය**

| රක්ෂකයා | 2016 දෙසැම්බර් 31වන දිනට (ආ) | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|
| | ණය අවදානම (රු. 000) | සම්බන්ධතා අවදානම (රු. 000) | වෙළෙඳපොළ අවදානම (රු. 000) | ප්‍රතිරක්ෂණ අවදානම (රු. 000) | වගකීම් අවදානම (රු. 000) | මෙහෙයුම් අවදානම (රු. 000) | විවිධාංගීකරණයට පෙර මුළු අවදානම් ප්‍රාග්ධන අයකිරීම (රු. 000) | විවිධාංගීක රණයට පසු මුළු අවදානම් ප්‍රාග්ධන අයකිරීම (රු. 000) |
| අලියාන්ස් ජෙනරල් | 2,180 | 237,304 | 125,373 | 20,422 | 406,967 | 39,619 | 831,864 | 561,811 |
| අමානා ජෙනරල් | 15,513 | 140,204 | 27,537 | 6,822 | 127,351 | 27,433 | 344,861 | 230,434 |
| ෆෙයාර්ෆස්ට් | - | 316,750 | 25,965 | 2,586 | 361,380 | 29,165 | 735,846 | 500,678 |
| සෙලින්කෝ ජෙනරල් | 90,887 | 1,157,908 | 995,151 | 160,111 | 1,577,597 | 192,609 | 4,174,263 | 2,881,910 |
| කොන්ටිනෙන්ටල් | 30,840 | 89,610 | 113,388 | 25,043 | 251,418 | 30,216 | 540,514 | 362,136 |
| කෝපරේටිව් ජෙනරල් | 46,195 | 297,635 | 271,396 | 8,005 | 305,284 | 37,250 | 965,766 | 694,984 |
| එච්එන්බී ජෙනරල් | 32,197 | 147,137 | 123,060 | 12,596 | 312,514 | 29,638 | 657,142 | 444,704 |
| ජනශක්ති ජෙනරල් | 227,382 | 653,929 | 1,584,176 | 81,982 | 1,311,500 | 171,627 | 4,030,597 | 2,870,381 |
| එල්ඕඑල්සී ජෙනරල් | 5,119 | 116,550 | 247,856 | 17,959 | 383,579 | 35,969 | 807,031 | 546,416 |
| එම්බීඑස්එල් | 7,643 | 319,052 | 19,556 | 19,040 | 147,104 | 10,870 | 523,264 | 393,947 |
| ඔරියන්ට් | 20,370 | 130,676 | 39,334 | 10,125 | 88,783 | 14,058 | 303,347 | 219,733 |
| පීපල්ස් | 93,365 | 73,974 | 375,411 | 7,187 | 601,762 | 62,820 | 1,214,520 | 817,615 |
| සණස | 3,355 | 24,241 | 46,220 | 3,161 | 26,624 | 4,916 | 108,517 | 81,599 |
| එස්එල්අයිසී | 129,353 | 6,889,726 | 6,599,729 | 101,869 | 2,540,763 | 672,625 | 16,934,066 | 13,970,143 |
| යුනියන් ජෙනරල් | 29,950 | 362,984 | 449,803 | 169,577 | 778,664 | 90,518 | 1,881,495 | 1,280,347 |
| **එකතුව** | **734,348** | **10,957,679** | **11,043,956** | **646,485** | **9,221,289** | **1,449,335** | **34,053,093** | **25,856,838** |

ශ්‍රී ලංකා රක්ෂණ මණ්ඩලය විසින් මෙම අවශ්‍යතාවන්ට අනුකූල නොවන සමාග ම්වලට එරෙහිව සුදුසු පියවර ගෙන ඇත. එමෙන්ම, 120% ට ඉහළ ප්‍රමාණවත් ප්‍රාග්ධන අනුපාතය සමඟ අඩු ආන්තික සහිත සමාගම් RBC පිළිබඳ බලාත්මක කිරීමේ ක්‍රමෝපාය ප්‍රකාරව සමීපව අධීක්ෂණය කරන ලදී.

## රක්ෂණ සමාගම්වල පූර්ණ පවත්නා ප්‍රාග්ධන (TAC) අවශ්‍යතාව - සාමාන්‍ය රක්ෂණ ව්‍යාපාරය

23 වැනි වගුව මගින් 2016 දෙසැම්බර් 31 දිනට තනි තනි සාමාන්‍ය රක්ෂණ සමාගම් විසින් වාර්තා කළ පළමු පෙළ ප්‍රාග්ධනය, දෙවන පෙළ ප්‍රාග්ධනය, අඩුකිරීම් සහ පූර්ණ පවත්නා ප්‍රාග්ධනය විස්තර කරයි. සමාගම් විසින් නිකුත්කළ සහ සම්පූර්ණයෙන් ගෙවූ සාමාන්‍ය කොටස්, ප්‍රාග්ධන සංචිත සහ රඳවාගත් ඉපයීම් සඳහා අනිකුත් ගැලපීම් නියෝජනය කරන පළමු පෙළ ප්‍රාග්ධනය 2016 දී රුපියල් මිලියන 72,674 ක් විය. නියමය අනුව, දෙවන පෙළ ප්‍රාග්ධනය, පළමු පෙළ ප්‍රාග්ධනයෙන් 50% ඉක්මවිය නොහැක. එසේවුවත්, අඩුකිරීම් රුපියල් මිලියන 35,967 ක් වූ සැලකිය යුතු මට්ටමක පැවතුණි. මෙම අඩුකිරීම් නොපිළිගතහැකි ණය සහ අත්තිකාරම්, පෙර ගෙවීම්, තොග, ඔඩපන වත්කම්, විලම්භිත ආදායම් බදු වත්කම් යනාදියෙන් සමන්විත වේ.

## රක්ෂණ සමාගම් විසින් දරන අවදානම් අයකිරීම් සැසැඳීම - සාමාන්‍ය රක්ෂණ ව්‍යාපාරය

24 වැනි වගුව මගින් අවදානම් පදනම් ප්‍රාග්ධන අවශ්‍යතාවට අදාළ වන්නා වූ විවිධ අවදානම් අයකිරීම් පිළිබඳව සමාගම් අනුව සංයුතිය පෙන්නුම් කරයි. තරමක් ඉහල පොළී අනුපාත වාතාවරණයත් සමඟ, වෙළෙඳපොළ අවදානම 2016 දී විවිධාංගීකරණයට පෙර මුළු අවදානම් ප්‍රාග්ධන අයකිරීම්වලින් 32.43% ක් නියෝජනය කරන ලදී. සමාගම් කිහිපයකට පිළිගතහැකි ප්‍රතිශත ඉක්මවමින් ඉඩම් හා ගොඩනැගිලි වැනි ආයෝජන කෙරෙහි ඉහළ සංකේන්ද්‍රණයක් තිබුණු අතර, එය රුපියල් මිලියන 10,958 දක්වා සමස්ත සම්බන්ධතා අවදානම් අයකිරීම්වල වැඩිවීමකට හේතු විය. වාරික වගකීම් සහ හිමිකම්පෑම් වගකීම සමන්විත වන වගකීම් අවදානම් අයකිරීම මුළු අවදානම් අයකිරීම්වලින් 27.08% ක් නියෝජනය කරන ලදී.

ණය අවදානම් අයකිරීම සාපේක්ෂ වශයෙන් අඩු වූ අතර සාමාන්‍ය රක්ෂණ සමාගම් ප්‍රමිත සහ තරමක් අඩු අවදානම් ආයෝජනයන්හී ප්‍රධාන වශයෙන් ආයෝජනය කර ඇත. ප්‍රතිරක්ෂණ අවදානමද රුපියල් මිලියන 646 ක අඩු අවදානම් අයකිරීමක් වාර්තා කරන ලදී.

## නව, අලුත් කළ සහ පවත්නා රක්ෂණ ඔප්පු පිළිබඳ විස්තර සාමාන්‍ය රක්ෂණ ව්‍යාපාරය

25 වන වගුවේ පෙන්වන පරිදි, සාමාන්‍ය රක්ෂණ ව්‍යාපාරයේ දැනට ක්‍රියාත්මක මුළු රක්ෂණ ඔප්පු සංඛ්‍යාව 2015 වසර අවසානයට වාර්තා කළ ඔප්පු 5,049,846 ට සාපේක්ෂව 2016 දී 5,647,512 ක් වූ අතර 2015 වසරේදී වාර්තා කළ ප්‍රමාණය හා සැසැඳීමේදී 11.84% ක වර්ධනයක් නියෝජනය කරන ලදී. 2016 දී මෝටර් රථවාහන රක්ෂණය ක්‍රියාත්මකව පැවති රක්ෂණ ඔප්පුවලින් 88.70% ක් නියෝජනය කළ අතර එය 2,627,651 ක් වූ තුන්වැනි

**වගුව 25**

**නව, අලුත් කළ සහ ක්‍රියාත්මකව ඇති රක්ෂණ ඔප්පු පිළිබඳ විස්තර - සාමාන්‍ය රක්ෂණ ව්‍යාපාරය**

| | 2015 | | | 2016 | | |
|---|---|---|---|---|---|---|
| | නව ඔප්පු | අලුත් කළ ඔප්පු | වසර අවසානයට ක්‍රියාත්මක ඔප්පු | නව ඔප්පු | අලුත් කළ ඔප්පු | වසර අවසානයට ක්‍රියාත්මක ඔප්පු |
| ගිනි | 79,430 | 164,512 | 199,257 | 104,523 | 182,708 | 236,422 |
| මුහුදු | 158,616 | 18,893 | 149,844 | 165,754 | 24,821 | 162,518 |
| මෝටර් රථ වාහන | 1,994,966 | 2,561,100 | 4,504,969 | 2,250,464 | 2,882,007 | 5,009,271 |
| 3වැනි පාර්ශ්වය පමණක් | 1,074,995 | 1,392,811 | 2,464,924 | 1,168,151 | 1,452,760 | 2,627,651 |
| විස්තීර්ණ | 919,971 | 1,168,289 | 2,040,045 | 1,082,313 | 1,429,247 | 2,381,620 |
| සෞඛ්‍ය | 8,012 | 7,718 | 13,990 | 8,829 | 7,377 | 15,401 |
| විවිධ | 140,756 | 55,282 | 181,786 | 187,055 | 78,094 | 223,900 |
| **එකතුව** | **2,381,780** | **2,807,505** | **5,049,846** | **2,716,625** | **3,175,007** | **5,647,512** |

පාර්ශ්ව රක්ෂණ ඔප්පු සහ 2,381,620 ක් වූ විස්තීරණ ඔප්පුවලින් සමන්විත විය. ක්‍රියාත්මකව පැවති ගිණි රක්ෂණ ඔප්පු ප්‍රමාණය 2015 වසර අවසානයේදී වාර්තා කළ 199,257 ප්‍රමාණයේ සිට 2016 දී 236,422 දක්වා වැඩි වී ඇත. වසර තුළ, රක්ෂණ සමාගම් නව ඔප්පු 2,716,625 ක් ලියා ඇති අතර, එය පසුගිය වසරට සාපේක්ෂව 14.06% කින් වැඩි වී ඇත. රක්ෂණ ඔප්පු 2015 වසරේදී අළුත් කළ ඔප්පු 2,807,505 ට සාපේක්ෂව 2016 වසර තුළ ඔප්පු 3,175,007 ක් අළුත් කරනු ලැබ ඇත.

## ප්‍රතිරක්ෂණ ව්‍යාපාරය

ජාතික රක්ෂණ භාර අරමුදල ප්‍රාථමික රක්ෂකයින්ට ප්‍රතිරක්ෂණ ආවරණ ලබාදෙන ශ්‍රී ලංකාවේ එකම ආයතනය ලෙස ක්‍රියාත්මක වේ. සියලුම ප්‍රාථමික රක්ෂකයින් විසින් 2012 දෙසැම්බර් 31 දිනැති අංක 1791/4 දරන රජයේ ගැසට් නිවේදනය අනුව සෑම සාමාන්‍ය ප්‍රතිරක්ෂණයෙන් ඇතිවන ඔවුන්ගේ මුළු වගකීමෙන් 30% ක් ජාතික රක්ෂණ භාර අරමුදලට පවරාදීම අනිවාර්ය වේ.

2016 වසර තුළ, ජාතික රක්ෂණ භාර අරමුදල ප්‍රතිරක්ෂණ වාරික ආදායම ලෙස රුපියල් මිලියන 2,357 ක් උපයාගෙන ඇති අතර එය 2015 දී උපයන ලද රුපියල් මිලියන 1,738 ට සාපේක්ෂව 35.64% කින් වැඩිවීමකි. වාරික ආදායමෙහි මෙම වැඩිවීමට සාමාන්‍ය රක්ෂණ ව්‍යාපාරයේ විවිධ උපපන්තීන් පුළුල් පරාශයකින් ප්‍රතිරක්ෂණ ව්‍යාපාරය පිළිගැනීම ප්‍රධාන වශයෙන් හේතු විය.

ජාතික රක්ෂණ භාර අරමුදල රුපියල් මිලියන 384 ක පිරිවැයක් ඇතුළුව 2016 වසර තුළ පිළිගත් ප්‍රතිරක්ෂණ වගකීම් සඳහා ආපසු පවරාදීමේ ප්‍රතිරක්ෂණ වැඩපිළිවෙලක් ක්‍රියාත්මක කර ඇත.

2016 වසර තුළ, සාමාන්‍ය රක්ෂණ ව්‍යාපාරයේ ප්‍රතිරක්ෂණ ආදායම 14.12% කින් වැඩි වී ඇති අතර එය රුපියල් මිලියන 11,980 ක් (2015:රුපියල් මිලියන 10,419) විය. මෙයට ප්‍රධාන වශයෙන් හේතු වූයේ විශේෂයෙන් ගිනි රක්ෂණ ව්‍යාපාරයෙහි රඳවාගැනීමේ මට්ටම අඩුවීමයි.

ජාතික රක්ෂණ භාර අරමුදලේ ප්‍රතිරක්ෂණ ව්‍යාපාරය විසින් දරන ලද මුළු වත්කම් 2016 දෙසැම්බර් 31 දිනට රුපියල් මිලියන 5,915 ක් වූ අතර, 2015 වසර අවසානයේදී වාර්තාකළ රුපියල් මිලියන 3,604 ක් වූ වත්කම් වටිනාකමට සාපේක්ෂව 64.12% කින් වැඩිවිය. 2016 වසර අවසානයට, ජාතික රක්ෂණ භාර අරමුදලේ ප්‍රතිරක්ෂණ ව්‍යාපාරය රුපියල් මිලියන 1,863 ක් (2015 : රුපියල් මිලියන 2,915) රජයේ සුරැකුම්පත්වල ආයෝජනය කොට ඇති අතර, ඉන් රුපියල් මිලියන 221 ක (2015 : රුපියල් මිලියන 186) ආයෝජන ආදායමක් උත්පාදනය කරන ලදී. ඉහළ හිමිකම්පෑම් හේතුකොට ගෙන වසර තුල රජයේ ණය සුරැකුම්පත්වල සිදුකළ ආයෝජනය අඩු විය.

2016 වසර තුළ, ජාතික රක්ෂණ භාර අරමුදල ප්‍රතිරක්ෂණ හිමිකම්පෑම් 295 ක් ලද අතර ගෙවන ලද දළ හිමිකම්පෑම් රුපියල් මිලියන 6,832 ක් විය. එමෙන්ම, 2016 දී දරන ලද ශුද්ධ හිමිකම්පෑම් රුපියල් මිලියන 3,432 ක් (2015:රුපියල් මිලියන 1,243) වූ අතර එය 195.37% ක (2015:67.41%) හිමිකම්පෑම් අනුපාතයකට හේතු විය. 2016 මැයි මස රට තුළ පැවති දරුණු ගංවතුර තත්ත්වය මෙයට ප්‍රධාන වශයෙන් හේතු විය.

ජාතික රක්ෂණ භාර අරමුදලේ ප්‍රතිරක්ෂණ ව්‍යාපාරය දරන ලද වියදම් 2015 දී දරන ලද රුපියල් මිලියන 507 ට වඩා 14.55% ක වැඩිවීමක් වාර්තා කරමින් 2016 වසර තුළ රුපියල් මිලියන 581 ක් වූ අතර එය 33.01 %ක (2015 : 27.5%) වියදම් අනුපාතයකට හේතු විය. ඒ අනුව, හිමිකම්පෑම් අනුපාතය සහ වියදම් අනුපාතයේ එකතුව වන ඒකාබද්ධ අනුපාතය 2015 දී වාර්තා කළ 94.91% ට වඩා 133.47% කින් සැලකිය යුතු ලෙස වැඩි වී 228.38% ක් විය. මෙම ඒකාබද්ධ අනුපාතය වැඩිවීමට 2016 වසරේදී මුහුණ පෑ ගංවතුර වෙනුවෙන් දරන ලද හිමිකම්පෑම් සහ වියදම් හේතු විය.

## රක්ෂණ තැරැව්කාර සමාගම්

2016 වසර තුළ දී රක්ෂණ තැරැව්කාර සමාගම් පනස් අටක් වෙළෙඳපොල තුළ ක්‍රියාත්මක වූ අතර රුපියල් මිලියන 17,781 ක් වූ දළ ලිඛිත වාරික ආදායමක් උත්පාදනය කළේය. ඒ අනුව රක්ෂණ තැරැව්කාර සමාගම් හරහා උත්පාදිත මුළු දළ ලිඛිත වාරික ආදායම 2015 වසරේ දී උත්පාදිත රුපියල් මිලියන 16,330 හා සැසඳීමේ දී 2016 දී 8.89% ක වර්ධනයක් වාර්තා කළේය. පිළිවෙලින් රුපියල් මිලියන 263 ක් සහ රුපියල් මිලියන 17,518 ක් වූ දීර්ඝ කාලීන

රක්ෂණ ව්‍යාපාරය සහ සාමාන්‍ය රක්ෂණ ව්‍යාපාරය හරහා උත්පාදිත වාරික ආදායම මෙම මුළු දළ ලිඛිත වාරික ආදායමට ඇතුලත් විය. රක්ෂණ තැරැව්කාර සමාගම් හරහා උත්පාදිත මුළු දළ ලිඛිත වාරික ආදායමෙන් 98.52% ක් සාමාන්‍ය රක්ෂණ ව්‍යාපාරයේ දළ ලිඛිත වාරික ආදායම නියෝජණය කළ අතර දිර්ඝ කාලීන රක්ෂණ ව්‍යාපාරය නිරූපණය කළේ 1.48% ප්‍රමාණයක් පමණි.

පසුගිය වසර කිහිපය හා සමානවම, 2016 වසර තුළදී දීර්ඝ කාලීන රක්ෂණ ව්‍යාපාරය කෙරෙහි රක්ෂණ තැරැව්කාර සමාගම්වල දායකත්වය එතරම් සැලකිය යුතු අගයක් නොවූ අතර රක්ෂණ තැරැව්කාර සමාගම්වලින් උත්පාදනය කර ඇත්තේ දීර්ඝ කාලීන රක්ෂණ ව්‍යාපාරයේ මුළු දළ ලිඛිත වාරික ආදායමෙන් 0.41% ක් (රුපියල් මිලියන 63,495) පමණි. රක්ෂණ තැරැව්කාර සමාගම් සාමාන්‍ය රක්ෂණ ව්‍යාපාරයේ මුළු දළ ලිඛිත වාරික ආදායමෙන් 22.04% ක් උත්පාදනය කර ඇති අතර (වර්ජන, කැරලි කෝලාහල, සිවිල් කැළඹීම් හා ත්‍රස්තවාදය වාරික ආදායම ඇතුළුව) එය රුපියල් මිලියන 79,474 ක් විය.


2016 වසරේ දී රක්ෂණ තැරැව්කාර සමාගම් විසි පහක් අතුරින් එක් එක් සමාගම රුපියල් මිලියන 100 ඉක්මවන දළ ලිඛිත වාරික ආදායමක් ප්‍රසම්පාදනය කළ අතර, මෙම රක්ෂණ තැරැව්කරුවන් සාමූහිකව රුපියල් මිලියන 16,722 ක දළ ලිඛිත වාරික ආදායමක් උත්පාදනය කළේය. 26 වැනි වගුවෙන් නිරූපණය කර ඇති පරිදි ඉතිරි රක්ෂණ තැරැව්කාර සමාගම් තිස් තුන රුපියල් මිලියන 1,059 ක් උත්පාදනය කර ඇත.

**වගුව 26**

**රක්ෂණ තැරැව්කාර සමාගම් හරහා ජනනය කළ දළ ලිඛිත වාරික ආදායම - 2016**

| | | දළ ලිඛිත වාරික ආදායම(*) | | | | | |
|---|---|---|---|---|---|---|---|
| | | දිගුකාලීන රක්ෂණ ව්‍යාපාරය | | සාමාන්‍ය රක්ෂණ ව්‍යාපාරය | | එකතුව | |
| | රක්ෂණ තැරැව්කාර සමාගමේ නම | රු.('000) | වෙළඳපොළ කොටස (%) | රු.('000) | වෙළඳපොළ කොටස (%) | රු.('000) | වෙළඳපොළ කොටස (%) |
| 1 | ඒඩීඉසෙඩ් ඉන්ෂුවරන්ස් බ්‍රෝකර්ස් (ප්‍රයිවට්) ලිමිටඩ් | 13,896 | 5.29 | 399,937 | 2.28 | 413,833 | 2.33 |
| 2 | එයිට්කන් ස්පෙන්ස් ඉන්ෂුවරන්ස් බ්‍රෝකර්ස් (ප්‍රයිවට්) ලිමිටඩ් | 779 | 0.30 | 472,843 | 2.70 | 473,622 | 2.66 |
| 3 | ඇල්ෆින්කෝ ඉන්ෂුවරන්ස් බ්‍රෝකර්ස් (ප්‍රයිවට්) ලිමිටඩ් | 126 | 0.05 | 613,059 | 3.50 | 613,185 | 3.45 |
| 4 | ඇලියන් ඉන්ෂුවරන්ස් බ්‍රෝකර්ස් (ප්‍රයිවට්) ලිමිටඩ් | 21,812 | 8.30 | 85,599 | 0.49 | 107,411 | 0.60 |
| 5 | ඇසට්ලයින් ඉන්ෂුවරන්ස් බ්‍රෝකර්ස් ලිමිටඩ් | | - | 1,303,079 | 7.44 | 1,303,079 | 7.33 |
| 6 | සීඑෆ් ඉන්ෂුවරන්ස් බ්‍රෝකර්ස් (ප්‍රයිවට්) ලිමිටඩ් | 150 | 0.06 | 2,429,095 | 13.87 | 2,429,245 | 13.67 |
| 7 | කොලොම්බෝ ඉන්ෂුවරන්ස් බ්‍රෝකර්ස් (ප්‍රයිවට්) ලිමිටඩ් | 5,745 | 2.19 | 221,790 | 1.27 | 227,535 | 1.28 |
| 8 | කොමර්ෂල් ඉන්ෂුවරන්ස් බ්‍රෝකර්ස් (ප්‍රයිවට්) ලිමිටඩ් | 45,467 | 17.30 | 2,231,903 | 12.74 | 2,277,370 | 12.81 |
| 9 | ඩෙල්මේජ් ඉන්ෂුවරන්ස් බ්‍රෝකර්ස් (ප්‍රයිවට්) ලිමිටඩ් | 21,174 | 8.06 | 981,334 | 5.60 | 1,002,508 | 5.64 |
| 10 | ඊඒජී- ආර්එම්එස් ඉන්ෂුවරන්ස් බ්‍රෝකර්ස් (ප්‍රයිවට්) ලිමිටඩ් | | - | 118,583 | 0.68 | 118,583 | 0.67 |
| 11 | ඉක්විටි ඉන්ෂුවරන්ස් බ්‍රෝකර්ස් (ප්‍රයිවට්) ලිමිටඩ් | | - | 104,787 | 0.60 | 104,787 | 0.59 |
| 12 | එසාජි කර්ම්ජී ඉන්ෂුවරන්ස් බ්‍රෝකර්ස් (ප්‍රයිවට්) ලිමිටඩ් | 20,742 | 7.89 | 397,284 | 2.27 | 418,026 | 2.35 |
| 13 | ෆින්ලේ ඉන්ෂුවරන්ස් බ්‍රෝකර්ස් (ප්‍රයිවට්) ලිමිටඩ් | 22,758 | 8.66 | 1,388,300 | 7.93 | 1,411,058 | 7.94 |
| 14 | ෆෝසයිට් ඉන්සුවරන්ස් ඇන්ඩ් රීඉන්සුවරන්ස් බ්‍රෝකර්ස් (ප්‍රයිවට්) ලිමිටඩ් | | - | 433,209 | 2.47 | 433,209 | 2.44 |
| 15 | ග්ලෝබල් ඉන්ෂුවරන්ස් බ්‍රෝකර්ස් ඇන්ඩ් සර්විසස් (ප්‍රයිවට්) ලිමිටඩ් | 68 | 0.03 | 116,011 | 0.66 | 116,079 | 0.65 |
| 16 | ලයිෆ් ඇන්ඩ් ජෙනරල් ඉන්ෂුවරන්ස් බ්‍රෝකර්ස් සෙලෝන් (ප්‍රයිවට්) ලිමිටඩ් | 1,125 | 0.43 | 195,184 | 1.11 | 196,310 | 1.10 |
| 17 | මර්කන්ටයිල් ඉන්සුවරන්ස් බ්‍රෝකර්ස් (ප්‍රයිවට්)ලිමිටඩ් | | - | 292,692 | 1.67 | 292,692 | 1.65 |
| 18 | නේෂන්ස් ඉන්ෂුවරන්ස් බ්‍රෝකර්ස් ලිමිටඩ් | 6,608 | 2.51 | 1,309,517 | 7.48 | 1,316,125 | 7.40 |
| 19 | ප්‍රෝකෙයා ඉන්ෂුවරන්ස් බ්‍රෝකර්ස් (ප්‍රයිවට්) ලිමිටඩ් | 2,103 | 0.80 | 265,416 | 1.52 | 267,518 | 1.51 |
| 20 | ප්‍රොටෙක්ෂන් ඇන්ඩ් ඇෂුවරන්ස් ඉන්ෂුවරන්ස් බ්‍රෝකර්ස් (ප්‍රයිවට්) ලිමිටඩ් | | - | 653,102 | 3.73 | 653,102 | 3.67 |
| 21 | රිලයන්ස් ඉන්ෂුවරන්ස් බ්‍රෝකර්ස් ලංකා (ප්‍රයිවට්) ලිමිටඩ් | 25,507 | 9.71 | 474,854 | 2.71 | 500,361 | 2.81 |
| 22 | සේනාරත්න ඉන්ෂුවරන්ස් බ්‍රෝකර්ස් (ප්‍රයිවට්) ලිමිටඩ් | 6,699 | 2.55 | 821,427 | 4.69 | 828,127 | 4.66 |
| 23 | සෙන්කඩගල ඉන්ෂුවරන්ස් බ්‍රෝකර්ස් (ප්‍රයිවට්) ලිමිටඩ් | | - | 889,079 | 5.08 | 889,079 | 5.00 |
| 24 | ස්ට්‍රැටජික් ඉන්ෂුවරන්ස් බ්‍රෝකර්ස් (ප්‍රයිවට්) ලිමිටඩ් | 23,319 | 8.88 | 92,194 | 0.53 | 115,513 | 0.65 |
| 25 | සෙනිත් ඉන්ෂුවරන්ස් බ්‍රෝකර්ස් (ප්‍රයිවට්) ලිමිටඩ් | 1,150 | 0.44 | 212,212 | 1.21 | 213,361 | 1.20 |
| | **උප-එකතුව** | **219,228** | **83.44** | **16,502,490** | **94.20** | **16,721,718** | **94.05** |
| | **වෙනත් රක්ෂණ තැරැව්කාර සමාගමේ** | **43,517** | **16.56** | **1,015,285** | **5.80** | **1,058,802** | **5.95** |
| | **මුළු එකතුව** | **262,745** | **100** | **17,517,775** | **100** | **17,780,520** | **100** |

**රූපසටහ 19**
**2007 සිට 2016 දක්වා රක්ෂණ තැරැව්කාර සමාගම් හරහා ජනනය කළ දළ ලිඛිත වාරික ආදායම**




| | 2007 | 2008 | 2009 | 2010 | 2011 | 2012 | 2013 | 2014 | 2015 | 2016 |
|---|---|---|---|---|---|---|---|---|---|---|
| සාමාන්‍ය රක්ෂණය ද.ලි.වා.ආ. (රු. මිලියන) | 7,393 | 8,781 | 8,698 | 9,317 | 10,193 | 12,532 | 14,189 | 14,559 | 16,124 | 17,518 |
| දීර්ඝ කාලීන රක්ෂණය ද.ලි.වා.ආ. (රු. මිලියන) | 158 | 195 | 188 | 243 | 296 | 195 | 191 | 158 | 206 | 263 |
| මුළු ද.ලි.වා.ආ. (%) ලෙස තැරැව්කාර සමාගම්වල දායකත්වය | 14.55 | 15.43 | 15.44 | 14.43 | 12.78 | 14.03 | 14.39 | 13.91 | 13.28 | 12.44 |

■ දීර්ඝ කාලීන රක්ෂණය ද.ලි.වා.ආ. (රු. මිලියන) ■ සාමාන්‍ය රක්ෂණය ද.ලි.වා.ආ. (රු. මිලියන) —■— මුළු ද.ලි.වා.ආ. (%) ලෙස තැරැව්කාර සමාගම්වල දායකත්වය

# මෙහෙයුම් කටයුතු සමාලෝචනය

## අධීක්ෂණ සමාලෝචනය

### රක්ෂණ සමාගම්

#### 1. මණ්ඩලයට ඉදිරිපත් කරන ලද වාර්තා පිළිබඳ සමාලෝචන

##### අ) වාර්ෂික ව්‍යවස්ථානුකූල වාර්තා, විගණනය කරන ලද මූල්‍ය ප්‍රකාශන සහ ජීවගණකඥ වාර්තා.

පනතේ විධිවිධාන ප්‍රකාරව සියලුම රක්ෂණ සමාගම් ඔවුන්ගේ වාර්ෂික ව්‍යවස්ථානුකූල වාර්තා, විගණනය කරන ලද මූල්‍ය ප්‍රකාශන අදාළ මූල්‍ය වර්ෂය අවසන් වී හය මසක් ඇතුළත මණ්ඩලයට ඉදිරිපත් කළ යුතු වේ. තවද, දීර්ඝ කාලීන රක්ෂණ ව්‍යාපාරයේ නිරත වී සිටින සමාගම් විසින් ජීවගණකඥ වාර්තාවක් සහ එහි සංක්ෂිප්තයක් වාර්ෂික ව්‍යවස්ථානුකූල වාර්තා සමඟ මණ්ඩලයට ඉදිරිපත් කළ යුතුවේ.

මණ්ඩලය විසින් ඉහත වාර්තාවල නිරවද්‍යතාව සහ පනතේ අඩංගු විධිවිධානවලට අනුකූලව නියමිත දිනට ඉදිරිපත් කර ඇති ද යන කරුණු සමාලෝචනය කරනු ලැබේ. වාර්තාවන් සමාලෝචනය කිරීමේදී මණ්ඩලය විසින් අධීක්ෂණය කරන ලද ව්‍යවස්ථානුකූල අවශ්‍යතාවලින් බැහැරවීම්, වෙනත් විෂමතාවයන් සහ හඳුනාගත් දෝෂ නිවැරදි කිරීම සඳහා අදාළ රක්ෂණ සමාගම් දැනුවත් කරන ලදී. තවද, ක්ෂේත්‍රගත විමර්ශනයෙන් හා රක්ෂණ සමාගම්වල නිලධාරීන් සමඟ පැවැත් වූ සම්මුඛ සාකච්ඡාවලදී අනාවරණය වූ සැලකිය යුතු කරුණු පිළිබඳව අවධානය යොමු කරනු ලැබේ.

##### ආ) අවදානම් තක්සේරු කිරීමේ සාරාංශය (RAS)

සියලුම රක්ෂණ සමාගම් විසින් ඔවුන්ගේ අවදානම් තක්සේරු කිරීමේ සාරාංශය සෑම වසරකම මාර්තු මස තිස්එක් වැනි දිනට ප්‍රථම මණ්ඩලය වෙත යොමු කළ යුතු වේ. එක් එක් රක්ෂණ සමාගමේ ආයතනික ව්‍යුහය, හිමිකාරත්වය, ව්‍යාපාරික පැතිකඩ, ඉහළ කළමනාකාරීත්වය, අලෙවිකරණය හා බෙදාහැරීමේ මාර්ග, රක්ෂණ හිමිකම් කළමනාකරණය, අවදානම් කළමනාකරණය ආදී කරුණු පිළිබඳව මණ්ඩලය විසින් මෙකී වාර්තා සමාලෝචන කිරීමෙන් අධ්‍යනය කරනු ලැබේ.

##### ඇ) ප්‍රතිරක්ෂණ ක්‍රියාපටිපාටි සමාලෝචනය

පනතේ 31(1) වගන්තිය අනුව සියලුම රක්ෂණ සමාගම් විසින් සහතික කරන ලද ප්‍රතිරක්ෂණ ආවරණ ගිවිසුම් හා ක්‍රියාපටිපාටි මණ්ඩලය වෙත වාර්ෂිකව ඉදිරිපත් කල යුතු වේ. මණ්ඩලය විසින් නියම කරනු ලැබූ තක්සේරු අවශ්‍යතා සම්පූර්ණ කරල ලද ප්‍රතිරක්ෂකයින්ගේ ප්‍රතිරක්ෂණ ආවරණ ලබා ගෙන ඇත්දැයි තහවුරු කර ගැනීම සඳහා එකී ලේඛන සමාලෝචන කරනු ලැබීය. එමෙන්ම ශ්‍රී ලංකා රක්ෂණ භාර අරමුදල වෙත අනිවාර්යයෙන් යොමු කළ යුතු ප්‍රතිරක්ෂණ ප්‍රතිශතයන් නිසි ලෙස සපුරා ඇත්ද යන්න පිළිබඳව විශේෂ අවධානයක් යොමු කරන ලදී. මෙහිදී හඳුනාගත් කොන්දේසි වලින් බැහැරවීම් සහ විචලනයන් නියමිත කාලයක් තුළ නිවැරදි කර මණ්ඩලයට යොමු කරන ලෙස අදාල සමාගම් වලට උපදෙස් ලබා දුනි. තවද, සියලුම රක්ෂණ සමාගම් විසින් එක් එක් සමාගම මගින් එළඹුනු Facultative ප්‍රතිරක්ෂණ ආවරණ සෑම කාර්තුවක් අවසන් වී දින 45 ක් ඇතුළත මණ්ඩලය වෙත ඉදිරිපත් කළ යුතු අතර මණ්ඩලය විසින් එම වාර්තාවල නිරවද්‍යතාව සහ අනෙකුත් කරුණු පිළිබඳ සියුම්ව සමාලෝචනය කරන ලදී.

##### ඈ) කාර්තුමය වාර්තා

සියලුම රක්ෂණ සමාගම් විසින් අවදානම් පාදක ප්‍රග්ධන (RBC) රාමුව සංශෝධනය වූ කාර්තුමය වාර්තා 2016 ජනවාරි පළමු වන දින සිට බලපැවැත්වෙන පරිදි මණ්ඩලය වෙත ඉදිරිපත් කළ යුතුවේ. 2016 වසරේ සියලු කාර්තු සඳහා සමාගම් විසින් ඉදිරිපත් කළ වාර්තා මණ්ඩලය විසින් සමාලෝචනය කර එක් එක් රක්ෂණ සමාගමේ කාර්ය සාධනය සහ පනතේ රීති සහ රෙගුලාසි වලට අනුකූලව ඉදිරිපත් කර ඇත්දැයි නිර්ණය කරන ලදී. එකී රක්ෂණ සමාගම්වල කාර්තුමය කාර්යසාධනය සමාලෝචනය කිරීම සඳහා මණ්ඩලය විසින් දීර්ඝ කාලීන සහ සාමාන්‍ය රක්ෂණ යන අංශ දෙකෙහිම වාරික ආදායම, ප්‍රාරක්ෂණ ලාභය සහ ශුද්ධ ලාභය පදනම් කරගෙන විශ්ලේෂණය කළ අතර රක්ෂණ සමාගම් හි කාර්තුමය කාර්යසාධනය සමාලෝචනය කිරීම සඳහා පසුගිය වසරේ අනුපාත සමඟ සැසැඳීමක් සිදුකළ අතර ඒ සඳහා එක් එක් සමාගමෙන් ලාභදායකත්වය, සමස්ත වියදම් සහ හිමිකම්පෑම පිළිබඳව අවධානය යොමු කරන ලදී. තවදුරටත් එක් එක් රක්ෂණ සමාගමෙහි නුබුන්වත්බව, ද්‍රවශීලතාවය සහ ප්‍රාග්ධන ප්‍රමාණාත්මකතාවය ඇතුළු වත්කම්, වගකීම් තත්ත්වය සහ අනුපාත පරීක්ෂා කිරීමෙන් සෑම රක්ෂණ සමාගමකම එක් එක් කාර්තුව සඳහා මූල්‍ය තත්ත්වය විමර්ෂණය කරන ලදී.

එකී වාර්තා සමාලෝචනය කිරීමේදී හඳුනාගත් පනතේ රීති, රෙගුලාසි වලට අනුකූල නොවීම් නිශ්චිත කාලසීමාවක් තුළ නිවැරදි කිරීමට පියවර ගන්නා ලෙසත් එකී නිවැරදි කළ වාර්තා මණ්ඩලය වෙත යොමු කරන ලෙසටත් අදාළ සමාගම් වෙත උපදෙස් ලබා දුනි.

සියලුම රක්ෂණ සමාගම් විසින් සෑම කාර්තුවකම ඔවුන් පනතේ විධිවිධාන සහ රීති සපුරාලන බවට 2006 අංක 6 දරණ මූල්‍ය ගනුදෙනු විධිවිධාන පනතට අනුකූල වී ඇති බවටත් සහතික කිරීමේ වාර්තා දෙකක් (A) සහ (B) වශයෙන් මණ්ඩලයට යොමු කළ අතර මණ්ඩලය එකී වාර්තාවල නිරවද්‍යතාවය සමාලෝචනය කරන ලදී.

### ඊ) මාසික වාර්තා

මණ්ඩලය විසින් නිකුත් කළ නියෝගවලට අනුව රක්ෂණ සමාගම් අටක් එක් එක් මාසය අවසන් වී දින විසි එකක් ඇතුළත ඔවුන්ගේ මාසික ව්‍යවස්ථානුකූල වාර්තා මණ්ඩලය වෙත ඉදිරිපත් කළ යුතු විය. මෙම නියමය සමාගම් විසින් ඉදිරිපත් කරනු ලබන කාර්තුමය වාර්තාවලට අමතරව සැපයිය යුතු වේ. එක් එක් සමාගම්වල මූල්‍ය තත්ත්වය පනතේ රීති සහ රෙගුලාසිවලට අනුකූලදැයි සමාලෝචනය කිරීම සඳහා මෙම මාසික වාර්තා පරීක්ෂා කර බැලූ අතර, හඳුනාගත් රීති සහ කොන්දේසිවලින් බැහැරවීම් සහ විෂමාචාරයන් නියමිත කාලයක් තුළ නිවැරදි කර මණ්ඩලයට යොමු කරන ලෙසට උපදෙස් ලබාදුනි.

## 2) ණය ගෙවීමේ හැකියාවේ සීමා රීති ප්‍රකාරව අනුකූලතාවය අධීක්ෂණය කිරීම

අවදානම් පාදක ප්‍රාග්ධන නියමය - 2015 ට අනුව සෑම සාමාන්‍ය හා දිගුකාලීන රක්ෂණ සමාගම් විසින් අවම ප්‍රාග්ධන ප්‍රමාණාත්මක අනුපාතය සහ අවම ප්‍රාග්ධන අවශ්‍යතාවය සපුරාලිය යුතුය. එමෙන්ම සෑම සමාගමක්ම මාසික/ කාර්තුමය/ වාර්ෂික ව්‍යවස්ථානුකූල වාර්තා එක් එක් සමාගම් විසින් එවනු ලබන පවතින මුලු ප්‍රාග්ධන අගයන් සහ ප්‍රමාණවත් ප්‍රාග්ධන අනුපාතයන් සමාලෝචනය කිරීම සිදුකෙරේ. එම අගයන් අනුකූල නොවන අවස්ථාවන්හිදී හෝ ගණනය කිරීම් නිරවද්‍ය නොවන අවස්ථාවන් හිදී නිශ්චිත කාල සීමාවක් තුළදී පනතේ රීතිවලට අනුකූලවීමට නිසි පියවර ගන්නා ලෙසට මණ්ඩලය උපදෙස් දෙන ලදි.

## 3. නිශ්චිත ආයෝජනවල අනුකූලතා අධීක්ෂණය කිරීම

### අ) රජයේ සුරැකුම්පත්වල ආයෝජනය කිරීම

පනතේ විසිපස් වන වගන්තියට අනුව සාමාන්‍ය රක්ෂණ ව්‍යාපාර සඳහා වූ තාක්ෂණික සංචිත වත්කම්වලින් 20% ට නොඅඩු ප්‍රමාණයක් සහ දිගුකාලීන රක්ෂණ ව්‍යාපාරය සඳහා වූ දිගුකාලීන රක්ෂණ අරමුදලේ වත්කම් වලින් 30% ට නොඅඩු ප්‍රමාණයක් රක්ෂකයින් විසින් රජයේ සුරැකුම්පත්වල ආයෝජන පවත්වාගෙන යා යුතු වේ. පනතේ 25 වන වගන්තියට අනුකූල වීම සහතික කිරීම සඳහා මණ්ඩලය විසින් මාසික / කාර්තුමය / වාර්ෂික පදනම මත රක්ෂණ සමාගම් විසින් රජයේ සුරැකුම්පත්වල කර ඇති ආයෝජන සියුම්ව අධීක්ෂණය කරල ලදි. මෙම ආයෝජනවල නිරවද්‍යතාව සහ හිමිකාරත්වය තහවුරු කිරීම සඳහා ශ්‍රී ලංකා මහ බැංකුව විසින් එක් එක් සමාගම වෙත නිකුත් කරන ලද තැන්පතු පිළිබඳ ප්‍රකාශන මණ්ඩලය විසින් විමර්ශණය කරනු ලැබේ. විමර්ශනයේදී හඳුනා ගනු ලැබූ නියාමන අවශ්‍යතාවලින් බැහැරවීම් නිශ්චිත කාලසීමාවක් තුළ නිවැරදි කර මණ්ඩලය වෙත යොමු කරන ලෙසට අදාළ රක්ෂණ සමාගම් වෙත දැනුම් දෙන ලදී.

### ආ) නිර්ණයන් අනුව කෙරෙන වෙනත් ආයෝජන

2011 මාර්තු එක වන දිනැති නිර්ණය කිරීම් අංක එක සහ පසුව සිදුකෙරුණු සංශෝධනවලට අනුව, සියළුම රක්ෂණ සමාගම් විසින් ඔවුන්ගේ තාක්ෂණික සංචිතයන්හි ශේෂව තිබෙන වත්කම් හා දිගුකාලීන රක්ෂණ අරමුදලේ ශේෂව තිබෙන වත්කම් ආයෝජනය කළ යුතු වේ. රක්ෂණ සමාගම් විසින් මණ්ඩලය වෙත යොමු කළ ආයෝජන විස්තර, මණ්ඩලය විසින් සියුම්ව නිරීක්ෂණය කළ අතර හඳුනාගත් පනතේ රීති වලින් බැහැරවීම් නිශ්චිත කාලයක් තුළ නිවැරදි කර මණ්ඩලය වෙත යොමු කරන ලෙස අදාළ සමාගම් වලට දැනුම් දෙන ලදී.

## 4. අවදානම් පාදක ප්‍රාග්ධන මත බලාත්මක උපායමාර්ග

අවදානම් පාදක ප්‍රාග්ධන අවශ්‍යතා අනුව ප්‍රාග්ධන අවශ්‍යතා පවත්වා ගැනීමට අසමත් වූ රක්ෂණ සමාගම් වලට මණ්ඩලය මැදිහත් වීම සහ ඒ සම්බන්ධව අනුකූල නොවීම් අනුකූල වීම සඳහා අවශ්‍ය නිවැරදි ක්‍රියාමාර්ග ක්‍රියාත්මක කරනු ලැබේ. ඒ අනුව මණ්ඩලය විසින් අවදානම් පාදක ප්‍රාග්ධනය මත බලාත්මක උපායමාර්ග සම්පාදනය කරන ලදී. ඒ අනුව අවම ප්‍රාග්ධන අවශ්‍යතා පවත්වා ගෙන යාමට නොහැකි වූ සමාගම් පහක් 2016 වසර තුලදී අවදානම් පාදක ප්‍රාග්ධන මත බලාත්මක උපාය මාර්ග වලට අනුකූල වන ලදී. මෙම පියවර අනුග මනය කිරීම තුලින් සමාගම් හී මූල්‍ය තත්වය හා වගකීම පියවීමේ හැකියාව පිරිහී අර්බුදකාරී තත්වයකට පත්වීමට පෙර මණ්ඩලයේ අධිකෂණ මැදිහත්වීම් ආරම්භ කළ හැකිය.

## 5. ක්ෂේත්‍රගත විමර්ශන

2016 වසර තුලදී අවදානම් පාදක අධීක්ෂණ ක්‍රමවේදය අනුව මණ්ඩලය විසින් රක්ෂණ සමාගම්වල ක්ෂේත්‍රගත විමර්ශන පහක් පවත්වන ලදි. මෙම වසර තුළ පවත්වනු ලැබූ ක්ෂේත්‍රගත විමර්ශනවල මුලිකම අරමුණ වූයේ සමාගම්හි ආයතන අවධානම් කළමණාකරණය පිළිබඳ අවබෝධයක් ලබා ගැනීමටයි. තවද මෙම විමර්ශනවලදී මණ්ඩලය විසින් රක්ෂණ සමාගම්හි මෙහෙයුම්, පද්ධති, ප්‍රතිපත්ති සහ පටිපාටීන් සමාලෝචනය කර පනතේ විධිවිධාන සහ අනෙක් රීති හා මණ්ඩලයේ රෙගුලාසි පිළිපැදීම අගයන ලදී. තවද, අදාළ රක්ෂණ සමාගම් වල මෙහෙයුම්, පද්ධති, ප්‍රතිපත්ති සහ පටිපාටීන් පිළිබඳ තොරතුරු ලබා ගැනීම පිණිස රක්ෂණ සමාගම් හී ජ්‍යෙෂ්ඨ නිලධාරීන්, අභ්‍යන්තර/බාහිර විගණකයින් සහ ජීවගණකඥයින් සමඟ සම්මුඛ සාකච්ඡා පවත්වන ලදි. තව දුරටත් මුදල් විශුද්ධිකරණ පනතේ මාර්ගෝපදේශවලට අනුගත වීමේදී අධීක්ෂණය කරනු ලැබීය.

ක්ෂේත්‍රගත විමර්ශන අතරතුරදී කරන ලද නිරීක්ෂණ, වැඩි දියුණු කිරීම සඳහා මණ්ඩලයේ නිර්දේශ සමඟ අදාල රක්ෂණ සමාගම් හි ප්‍රතිචාර ලබා ගැනීම සඳහා ඔවුන් වෙත විමර්ශන වාර්තා යොමු කරන ලදි.

## 6. ශ්‍රී ලංකා මහ බැංකුව වෙත තොරතුරු ඉදිරිපත් කිරීම

කාර්තුමය වාර්තාවලින් එක් රැස්කර ගත් තොරතුරු මත පදනම්ව මණ්ඩලය විසින් රක්ෂණ කර්මාන්තයේ කාර්යසාධනය පිළිබඳ මූල්‍ය තොරතුරු කාර්තුමය පදනමකින් ශ්‍රී ලංකා මහ බැංකුවේ මූල්‍ය පද්ධති ස්ථායිතා දෙපාර්තමේන්තුවට ඉදිරිපත් කරනු ලැබීය. වාරික ආදායම, ලාභදායිත්වය, ද්‍රවශීලත්වය ආදී කාර්තුමය වාර්තාවලින් එක්රුස් කළ විස්තර මත පදනම්ව රක්ෂණ කර්මාන්තයේ කාර්යසාධන අගයනු ලැබීය.

## 7. රක්ෂණ කර්මාන්තයේ අත්පොත - 2015

2015 දෙසැම්බර් 31 වන දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා මණ්ඩලය විසින් රක්ෂණ කර්මාන්තයෙන් එක්රුස් කර ගනු ලැබූ තොරතුරු සහ සංඛ්‍යා ලේඛන පදනම් කරගෙන රක්ෂණ කර්මාන්තයේ අත්පොත රක්ෂණ කර්මාන්තයේ සහ පාර්ශ්වකරුවන්ගේ ප්‍රයෝජනය සඳහා ප්‍රකාශයට පත් කරනු ලැබීය. මෙම අත්පොතෙහි රක්ෂණ කර්මාන්තයේ මුළු වත්කම්, රක්ෂණ ව්‍යාපාරයේ උප පන්තීන්හි දළ වාරික, පුළුල් ආදායම් ප්‍රකාශය සහ රක්ෂණ සමාගම් හි මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය ද, රඳවා තබාගැනීමේ අනුපාතය, හිමිකම් අනුපාතය, ඒකාබද්ධ අනුපාතය වැනි අනුපාතද ඇතුළත්ව සකස් කරන ලදී.

## 8. ජීවගණකඥ සහතික කිරීම

මණ්ඩලය විසින් තීරණය කරන ලද පරිදි සෑම සාමාන්‍ය හා දීර්ඝ කාලීන රක්ෂණ සමාගම් ඔවුන්ගේ 2016 මාර්තු මස 31 වැනි දිනෙන් අවසන් වන කාර්තුමය වාර්තා හෝ 2016 ජුනි මස 30 වැනි දිනෙන් අවසන් වන කාර්තුමය වාර්තා අදාල සමාගම්හි පත්කරන ලද ජීවගණකඥ විසින් සහතික කළ යුතුය. මෙමගින් අවදානම් පාදක ප්‍රාග්ධන නීති ආරම්භයේදීම ප්‍රාග්ධන ප්‍රමාණාත්මකතා පිළිබඳව රක්ෂණ සමාගම් වලට දැනුවත් වී සිටීමට මෙය උපයෝගී විය. එක් සමාගමක් හැර අනෙකුත් සියලුම සමාගම් මෙම අවශ්‍යතාවයට අනුකූල වන ලදී.

## 9. රක්ෂණ අධීක්ෂණ හැකියා ගොඩනැගීම

ලෝක බැංකු උපදේශකවරුන් විසින් 2016 අගෝස්තු 22 දා සිට 2016 සැප්තැම්බර් 2 දා දක්වා රක්ෂණ අධීක්ෂණ හැකියා ගොඩගැනීමට කෙටිකාලීන ව්‍යාපෘතියක් පවත්වනු ලැබීය. මෙහි මූලික අරමුණු වූයේ අවදානම් පාදක ප්‍රාග්ධනය ඵලදායි ලෙස ක්‍රියාත්මක කිරීමට සහයෝගය ලබා දීමටය. තවද අවදානම් පාදක අධීක්ෂණ වාර්තා කිරීමේ ක්‍රියාවලියද අධීක්ෂණ කාර්යය මණ්ඩලයේ හැකියාව වැඩි දියුණු කිරීමද අවධානය යොමු කරනු ලැබීය. මෙම ව්‍යාපෘතියේ එක් කොටසක් ලෙස ක්ෂේත්‍රගත විමර්ශන තුනක් ලෝක බැංකු උපදේශකවරුන්ගේ මැදිහත්වීම තුලින් මණ්ඩලය විසින් පවත්වනු ලැබීය. තවද මණ්ඩලය විසින් අවදානම් පාදක ප්‍රාග්ධනය ක්‍රියාත්මක කිරීමේදී පැන නැගුනු ගැටළු සාකච්ඡා කිරීමට සියලුම රක්ෂණ සමාගම් සඳහා වැඩ මුළුවක් පවත්වනු ලැබීය. ශුද්ධ වාරික ගණනය කිරීමේ ක්‍රමවේදයේ සිට දළ වාරික ගණනය කිරීමේ ක්‍රමවේදයට පිවිසීමෙන් ඇතිවූ අතිරික්තය පිළිබඳවද, සෘණ සංචිත, විලම්භිත අත්පත්කර ගැනීමේ වියදම්, අවදානම් ගාස්තු, ආතති පරීක්ෂාව ආදිය පිළිබඳවද සාකච්ඡා කරනු ලැබිය.

## 10. ලෝක බැංකු තාක්ෂණික සහය ව්‍යාපෘතිය

ලෝක බැංකුව විසින් ක්‍රියාත්මක කිරීමට නියමිත Sri Lanka Financial Sector Modernization ව්‍යාපෘතියේ එක් අදියරක් ලෙස 2016 වසරේ ලෝක බැංකු කණ්ඩායම විසින් පෙර සූදානමක් සිදු කෙරිණි. මෙහිදී මණ්ඩලයේ සාමාජිකයින් සමඟ රක්ෂණ අධීක්ෂණ හැකියා ගොඩනැගීමේ ව්‍යාපෘතියට අදාල සංරචක පිළිබඳවද ඊට අදාල අනෙකුත් ගැටළු පිළිබඳවද සාකච්ඡා කරනු ලැබීය.

## රක්ෂණ තැරැව්කාර සමාගම්

### 1. කාර්තුමය වාර්තා, මාසික වාර්තා, අන්තර්කාලීන මූල්‍ය ප්‍රකාශන සහ විගණනය කරනලද මූල්‍ය ප්‍රකාශන සමාලෝචනය

2010 පෙබරවාරි 25 දින අංක 1642/16 දරන ගැසට් නිවේදනය (පළමු උපලේඛනය) අනුව සියලු රක්ෂණ තැරැව්කරුවන් ඔවුන්ගේ කාර්තුමය වාර්තා සහ අන්තර්කාලීන මූල්‍ය ප්‍රකාශන එක් එක් කාර්තුව අවසන් වී දින 45ක් ඇතුළත මණ්ඩලයට ඉදිරිපත් කළ යුතුය.

රක්ෂණ තැරැව්කාර සමාගම් බහුතරයක් සිය කාර්තුමය වාර්තා සහ අන්තර් කාලීන මූල්‍ය ප්‍රකාශන එකී නියමිත කාලසීමාව ඇතුළත මණ්ඩලයට ඉදිරිපත් කරන ලදී. රක්ෂණ තැරැව්කරුවන් ඉදිරිපත් කළ කාර්තුමය වාර්තා මණ්ඩලය විසින් සමාලෝචනය කරනු ලැබීය. වාර්තා සමාලෝචනය අතරතුරදී කිසියම් නියාමන අවශ්‍යතාවලින් බැහැරවීම් සහ විෂමතා නිරීක්ෂණය කලේ නම් මණ්ඩලය නියම කළ කාලසීමාවක් තුළ දී ඒවා නිවැරදි කරනු පිණිස අදාළ තැරැව්කරුවන්ට දැනුම් දෙනු ලැබීය.

රක්ෂණ තැරැව්කාර සමාගම් වල විගණනය කළ මූල්‍ය ප්‍රකාශන මූල්‍ය වර්ෂය අවසානයේ සිට මාස හයක් ඇතුළත මණ්ඩලයට ඉදිරිපත් කළ යුතුය. එසේ ඉදිරිපත් කළ විගණන කළ මූල්‍ය ප්‍රකාශන මණ්ඩලය විසින් සමාලෝචනය කරන ලදී. නියාමන අවශ්‍යතාවලින් බැහැර වීම් නිවැරදි කිරීම සඳහා ඒවා පිළිබඳ අදාළ තැරැව්කාර සමාගම්වලට දැනුම් දෙන ලදී.

### 2. වාරික එකතු කිරීමේ ක්‍රියාවලිය අධීක්ෂණය කිරීම

පනතේ 89 වැනි පරිච්ඡේදයට අනුව රක්ෂකයන් වෙනුවෙන් රක්ෂණ වාරික එකතු කරනු ලබන රක්ෂණ තැරැව්කරුවන් විසින් එකතු කරනු ලබන රක්ෂණ වාරික දෙසතියක් ඇතුළත ඒ ඒ අදාළ රක්ෂකයන් වෙත ප්‍රේෂණය කල යුතුය. මණ්ඩලය විසින් කාර්තුමය වාර්තා නිරීක්ෂණය කිරීම් තුලදී සහ ක්ෂේත්‍රගත විමර්ශන අතරතුරදී

රක්ෂණ තැරැව්කරුවන් විසින් පනතේ 89 වැනි වගන්තිය පිළිපැදීම පිළිබඳව සියුම්ව අධීක්ෂණය කරනු ලැබීය. එකී විධිවිධානවලට අනුකූල නොවන රක්ෂණ තැරැව්කරුවන්ට විරුද්ධව මණ්ඩලය අවශ්‍ය පියවර ගනු ලැබිණ.

### 3. ක්ෂේත්‍රගත විමර්ශන

පනතට සහ මණ්ඩලයේ රීති හා රෙගුලාසිවලට අනුකූල වන ආකාරයෙන් රක්ෂණ තැරැව්කාර ව්‍යාපාරය ක්‍රියාත්මක වන්නේද යන්න අධීක්ෂණය කිරීම සඳහා 2016 වසර තුළදී මණ්ඩලය විසින් ක්ෂේත්‍රගත විමර්ශන අටක් පවත්වන ලදී. ක්ෂේත්‍රගත විමර්ශනවලදී සිදුකළ නිරීක්ෂණ නිවැරදි කිරීමේ පියවර සඳහා නිර්දේශ සමඟ අදාළ රක්ෂණ තැරැව්කරුවන්ගේ අවධානයට යොමු කරනු ලබන අතර අවශ්‍ය අවස්ථාවලදී මණ්ඩලය විසින් නියාමන පියවර ගනු ලැබිණ.

### 4. ලියාපදිංචිය අලුත් කිරීම

2017 වසර සඳහා රක්ෂණ තැරැව්කරුවන්ගේ ලියාපදිංචිය අලුත් කිරීම සඳහා ඔවුන්ගෙන් ලැබූ ඉල්ලුම්පත්‍ර මණ්ඩලය විසින් සමාලෝචනය කරන ලදී. මණ්ඩලය විසින් රක්ෂණ තැරැව්කරුවන්ගේ ලියාපදිංචිය අලුත් කිරීමට පෙර ඔවුන්ගේ විගණනය කළ මූල්‍ය ප්‍රකාශන සහ කාර්තුමය වාර්තා විශ්ලේෂණය කරමින් රක්ෂණ තැරැව්කරුවන්ගේ මූල්‍ය තත්ත්වය අගයනු ලැබිණ.

# නියාමන සමාලෝචනය

## රක්ෂණ සමාගම් ලියාපදිංචි කිරීම

මෙම වසර තුළදී, රක්ෂණ සමාගම් ලෙස ක්‍රියා කිරීම සඳහා නව ලියාපදිංචි කිරීම් ප්‍රදානය කර නොමැත. එබැවින්, ලියාපදිංචි රක්ෂණ සමාගම් ගණන 29 ලෙසම පැවතිණි.

**ඇමුණුම** I : මණ්ඩලයේ ලියාපදිංචි වී සිටින රක්ෂණ සමාගම්වල නාම ලේඛනය, ඔවුන්ට කරගෙන යාමට අවසර ලබාදී ඇති රක්ෂණ ව්‍යාපාර පන්තිය/පන්ති දැක්වේ.

### නව රක්ෂණ තැරැව්කාර සමාගම් ලියාපදිංචි කිරීම සහ රක්ෂණ තැරැව්කාර සමාගම්වල ලියාපදිංචිය අළුත් කිරීම්

රක්ෂණ තැරැව්කරුවන් ලෙස ලියාපදිංචි වීම සඳහා, නව ඉල්ලුම් පත්‍ර භාර ගැනීම සම්බන්ධයෙන් පනවා තිබූ තාවකාලික තහනම ඉවත් කරන ලදි. ඒ අනුව මෙම වසර තුලදී රක්ෂණ තැරැව්කරුවන් ලෙස ලියාපදිංචි වීම සඳහා නව ඉල්ලුම් පත්‍ර 5 මණ්ඩලය වෙත ලැබුණු අතර, එයින් සමාගම් 3 සඳහා නව ලියාපදිංචිවීම් ප්‍රදානය කරන ලදි. තවද, සමාන්‍ය රක්ෂණ තැරැව්කාර ව්‍යාපාරය සඳහා ලියාපදිංචි වී සිටි තැරැව්කාර සමාගම් 2 විසින් දීර්ඝ කාලීන රක්ෂණ තැරැව්කාර ව්‍යාපාරය සඳහා ලියාපදිංචි වීමට ඉල්ලුම් කරන ලදි.

2016 වසර සඳහා ලියාපදිංචිය අළුත් කිරීමේ අපේක්ෂාවෙන් රක්ෂණ තරැව්කාර සමාගම් 55කින් ඉල්ලුම් පත්‍ර මණ්ඩලය වෙත ලැබී තිබෙන අතර එම සමාගම් පනත යටතේ අවශ්‍ය නියමයන් සම්පූර්ණ කර ඇති බැවින් 2017 වසර සඳහා එම සියළුම සමාගම්වලට සිය ලියාපදිංචිය අළුත් කිරීම් ප්‍රදානය කර ඇත.

ඇමුණුම II : මණ්ඩලයේ ලියාපදිංචි වී සිටින රක්ෂණ තැරැව්කාර සමාගම්වල නාම ලේඛණය, ඔවුන්ට කරගෙන යාමට අවසර ලබාදී ඇති රක්ෂණ ව්‍යාපාර පන්තිය/පන්ති සහ ලියාපදිංචි කාලපරිච්ඡේදය දැක්වේ.

## බලාත්මක කිරීමේ ක්‍රියාවලිය

### රක්ෂණ සමාගම්

#### අත්හිටුවීම්

මණ්ඩලය විසින් එක් රක්ෂණ සමාගමකට, පුරෝකථනය කරන ලද අවධානම් පදනම් වූ ප්‍රාග්ධන ගණනය කිරීම්, සැබෑ ගණනය කිරීම් වලින් භෞතික වශයෙන් වෙනස් නොවන බවට සහ අවධානම් පදනම් වූ ප්‍රාග්ධන අවශ්‍යතාවයන් හා අනුකූලවන බවට, ලිඛිත සහතික කිරීමක්, ජීවගණකඥයා මගින් ලබා දීමට නියම කරන ලදි. කෙසේවුවද, එම රක්ෂණ සමාගම විසින් පැවතිය යුතු, ණය ගෙවීමේ හැකියාවේ සීමා වටිනාකම හා අනුකූල බව පෙන්නුම් කිරීමට අපොහොසත් වීම නිසා, 2016 ජූලි මස 25 වන දින සිට 2016 අගෝස්තු 15 දක්වා කාලය තුළ ලියාපදිංචිය අත්හිටුවන ලදි.

මණ්ඩලය විසින් තවත් රක්ෂණ සමාගමක ලියාපදිංචිය, 2016 ඔක්තෝම්බර් මස 4 වන දින සිට 2016 ඔක්තෝම්බර් 25 දින දක්වා අත්හිටුවන ලද්දේ, මණ්ඩලය විසින් නියම කරන ලද අවශ්‍යතා සම්පූර්ණ කිරීම, ණය ගෙවීමේ හැකියාවේ සීමා (අවධානම් පදනම් වූ ප්‍රාග්ධන) රීති සහ සංයුක්ත රක්ෂණ ව්‍යාපාරය වෙන් කිරීමට අපොහොසත් වීම හේතුවෙනි. ඉහත සඳහන් අතහිටුවීම මණ්ඩලය විසින් නියම කළ අවශ්‍යතා සම්පූර්ණ කරන තෙක් 2016 ඔක්තෝම්බර් 26 සිට තවත් දීර්ඝ කරන ලදි. මේ අතරතුර අදාල රක්ෂණ සමාගමේ මව් සමාගම විසින් රක්ෂණ සමාගමට ගෙවීමට නොහැකි වන ඕනෑම රක්ෂණ හිමිකමක් ගෙවීමට සහතික වෙමින් පොරොන්දුවක් ලබා දුනි. ඒ අනුව මණ්ඩලය විසින් පවතින් රක්ෂණ හිමිකම් ඔප්පු අළුත් කිරීම සඳහා පමණක් ඉඩ ලබා දෙමින් අත්හිටුවීම ඉවත් කරන ලදි. තවදුරටත්, මව් සමාගම විසින් රක්ෂණ සමාගමට ගෙවීමට නොහැකි වන ඕනෑම රක්ෂණ හිමිකමක්, ඔවුනගේ කොටස් හිමිකම අන්සතු කරනතෙක්, ගෙවීමට සහතික වන ලදි. ඒ අනුව එම රක්ෂණ සමාගම වෙත පනවා තිබූ අත් හිටුවීම 2017 ජනවාරි 9 දින සම්පූර්ණයෙන් ඉවත් කරන ලදි.

2009 වසරේදී සෙලින්කෝ නකාශුල් ලිමිටඩ් සම්බන්ධයෙන් පනවන ලද අත්හිටුවීම අඛණ්ඩව ක්‍රියාත්මක වේ. එම සමාගමේ රක්ෂණ ඔප්පු හිමයන්ගේ රක්ෂණ හිමිකම් පිළිබඳව තක්සේරුවක් සිදු කලද, සමාගමට එරෙහිව තවමත් විභාග වෙමින් පවතින නඩුකරයන් නිසා අදාල හිමිකම් නිරවුල් කිරීම අවසන් කිරීමට නොලැබුණි.

පනතේ 18(1) වගන්තිය ප්‍රකාරව රක්ෂණකරුවකුගේ ලියාපදිංචි කිරීම, වෙනත් තරග අතර මණ්ඩලය විසින් නිශ්චය කරනු ලබන ණය ගෙවීමේ හැකියාව පිළිබඳ සීමාව පවත්වා ගෙන යාමට අසමත් වීම සහ පනතේ යම් විධි විධානයක් හෝ එය යටතේ සාදන ලද යම් නියෝගයක් හෝ රීතියක් හෝ පනත යටතේ මණ්ඩලය විසින් පනවන ලද යම් කොන්දේසියක් හෝ දෙන ලද යම් විධානයක් කඩ කර තිබීම හේතුවෙන්, සම්පූර්ණයෙන්ම හෝ රක්ෂණ ව්‍යාපාරයේ එක්තරා පන්තියක් අනුපන්තියක් සම්බන්ධයෙන් අවලංගු කරනු ලැබිය හැකිය.

#### අවවාද කිරීම්

- එක් රක්ෂණ සමාගමක අධ්‍යක්ෂ මණ්ඩලය වෙත, ශ්‍රී ලංකා රක්ෂණ මණ්ඩලය විසින් විධානයක් නිකුත් කරන ලද්දේ, ඔවුනගේ 2015 වර්ෂයේ මාර්තු 31, ජුනි 30 සහ සැප්තැම්බර් 30 කාර්තුමය වාර්තාවන්හි, අසත්‍ය සහ වැරදි සහගත තොරතුරු සපයා තිබීම හේතුවෙනි.
- පනතේ 57 වන වගන්තිය ප්‍රකාරව මණ්ඩලය විසින් 2015 වර්ෂයේදී රක්ෂණ සමාගමකට එරෙහිව, ඊළග

මාසයේ 15 වන දින වන විට, මාසික වාර්තාව ඉදිරිපත් කිරීමට විධානයක් නිකුත් කරන ලදි. කෙසේ වුවද, 2016 අප්‍රේල් මාසය සඳහා අදාල මාසික වාර්තාව ඉදිරිපත් නොකිරීම හේතුවෙන් පනතේ විධිවිධාන උල්ලංඝනය කිරීම සහ විධානය කඩ කිරීමට එරෙහිව මණ්ඩලය අදාල රක්ෂණ සමාගමට අවවාද කරන ලදි.

## බලාත්මක කිරීමේ ක්‍රියාවලිය

## රක්ෂණ තැරැව්කාර සමාගම් අත්හිටුවීම්

- පනතේ 84(1) වගන්තිය ප්‍රකාරව කාර්තුමය වාර්තා ඉදිරිපත් කිරීමට අපොහොසත් වීම හේතුවෙන්, 2016 අගෝස්තු 4 දින සිට 2016 ඔක්තෝම්බර් 5 දින තෙක්, එක් රක්ෂණ තැරැව්කාර සමාගමක ලියාපදිංචිය අත්හිටුවන ලදි. එම සමාගමේ ලියාපදිංචිය නැවත වතාවක් පනතේ 84(1) වගන්තිය ප්‍රකාරව නොවැම්බර් මස අත්හිටුවන ලද්දේ, විගණිත මූල්‍ය ප්‍රකාශනය ඉදිරිපත් කිරීමට අපෝහොසත් වීම හේතුවෙනි. විගණිත මූල්‍ය ප්‍රකාශය ඉදිරිපත් කිරීමට දිගින් දිගටම අපොහොසත් වීම නිසා එම රක්ෂණ සමාගමේ ලියාපදිංචිය 2016 නොවැම්බර් 24 වන දින සිට අවලංගු කරන ලදි.

  පනතේ 84(1) වගන්තිය ප්‍රකාරව මණ්ඩලය විසින්, රක්ෂණ තැරැ ව්කාර සමාගමක ලියාපදිංචිය අත්හිටුවීම හෝ අවලංගු කිරීම, එහි සඳහන් වන හේතුන් මත සිදු කල හැකිය.

- කාර්තුමය වාර්තා ඉදිරිපත් කිරීමට අපොහොසත් වීම හේතුවෙන් මණ්ඩලය විසින් එක්තරා රක්ෂණ තරැව්කාර සමගාමක ලියාපදිංචිය පනතේ 84(1) වගන්තිය යටතේ, අත්හිටුවන ලදි. එම සමාගම විසින් අදාල කාර්තුමය වාර්තා ඉදිරිපත් කිරීමට තව දුරටත් අපොහොසත් වීම නිසා මණ්ඩලනය විසින් එහි ලියාපදිංචියද අවලංගු කරන ලදි.

- තවත් රක්ෂණ තරැව්කාර සමාගම් දෙකක්, තම කාර්තුමය වාර්තා ඉදිරිපත් කිරීමට අපොහොසත් වීම හේතුවෙන්, මණ්ඩලය විසින් පනතේ 84(1) වගන්තිය යටතේ ඒවායෙහි ලියාපදිංචිය 2016 ඔක්තෝම්බර් 4 වන දින සිට අත්හිටුවන ලද අතර එම කාර්තුමය වාර්තා ඉදිරිපත් කිරීමෙන් පසු අදල අත්හිටුවීම ඉවත් කරන ලදි.

## අවවාද කිරීම්

1. මණ්ඩලය විසින් පනතේ 86(1) වගන්තිය ප්‍රතිපාදන හා අනුකූල වීමට අපොහොසත් වීම හේතුවෙන් රක්ෂණ තැරැව්කාර සමාගමකට අවවාද කරන ලදි.

   2010 පෙබරවාරි 25 දිනැති, අංක 1642/16 දරණ, අති විශේෂ ගැසට් පත්‍රයේ ප්‍රසිද්ධ කරන ලද 07 වන රීතිය සමග කියැවෙන පනතේ 86(1) වගන්තිය මගින් වෙනත් කරුණු අතර දැක්වෙන්නේ සෑම රක්ෂණ තැරැව්කරුවෙකු විසින්ම රක්ෂණ තැරැව්කාර සමාගමේ ප්‍රධාන නිලධාරියා සහ එම සමාග මේ අධ්‍යක්ෂවරයකු විසින් සහතික කරනු ලැබූ කාර්තුමය වාර්තාව එක් එක් කාර්තුව අවසානයේදී දින 45 ඇතුලත දී මණ්ඩලය වෙත ඉදිරිපත් කල යුතුය.

   මීට අමතරව, පනතේ 82(1)(ඉ) වගන්තියේ ප්‍රතිපාදන උල්ලංඝනය කිරීම හේතුවෙන් තවත් රක්ෂණ තැරැව්කාර සමාගමකට මණ්ඩලය විසින් අවවාද කරන ලදි.

   පනතේ 82(1) (ඉ) වගන්තිය අනුව රක්ෂණ තැරැව්කාර සමාගමක්, රක්ෂණ තැරැව්කාර ව්‍යාපාරය කරගෙන යාමේ තනි කාර්ය සඳහා, සංස්ථාගත කර තිබිය යුතුය.

### නියාමන/උපදේශාත්මක ක්‍රියාමාර්ග

1. මණ්ඩලය විසින් රක්ෂණ තැරැව්කාර සමාගමක් ලෙස ලියාපදිංචිවීම සඳහා නව ලියාපදිංචි අයදුම්පත් භාර ගැනීම 2012 අප්‍රේල් 27 දින සිට බලාත්මක වන පරිදි නැවත දැනුම් දෙන තුරු තාවකාලිකව නවතා දමන ලදි.

   මණ්ඩලය වෙත යොමු කරන ලද රක්ෂණ තැරැව්කාර සමාගමක් ලෙස ලියාපදිංචිවීම සඳහා අයදුම්පත් විශාල සංඛ්‍යාව කෙරෙහි අවධානය යොමු කරමින් එම තාවකාලික අත්හිටුවීම් ඉවත් කිරීමට මණ්ඩලය තීරණය කරන ලදි.

2. එක්තරා රක්ෂණ සමාගමක් වෙත එම සමාගමට ආශ්‍රිත, පාලිත, පාලක හෝ සමාගම් සමූහයක සාමාජික සමාගමක් සමග හෝ මණ්ඩලයේ අනුමැතියනොමැතිව ගනුදෙනුවලට ඇතුළත් වීම තහනම් කරමින් 2015 වර්ෂයේදී මණ්ඩලය විසින් විධානයන් නිකුත් කරන ලදි. එම රක්ෂණ සමාගම විසින් එකී එක් විධානයක් සමග අනුකූලවීම සඳහා කාලය දීර්ඝ කිරීමක් මණ්ලයෙන් ඉල්ලා සිටියේය. එම ඉල්ලීම සලකා බැලූ මණ්ඩලය අවසාන වතාවට දීර්ඝ කිරීමක් ලබා දෙන ලදි.

3. රක්ෂණ නියෝජිතයින් ලෙස ලියාපදිංචි වීමට බලාපොරොත්තු වන පුද්ගලයන් විසින් ශ්‍රී ලංකා රක්ෂණ ආයතනයේ පවත්වනු ලබන පූර්ව බඳවාගැනීමේ පරීක්ෂණයට ඉදිරිපත් වීම සඳහා තම සුදුසුකම් සම්බන්ධයෙන් මණ්ඩලය වෙත ඉදිරිපත් කල ඉල්ලීම් සලකා බලා 2010 ඔක්තෝබර් 5 දිනැති අංක 1674/4 මගින් සංශෝධිත 2002 සැප්තැම්බර් 23 දිනැති අංක 1255/3 දරණ අතිවිශේෂ ගැසට් පත්‍රයේ 2(ඇ)(ii) රීතිය ප්‍රකාරව මණ්ඩලය විසින් අනුමැතිය ප්‍රදානය කර ඇත.

   රක්ෂණ නියෝජිත සුදුසුකම් රීති 2 (ඇ) (i) (2010 ඔක්තෝබර් 5 දිනැති අංක 1674/4 මගින් සංශෝධිත 2002 සැප්තැම්බර් 23 දිනැති අංක 1255/3 දරණ අතිවිශේෂ ගැසට් පත්‍රය) ප්‍රකාරව, ගණිනය හෝ අංක ගණිතය සහ සිංහල හෝ දෙමළ හෝ ඉංග්‍රීසි භාෂාව යන විෂයන්ට සාමාන්‍ය සමාර්ථයක් සහිතව

අධ්‍යාපන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගය සමත්වී තිබීම රක්ෂණ නියෝජිතයකු ලෙස ලියාපදිංචි වීමට සපුරාලිය යුතු එක් අවම සුදුසුකමක් ලෙස සඳහන් කර ඇත. එසේ වුවද, එම රීති 2(ඇ) (ii) ප්‍රකාරව, යම් තැනැත්තකු රීති 2 (ඇ) (i) හි සඳහන් කර ඇති මට්ටමට සමාන හෝ ඉහළ වෙනත් යම් අදාල ක්ෂේත්‍රයකින් සුදුසුකම් ලබා ඇත්තේ නම්, එම සුදුසුකම, රක්ෂණ නියෝජිත සුදුසුකම් රීතිවල සඳහන් කර ඇති මට්ටමට සමාන බවට, මණ්ඩලය විසින්, එක් එක් සිද්ධිය අනුව, සලකාබලනු ලැබිය හැක.

4. "ප්‍රංශයේ ජීව ගණක ආයතනයේ අධි සාමාජික" සහ ඇමරිකා එක්සත් ජනපදයේ කැෂුවල්ටි ඇක්චුරියල් සොසායිටි (Cassualty Acturial Society) හි අධිසාමාජික යන සුදුසුකම්, රක්ෂණ සමාගමක ජීවගණක තක්සේරුව සිදු කිරීම සඳහා මණ්ඩලය විසින් අනුමත කරන ලදි. ඉහත කී සුදුසුකම් පනතේ 114 වන වගන්තිය යටතේ පිළිගෙන නොතිබුණි. ඉහත කී අනුමැතිය රක්ෂණ සමාගම් දෙකක් මගින් යෝජනා කරන ලද නව උපදේශක ජීවගණක පත්කිරීම් සඳහා ප්‍රදනය කරන ලදි.

   පනතේ 114 වන වගන්තිය ප්‍රකාරව, "ජීව ගණක" යන්නෙන් එංගලන්තයේ ජීව ගණක ආයතනයේ හෝ ස්කොට්ලන්තයේ ජීව ගණකයන්ගේ පීඨයේ අධි සාමාජිකයකු හෝ මණ්ඩලය විසින් අනුමත කරන ලද වෙනත් යම් වෘත්තීය ජීව ගණක ආයතනයක අධි සාමාජිකයකු; හෝ අදළ ජීව ගණක කාරණාවල දී අවුරුදු දහයකට නොඅඩු පසු සුදුසුකම් පළපුරුද්දක් ඇති, ඉහත සඳහන් කවර හෝ වෘත්තීය ජීව ගණක ආයතනයක ආශ්‍රිත සාමාජිකයකු අදහස් වේ.

5. ශ්‍රී ලංකා රක්ෂණ ආයතන (ශ්‍රී.ර.ආ.) විසින් සිය ආයතන නාමයේ කොටසක් ලෙස "රක්ෂණය" යන වචනය භාවිතා කිරීම සඳහා ඉදිරිපත් කරන ලද ඉල්ලීමට මණ්ඩලය සිය එකඟතාව පළ කරන ලද්දේ, ශ්‍රී.ර.ආ. පාර්ලිමේන්තු පණතක් මගින් පිහිටුවනු ලබන නිසාය.

   පනතේ 96 වන වගන්තිය ප්‍රකාරව රක්ෂණකරුවකු, මේ පනත යටතේ ලියාපදිංචි කර ඇති තැරැව්කරුවකු හෝ එවැනි රක්ෂණකරුවකුගේ හෝ තැරැව්කරුවකුගේ රක්ෂණ නියෝජිතයකු නොවන වෙනත් කිසිම තැනැත්තකු විසින්, මණ්ඩලයේ ලිඛිත අනුමතය නොමැතිව, ස්වකීය නාමයේ, අභිධානයේ හෝ විස්තරයේ කොටසක් වශයෙන් " රක්ෂණය" වන වචනය හෝ ඒ වචනයේ ව්‍යුප්පන්න කිසිවක් හෝ වෙනත් භාෂාවක ඒ වචනයට සමාන වෙනත් යම් වචනයක්, ඒ නාමයෙන්, අභිධානයෙන් හෝ විස්තරයෙන් ඒ තැනැත්තා විසින් ශ්‍රී ලංකාවෙහි රක්ෂණ ව්‍යාපාරය කර ගෙන යන බව පෙන්නුම් කිරීම පිණිස භාවිත කිරීම හෝ ඒ ප්‍රතිඵලය ගෙන දෙන නිරූපණ කිසිවක් යම් බිල්පත්‍ර ශීර්ෂයක, ලිපි ශීර්ෂයක, දැන්වීමක හෝ ප්‍රචාරක දැන්වීම් කිරීමක් හෝ නොකළ යුතුය.

   එසේ වුව ද, රක්ෂණකරුවන්ගේ හෝ තැරැව්කරුවන්ගේ සමාගමක් විසින් "රක්ෂණය" යන වචනය හෝ ඒ වචනයේ ව්‍යුත්පන්න කිසිවක් හෝ යම් භාෂාවක ඒ වචනයට සමාන වචනයක් හෝ එහි නාමයේ හෝ අභිධානයේ කොටසක් වශයෙන් නැතහොත් එහි කටයුතුවල විස්තරයක් වශයෙන් භාවිත කිරීම, මේ වගන්තියේ ඇතුළත් කිසිවකින් තහනම් නොවන්නේය.

6. ඉන්දියානු රක්ෂණ ආයතනය (ඉ.ර.ආ) විසින් ප්‍රදනය කරනු ලබන ආශ්‍රිත සාමාජික හෝ අධි සාමාජික සුදුසුකම, වරලත් රක්ෂණ ආයතනය (ව.ර.ආ.) විසින් ප්‍රදනය කරනු ලබන ආශ්‍රිත සාමාජික සුදුසුකමට සමාන බවට පිළිගන්නා ලෙසට, ඉ.ර.ආ. විසින් පනතේ 32 වගන්තිය සහ රීති (2) (අ) සමග කියවිය යුතු පනතේ 94 වගන්තිය ප්‍රකාරව, මණ්ඩලය වෙත ඉල්ලීමක් ඉදිරිපත් කරන ලදි.

   ඉ.ර.ආ. විසින් ප්‍රදනය කරනු ලබන ආශ්‍රිත සාමාජික හෝ අධිසාමාජික සුදුසුකමට ලබාදෙනු ලැබෙන සම්මාන සමර්ථයන් සාපේක්ෂ වශයෙන් අඩු බවට නිරීක්ෂණය කරමින්, එම සුදුසුකම් ව.ර.ආ. විසින් ප්‍රදනය කරනු ලැබෙන ආශ්‍රිත සාමාජික හෝ අධිසාමාජික සුදුසුකමට සමාන බවට සැලකිය නොහැකි බවට මණ්ඩලය තීරණය කරන ලදි.

7. එක් රක්ෂණ සමාගමක් විසින් සිය කොටස් හිමියන්ගේ අරමුදලින් සිදුකරනු ලබන ආයොජනයක් බව ප්‍රකාශ කරමින් එම සමාගමේ පාලිත සමාගම් දෙකක රුපියල් මිලියන 250 බැගින් වූ ආයෝජනයක් සිදුකිරීම සඳහා මණ්ඩලයේ අනුමැතිය ඉල්ලා සිටින ලදි.

   මණ්ඩලය විසින් පනතේ 57 වන වගන්තිය ප්‍රකාරව කලින් නිකුත් කරන ලද විධානයක් අනුව, ඉල්ලුම්කාර සමාගමේ පාලක සමාග මට සිය ව්‍යාපාර සමූහයේ සම කොටස්, ණය සාධන පත්‍ර, ආදියෙහි කිසියම් ආයෝජනයක් සිදු කිරීමට අවසර නොදෙන ලදි.

   මින් පෙර අවස්ථාවකදී, මණ්ඩලය තීරණය කර ඇති ආකාරයට, වෙන් කිරීමට පෙර සංයුක්ත රක්ෂණ සමාගම්වෙත මණ්ඩලය විසින් නිකුත් කර ඇති විධාන, ඒ ආකාරයටම නව රක්ෂණ සමාගම්වලටද අදල වේ. කෙසේ වෙතත්, අයදුම්කාර සමාගම ප්‍රමාණවත් ප්‍රාග්ධන අනුපාතය (CAR) සහ පූර්ණ පවත්නා ප්‍රාග්ධනය (TAC) නියමිත මට්ටමට වඩා ඉහළින් පවත්වාගෙන යාම සහ වෙනත් අදළ කරුණු සලකාබලා, ඉහත කී ආයෝජනයට මණ්ඩලය විසින් අනුමැතිය ලැබදෙන ලදි.

8. පනතේ 102 වගන්තිය යටතේ නියම කර ඇති පරිදි, සාමාන්‍ය රක්ෂණ සමාගම් දෙකක් ඒකාබද්ධ කිරීම

වෙනුවෙන් දිස්ත්‍රික් අධිකරණයේ අනුමැතිය ලබාගැනීම සඳහා, දිස්ත්‍රික් අධිකරණයේ සලකා බැලීම පිණිස ඉදිරිපත් කිරීම සඳහා එම සමාගම් විසින් මණ්ඩලයේ නිරීක්ෂණය ප්‍රදානය කරන ලෙසට ඉල්ලා සිටියේය. මණ්ඩලය විසින් එම ඒකාබද්ධ කිරීම පිළිබඳව සිය නිරීක්ෂණය ප්‍රදානය කරන ලදි.

පනතේ 102 වගන්තිය ප්‍රකාරව රක්ෂණ ව්‍යාපාරය පැවරීමට හා ඒකාබද්ධ කිරීමට අදාළ සියලු ගනුදෙනු දිසා අධිකරණයක් විසින් අනුමත කරනු ලැබිය යුතු අතර, එවැනි අනුමතයක් සඳහා ඉල්ලුම් කිරීමේ දී ඒ පැවරීම හා ඒකාබද්ධ කිරීම පිළිබඳව මණ්ඩලයේ නිරීක්ෂණවල පිටපතක් ද අධිකරණය වෙත එහි පරීක්ෂා කිරීම සඳහා ඉදිරිපත් කරනු ලැබිය යුතුය.

9. එක්තරා සමාගමක් විසින් ශ්‍රී ලංකාවේ විවිධ රක්ෂණ සමාගම්වල කැමැත්ත සහිතව තොරතුරු එක් රැස් කරමින් "eiusurance.lk" යන වසම් නාමය යටතේ "රක්ෂණ තොරතුරු මධ්‍යස්ථානයක්" නිර්මාණය කිරීමට අදහස් කරනු ලබන බව දන්වා, පනතේ 96 වන වගන්තිය යටතේ "රක්ෂණය" යන වචනය සිය සමාගම් නාමයේ කොටසක් ලෙස භාවිතා කිරීමට මණ්ඩලයේ අනුමැතිය ඉල්ලා සිටියේය.

අයදුම්කාර සමාගම ඉදිරිපත් කළ තොරතුරු තහවුරු කරගැනීමෙන් සහ ශ්‍රී ලංකා රක්ෂණ සංගමයේ සහ ශ්‍රී ලංකා රක්ෂණ තැරැව්කරුවන්ගේ සංගමයේ ඒ පිළිබඳ තවදුරටත් අදහස් ලබා ගැනීමෙන් පසු, එම යෝජිත වෙබ් අඩවිය/ව්‍යාපාර ආකෘතිය රක්ෂණ තැරැව්කරුවකු හෝ රක්ෂණ නියෝජිතවරයකු ලෙස සලකා බැලිය නොහැකි නිසා, එම සමාගමේ ඉල්ලීමට එකඟතාව ලබාදීමට නොහැකි බවට මණ්ඩලය තීරණය කරන ලදි.

10. එක් රක්ෂණ සමාගමක් විසින් එක් මාලදිවයින රක්ෂණ සමාගමක් ප්‍රතිරක්ෂණ සමාගමක් ලෙස පිළිගන්නා ලෙසට ඉල්ලීමක් මණ්ඩලය වෙත ඉදිරිපත් කරන ලදි. කෙසේවෙතත්, එම යෝජිත විදේශීය රක්ෂණ සමාගමට පනතේ 31(1) වගන්තිය යටතේ නිකුත් කරන ලද ප්‍රති-රක්ෂණ නියම හා කොන්දේසිවල සඳහන් ශ්‍රේණිගත කිරීම් නොමැති වීම සලකා බැලූ මණ්ඩලය, එම ඉල්ලීමට එකඟ නොවීය.

11. සංශෝධිත පනතින් හඳුන්වා දුන් විධිවිධාන ප්‍රකාරව රක්ෂණ සමාගම් වල අධ්‍යක්ෂකවරු පත් කිරීම සඳහා මණ්ඩලය විසින් ඉල්ලුම් පත්‍ර රාශියකට අනුමැතිය ප්‍රදානය කර ඇත.

12. පනතේ විධි විධාන අනුව ප්‍රධාන නිලධාරීන් පත් කිරීම සඳහා අනුමැතිය අපේක්ෂාවෙන් රක්ෂණ සමාගම් සහ රක්ෂණ තැරැව්කාර සමාගම් ඉදිරිපත් කරන ලද ඉල්ලුම් පත්‍ර රාශියකට මණ්ඩලය විසින් අනුමැතිය ප්‍රදානය කරන ලදි.


13. අවදානම් පදනම් වූ ප්‍රාග්ධන රීති ප්‍රකාරව තක්සේරුකරුවන් පත් කිරීම සඳහා රක්ෂණ සමාගම් වෙත මණ්ඩලය විසින් අනුමැතිය ප්‍රදානය කරන ලදි.

# විමර්ශන සමාලෝචනය

වත්මන් හා අනාගත ඔප්පු හිමියන්ගේ සුභසිද්ධිය ආරක්ෂා කිරීමේ සමස්ථ පරමාර්ථය යටතේ, රක්ෂණ හිමිකම්පාන්නන් විසින් මණ්ඩලය වෙත යොමු කරනු ලබන, රක්ෂණ වන්දි ගෙවීම් සම්බන්ධයෙන් රක්ෂකයන් හා හිමිකම්පාන්නන් අතර හටගන්නා ආරවුල් විමර්ශනය කිරීමට හා ඒවා නිරාකරණය කිරීමට මණ්ඩලයට බලතල ඇත. එමෙන්ම, කිසියම් රක්ෂකයෙකු, තැරැව්කරුවෙකු හෝ නියෝජිතයෙකුගේ විෂමාචාරයක් හෝ අක්‍රමිකතාවයක් පිළිබඳව ලැබෙන පැමිණිලි ද මණ්ඩලය විසින් විමර්ශනය කරනු ලබයි.

යම් ආරවුලක් හෝ පැමිණිල්ලක් (රක්ෂකයෙකු, තැරැව්කරුවකු හෝ නියෝජිතයෙකුට එරෙහිව) මණ්ඩලය වෙත යොමු කරනු ලැබූ විටකදී, ආරවුලට සම්බන්ධ අනෙක් පාර්ශවයට හෝ පැමිණිල්ලට ලක් වූ පාර්ශවයට තම ස්ථාවරයට අදාල කරුණු පැහැදිලි කිරීමට අවස්ථාවක් දෙනු ලබන අතර අවශ්‍ය වුවහොත් දෙපාර්ශවයෙන්ම වැඩිදුර තොරතුරු සහ පැහැදිලි කරගැනීම් ලබාගනු ලැබේ. මීට අමතරව, කාරණය නිරාකරණය කිරීම සඳහා අදාල රාජ්‍ය ආයතනයන්ගෙන් හා ස්වාධීන විශේෂඥයන්ගෙන් ද අවශ්‍ය අවස්ථා වලදී මණ්ඩලය විසින් උපදෙස් ලබාගැනීම සිදු කරනු ලබයි.

**රූප සටහන 1**
**පසුගිය වසර පහ (5) තුළ ලැබුණු පැමිණිලි**




**රූප සටහන 2**
**2016 වසර තුළ දී ලැබුණු පැමිණිලි - මාසිකව**




## 2016 වසර තුළ දී මණ්ඩලය වෙත යොමු කරන ලද පැමිණිලි


සමාලෝචිත වසර තුළ දී මණ්ඩලය වෙත නව පැමිණිලි 353 ක් යොමු වී ඇති අතර වසර තුළ දී පැමිණිලි 345ක් සම්බන්ධයෙන් විමර්ශන කටයුතු අවසන් කර ඇත. විමර්ශිත පැමිණිලි අතුරින්, මණ්ඩලයේ මැදිහත් වීම මත, රක්ෂණ හිමිකම්පෑම් 72 කට අදාල වන්දි ගෙවීමට රක්ෂකයින් විසින් කටයුතු කරන ලදී. එසේ මණ්ඩලයේ මැදිහත් වීම මත ගෙවන ලද රක්ෂණ වන්දිවල මුළු වටිනාකම රුපියල් මිලියන 21.5 ක් පමණ වේ.

පසුගිය වසර පහ (5) ක කාලය තුළ මණ්ඩලය වෙත යොමු කෙරුණු මුළු පැමිණිලි සංඛ්‍යාව 1,475 කි. 1 වන රූප සටහන අනුව, වැඩිම පැමිණිලි සංඛ්‍යාවක් වාර්තා වී ඇත්තේ සමාලෝචිත වසරේදී (2016) වේ. මණ්ඩලය විසින් සිදු කරන ලද විවිධ දැනුවත් කිරීමේ වැඩසටහන් හරහා මණ්ඩලයේ කාර්යභාරය පිළිබඳ මහජනතාවගේ දැනුවත්භාවය වැඩිදියුණු වීම, මේ සඳහා හේතු වන්නට ඇතැයි සැලකිය හැකිය.

2016 වසර තුළ මණ්ඩලය වෙත මාසිකව ලැබුණු පැමිණිලි පිළිබඳ විස්තරයක් 2 වැනි රූප සටහන මගින් දැක්වේ. නොවැම්බර් මාසයේ දී වැඩිම පැමිණිලි සංඛ්‍යාවක් (36) වාර්තා වී ඇති අතර අඩුම පැමිණිලි සංඛ්‍යාවක් වන, පැමිණිලි 17 ක් වාර්තා වී ඇත්තේ අප්‍රේල් මාසයේදී ය. මසකට සාමාන්‍යයෙන් පැමිණිලි 30 ක් පමණ ලැබී ඇති අතර, ජනවාරි, පෙබරවාරි, ජූනි, ඔක්තෝබර්, නොවැම්බර් හා දෙසැම්බර් යන මාසයන් හි එකී සාමාන්‍ය අගය ඉක්මවා පැමිණිලි ලැබී ඇත.

2016 වසරේ දී ලැබුණු මුළු පැමිණිලිවල වර්ගීකරණයක් 3 වන රූප සටහන මගින් දක්වා ඇත. ඒ අනුව, වසර තුළ දී යොමු වූ මුළු පැමිණිලි වලින් 229 (65%) ක් සාමාන්‍ය රක්ෂණ ව්‍යාපාරය ආශ්‍රිතව ද පැමිණිලි 93 (26%) ක් දීර්ඝ

**රූප සටහන 3**
**2016 වර්ෂයේදී ලැබුණු පැමිණිලි වර්ගීකරණය**




කාලීන රක්ෂණ ව්‍යාපාරය ආශ්‍රිතව ද විය. ඉතිරි පැමිණිලි 31 (9%) සාමාන්‍ය හෝ දීර්ඝ කාලීන ලෙස වර්ගීකරණය කළ නොහැකි පැමිණිලි වේ. 2016 වර්ෂයේ දී මණ්ඩලය වෙත ලැබුණු පැමිණිලි සංයුතිය, පසුගිය වර්ෂයට සාපේක්ෂව සැලකිය යුතු ලෙස වෙනස් වී නොතිබුණි.

## දීර්ඝ කාලීන රක්ෂණ ව්‍යාපාරයට අදාල පැමිණිලි

දීර්ඝ කාලීන රක්ෂණ ව්‍යාපාරයට අදාලව ලැබුණු පැමිණිලි, එසේ පැමිණිලි කිරීමට හේතු වූ මූලික කාරණාවට අනුව සිදුකළ වර්ගීකරණයක් 1 වැනි වගුවේ දක්වා ඇත. හිමිකම් ගෙවීම ප්‍රතික්ෂේප වීම සම්බන්ධයෙන් වැඩිම පැමිණිලි සංඛ්‍යාවක් ලැබී ඇත. එකී හිමිකම් ගෙවීම ප්‍රතික්ෂේප වීම ආශ්‍රිත පැමිණිලි සඳහා ප්‍රධාන වශයෙන් හේතු වී ඇත්තේ රක්ෂණ ඔප්පුව ලබාගැනීමේදී හෝ පුනස්ථාපනයේදී වැදගත් කරුණු වරදවා දැක්වීම හෝ යෝජනා පත්‍රය මගින් වැදගත් කරුණු හෙළිදරව් නොකිරීමයි.

උපරිම සද්භාවය නම් මූලධර්මය මත රක්ෂණ ගිවිසුම් වල වලංගුබව රඳා පවතී. ඒ අනුව, රක්ෂකයා හා රක්ෂිතයා යන දෙපාර්ශවය විසින්ම, රක්ෂණ ගිවිසුමට එළඹීමේ තීරණයට වැදගත් වන්නා වූ කරුණු අනෙක් පාර්ශවයට හෙළිදරව් කිරීමේ වගකීමක් පවතී. විශේෂයෙන්ම දීර්ඝ කාලීන රක්ෂණ ගිවිසුම් වලදී, රක්ෂකයා විසින් විමසනු ලබන සියළු තොරතුරු, නිවැරදිවත් අඩුපාඩු රහිතවත් ලබාදීමට රක්ෂණ යෝජකයාට වගකීමක් ඇත.

මණ්ඩලය විසින් පවත්වනු ලබන දැනුවත් කිරීමේ වැඩසටහන් වලදී ලැබෙන ප්‍රතිචාර සහ ලැබෙන පැමිණිලි වල අන්තර්ගතය අනුව නිරීක්ෂණය වන්නේ, රක්ෂණ ඔප්පුවක් ලබාගැනීමේදී රක්ෂණ යෝජකයා වෙත පැවරෙන, වැදගත් කරුණු හෙළිදරව් කිරීමේ වගකීම පිළිබඳ මහජනතාව අතර ඇති දැනුවත්භාවය ප්‍රමාණවත් නොවන බවයි. මෙම අඩුපාඩුව මගහැරවීම සඳහා, ඔප්පුවක් අලෙවි කරන අවස්ථාවේදී ඔප්පුහිමියා වෙත ලබාදෙන තොරතුරු වල ප්‍රමිතිය ඉහළ නැංවීමට සහ මණ්ඩලය මගින් සිදු කරන දැනුවත් කිරීමේ වැඩසටහන් මගින් අවශ්‍ය පියවර ගෙන ඇත. වැදගත් කරුණු හෙළිදරව් නොකිරීම හෝ කරුණු වරදවා දැක්වීම, හිතාමතා හෝ වංචනිකව සිදු නොකළ බවට තහවුරු වූ අවස්ථා වලදී, අදාල හිමිකම් ගෙවීම් ප්‍රතික්ෂේප කිරීම් සම්බන්ධව රක්ෂණ මණ්ඩලයට මැදිහත් වීමට හැකි විය.

හිමිකම් ඉල්ලුම් කරන අවස්ථාවේදී, නියමිත දිනට වාරික නොගෙවීම නිසා රක්ෂණ ඔප්පුව අප්‍රාණික තත්වයේ පැවතීම හේතුවෙන් ද හිමිකම් ප්‍රතික්ෂේප වී තිබුණි. වාරික ගෙවිය යුතු නියමිත කාල සීමාව රක්ෂණ ඔප්පුවේ දක්වා ඇති අතර එබැවින් නියමිත දිනට පෙර වාරික ගෙවීම සඳහා රක්ෂණ ඔප්පුහිමියාහට ගිවිසුම්ගත වගකීමක් තිබේ. තමන් වෙත ලැබෙන සියළු වාරික ගෙවීම් සඳහා රිසිට්පතක් නිකුත් කිරීමට රක්ෂකයන් බැඳී සිටින අතර, යම් ආරවුලකදී තමන් නියමිත පරිදි රක්ෂණ වාරික ගෙවූ බව තහවුරු කිරීමට ඔප්පුහිමියා හට ඇති එකම පිළිගත හැකි සාක්ෂිය එම රිසිට්පත වේ. නියමිත පරිදි වාරික ගෙවූ බව තහවුරු වූ අවස්ථාවන්හි දී පමණක් අදාල ආරවුල් සම්බන්ධයෙන් මණ්ඩලයට මැදිහත් විය හැකි විය.

ඔප්පුවේ කොන්දේසි වැරදියට වටහා ගැනීම සහ රක්ෂකයන් විසින් ප්‍රමාණවත් පැහැදිලි කිරීම් හා විස්තර ලබා නොදීම, ගෙවූ හිමිකම් මුදල ප්‍රමාණවත් නොවීමට අදාල ආරවුල් සඳහා ප්‍රධාන හේතුව වී ඇත. සෘජුවම මණ්ඩලය විසින් හෝ අදාල රක්ෂකයන් හරහා, අවශ්‍ය පැහැදිලි කිරීම් ලබාදීම මගින් එම ආරවුල් නිරාකරණය කිරීමට හැකි

**වගුව 1**
**දීර්ඝ කාලීන රක්ෂණ ව්‍යාපාරයට අදාල පැමිණිලි - ගැටළුව අනුව**

| ගැටළුව | # | % |
|---|---|---|
| හිමිකම් ගෙවීම ප්‍රතික්ෂේප වීම | 32 | 34.40 |
| හිමිකම් මුදල ප්‍රමාණවත් නොවීම | 23 | 24.73 |
| ඔප්පු අවලංගු කිරීම/ පුනස්ථාපනය | 20 | 21.50 |
| වෙනත් | 18 | 19.35 |
| **එකතුව** | 93 | 100.00 |

විය. ඔප්පුවේ කොන්දේසි වලට අනුකූල නොවන පරිදි ප්‍රතිලාභ ගණනය කර ඇති සහ ප්‍රතිලාභ ගණනය කිරීමේ පදනම ඔප්පුවේ දක්වා නොමැති අවස්ථාවන් කිහිපයකදී, රක්ෂිතයාගේ සුභසිද්ධිය පිණිස, යෝජිත හිමිකම් මුදල නැවත සලකා බලන ලෙස රක්ෂකයන් වෙත මණ්ඩලය උපදෙස් ලබාදුනි.

ප්‍රධාන වශයෙන් මූල්‍ය අපහසුතා සහ රක්ෂණ ඔප්පුවේ ප්‍රතිලාභ පිළිබඳ වැරදි මතයන් හේතුවෙන්, රක්ෂණ ඔප්පු කාලසීමාව තුළ දී ඔප්පුව අවලංගු කර ගෙවන ලද වාරික මුදල් නැවත ලබාදෙන ලෙස ඇතැම් රක්ෂිතයන් ඉල්ලීම් කරනු ලබයි. නමුත්, දීර්ඝ කාලීන රක්ෂණයේදී වාරික වශයෙන් ගෙවන ලද මුදල්, රක්ෂණ ඔප්පුව ආරම්භයේ සිට දින 21 ක කාලසීමාවකින් පසුව, නැවත ලබාගැනීමට රක්ෂිතයන් හට හිමිකමක් නොමැත. රක්ෂිතයන්ගේ ආර්ථික හා අනෙක් දුෂ්කරතාවයන් සැලකිල්ලට ගෙන යම් සහනයක් සැලසීමට රක්ෂකයන් එකඟ වූ අවස්ථා කිහිපයකදී හැරෙන්නට එවැනි ඉල්ලීම් සම්බන්ධයෙන් මැදිහත් වීමට මණ්ඩලයට හැකියාවක් නොතිබුණි.

මණ්ඩලය වෙත ලැබුණු ඉහත සඳහන් පැමිණිලි උද්ගතවීමට මූලික හේතු හඳුනාගැනීමෙන් පසු, දැනුවත් කිරීමේ වැඩසටහන් සහ අදාල නියාමන මැදිහත්වීම් හරහා එම හේතු අවම කිරීමට අවශ්‍ය පියවර ගන්නා ලදි.

## සාමාන්‍ය රක්ෂණ ව්‍යාපාරයට අදාල පැමිණිලි

හිමිකම් ප්‍රතික්ෂේප වීමට අදාල පැමිණිලි සඳහා ප්‍රධාන හේතූන් වූයේ, හිමිකමට අදාල වැදගත් කරුණු වරදවා දැක්වීම සහ ඔප්පුවේ කොන්දේසි හා ප්‍රතිඥාභාර (රක්ෂිතයා විසින් සපුරාලියයුතු අවශ්‍යතා) උල්ලංඝණය වීමයි. සාමාන්‍ය රක්ෂණ ව්‍යාපාරයට අදාල පැමිණිලිවලින් බහුතරය රථ වාහන රක්ෂණය සම්බන්ධයෙන් වූ අතර එම ප්‍රමාණය සාමාන්‍ය රක්ෂණ ව්‍යාපාරයේ රථ වාහන රක්ෂණයට අදාල දළ ලිඛිත වාරික ආදායමේ ප්‍රතිශතයට අනුරූපී වේ. මණ්ඩලය වෙත යොමු කරන ලද, රථ වාහන හිමිකම් ප්‍රතික්ෂේප වීමට අදාල පැමිණිලි සඳහා ප්‍රධාන හේතූන් වූයේ; අනතුර දැනුම්දීමට ප්‍රමාද වීම, අනතුරින් පසු රියදුරු මාරු කිරීම (වෙනත් රියදුරකු ඉදිරිපත් කිරීම) සහ නියමිත කාලය තුළ වාරිකය නොගෙවීම හේතුවෙන් ඔප්පුව අවලංගු වී තිබීමයි. රක්ෂණ හිමිකම් ප්‍රතික්ෂේප වීම සම්බන්ධයෙන් මණ්ඩලයට මැදිහත්වීමට හැකි වූයේ, කිසිදු ආකාරයේ වංචාවක් හෝ හිතාමතා/නොසැකිලිමත්කම හේතුවෙන් හිමිකමට අදාල කරුණු වරදවා දැක්වීමක් සිදු වී නොමැති බව තහවුරු වූ අවස්ථා වලදී පමණි.

හිමිකම් මුදල ප්‍රමාණවත් නොවීමට අදාල ආරවුල් සඳහා ප්‍රධාන හේතු ලෙස නිරීක්ෂණය වූයේ, තම තීරණය දැනුම්දීමේ ලිපිවල රක්ෂකයන් විසින් තම තීරණය සම්බන්ධයෙන් ප්‍රමාණවත් පැහැදිලි කිරීම් ලබානොදීමයි. එම ආරවුල් බොහොමයක් අවශ්‍ය පැහැදිලි කිරීම් ලබාදීම මගින් නිරාකරණය කළ හැකි විය. රක්ෂණ හිමිකම් ගෙවීම් ප්‍රමාද වීම සම්බන්ධයෙන් ලැබුණු සියළු ආරවුල් මණ්ඩලයේ මැදිහත් වීම මත නිරාකරණය කිරීමට හැකි විය.

## වෙනත් පැමිණිලි

දීර්ඝකාලීන හෝ සාමාන්‍ය රක්ෂණ ව්‍යාපාරයට සෘජුව අදාල නොවන වෙනත් පැමිණිලි 31 ක් 2016 වර්ෂය තුළ දී මණ්ඩලය වෙත ලැබුණි. මින් බහුතරයක් රක්ෂණ නියෝජිතයන්ගේ අසාධාරණ ලෙස සේවය අවසන් කිරීම් හා අවශ්‍ය අධ්‍යාපන සුදුසුකම් සපුරා නොමැතිවීම සම්බන්ධයෙන් වේ. පනතේ සඳහන් මණ්ඩලයේ විෂය පථය ප්‍රකාරව එසේ ලැබුණු වෙනත් පැමිණිලි සම්බන්ධයෙන් අවශ්‍ය ක්‍රියාමාර්ග ගන්නා ලදී.

**වගුව 2**

**සාමාන්‍ය රක්ෂණ ව්‍යාපාරයට අදාල පැමිණිලි - ගැටළුව අනුව**

| ගැටළුව | # | % |
|---|---|---|
| හිමිකම් ගෙවීම ප්‍රතික්ෂේප වීම | 146 | 63.75 |
| හිමිකම් මුදල ප්‍රමාණවත් නොවීම | 45 | 19.66 |
| හිමිකම් ගෙවීම ප්‍රමාද වීම | 13 | 5.67 |
| වෙනත් | 25 | 10.92 |
| **එකතුව** | 229 | 100.00 |

## ව්‍යාපාරික චර්යාව නියාමනය කිරීම :

### 1. රක්ෂකයන් සහ රක්ෂණ තැරැව්කරුවන් විසින් පාරිභෝගික පැමිණිලි නිරාකරණය කිරීමට අදාල මාර්ගෝපදේශයන්

රක්ෂකයන් හා රක්ෂණ තැරැව්කරුවන් විසින් පාරිභෝගික පැමිණිලි නිරාකරණය කිරීමේදී අනුගමනය කළයුතු ක්‍රියාපිළිවෙත සම්බන්ධයෙන් මාර්ගොපදේශනයන් 2016 වර්ෂයේ ඔක්තෝබර් 01 දින සිට ක්‍රියාත්මක වන පරිදි මණ්ඩලය විසින් නිකුත් කරන ලදී. පාරිභෝගිකයන් වෙත සාධාරණ ලෙස සැලකීම තහවුරු කිරීම සඳහා රක්ෂණ තැරැව්කරුවන් හා රක්ෂකයන් විසින් තමන් වෙත ලැබෙන පැමිණිලි ඉක්මන් හා සාධාරණ ක්‍රමවේදයකට අනුව නිරාකරණය කිරීමට අවශ්‍ය ප්‍රතිපත්ති සහ ක්‍රියාපිළිවෙත් ස්ථාපනය කිරීම මෙම මාර්ගෝපදේශයන්හි මූලික අරමුණ වේ.

රක්ෂකයන් හා රක්ෂණ තැරැව්කරුවන් විසින් තම පාරිභෝගිකයන්ගේ දැනගැනීම සඳහා පැමිණිලි නිරාකරණය කිරීමේ පටිපාටිය ප්‍රසිද්ධ කිරීම හා පැමිණිලි කළමනාකරණය කිරීමේ ආයතනික ප්‍රතිපත්තියක් ගොඩනැංවීම අදාල මාර්ගෝපදේශයන් යටතේ අපේක්ෂා කෙරේ. රක්ෂකයන් හා රක්ෂණ තැරැව්කරුවන් විසින් පාරිභෝගික පැමිණිලි පිළිබඳ වාර්තා පවත්වාගෙනයාම ද එම පැමිණිලි උද්ගත වීම සඳහා පාදක වූ හේතූන් හඳුනාගැනීම ද

මාර්ගෝපදේශයන් යටතේ තවදුරටත් අපේක්ෂා කෙරේ. මෙම මාර්ගෝපදේශයන් නිකුත් කිරීම, රක්ෂණ ඔප්පුහිමියන්ගේ අයිතීන් ආරක්ෂා වන පරිදි, ශ්‍රී ලංකාව තුළ රක්ෂණ ව්‍යාපාරය වෘත්තීමය හා විචක්ෂණ භාවයෙන් යුතුව කරගෙන යනු ලබන බවට වගබලා ගැනීමේ රක්ෂණ මණ්ඩලයේ මූලික අරමුණ හා අනුකූල වේ.

## 2. රක්ෂණ හිමිකම් සම්බන්ධයෙන් විමර්ශනයන් සිදු කළයුතු ආකාරය පිළිබඳ මාර්ගෝපදේශයන්

රක්ෂණ ව්‍යාපාරයේ වෘත්තීමයභාවය ප්‍රවර්ධනය කිරීමේ අරමුණින්, රක්ෂණ හිමිකම් ගෙවීමට අදාල විමර්ශනයන් කිරීමේදී පවත්වාගත යුතු අවම ප්‍රමිතීන් නීර්ණය කිරීම සඳහා මණ්ඩලය විසින් 2017.01.01 දින සිට ක්‍රියාත්මක වන පරිදි, මෙම මාර්ගෝපදේශයන් නිකුත් කරනු ලැබීය. මෙම මාර්ගෝපදේශයන් යටතේ, විමර්ශනයේ රහස්‍යභාවය ආරක්ෂාවන අයුරින්, රක්ෂකයන්ගේ හා හිමිකම්පාන්නන්ගේ අයිතීන් පිළිබඳ සැලකිලිමත්වෙමින්, ස්වාධීන හා අපක්ෂපාතී ලෙස විමර්ශන නිලධාරීන් විසින් සිය කාර්යභාරය ඉටු කරනු ලබන බවට තහවුරු කිරීම රක්ෂකයන් වෙතින් අපේක්ෂා කෙරේ. තවද, හිමිකම්පාන්නන්, සාක්ෂිකරුවන් හා තොරතුරු ලබාදෙන්නන් ආදී පුද්ගලයන් සමග වෘත්තීමයභාවය සුරැකෙන ලෙස කටයුතු කිරීම ද මාර්ගෝපදේශයන් යටතේ අපේක්ෂා කෙරේ.

## 3. රක්ෂණ නියෝජිතයන්ට අදාල කරුණු

රක්ෂණ නියෝජිතයන්ට අදාල කරුණු පිළිබඳ සාකච්ඡා කොට අවශ්‍ය පියවර ගැනීම සඳහා මණ්ඩලය, ශ්‍රී ලංකා රක්ෂණකරුවන්ගේ සංගමය (IASL), ශ්‍රී ලංකා රක්ෂණ තැරැව්කරුවන්ගේ සංගමය (SLIBA) සහ ශ්‍රී ලංකා රක්ෂණ ආයතනයේ (SLII) සාමාජිකත්වයෙන් කමිටුවක් පත්කර ඇත. එකී කමිටුව මගින් සමාලෝචිත වර්ෂය තුළ පහත කරුණු පිළිබඳ සාකච්ඡා කර අදාල පියවර ගෙන ඇත.

### අධ්‍යාපන සුදුසුකම් තහවුරු කිරීම

රක්ෂණ නියෝජිතයන් වශයෙන් ලියාපදිංචිවන පුද්ගලයන්ගේ අධ්‍යාපන සුදුසුකම් පරීක්ෂා කිරීම සඳහා ශ්‍රී ලංකා රක්ෂණකරුවන්ගේ සංගමය විසින් යෝජිත ක්‍රමවේදය, මණ්ඩලය විසින් අනුමත කරන ලදී. ඒ අනුව, අනාගත රක්ෂණ නියෝජිතයන්ගේ අ.පො.ස සාමාන්‍ය පෙළ ප්‍රතිඵල විභාග දෙපාර්තමේන්තුව වෙතින් තහවුරු කර ගැනීම අදාල රක්ෂකයා හෝ රක්ෂණ තැරැව්කරු විසින් සිදුකළ යුතු වේ. ශ්‍රී ලංකා රක්ෂණ ආයතනය විසින් පවත්වනු ලබන, රක්ෂණ නියෝජිතයන් සඳහා වන පූර්ව බඳවාගැනීමේ විභාගයේ ප්‍රතිඵල සඳහන් සහතික පත්‍රය නිකුත් කරනු ලබන්නේ අ.පො.ස. සාමාන්‍ය පෙළ ප්‍රතිඵල තහවුරු කරගැනීමෙන් පසුවයි.

### රක්ෂණ නියෝජිතයන්ට එරෙහි පැමිණිලි විමර්ශනය කිරීමේදී අනුගමනය කළයුතු යහපත් පරිචයන්

කමිටුව විසින් පිළියෙල කරන ලද, රක්ෂණ නියෝජිතයන්ට එරෙහි පැමිණිලි විමර්ශනය කිරීමේදී රක්ෂකයන් විසින් අනුගමනය කළයුතු යහපත් පරිචයන් මණ්ඩලය විසින් අනුමත කරන ලදී. 2016 වසරේ ඔක්තෝබර් 01 දින සිට බලාත්මක වන පරිදි නිකුත් කර ඇති මෙම යහපත් පරිචයන් මගින් මේ සම්බන්ධයෙන් රක්ෂණ ක්ෂේත්‍රයේ පවතින පරිචයන් ප්‍රමිතිගත කිරීම හා විමර්ශනයන් සිදු කිරීමේ දී නිසි ක්‍රමවේදයක් අනුගමනය කිරීම තහවුරු කිරීම අපේක්ෂිතය. තවද, රක්ෂකයන් හා රක්ෂණ තැරැව්කරුවන් විසින් තම විමර්ශනවල දී අනුගමනය කරනු ලබන ක්‍රමවේදයන් පැහැදිලිව නිර්වචනය කරන ලද ආයතනික කාර්යපටිපාටියක ඇතුළත් කර තිබිය යුතු වන අතර, මෙම යහපත් පරිචයන් එම කාර්යපටිපාටියේ ම කොටසක් විය යුතුය.

### රක්ෂණ විකුණුම්කරණයේ නියුතු ස්ථිර සේවකයන්ගේ සුදුසුකම්

කමිටුවේ අදහස් සැලකිල්ලට ගැනීමෙන් අනතුරුව, රක්ෂකයන් හා රක්ෂණ තැරැව්කරුවන් විසින් විකුණුම්කරණය හෝ විකුණුම් කළමණාකරණය සඳහා ස්ථිර සේවයට අළුතින් බඳවා ගන්නා සියළු සේවකයන්හට, රක්ෂණ නියෝජිතයන් වෙත ලබාදෙන හෝ ඊට වැඩි මට්ටමේ පුහුණුවක් ලබාදීම අවශ්‍ය බවත් ඔවුන් විසින් රක්ෂණ නියෝජිතයන්ට අදාල අවම අධ්‍යාපන සුදුසුකම් සපුරා තිබිය යුතු බවත්, මණ්ඩලය විසින් තීරණය කරන ලදී.

### ආචාර ධර්ම පද්ධතිය

කමිටුවේ අදහස් පදනම් කරගෙන, රක්ෂණ මණ්ඩලයේ උපදේශකත්වය යටතේ, ශ්‍රී ලංකා රක්ෂණකරුවන්ගේ සංගමය විසින් රක්ෂණ නියෝජිතයන් සඳහා වන මෙම ආචාරධර්ම පද්ධතිය සකසන ලදී. රක්ෂණ නියෝජිතයකු ලෙස කටයුතු කිරීමේ දී පවත්වා ගත යුතු අවම වෘත්තීමය හා ආචාරධර්ම ප්‍රමිතීන් මෙමගින් නිර්ණය කර ඇත. මෙම ආචාර ධර්ම පද්ධතිය, රක්ෂණ මණ්ඩලය විසින් 2017 මාර්තු මස පැවති අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීමේ දී අනුමත කරන ලදී.

## 4. රථවාහන රක්ෂණය

### මූල්‍ය හෝ කල්බදු සමාගම් (වාහනයේ පරම හිමිකරු) විසින් පුරවනු ලබන රක්ෂණ යෝජනා පත්‍ර මත නිකුත් කෙරෙන රක්ෂණ ඔප්පු

මූල්‍ය/ කල්බදු පහසුකම් යටතේ ලබාගත් වාහන සඳහා රක්ෂණාවරණ ලබාගැනීමේ දී, අදාල රක්ෂණ යෝජනා පත්‍රය (රක්ෂණ

ඔප්පුහිමියා විසින් නොව) මූල්‍ය/ කල්බදු සමාගම විසින් පුරවා අත්සන් කර ඇති අවස්ථා බොහොමයක් නිරීක්ෂණය විය. එවැනි රක්ෂණාවරණ යටතේ රක්ෂණ හිමිකම් ලබාගැනීමේ දී රක්ෂණ ඔප්පුහිමියන්ගේ අයිතීන් තහවුරු කෙරෙන ක්‍රමවේදයක් යෝජනා කරන ලෙස මණ්ඩලය විසින් ශ්‍රී ලංකා රක්ෂණකරුවන්ගේ සංගමය වෙත දන්වන ලදී. ඊට ප්‍රතිචාර ලෙස, එසේ රක්ෂණ ඔප්පුහිමියන් විසින් අත්සන් නොකරන ලද රක්ෂණ යෝජනා පත්‍රයන් හි සඳහන් කරුණු මත පදනම්ව හිමිකම් ප්‍රතික්ෂේප නොකිරීමට ශ්‍රී ලංකා රක්ෂණකරුවන්ගේ සංගමයේ සාමාජික රක්ෂණ සමාගම් එකඟ විය.

### පූර්ණ හානි හිමිකම් ගෙවීමේදී වාහනයේ තක්සේරු වටිනාකම පිළිබඳ ආරවුල්

මේ සම්බන්ධයෙන් ශ්‍රී ලංකා රක්ෂණකරුවන්ගේ සංගමය විසින් යෝජනා කරන ලද ක්‍රමවේදය මණ්ඩලය විසින් අනුමත කරන ලදී. ඒ අනුව, වාහනයේ තක්සේරු වටිනාකම පිළිබඳ ආරවුලක් හටගත් අවස්ථාවකදී (ශ්‍රී ලංකා රක්ෂණකරුවන්ගේ සංගමය විසින් තෝරාගෙන සිය වෙබ් අඩවිය හරහා ප්‍රකාශයට පත්කර ඇති) ස්වාධීන තක්සේරු ආයතනයකින් විකල්ප තක්සේරු වටිනාකමක් පාරිභෝගිකයා විසින් ලබාගත යුතු වේ. පාරිභෝගිකයාගේ වියදමින් ලබාගතයුතු මෙම තක්සේරු වටිනාකම, රක්ෂණ සමාගමේ යෝජිත වන්දි මුදලට වඩා වැඩි අවස්ථාවක දී පමණක් සැලකිල්ලට ගතයුතු බව ද මණ්ඩලය විසින් තීරණය කරන ලදී.

### ඔප්පුහිමියන් වෙත රක්ෂණ ඔප්පු ලබාදීම

රක්ෂණ තැරැව්කරුවන්, මූල්‍ය සමාගම්, කල්බදු සමාගම් හා බැංකු හරහා නිකුත් කෙරෙන රථවාහන රක්ෂණාවරණයන්ට අදාල රක්ෂණ ඔප්පු, ඔප්පුහිමියන් වෙත ලබාදීමේදී රක්ෂණ සමාගම් විසින් මුහුණපාන ප්‍රායෝගික ගැටළු පිළිබඳව ශ්‍රී ලංකා රක්ෂණකරුවන්ගේ සංගමය විසින් මණ්ඩලය වෙත දන්වන ලදී. ඒ සම්බන්ධයෙන් සලකා බැලීමෙන් අනතුරුව අදාල අතරමැදි සමාගම වෙත නියමිත කාලසීමාව තුළ දී රක්ෂණ ඔප්පුවේ පිටපත් 2 ක් යොමු කිරීමට හැකිවන පරිදි, රක්ෂණ මණ්ඩලයේ විධාන අංක 02 සංශෝධනය කරන ලදී. තවද, රක්ෂණ ඔප්පුවේ පිටපතක් රක්ෂණ සමාගමේ ඕනෑම ශාඛාවකින් ලබාගත හැකි බව, රක්ෂණ සමාගම් විසින් රක්ෂණ සහතිකය සහ/හෝ ඔප්පු උපලේඛනය මගින් ඔප්පුහිමියන්ව දැනුවත් කළයුතු බවට ද මණ්ඩලය තීරණය කරන ලදී.

### 5. ප්‍රචාරක දැන්වීම්වල අන්තර්ගතය

පනතේ 99 වන වගන්තිය ප්‍රකාරව, රක්ෂකයන් විසින් ප්‍රචාරය කරනු ලබන දැන්වීම්වල කිසිදු අසත්‍ය, වැරදි සහගත හෝ මහජනයා නොමඟයවන සුළු තොරතුරක් හෝ කරුණක් ඇතුළත් නොවිය යුතුය. රක්ෂකයන් වෙනුවෙන් රක්ෂණ සැලසුම් අලෙවිකරණයේ නිරතව සිටින ජංගම දුරකථන සමාගම් විසින් ප්‍රචාරය කරන ලද ඇතැම් දැන්වීම්වල මහජනයා නොමඟ යවන සුළු තොරතුරු ඇතුළත්ව තිබූ බව නිරීක්ෂණය වීමෙන් පසු එම දැන්වීම් නොපමාව නිවැරදි කරන ලෙස අදාල රක්ෂකයන් වෙත දන්වන ලදී. ඒ අනුව, එම පුවත්පත් දැන්වීම් නිවැරදි කරන ලදී.

# වෙළඳපොළ සංවර්ධන සහ බාහිර සබඳතා සමාලෝචනය

ආර්ථිකයේ තිරසාර වර්ධනයට දායක වෙමින් සමාජයක අවදානම් ආවරණය කිරීමට භාවිතා කරන්නා වූ වැදගත් වුත් අනන්‍යවූත් මූල්‍යමය මෙවලමක් ලෙස රක්ෂණය විසින් තීරණාත්මක කාර්ය භාරයක් කරනු ලබයි. ආර්ථිකයට රක්ෂණය වැදගත් වුවත් එසේම අවදානම් අඩු කිරීමෙහිලා භාවිතා කළ හැකි උපකරණයක් ලෙස අනෙකුත් දියුණු රටවලට සාපේක්ෂව රක්ෂණ නිපැයුම් ලංකාව තුළ තවමත් පුළුල්ව භාවිතාවීමක් දක්නට නොලැබේ. සාමාන්‍ය මහජනතාව ඔවුන් වෙනුවෙන් සහ ඔවුන්ගේ පවුල්වල සාමාජිකයන් වෙනුවෙන් වැදගත් තීරණ ගැනීමේදී ඔවුන්ට අවශ්‍ය දැනුම තිබේ දැයි සහතිකවීම සඳහා "රක්ෂණය පිළිබඳව දැනුවත්වීම" අතිශය වැදගත් කාර්ය භාරයක් කරනු ලබයි. රක්ෂණය පිළිබඳ දැනුවත්වීම වර්ධනය කිරීම තුළින් රක්ෂණ සංකල්ප හා රක්ෂණ නිපැයුම් පිළිබඳ අවබෝධය වර්ධනය කර ගැනීම, අවදානම් හා යෝග්‍ය අවස්ථාවන් පිළිබඳ අවබෝධ කර ගැනීමට අවශ්‍ය හැකියාවන් වර්ධනය කර ගැනීම හා තම අවශ්‍යතාවයන්ට ගැළපෙන පරිදි රක්ෂණය සම්බන්ධයෙන් තීන්දු තීරණ ගැනීම සඳහා මහජනතාවට ඉඩ ප්‍රස්තාවන් හිමි වේ.

සමාජීය, අධ්‍යාපනික හා සංස්කෘතික වැනි පසුබිම නොසලකමින් සියලුම පුරවැසියන් හට රක්ෂණ කර්මාන්තය තුළ ඇති අවස්ථාවන් භුක්තිවිඳීමේ විශ්වාසයෙන් ජනතාව වෙත රක්ෂණ දැනුම බෙදාහැරීමට මණ්ඩලය විසින් මෙම අංශය වෙත සැලකිය යුතු සම්පත් ප්‍රමාණයක් වෙන් කර ඇත.

මෙම සමාලෝචිත වසර තුළ "රක්ෂණ දැනුමැති සමාජයක්" බිහි කිරීමේ අරමුණින් මණ්ඩලය විසින් රක්ෂණය පිළිබඳ දැනුවත් කිරීමේ වැඩසටහන් රාශියක් සැලසුම් කර ක්‍රියාත්මක කර ඇත. විවිධ මාධ්‍යයන් ඔස්සේ ක්‍රියාත්මක කරන ලද එවැනි වැඩසටහන්වල විස්තර පහතින් දක්වා ඇත:

## දැනුවත් කිරීමේ වැඩසටහන්

### ප්‍රාදේශීය ලේකම් කාර්යාලවල පවත්වන ලද වැඩසටහන්

ප්‍රාදේශීය ලේකම් කාර්යාල වලට අනුයුක්ත කරන ලද ග්‍රාමසේවා නිලධාරීන්, පොලිස්, දිවිනැගුම සංවර්ධන, කෘෂිකර්ම හා ක්ෂේත්‍ර නිලධාරීන් ඇතුළු රාජ්‍ය නිලධාරීන් ඉලක්ක කර ගනිමින් මෙම වසරේදීද දැනුවත් කිරීමේ වැඩසටහන් ප්‍රාදේශීය ලේකම් කාර්යාල වලදී අඛණ්ඩව පවත්වන ලදී. අදාල ප්‍රාදේශීය ලේකම් කාර්යාල වල ප්‍රාදේශීය ලේකම්වරුන්ගේ සහ පරිපාලන නිලධාරීන්ගේ සහය ඇතිව රාජ්‍ය නිලධාරීන් සඳහා මණ්ඩලය විසින් දැනුවත් කිරීමේ වැඩසටහන් කර ගෙන යන ලදී. මෙහිදී මණ්ඩලයේ කාර්යභාරය (රක්ෂණ කර්මාන්තයේ නියාමන ආයතනය ලෙස), ජීවිත හා දේපලට විය හැකි අවදානම් ආවරණය කිරීම සඳහා රක්ෂණ ඔප්පුවක් තිබීමේ වැදගත්කම හා රක්ෂණ ඔප්පුවක් මිලදී ගැනීමේදී හා එය පවත්වා ගෙන යාමේදී සැලකිලිමත් විය යුතු වැදගත් කරුණු පිළිබඳව දැනුවත් කරන ලදී. රාජ්‍ය සේවයේ බිම් මට්ටමේ සේවයේ නියුතු රාජ්‍ය නිලධාරීන් සමඟ අන්‍යෝන්‍ය ක්‍රියාකාරිත්වය තුළින් රක්ෂණය සම්බන්ධයෙන් මහජනතාවගේ සිතුවිලි රටාව හා අත්දැකීම් පිළිබඳ අවබෝධයක් ලබා ගැනීමට මණ්ඩලයේ නිලධාරීන්ට මෙමගින් අවස්ථාවක් ලැබුණි.

ග්‍රාමසේවා කොට්ඨාශ 798 ක් ආවරණය කරමින් මාතර, හෝමාගම, පොල්ගහවෙල, උහන, කෑගල්ල, හාලිඇල, දොම්පේ, වෙන්නප්පුව, බඩල්කුඹුර, දික්වැල්ල, වලල්ලාවිට හා දිඹුලාගල යන ප්‍රාදේශීය ලේකම් කාර්යාලවල කොට්ඨාශ දින රැස්වීම් වලදී දැනුවත් කිරීමේ වැඩසටහන් 12 ක් පවත්වන ලදී. මෙම වැඩසටහන් සඳහා අදාල ප්‍රදේශවල රජයේ නිලධාරීන් 1858 ක් පමණ සංඛ්‍යාවක් සහභාගි විය.


ප්‍රාදේශීය ලේකම් කාර්යාලයක වැඩසටහනක්

### අනිකුත් වැඩසටහන්

රජයේ සේවකයින් වෙනුවෙන් කරනු ලබන ප්‍රධාන දැනුවත් කිරීමේ වැඩ සටහන් වලට අමතරව, මණ්ඩලය විසින් ව්‍යාපාරික ප්‍රජාව, පාසල් සිසුන් හා විශ්ව විද්‍යාල සිසුන් වෙනුවෙන් රක්ෂණය පිළිබඳව පහත සඳහන් දැනුවත් කිරීමේ වැඩසටහන් පවත්වන ලදී.

- වර්ෂ 2016 මාර්තු මස 31 වන දින ශ්‍රී ලංකා ජාතික වාණිජ මණ්ඩලයේදී ව්‍යාපාරික ප්‍රජාව වෙනුවෙන් දැනුවත් කිරීමේ වැඩසටහනක් පවත්වන ලදී. මෙම වැඩසටහන ශ්‍රී ලංකා ජාතික වාණිජ මණ්ඩලය සමඟ ඒකාබද්ධව මණ්ඩලය විසින් සංවිධානය කර පවත්වන ලදී.
- මොරටුවේ වේල්ස් කුමර හා වේල්ස් කුමරි යන විදුහල්වල, එහි අ.පො.ස. (උ. පෙළ) වාණිජ විෂය ධාරාවේ ශිෂ්‍ය ශිෂ්‍යාවන් හා ගුරුවරුන් වෙනුවෙන් වේල්ස් කුමර විදුහලේදී දැනුවත් කිරීමේ වැඩ සටහනක් පවත්වන ලදී. මෙම වැඩ සටහන වේල්ස් කුමර විදුහලේ ආදි ශිෂ්‍ය සංගමය විසින් සංවිධානය කරන ලදී.
- බෙන්තොට ප්‍රාදේශීය සභාවේ ඉල්ලීම මත ඇල්පිටිය අධ්‍යාපන කලාපයේ පාසැල් කිහිපයක අ.පො.ස. (උ. පෙළ) වාණිජ විෂය ධාරාවේ ශිෂ්‍ය ශිෂ්‍යාවන් හා ගුරුවරුන් වෙනුවෙන් රක්ෂණය පිළිබඳව වැඩ මුළුවක් බෙන්තොට ගාමිණී මධ්‍ය මහා විදුහලේ පවත්වන ලදී.
- සබරගමුව විශ්ව විද්‍යාලයේ කළමනාකරණ පීඨයේ ඉල්ලීමක්

මත රක්ෂණයේ නූතන භාවිතයන් පිළිබඳ දැනුවත් කිරීමේ අධ්‍යාපනික වැඩසටහනක්, බැංකුකරණය හා රක්ෂණය පිළිබඳ විද්‍යාවේදී උපාධිය හදාරන ශිෂ්‍ය ශිෂ්‍යාවන් වෙනුවෙන් මණ්ඩලය විසින් සංවිධානය කරන ලදී.


ශ්‍රී ලංකා ජාතික වාණිජ මණ්ඩලයේ වැඩසටහන්

### විද්‍යුත් මාධ්‍යයන් හරහා දැනුවත් කිරීම

වඩාත් පුළුල් ලෙස ජනතාව අතරට යාම සඳහා ඵලදායි සන්නිවේදන මාධ්‍යයක් ලෙස විද්‍යුත් මාධ්‍යයේ වැදගත්කම හඳුනා ගනිමින් රූපවාහිනී වැඩසටහන් දෙකක් හා ගුවන් විදුලි මාධ්‍ය වැඩසටහන් දෙකක් මෙම සමාලෝචිත වසර තුළ මණ්ඩලය විසින් සංවිධානය කරන ලදී. මණ්ඩලයේ නිලධාරීන් විසින් රක්ෂණය සම්බන්ධව පහත සඳහන් දැනුවත් කිරීමේ වැඩ සටහන් වලට සහභාගි විය.

- "Coffee Table" : පටිගත කරන ලද සාකච්ඡාවක් ලෙස ස්වාධීන රූපවාහිනි සේවය ඔස්සේ ප්‍රචාරය විය.
- "Rupees & Sense" : පටිගත කරන ලද සාකච්ඡාවක් ලෙස ස්වාධීන රූපවාහිනි සේවය ඔස්සේ ප්‍රචාරය විය.
- "සාර ප්‍රභා ගිර" : ශ්‍රී ලංකා ගුවන් විදුලි සංස්ථාවේ වෙළඳ සේවය ඔස්සේ සජීවී වැඩසටහනක් ලෙස ප්‍රචාරය විය.

තවද, ශ්‍රී ලංකා රක්ෂණ සංගමය විසින් සංවිධානය කරන ලද "ජීවිත රක්ෂණය පිළිබඳ දැනුවත් කිරීමේ මාසය - 2016" තුළ ශ්‍රී ලංකා ගුවන් විදුලි සංස්ථාවේ සිටි එෆ් එම් සේවය ඔස්සේ ජීවිත රක්ෂණය පිළිබඳව පටිගත කරන ලද කෙටි පණිවිඩ දිනකට 10 වාරයක් පැයේ පුවත් විකාශනයෙන් පසුව ප්‍රචාරය කරන ලදී.


ගුවන් විදුලි වැඩසටහනක්

### මුද්‍රිත මාධ්‍යයන් හරහා දැනුවත් කිරීම

සමාලෝචිත වසර තුළ, මණ්ඩලය විසින් පහත දැක්වෙන පුවත් පත් නිවේදන හා දැන්වීම් ප්‍රකාශයට පත් කරන ලදී.

#### 'පුවත් පත් නිවේදන

- 2015 වසර තුළ රක්ෂණ කර්මාන්තයේ කාර්ය සාධනය.
- 2016 වසරේ පළමු කාර්තුව තුළ රක්ෂණ කර්මාන්තයේ කාර්ය සාධනය.
- 2016 වසරේ පළමු අර්ධ වාර්ෂික කාල සීමාවේ දී රක්ෂණ කර්මාන්තයේ කාර්ය සාධනය.
- රක්ෂණ කරුවන් හා රක්ෂණ තැරැව්කරුවන් සඳහා වූ පැමිණිලි විභාග කිරීමේ මාර්ග උපදේශ.

#### පුවත් පත් දැන්වීම්

- "මහජනතාව සඳහා වූ විශේෂ නිවේදනයයි" යන මාතෘකාව යටතේ ලියාපදිංචි රක්ෂණ සමාගම් හා රක්ෂණ තැරැව්කාර සමාගම් පිළිබඳව වාර්ෂිකව පළ කෙරෙන පුවත්පත් දැන්වීම.
- වැදගත් කරුණු හෙළිදරව් කිරීම, වාහනයේ වෙළඳපොළ වටිනාකමට ආවරණයක් ලබාගැනීම හා රක්ෂණීය අයිතීන් යනාදී කරුණු වලට අවධානය යොමු කරමින් පළ කරන ලද මෝටර් රථ රක්ෂණය පිළිබඳ දැන්වීම.
- මණ්ඩලයෙන් බලපත්‍ර ලත් රක්ෂණ සමාගම් සමඟ පමණක් ගනුදෙනු කිරීම සම්බන්ධයෙන් "වැදගත් නිවේදනයයි" යන මාතෘකාව යටතේ පළ කරන ලද දැන්වීම.

### සෑම වසරකම, සැප්තැම්බර් මස 01 වන දින "ජාතික රක්ෂණ දිනය" ලෙස ප්‍රකාශයට පත් කිරීම

සෑම වසරකම සැප්තැම්බර් මස 01 වන දින "ජාතික රක්ෂණ දිනය" ලෙස ප්‍රකාශයට පත් කර ගැනීම සඳහා අවශ්‍ය අනුමැතියන් ලබාගැනීමට මණ්ඩලයේ සහයෝගය අපේක්ෂා කරන බව ශ්‍රී ලංකා රක්ෂණ සංගමය දැනුම් දී තිබුණි. මුදල් අමාත්‍යවරයාගේ මූලික අනුමැතිය ලබා ගැනීමට හා කැබිනට් මණ්ඩලයේ අනුමැතියට ඉදිරිපත් කෙරෙන කැබිනට් පත්‍රිකා සකස් කර ගැනීමට මුදල් අමාත්‍යාංශය හා එක්ව කටයුතු කිරීමට මණ්ඩලයට හැකි විය. ඒ අනුව, සෑම වසරකම සැප්තැම්බර් 01 දින "ජාතික රක්ෂණ දිනය" ලෙස ප්‍රකාශයට පත් කිරීමට මුදල් අමාත්‍යවරයා විසින් ඉදිරිපත් කරන ලද යෝජනාවට කැබිනට් මණ්ඩලය විසින් අනුමැතිය ලබා දී තිබුණි.

### ප්‍රකාශන

සමාලෝචිත කාලය තුළ පහත සඳහන් ප්‍රකාශන භාෂා තුනෙන්ම මුද්‍රණය කර ප්‍රධාන වශයෙන් දැනුවත් කිරීමේ වැඩසටහන් වලදී බෙදා හරින ලදී.

- "රක්ෂණ ඔප්පු හිමියෙකු වශයෙන් ඔබගේ යුතුකම් හා අයිතිවාසිකම් පිළිබඳ දැනුවත් වන්න" සම්බන්ධ අත් පත්‍රිකාව
- "සෞඛ්‍ය රක්ෂණාවරණ ගැන ඔබ දැන ගත යුතු දේ" අත් පත්‍රිකාව

ඉහත සඳහන් පුවත් පත් නිවේදන, දැන්වීම් හා අත් පත්‍රිකා අපගේ වෙබ් අඩවියට ඇතුළත් කර ඇත.




අත් පත්‍රිකා

## අනිකුත් කටයුතු

### රක්ෂණ නිමැවුම් විශ්ලේෂණය කිරීම

වර්ෂ 2000 අංක 43 දරන රක්ෂණ කර්මාන්තය විධිමත් කිරීමේ (සංශෝධිත) පනතේ 37 වන වගන්තිය අනුව, රක්ෂණ ඔප්පු හිමියන්ගේ යහපත ප්‍රමාණවත් පරිදි ආරක්ෂා වන්නේද යන්න තවදුරටත් විමසා බැලීම සඳහා සියලුම නව රක්ෂණ (ඔප්පු) ආකෘතීන් මණ්ඩලය වෙත ගොනු කළ යුතුය.

මණ්ඩලය වෙත ගොනු කරනු ලබන විවිධ රක්ෂණ ඔප්පු වර්ග අතරින්, වාර්ෂිකව එක් වර්ගයක් තෝරා ගෙන, රක්ෂණ ඔප්පු හිමියන්ගේ යහපත පිණිස රක්ෂණ නිමැවුම් වැඩි දියුණු කිරීමේ පරමාර්ථය සහිතව එම රක්ෂණ ඔප්පුවල අඩංගුවන්නා වූ කොන්දේසි, ප්‍රතිලාභ ව්‍යුහය හා එහි සැකැස්ම දියුණු කිරීමට එම නිමැවුම්වල අඩු පාඩු විශ්ලේෂණය කිරීමේ අදහසින් අධ්‍යයනයක් කරනු ලබයි. මෙසේ විශ්ලේෂණය කරන ලද රථවාහන, සෞඛ්‍ය හා ගිනි රක්ෂණ නිමැවුම් වල අඩුපාඩු සමාලෝචනය කර ප්‍රතිශෝධනය කිරීමෙන් පසු එම නිර්දේශයන් අනුමැතිය සඳහා මණ්ඩලයේ සාමාජිකයන් වෙත ඉදිරිපත් කරනු ලැබීය. මෙසේ අනුමැතිය ලැබීමෙන් පසුව එම වාර්තාවල අඩංගු නිර්දේශයන් ශ්‍රී ලංකා රක්ෂණ සංගමය වෙත ඔවුන්ගේ ප්‍රතිචාර විමසීම සඳහා යවා ඇත.

### ගෝලීය රක්ෂණ වෙළඳපොළ ප්‍රවණතාවයන් වෙනුවෙන් OECD වෙත දුන් දායකත්වය

ආර්ථික සහයෝගිතාව හා සංවර්ධනය සඳහා වූ සංවිධානයේ (OECD) වාර්ෂික අධීක්ෂණ වාර්තාවේ "ගෝලීය රක්ෂණ වෙළඳපොළ ප්‍රවණතාවයන්" යන නාමය යටතේ වූ ප්‍රකාශනයට ශ්‍රී ලංකා රක්ෂණ කර්මාන්තයේ සංඛ්‍යාත්මක දත්ත, මණ්ඩලය විසින් ලබාදෙන ලදී. මෙය ශ්‍රී ලංකාවේ රක්ෂණ කර්මාන්තයට අදාලව සම්පූර්ණ දත්ත අන්තර් ජාතික ප්‍රකාශනයකට ඇතුළත් වූ ප්‍රථම වතාව වන අතර ඒ බව "ගෝලීය රක්ෂණ වෙළඳපොළ ප්‍රවණතාවයන් - 2016" ප්‍රකාශනයේ සඳහන් කොට ඇත.

### මහජන තොරතුරු විමසීම

සමාලෝචිත වසර තුලදී රක්ෂණය පිළිබඳව ජනතාවගෙන්, ඔප්පු හිමියන්ගෙන් හා අනෙකුත් අදාල පාර්ශව වලින් ඉදිරිපත් වූ විවිධ විමසීම් හා තොරතුරු සඳහා ප්‍රතිචාර දක්වන ලදී.

# පරිපාලනමය සමාලෝචනය

## මානව සම්පත්

ඕනෑම සංවිධානයක සාර්ථකත්වය විශාල වශයෙන්ම රැඳී තිබෙන්නේ එහි ක්‍රියාකාරීත්වයට හවුල් වන්නා වූ පුද්ගලයින්ගේ විශේෂඥ ඥානය මතය. මණ්ඩලයේ සාර්ථක උපක්‍රමවල කශේරුව (කොඳුනාරටිය) වන්නේ අපගේ මානව සම්පත් බැවි අප විශ්වාස කරන්නේ එබැවිනි.

ශ්‍රී ලංකාවේ රක්ෂණ කර්මාන්තය සියළුම රක්ෂණ සහතික දරන්නන්ගේ සහ අනාගත රක්ෂණ සහතික දරන්නන්ගේ අයිතිවාසිකම් ආරක්ෂා කිරීමේ අරමුණින් ක්‍රියාත්මක විය යුතුය යන අභිප්‍රාය සාක්ෂාත් කර ගැනීම උදෙසා අවශ්‍ය යුතුකම් සහ කාර්යභාරය හඳුනා ගැනීම තුළින් මණ්ඩලය සිය සංවිධාන ව්‍යුහය ස්ථාපනය කර ඇත.

අපේක්ෂිත වෘත්තීකයින් නිසි කලට බඳවා ගැනීම තුළින් මානව සම්පත් ශක්තිමත් කිරීම සඳහා අවශ්‍ය පියවර මේ වසර තුළදී මණ්ඩලය විසින් ගන්නා ලදී. මෙම පියවර සාක්ෂාත් කර ගැනීම උදෙසා සමාලෝචිත වසර තුළ දී එක් අධ්‍යක්ෂවරයෙක්, සහය අධ්‍යක්ෂවරයෙක් සහ රියැදුරෙක් ස්ථිර කාර්ය මණ්ඩලයට බඳවා ගන්නා ලද අතර ජීවගණක උපදේශකවරයෙක් කොන්ත්‍රාත් පදනම මත බඳවා ගන්නා ලදී. 2016 දෙසැම්බර් 31 වන දිනට කාර්ය මණ්ඩලය 42 ක් විය. කාර්ය මණ්ඩලයේ අධ්‍යාපනික හා වෘත්තීය සුදුසුකම් පහත වගුවෙන් දැක්වේ.

| නිළධාරීන් සංඛ්‍යාව | අධ්‍යාපනික සුදුසුකම් | | | | | |
|---|---|---|---|---|---|---|
| | පශ්චාත් උපාධිය ප්‍රථම උපාධිය හා වෘත්තීය සුදුසුකම් | පශ්චාත් උපාධිය හා වෘත්තීය සුදුසුකම් | පශ්චාත් උපාධිය හා ප්‍රථම උපාධිය | ප්‍රථම උපාධිය හා වෘත්තීය සුදුසුකම් | ප්‍රථම උපාධිය | වෘත්තීය සුදුසුකම් |
| 42 | 09 | 02 | 01 | 08 | 07 | 03 |

## පුහුණු කිරීම්

ආයතනික අරමුණු සහ කාර්යසාධනය වර්ධනය කර ගැනීම උදෙසා දැනුම සහ වෘත්තීයමය නිපුණතාවන් ලබා ගැනීමට සේවක මණ්ඩලයට සහායවීමේ අරමුණින් පුහුණු සහ සංවර්ධන ප්‍රතිපත්තීන් වෙත අවධානය යොමු කරන ලදී. සේවක මණ්ඩලයේ හැකියාවන් ශක්තිමත් කිරීම උදෙසා දේශීය මෙන්ම විදේශීය පුහුණු අවස්ථාවන් ඔවුන් වෙත වගුවේ දැක්වෙන පරිදි ලබා දෙන ලදී.

| වර්ගය | 2015 (රු.) | 2016 (රු.) |
|---|---|---|
| දේශීය සුදුසුකම් | 1,752,935/- | 2,021,522/- |
| විදේශීය සුදුසුකම් | 8,144,101/- | 8,370,750/- |

## කාර්ය මණ්ඩල සුභසාධනය

කාර්ය මණ්ඩලයේ අභිප්‍රේරණය සහ ධෛර්යය වර්ධනය කිරීම සඳහා ඔවුන්ගේ සුභසාධනය වැදගත් සාධකයකි. එබැවින් ශ්‍රී ලංකා රක්ෂණ මණ්ඩලය විසින් නේවාසික සහ බාහිර වෛද්‍ය පහසුකම්, හදිසි අනතුරු රක්ෂණාවරණ, වාහන ණය, ආපදා ණය හා උත්සව අත්තිකාරම් වැනි සිත්ගන්නා සුළු සුභසාධනයන් ලබා දෙන ලදී. තව ද, කාර්ය මණ්ඩලය සහ ඔවුන්ගේ පවුල්වල අයගේ සබැඳියාවන් වර්ධනය කිරීම උදෙසා නේවාසික පුහුණු වැඩසටහනක් සහ වාර්ෂික සුහද හමුව පවත්වන ලදී.

# මූල්‍ය සමාලෝචනය

## රක්‍ෂණ ඔප්පු හිමියන්ගේ ආරක්ෂණ අරමුදල (PPF)


රක්‍ෂණ පනතේ නියමයන්ට අනුව රක්‍ෂණ ඔප්පු හිමියන්ගේ ආරක්ෂණ අරමුදල වෙනුවෙන් එකතුවන මුදලින් (සෙස්), නියම කොට ඇති කටයුතු සඳහා ක්ෂණිකව යොදවන්නට අවශ්‍ය නොවන මුදල් විචක්ෂණ ලෙස උපරිම ප්‍රතිලාභ ලැබෙන අන්දමින් මෙම වසර තුළ දී ද මණ්ඩලය විසින් ආයෝජනය කරන ලද අතර 1 වැනි රූපසටහනෙන් එම සෙස් බදු ආදායමත් ආයෝජන ආදායමත් විදහා දක්වයි.

වාසිදායක වෙළඳපල තත්වයන්ගේ බලපෑම හේතුවෙන් ආයෝජන ආදායමේ කැපී පෙනෙන වර්ධනයක් 2015 වසරට සාපේක්ෂව 2016 වසරේදි දැකිය හැක.

රක්‍ෂණ ඔප්පු හිමියන්ගේ ආරක්ෂණ අරමුදලේ වටිනාකම පසුගිය වසර පහ තුළ වර්ධනය වී ඇති අන්දම 2 වැනි රූපසටහන මඟින් පෙන්නුම් කරයි.


2016 දෙසැම්බර් 31 වැනි දිනට රක්ෂණ ඔප්පු හිමියන්ගේ ආරක්ෂණ අරමුදලේ වත්කම් සංයුතිය පහත දක්වා ඇත. (රූප සටහන 03)

### රූප සටහන 1
### 2012-2016 කාලපරිච්ඡේදය සඳහා සෙස් බදු ආදායම සහ ආයෝජන ආදායම





| | 2012 | 2013 | 2014 | 2015 | 2016 |
|---|---|---|---|---|---|
| සෙස් ආදායම (රු. මිලියන) | 237 | 246 | 274 | 322 | 408 |
| ආයෝජන ආදායම (රු. මිලියන) | 136 | 236 | 158 | 145 | 229 |

### රූප සටහන 2
### 2012 - 2016 කාලපරිච්ඡේදය සඳහා රක්‍ෂණ ඔප්පු හිමියන්ගේ ආරක්ෂණ අරමුදලේ අගය




| | 2012 | 2013 | 2014 | 2015 | 2016 |
|---|---|---|---|---|---|
| අරමුදලේ වටිනාකම (රු. මිලියන) | 1,622 | 1,778 | 2,183 | 2,643 | 3,292 |

### රූප සටහන 3
### 2016 දෙසැම්බර් 31 වැනි දිනට රක්‍ෂණ ඔප්පු හිමියන්ගේ ආරක්ෂණ අරමුදලේ වත්කම් සංයුතිය



මණ්ඩලයේ සමස්ථ ආදායම ජනනය වන්නේ පහත දැක්වෙන ප්‍රභවයන්ගෙනි:

- රක්ෂකයින් සහ රක්ෂණ තැරැව්කාර සමාගම් ලියාපදිංචිය සඳහා අයකරන ලියාපදිංචි කිරීමේ ගාස්තු
- රක්ෂණ සමාගම්වලින් අය කරන වාර්ෂික ගාස්තු
- වාර්ෂිකව ලියාපදිංචිය අළුත් කිරීම සඳහා රක්ෂණ තැරැව්කාර සමාගම් වලින් අය කරන ගාස්තු
- අතිරික්ත අරමුදල් ආයෝජනයෙන් ලැබෙන පොළී ආදායම

2012 සිට 2016 දක්වා කාලපරිච්ඡේදය සඳහා මණ්ඩලයේ සමස්ත ආදායම බෙදී ඇති ආකාරය 4 වැනි රූපසටහන මඟින් දැක් වේ.

වාර්ෂික ගාස්තු ආදයමේ කැපීපෙනෙන වර්ධනයක් 2014-2016 කාලපර්ච්ඡේදය තුළ දක්නට හැක.


මණ්ඩලය ආසන්න වශයෙන් රු මිලියන 12ක අතිරික්තයක් 2016 වසරේදි වාර්තාකර ඇත. පනතේ විධි විධානවලට අනුකූලව අදයම හා වියදම අතර හිගය රක්ෂන ඔප්පු හිමියන්ගේ ආරක්ෂක අරමුදලින් පෙර වර්ෂවලදී පියවාගෙන ඇති බැවින්, ඉහත අතිරික්තය ආරක්ෂණ අරමුදලට බැර කරන ලදි.

## මණ්ඩලයේ වියදම

2015 වසරට සාපේක්ෂව 2016 වසරේදී වියදමේ සුළු වර්ධනයක් දක්නට ලැබේ.


2012 සිට 2016 කාලපර්ච්ඡේදය දක්වා මණ්ඩලයේ සමස්ථ වියදම 5 වන රූපසටහනෙන් දැක්වෙන අතර ප්‍රධාන වශයෙන් කාර්ය මණ්ඩල වියදම් හා මෙහෙයුම් වියදම් එහි අන්තර් ගත වේ.

**රූප සටහන 4**
**2012 සිට 2016 දක්වා කාලපරිච්ඡේදය සඳහා මණ්ඩලයේ ආදායම**




| | 2012 | 2013 | 2014 | 2015 | 2016 |
|---|---|---|---|---|---|
| වාර්ෂික ගාස්තු (රු. මිලි) | 61 | 70 | 73 | 104 | 126 |
| ලියාපදිංචි හා ලියාපදිංචිය අලුත් කිරීමේ ගාස්තු (රු. මිලි) | 5 | 4 | 4 | 9 | 5 |
| වෙනත් ආදායම් (රු. මිලි) | 2 | 1 | 2 | 2 | 3 |
| ප්‍රදාන හඳුනා ගැනීම් (රු. මිලි) | 7 | 5 | 4 | 5 | 2 |
| මුළු ආදායම් (රු. මිලි) | 75 | 80 | 83 | 119 | 136 |

**රූප සටහන 5**
**2012 සිට 2016 කාලපරිච්ඡේදය තුල මණ්ඩලයේ සමස්ථ වියදම**




| | 2012 | 2013 | 2014 | 2015 | 2016 |
|---|---|---|---|---|---|
| මුළු වියදම (රු. මිලියන) | 94 | 105 | 107 | 123 | 124 |



# මූල්‍ය තොරතුරු

# මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශනය

**2016 දෙසැම්බර් 31 දිනට**

| | සටහන් | 2016<br>රු. | 2015<br>රු. |
|---|---|---|---|
| **වත්කම්** | | | |
| **ජංගම නොවන වත්කම්** | | | |
| දේපල පිරියත සහ උපකරණ | 1 | 7,629,457 | 11,274,097 |
| රක්ෂණ ඔප්පු හිමියන්ගේ ආරක්ෂණ අරමුදල - කුළී සහ විද්‍යුත් තැන්පතු හා භාණ්ඩාගාර බැඳුම්කර | 2 | 1,091,418,880 | 1,091,418,880 |
| **ජංගම වත්කම්** | | | |
| භාණ්ඩ තොග | 3 | 393,033 | 445,902 |
| රක්ෂණ ඔප්පු හිමියන්ගේ ආරක්ෂණ අරමුදල - ආයෝජන හා වෙනත් | 2 | 2,200,416,486 | 1,551,778,353 |
| අනෙකුත් ජංගම වත්කම් | 4 | 19,148,704 | 21,841,991 |
| රජයේ සුරැකුම්පත්වල ආයෝජනය | | 22,700,000 | 1,000,000 |
| මුදල් හා මුදල් හා සමාන දෑ | 5 | 2,301 | 575,848 |
| **මුළු වත්කම්** | | 3,341,708,861 | 2,678,335,071 |
| **සංචිත හා වගකීම්** | | | |
| **සංචිත** | | | |
| රක්ෂණ ඔප්පු හිමියන්ගේ ආරක්ෂණ අරමුදල | 6 | 3,291,835,366 | 2,643,197,233 |
| ප්‍රත්‍යාගණන සංචිතය | | 7,389,652 | 7,389,652 |
| **වගකීම්** | | | |
| **ජංගම නොවන වගකීම්** | | | |
| ප්‍රදාන | 7 | 3,523,232 | 4,965,789 |
| විශ්‍රාම ප්‍රතිලාභ බැඳීම් | 8 | 9,842,625 | 8,035,447 |
| | | 13,365,857 | 13,001,236 |
| **ජංගම වගකීම්** | | | |
| ලද අත්තිකාරම් | | 8,268,794 | 7,526,285 |
| අනෙකුත් ජංගම වගකීම් | 9 | 20,410,878 | 7,220,665 |
| ලෙජරය අනුව සෘණ ශේෂය | 17 | 438,314 | - |
| | | 29,117,986 | 14,746,950 |
| **මුළු සංචිත හා වගකීම්** | | 3,341,708,861 | 2,678,335,071 |

මෙම මූල්‍ය ප්‍රකාශන සකස් කිරීම හා ඉදිරිපත් කිරීම පිළිබඳ වගකීම රක්ෂණ මණ්ඩලයේ සාමාජිකයින් වෙත පැවරේ.

ඉහත මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශනය පිටු අංක 84 සිට 92 දක්වා ඉදිරිපත් කර ඇති ගිණුම්කරණ ප්‍රතිපත්තීන් සහ සටහන් සමඟ සංයෝජිතව කියවිය යුතු වේ.

**ඉන්ද්‍රාණි සුගතදාස**
සභාපතිනිය

**ඒ.ආර්. දේශප්‍රිය**
සාමාජික

කොළඹ, ශ්‍රී ලංකාව
2017 පෙබරවාරි 27

# මෙහෙයුම් ප්‍රතිඵලය පිළිබඳ ප්‍රකාශනය

**2016 දෙසැම්බර් 31 දිනට**

| | සටහන් | 2016<br>රු. | 2015<br>රු. |
|---|---|---|---|
| ආදායම | | | |
| අයභාරය | 10 | 130,972,036 | 113,149,245 |
| ප්‍රදාන හඳුනා ගැනීම් | 7 | 2,061,963 | 4,527,482 |
| පොලී ආදායම | | 3,112,336 | 1,559,380 |
| රක්ෂණ ඔප්පු හිමියන්ගේ ආරක්ෂණ අරමුදලෙන් මාරු කිරීම් | 6 | - | 3,513,004 |
| වෙනත් ආදායම් | 11 | 258,370 | 225,376 |
| මුළු ආදායම | | 136,404,704 | 122,974,487 |
| වියදම් | | | |
| කාර්ය මණ්ඩල පිරිවැය | 12 | (71,862,315) | (70,205,520) |
| වෘත්තීය ගාස්තු | 13 | (2,801,156) | (2,388,225) |
| මෙහෙයුම් වියදම් | 14 | (49,032,420) | (49,986,744) |
| මූල්‍ය සහ අනෙකුත් | 15 | (150,126) | (206,872) |
| රක්ෂණ ඔප්පු හිමියන්ගේ ආරක්ෂණ අරමුදලට මාරුකිරීම් | 6 | (12,185,206) | - |
| මුළු වියදම් | | (136,031,223) | (122,787,361) |
| බදුවලට පෙර ශුද්ධ අතිරික්තය (ඌණතාවය) | | 373,480 | 187,126 |
| බදු | | (373,480) | (187,126) |
| බදුවලට පසු ශුද්ධ අතිරික්තය (ඌණතාවය) | | - | - |
| වර්ෂය සඳහා ශුද්ධ අතිරික්තය | | - | - |

පිටු අංක 84 සිට 92 දක්වා ඉදිරිපත් කර ඇති ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ සටහන් මූල්‍ය ප්‍රකාශනවල සංකලිත කොටසකි.

# මුදල් ප්‍රවාහ ප්‍රකාශනය

**2016 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා**

| | සටහන් | 2016<br>රු. | 2015<br>රු. |
|---|---|---|---|
| මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් ලද මුදල් ප්‍රවාහය | | | |
| කාලපරිච්ඡේදය සඳහා ශුද්ධ වැඩිවීම / (අඩුවීම) | | - | - |
| ක්ෂය සඳහා ගැලපීම් | | 4,259,214 | 5,214,297 |
| විශ්‍රාම ප්‍රතිලාභ සඳහා ප්‍රතිපාදන | | 1,807,178 | 2,278,349 |
| දේපල පිරියත හා උපකරණ විකුණුම් අලාභය | | (66,590) | (15,028) |
| ප්‍රදාන හඳුනාගැනීම | | (2,061,963) | (4,527,482) |
| ආදායම් බදු | | 373,480 | 187,126 |
| පොලී ආදායම | | (3,112,336) | (1,559,380) |
| කාරක ප්‍රාග්ධනය වෙනස්වීමට පෙර ශුද්ධ වැඩිවීම | | 1,198,985 | 1,577,883 |
| | | | |
| කාරක ප්‍රාග්ධනය වෙනස්වීම | | | |
| තොගවල (වැඩිවීම) / අඩුවීම | | 52,869 | (171,058) |
| ලැබිය යුතු දෑ වල (වැඩිවීම) / අඩුවීම | | 2,748,961 | 4,760,311 |
| අත්තිකාරම් ලැබීම් වල වල (වැඩිවීම) / අඩුවීම | | 742,508 | (4,200,249) |
| ණය හිමියන් සහ උපචිතයන්හි (වැඩිවීම) / අඩුවීම | | 13,190,213 | (1,866,056) |
| මෙහෙයුම් ක්‍රියාකාරකම් සඳහා භාවිතා කරන ලද මුදල් ප්‍රවාහය | | 16,734,551 | (1,477,052) |
| මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් වන ශුද්ධ මුදල් ප්‍රවාහය | | 17,933,536 | 100,830 |
| | | | |
| ආයෝජන ක්‍රියාකාරකම්වලින් ලැබූ/(ක්‍රියාකාරකම් සඳහා යෙදූ) මුදල් ප්‍රවාහය | | | |
| රජයේ සුරැකුම්පත් වල ආයෝජනය | | (21,700,000) | (1,000,000) |
| පොලී ආදායම | | 2,683,182 | 1,395,547 |
| දේපල පිරියත සහ උපකරණ විකිණීමෙන් ලද මුදල් | | 71,419 | 41,158 |
| දේපල පිරියත සහ උපකරණ මිලට ගැනීම් | | (619,406) | (3,012,711) |
| ආයෝජන ක්‍රියාකාරකම් සඳහා භාවිතා කරන ලද ශුද්ධ මුදල් ප්‍රවාහය | | (19,564,804) | (2,576,006) |
| | | | |
| මූල්‍ය ක්‍රියාකාරකම් තුළින් ලැබූ මුදල් ප්‍රවාහය | | | |
| රක්ෂණ ඔප්පු හිමියන්ගේ ආරක්ෂණ අරමුදලින් ප්‍රාග්ධන මාරුකිරීම් | | 619,406 | 3,012,711 |
| මූල්‍ය ක්‍රියාකාරකම්වලින් ලද ශුද්ධ මුදල් ප්‍රවාහය | | 619,406 | 3,012,711 |
| | | | |
| මුදල් සහ මුදල් හා සමාන දෑ වල ශුද්ධ වැඩිවීම (අඩුවීම) | | (1,011,862) | 537,535 |
| | | | |
| වර්ෂය ආරම්භයේ දී මුදල් සහ මුදල් හා සමාන දෑ | | 575,848 | 38,313 |
| | | | |
| වර්ෂය අවසානයේ දී මුදල් සහ මුදල් හා සමාන දෑ | | (436,014) | 575,848 |
| | | | |
| අතැති සහ බැංකුවේ ඇති මුදල් | 5 & 17 | (436,014) | 575,848 |

පිටු අංක 84 සිට 92 දක්වා ඉදිරිපත් කර ඇති ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ සටහන් මූල්‍ය ප්‍රකාශනවල සංකලිත කොටසකි.

# රක්ෂණ ඔප්පු හිමියන්ගේ ආරක්ෂණ අරමුදල මුදල් ප්‍රවාහ ප්‍රකාශනය

**2016 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා**

| | සටහන් | 2016<br>රු. | 2015<br>රු. |
|---|---|---|---|
| මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් ලද මුදල් ප්‍රවාහය | | | |
| රක්ෂණ ඔප්පු හිමියන්ගේ ආරක්ෂණ අරමුදලේ ශුද්ධ වර්ධනය | | 648,638,132 | 460,290,461 |
| කාරක ප්‍රාග්ධන වෙනස්වීමට පෙර ශුද්ධ වැඩිවීම | | 648,638,132 | 460,290,461 |
| කාරක ප්‍රාග්ධනය වෙනස්වීම | | | |
| රජයේ සුරැකුම්පත් වලින් ලැබිය යුතු පොලියෙහි (වැඩිවීම) / අඩුවීම | | (46,126,635) | 22,849,356 |
| ලැබිය යුතු සෙස් බදුවල (වැඩිවීම) / අඩුවීම | | (24,664,812) | (10,300,000) |
| අරමුදල් කළමනාකරණ ගිණුමේ ශේෂය වැඩිවීම / (අඩුවීම) | | 952,525 | 5,734,821 |
| සෙස් අරමුදලින් මාරු කළ යුතු අරමුදල්හි වැඩිවීම / (අඩුවීම) | | (19,967,093) | (8,944,939) |
| | | (89,806,014) | 9,339,238 |
| මෙහෙයුම් ක්‍රියාකාරකම් සඳහා භාවිතා කරන ලද ශුද්ධ මුදල් ප්‍රවාහය | | 558,832,118 | 469,629,698 |
| ආයෝජන ක්‍රියාකාරකම්වලින් ලද මුදල් ප්‍රවාහය | | | |
| රජයේ සුරැකුම්හි ආයෝජනය | | 362,599,903 | (1,677,958,452) |
| ස්ථාවර තැන්පතුවල ආයෝජන | | (922,000,000) | 1,208,400,000 |
| ආයෝජන ක්‍රියාකාරකම්වලින් ලද/(යෙදවූ) ශුද්ධ මුදල් ප්‍රවාහය | | (559,400,097) | (469,558,452) |
| මුදල් සහ මුදල් හා සමාන දෑ වල ශුද්ධ වැඩිවීම (අඩුවීම) | | (567,980) | 71,247 |
| වර්ෂය ආරම්භයේ දී මුදල් සහ මුදල් හා සමාන දෑ | | 1,071,247 | 1,000,000 |
| වර්ෂය අවසානයේ දී මුදල් සහ මුදල් හා සමාන දෑ | | 503,267 | 1,071,247 |
| බැංකුවේ ඇති මුදල් | 2 & 17 | 503,267 | 1,071,247 |

පිටු අංක 84 සිට 92 දක්වා ඉදිරිපත් කර ඇති ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ සටහන් මූල්‍ය ප්‍රකාශනවල සංකලිත කොටසකි.

# ගිණුම්කරණ ප්‍රතිපත්ති

## 1. වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති

### 1.1 සකස් කිරීමේ පදනම

ශ්‍රී ලංකා රක්ෂණ මණ්ඩලයේ මූල්‍ය ප්‍රකාශන ඓතිහාසික පදනම මත සකස් කර ඇති අතර ඒවා ඉදිරිපත් කිරීමේ දී අගයන් ආසන්නම ශ්‍රී ලංකා රුපියලට දක්වා ඇත.

යථායෝග්‍ය පරිදි ගිණුම්කරණ ප්‍රතිපත්ති ඉදිරියේ දැක්වෙන සටහන් මගින් අනාවරණය කර ඇත.

### 1.2 අනුකූලතාව පිළිබඳ ප්‍රකාශනය

ශ්‍රී ලංකා රක්ෂණ මණ්ඩලයේ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සකස් කර ඇති අතර, එම මූල්‍ය ප්‍රකාශන එම ගිණුම්කරණ ප්‍රමිතීන් හා අනුකූලතාවය දක්වනු ලැබේ.

### 1.3 වාර්තා කරන දිනයෙන් පසු හටගන්නා සිදුවීම්

වාර්තා කරන දිනයෙන් පසු හටගන්නා සියළුම ප්‍රමාණාත්මක සිද්ධීන් මෙම මූල්‍ය ප්‍රකාශන සකස් කිරීමේ කාර්යයේ දී සැලකිල්ලට ගෙන අවශ්‍ය ගැලපීම් හෝ අනාවරණයන් කර ඇත.

### 1.4 සංසන්දනාත්මක සංඛ්‍යාවන්

ප්‍රවර්ථන වර්ෂයේ ඉදිරිපත් කිරීම හා අනුකූල විය යුතු ආකාරයට පෙර වර්ෂවල සංසන්දනාත්මක සංඛ්‍යා ගැලපීම් කර ඇත.

### 1.5 බදුකරණය

ආදායම් බදු සඳහා ප්‍රතිපාදන 2006 අංක 10 දරන දේශීය ආදායම් පනතෙහි ප්‍රතිපාදනයන් හා අනුකූලව ගණනය කර ඇත.

පොලී හා ලාභාංශ ආදායම හැර මණ්ඩලයේ අනෙකුත් ආදායම් මේ වන විට ආදායම් බදුවලින් නිදහස් කර ඇත.

### 1.6 විදේශ ව්‍යවහාර මුදල් පරිවර්තනය

සියළුම විදේශීය මුදලින් සිදු වූ ගනුදෙනු ඒවා සිදු වූ අවස්ථාවේ දී පැවැති විනිමය අනුපාතිකයන් පාදකව, වාර්තා කරන මුදල් ඒකකය වන ශ්‍රී ලංකා රුපියල් අගයට පරිවර්තනය කර ඇත.

## 2. වත්කම් සහ අගය කිරීමේ පදනම

### 2.1 දේපල, පිරියත හා උපකරණ ස්වසන්තක අයිතිය සහිත දේපල, පිරියත හා උපකරණ

දේපල, පිරියත හා උපකරණ ඒවායේ පිරිවැයෙන්/ප්‍රත්‍යාගණන අගයෙන් සමුච්චිත ක්ෂය අඩු කළ අගයට නිරූපණය කර ඇත. දේපල, පිරියත හා උපකරණවල පිරිවැයට ඇතුළත් වන්නේ, අත්පත් කර ගැනීමේ පිරිවැය සමඟ එම වත්කම් අපේක්ෂිත භාවිත තත්ත්වයට ගෙන ඒම සඳහා දරන ලද අනෙකුත් වියදම්වල එකතුවයි.

#### ක්ෂය

වත්කම්වල ඇස්තමේන්තුගත ඵලදායී ජීවිත කාලය පුරා පහත අනුපාත පාදකව සරල මාර්ග ක්‍රමයට ක්ෂය ගණනය කරනු ලැබේ.

| | වාර්ෂික (%) |
|---|---|
| මෝටර් වාහන | 25 |
| ලී බඩු, වැද්දුම් සහ සවි කිරීම් | 12.5 |
| කාර්යාල හා විද්‍යුත් දත්ත සැකසුම් | 25 |
| උපකරණ | 25 |

ක්ෂය ප්‍රතිපාදන එම වත්කම් මිල දී ගත් දින සිට කරනු ලැබේ. ක්ෂය ප්‍රතිපාදනය වත්කම භාවිතයෙන් ඉවත් කරන තෙක් කරනු ලැබේ. වත්කම් විකුණුම් ලාභ/අලාභ වත්කම් විකුණුම් මුදල එකී වත්කමේ ලියා අඩුකල අගය සමඟ සංසන්දනය කිරීමෙන් නිශ්චය කෙරේ.

### 2.2 ආයෝජන

රජයේ සුරැකුම්පත්හි සහ ප්‍රතිමිලදී ගැනීම් ගිවිසුම්හි කර ඇති ආයෝජන අගය කර ඇත්තේ ඒවායේ පිරිවැයට හෝ මුහුණත් අගය යන 2න් අඩු අගයට වන අතර, ඒවා සඳහා වර්ෂය අවසානය තෙක් පොලී උපචිත පදනම මත ගිණුම් ගත කර ඇත.

### 2.3 තොග

තොග ඒවායේ පිරිවැය හෝ ශුද්ධ උපලබ්ධි අගය යන අගයන්වලින් අඩු අගයට දක්වා ඇත. තොගවල පිරිවැය නිශ්චය කිරීමේ දී ප්‍රථම ලැබීම් ප්‍රථම නිකුත් කිරීමේ ක්‍රමය (ප්‍ර.ලැ.ප්‍ර.නි) ඒ සඳහා පාදක කරගෙන ඇත.

### 2.4 ලැබිය යුතු දෑ

ලැබිය යුතු දෑ නිරූපණය කර ඇත්තේ, ඇස්තමේන්තුගත උපලබ්ධි අගයටයි.

### 2.5 මුදල් සහ මුදල් හා සමාන දෑ

මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සකස් කිරීමේ පරමාර්ථය සඳහා මුදල් හා මුදල් හා සමාන දෑවලින් නියෝජනය වන්නේ බැංකුවේ මුදල් සහ අතැති මුදල්ය.

## 3. බැරකම් සහ ප්‍රතිපාදන

### 3.1 විශ්‍රාම ප්‍රතිලාභ

#### 3.1.1 නිශ්චිත ප්‍රතිලාභ සැලසුම් - පාරිතෝෂික

සේවකයන් සඳහා සේවක පාරිතෝෂිකය ප්‍රථම සේවා වර්ෂයේ සිට සම්පූර්ණ ප්‍රතිපාදනය කෙරෙන ආකාරයට ගිණුම් ගත කර ඇත.

කෙසේ වෙතත් 1983 අංක 12 දරන පාරිතෝෂික ගෙවීම් පනත හා අනුකූලව ගෙවීම් පිළිබඳව වගකීම ඇති වන්නේ වර්ෂ 5 ක අඛණ්ඩ සේවා කාලයක් සම්පූර්ණ කරන ලද්දේ නම් පමණි.

# ගිණුම්කරණ ප්‍රතිපත්ති

### 3.1.2 නිශ්චිත සහභාග සැලසුම් - සේ.අ.අ. සහ සේ.භා.අ.

නිශ්චිත ව්‍යවස්ථාවන් සහ නියාමන හා අනුකූලව මණ්ඩලයේ සියළුම සේවකයන් සේවක අර්ථසාධක අරමුදලට දායකවීමට සහ සේවක භාරකාර අරමුදලට දායකවීමට සුදුසුකම් ලබති. මණ්ඩලය සේවක අර්ථසාධක අරමුදලට සහ සේවක භාරකාර අරමුදලට සේවකයන්ගේ දළ පාරිශ්‍රමිකය මත පිළිවෙළින් 12% ක සහ 3% ක මුදලක් දායක කරයි.

### 3.2 බැරකම්

බැරකම් අතරින් වාර්තා කරන දිනයෙන් පසු වර්ෂයක් තුළ දී හෝ ඉල්ලුම් කළවිටක දී ගෙවිය යුතු වන දෑ මූල්‍ය තත්වය පිළිබඳ ප්‍රකාශයේ ජංගම බැරකම් සේ වර්ගීකරණය කර ඇත. වාර්තා කරන දිනයෙන් පසු වර්ෂයකින් ඔබ්බට ගෙවිය යුතු සියළුම ගෙවීම් ජංගම නොවන බැරකම් ගණයට ඇතුළත් කර ඇත.

මූල්‍ය ප්‍රකාශ සකස් කිරීමේ දී සියළුම දන්නා බැරකම් ඒවායේ පිරිවැයට ඇතුළත් කර ඇත.

### 3.3 ප්‍රදාන

රක්ෂණ ඔප්පු හිමියන්ගේ ආරක්ෂණ අරමුදලෙන් මාරු කරනු ලබන ප්‍රාග්ධන වියදම් ප්‍රදාන සේ හඳුනා ගන්නා අතර එම වත්කම්වල ඇස්තමේන්තුගත ඵලදායී ජීවිත කාලය තුළ දී ඒවා හඳුනා ගනු ලැබේ.

## 4. ආදායම් සහ වියදම්

### 4.1 ආදායම් හඳුනා ගැනීම

ආදායම් උපචිත පදනම මත හඳුනාගෙන ඇත.

### 4.2 වියදම් හඳුනා ගැනීම

මණ්ඩලය පවත්වාගෙන යෑමේ දී දරනු ලබන සියළුම වියදම් වියදමට වැඩි ආදායම ගණනය කිරීමේ කාර්යය සඳහා ආදායමට එරෙහිව ලියාහරිනු ලැබේ.

### 4.3 මුදල් ප්‍රවාහ ප්‍රකාශනය

මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සකස් කර ඇත්තේ වක්‍ර ක්‍රමය මතයි.

# මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන්

1 දේපළ පිරියත හා උපකරණ

| | මෝටර් වාහන | ලී බඩු, වැද්දුම් හා සවිකිරීම් | කාර්යාල උපකරණ (විද්‍යුත් දත්ත සැකසුම් සහ වෙනත්) | පුහුණු උපකරණ | එකතුව |
|---|---|---|---|---|---|
| | රු. | රු. | රු. | රු. | රු. |
| පිරිවැය | | | | | |
| 2016 ජනවාරි 01 දිනට ශේෂය | 10,000,000 | 13,661,190 | 23,104,187 | 141,450 | 46,906,828 |
| එකතු කිරීම් | - | 96,577 | 522,828 | - | 619,406 |
| බැහැර කිරීම් | - | (217,430) | (1,204,516) | - | (1,421,946) |
| 2016 දෙසැම්බර් 31 දිනට ශේෂය | 10,000,000 | 13,540,337 | 22,422,500 | 141,450 | 46,104,286 |
| සමුච්චිත ක්ෂය | | | | | |
| 2016 ජනවාරි 01 දිනට ශේෂය | 3,393,773 | 11,334,176 | 20,763,332 | 141,450 | 35,632,731 |
| වර්ෂය සඳහා අය කිරීම් | 2,500,000 | 743,315 | 1,015,900 | - | 4,259,214 |
| බැහැර කිරීම් | - | (214,851) | (1,202,266) | - | (1,417,117) |
| 2016 දෙසැම්බර් 31 දිනට ශේෂය | 5,893,773 | 11,862,640 | 20,576,966 | 141,450 | 38,474,829 |
| ලියා අඩු කළ අගය | | | | | |
| 2016 දෙසැම්බර් 31 දිනට | 4,106,227 | 1,677,696 | 1,845,535 | - | 7,629,457 |
| ලියා අඩු කළ අගය | | | | | |
| 2015 දෙසැම්බර් 31 දිනට | 6,606,227 | 2,327,013 | 2,340,856 | - | 11,274,097 |

# මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන්

| | දෙසැම්බර් 31 දිනට | සටහන් | 2016 රු. | 2015 රු. |
|---|---|---|---|---|
| 2 | රක්ෂණ ඔප්පු හිමියන්ගේ ආරක්ෂණ අරමුදල - ආයෝජන සහ අනෙකුත් ජංගම නොවන වත්කම් | | | |
| | කුළී සහ විද්‍යුත් තැන්පතු | | 14,759,880 | 14,759,880 |
| | භාණ්ඩාගාර බැඳුම්කරයන්හි ආයෝජන | | 1,076,659,000 | 1,076,659,000 |
| | | | 1,091,418,880 | 1,091,418,880 |
| | **ජංගම වත්කම්** | | | |
| | රජයේ සුරැකුම්හි ආයෝජන | | 1,049,400,000 | 1,411,999,903 |
| | ස්ථාවර තැන්පතුවල ආයෝජන | | 922,000,000 | - |
| | රජයේ සුරැකුම්පත් හා ස්ථාවර තැන්පතුවලින් ලැබිය යුතු පොලිය | | 105,241,199 | 59,114,564 |
| | ලැබිය යුතු සෙස් බදු | 16 | 111,464,812 | 86,800,000 |
| | අරමුදල් කළමණාකරන ගිණුමේ ශේෂය | 17 | - | 952,525 |
| | බැංකුවේ ඇති ශේෂය | 17 | 503,267 | 1,071,247 |
| | රක්ෂණ ඔප්පු හිමියන්ගේ ආරක්ෂණ අරමුදලට මාරු කළ යුතු අගය | | 11,807,206 | - |
| | | | 2,200,416,486 | 1,559,938,240 |
| | අඩුකලා | | | |
| | රක්ෂණ ඔප්පු හිමියන්ගේ ආරක්ෂණ අරමුදලින් මාරු කල යුතු අගය | | - | 8,159,886 |
| | | | 2,200,416,486 | 1,551,778,353 |
| | මුළු වත්කම් | | 3,291,835,366 | 2,643,197,234 |
| 3 | භාණ්ඩ තොග | | | |
| | මුද්‍රණ ලිපිද්‍රව්‍ය හා පරිගණක උපාංග | | 352,633 | 358,832 |
| | මුද්දර | | 40,400 | 87,070 |
| | | | 393,033 | 445,902 |
| 4 | අනෙකුත් ජංගම වත්කම් | | | |
| | තැන්පතු | | 195,363 | 190,744 |
| | වෙනත් ලැබිය යුතු දෑ | | 3,106,577 | 309,684 |
| | ලැබිය යුතු රඳවා ගැනීමේ බදු | | 1,515,446 | 1,208,602 |
| | එකතු කළ අගය මත බදු පාලන ගිණුම | | 1,607,046 | 815,602 |
| | ලැබිය යුතු පොළී - භාණ්ඩාගාර බිල්පත් | | 121,919 | 4,228 |
| | සේවක ණය* | | 5,764,542 | 4,948,645 |
| | අත්තිකාම් සහ පෙර ගෙවීම් | | 1,062,196 | 1,554,512 |
| | ආර්ථික සේවා ගාස්තු | | 132,365 | - |
| | අරමුදල් කළමණාකරන ගිණුමේ ශේෂය | 17 | 5,643,249 | 4,650,087 |
| | රක්ෂණ ඔප්පු හිමියන්ගේ ආරක්ෂණ අරමුදලින් මාරු කල යුතු අගය | | - | 8,159,886 |
| | | | 19,148,704 | 21,841,991 |
| | *කාර්යය මණ්ඩලය සඳහා ප්‍රදානය කළ ණය | | | |
| | ජනවාරි 1 දිනට ශේෂය | | 4,948,645 | 4,911,857 |
| | වර්ෂය තුළ දී ප්‍රදානය කළ ණය | | 4,162,000 | 3,232,000 |
| | | | 9,110,645 | 8,143,857 |
| | වර්ෂය තුළ දී ණය ආපසු ගෙවීම් | | (3,346,103) | (3,195,212) |
| | දෙසැම්බර් 31 දිනට ශේෂය | | 5,764,542 | 4,948,645 |
| 5 | මුදල් සහ මුදල් හා සමාන දෑ | | | |
| | බැංකුවේ ඇති මුදල | | - | 575,848 |
| | ලංකා බැංකුව | | 2,301 | - |
| | | | 2,301 | 575,848 |

# මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන්

| දෙසැම්බර් 31 දිනට | සටහන් | 2016 | 2015 |
|---|---|---|---|
| | | රු. | රු. |
| 6 රක්ෂණ ඔප්පු හිමියන්ගේ ආරක්ෂණ අරමුද | | | |
| ආරම්භක ශේෂය | | 2,643,197,233 | 2,182,906,773 |
| වර්ෂය තුළදී ලද සෙස් බදු | 16 | 408,178,592 | 321,747,380 |
| භාණ්ඩාගාර බිල්පත් ආයෝජනය මත පොළී | | 2,647,461 | 70,257,878 |
| ප්‍රති මිල දී ගැනීම් සහ ඉල්ලුම් ගිණුම් මත පොළී | | 127,179,906 | 34,917,246 |
| භාණ්ඩාගාර බැඳුම්කර මත පොළී | | 95,381,313 | 7,036,326 |
| ස්ථාවර තැන්පතු මත පොළී | | 3,437,951 | 32,827,399 |
| අරමුදල් කළමණාකරණ ගිණුමේ ශේෂය මත පොළිය | | 263,804 | 49,800 |
| මණ්ඩලයේ ශුද්ධ අතිරික්තය | | 12,185,206 | - |
| | | 3,292,471,466 | 2,649,742,802 |
| අඩු කළා: | | | |
| මෙහෙයුම් වියදම් සඳහා මාරු කිරීම් | | - | 3,513,004 |
| ප්‍රාග්ධන වියදම් සඳහා මාරු කිරීම් | | 619,406 | 3,012,711 |
| රක්ෂණ ඔප්පු හිමියන්ගේ ආරක්ෂණ අරමුදලෙන් මුළු මාරු කිරීම් | | 619,406 | 6,525,714 |
| බැංකු ගාස්තු | | 16,695 | 19,855 |
| | | 636,100 | 6,545,569 |
| අවසාන ශේෂය | | 3,291,835,366 | 2,643,197,233 |
| 7 ප්‍රදාන | | | |
| වසර ආරම්භයේ දී ශේෂය | | 4,965,789 | 6,480,560 |
| රක්ෂණ ඔප්පු හිමියන්ගේ ආරක්ෂණ අරමුදලෙන් ප්‍රාග්ධන වියදම් | | 619,406 | 3,012,711 |
| අඩු කළා: වර්ෂය තුළ දී ක්‍රමක්ෂය කිරීම් | | (2,061,963) | (4,527,482) |
| වසර අවසානයේ දී ශේෂය | | 3,523,232 | 4,965,789 |
| සටහන - ප්‍රදාන හඳුනා ගැනීම | | | |
| ප්‍රදානයන්, මෙහෙයුම් ප්‍රතිඵල පිළිබඳ ප්‍රකාශයේ පහත අනුපාත යටතේ හඳුනාගෙන ඇත. | | | |
| මෝටර් රථ වාහන | | 25% | |
| කාර්යාල උපකරණ - වෙනත් සහ වි.ද.සැ. | | 25% | |
| ලී බඩු වැද්දුම් සහ සවි කිරීම් | | 12.5% | |
| පුහුණු උපකරණ | | 25% | |
| 8 විශ්‍රාම ප්‍රතිලාභ බැඳීම් | | | |
| වසර ආරම්භයේ දී ශේෂය | | 8,035,447 | 5,757,098 |
| වසර තුළ ප්‍රතිපාදන | | 1,807,178 | 2,278,349 |
| අඩුකළා - වසර තුළ සිදු කරන ලද ගෙවීම් | | - | - |
| වසර අවසානයේ ශේෂය | | 9,842,625 | 8,035,447 |
| 9 අනෙකුත් ජංගම වගකීම් | | | |
| උපචිත වියදම් | | 7,448,565 | 6,169,951 |
| සේවක අර්ථසාධක අරමුදල් සඳහා කළ යුතු ගෙවීම් | | 654,487 | 660,714 |
| සේවක භාරකාර අරමුදල් සඳහා කළ යුතු ගෙවීම් | | 98,174 | 99,108 |
| උපයන විට බදු සඳහා කළ යුතු ගෙවීම් | | 195,330 | 207,889 |
| රක්ෂණ ඔප්පු හිමියන්ගේ ආරක්ෂන අරමුදලට මාරුකල යුතු අගය | | 11,807,206 | - |
| වෙනත් | | 207,115 | 83,003 |
| | | 20,410,878 | 7,220,665 |

# මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන්

| දෙසැම්බර් 31 දිනට | 2016 | 2015 |
|---|---|---|
| | රු. | රු. |
| 10 අයභාරය | | |
| රක්ෂණ සමාගම්වලින් වාර්ෂික ගාස්තු | 125,489,332 | 103,811,505 |
| ලියාපදංචි කිරීමේ සහ අළුත් කිරීමේ ගාස්තු | 5,482,704 | 9,337,740 |
| | 130,972,036 | 113,149,245 |
| 11 වෙනත් ආදායම් | | |
| මෝටර් වාහන ණය මත පොළී | 26,129 | 25,583 |
| ආපදා ණය මත පොළී | 146,279 | 142,229 |
| ස්ථාවර වත්කම් විකුණුම් ලාභ | 66,590 | 15,028 |
| වෙනත් ආදායම් | 19,371 | 42,537 |
| | 258,370 | 225,376 |
| 12 කාර්ය මණ්ඩල වියදම | | |
| කාර්ය මණ්ඩල වැටුප | 39,765,213 | 38,492,392 |
| සේ.අ.අ. 12% | 4,775,620 | 4,667,638 |
| සේ.භා.අ. 3% | 1,193,905 | 1,166,910 |
| සභාපතිනියගේ වියදම් - දීමනා | 1,200,000 | 1,004,589 |
| සභාපතිනියගේ ඉන්ධන වියදම් | 238,680 | 239,090 |
| අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම් ගාස්තු | 750,000 | 457,500 |
| පුහුණුවන නිළධාරී දීමනා | 225,037 | 91,315 |
| අතිකාල | 137,226 | 147,337 |
| කාර්ය මණ්ඩල වෛද්‍ය වියදම් | 1,662,539 | 1,644,315 |
| කාර්ය මණ්ඩල වෛද්‍ය රක්ෂණය | 920,277 | 839,140 |
| ගිනි හා පුද්ගල රක්ෂණය | 367,374 | 483,391 |
| කාර්ය මණ්ඩල සුබසාධන | 1,264,417 | 1,513,780 |
| කාර්ය මණ්ඩල පුහුණු - දේශීය | 2,021,522 | 1,752,935 |
| විදේශ ගමන් හා පුහුණු- අධ්‍යක්ෂක මණ්ඩල හා කාර්ය මණ්ඩල | 8,370,750 | 8,144,101 |
| කාර්ය සාධනය පදනම් කරගත් දිරි දීමනා | 2,072,650 | 2,047,954 |
| ප්‍රචාරණය - බඳවා ගැනීම් | 137,520 | 223,620 |
| අධ්‍යක්ෂක දුරකථන | 300,613 | 220,950 |
| නිවාඩු දීමනා | 758,115 | 637,964 |
| අධ්‍යක්ෂකවරුන්ගේ වාහන දීමනා | 3,000,000 | 3,291,096 |
| අධ්‍යක්ෂකවරුන්ගේ ඉන්ධන දීමනා | 893,680 | 861,154 |
| සේවක පාරිතෝෂික | 1,807,178 | 2,278,349 |
| | 71,862,315 | 70,205,520 |
| 13 වෘත්තීමය ගාස්තු | | |
| උපදේශක සේවා ගාස්තු | 2,801,156 | 2,388,225 |
| | 2,801,156 | 2,388,225 |

# මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන්

| දෙසැම්බර් 31 දිනට | 2016 | 2015 |
|---|---|---|
| | රු. | රු. |
| 14 මෙහෙයුම් වියදම් | | |
| කාර්යාල කුලී | 29,495,421 | 27,740,409 |
| රථ ගාල් කිරීමේ ගාස්තු | 384,743 | 345,621 |
| දුරකථන හා අන්තර්ජාල වියදම් | 1,686,159 | 1,567,818 |
| විදුලිය | 1,315,853 | 1,327,103 |
| කාර්යාල නඩත්තු කිරීම් | 617,424 | 402,472 |
| මුද්‍රණ හා ලිපිද්‍රව්‍ය | 1,328,183 | 2,990,021 |
| මහජන දැනුවත් කිරීම් | 2,922,135 | 3,769,091 |
| සංග්‍රහ වියදම් | 54,591 | 91,770 |
| ගමන් වියදම් - දේශීය | 105,542 | 102,658 |
| කාර්යාල උපකරණ නඩත්තු වි.ද.සැ හා වෙනත | 1,216,309 | 1,030,533 |
| සාමාජිකත්වය - IAIS | 2,717,637 | 2,541,784 |
| ප්‍රචාරණය - වෙනත් | 31,040 | - |
| රැස්වීම් ගාස්තු | 705,435 | 1,812,680 |
| පුවත්පත් හා පුස්තකාල පොත් | 126,414 | 122,768 |
| තැපැල් හා පණිවිඩ ගාස්තු | 207,402 | 187,740 |
| විගණන ගාස්තු - විගණකාධිපති | 223,500 | 43,800 |
| අභ්‍යන්තර විගණන ගාස්තු | - | (1,035,000) |
| ක්ෂය | 4,259,214 | 5,214,297 |
| වෙළඳ බදු | - | (17,000) |
| පොදු වියදම් | 118,475 | 144,618 |
| නීති වියදම් | 8,040 | 205,069 |
| විමර්ශන වියදම් | 6,798 | 19,314 |
| අධීක්ෂණ වියදම් | - | 199,018 |
| වාහන නඩත්තු | 494,627 | 77,159 |
| වාහන රක්ෂණ | 130,859 | 229,143 |
| වාහන ඉන්ධන වියදම් | 202,343 | 185,783 |
| ජාතිය ගොඩනැගීමේ බදු | 674,276 | 688,075 |
| | 49,032,420 | 49,986,744 |
| 15 මූල්‍ය හා වෙනත් වියදම් | | |
| බැංකු ගාස්තු | 150,126 | 206,872 |
| | 150,126 | 206,872 |

# මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන්

16. ජාතික රක්ෂණ භාර අරමුදලින් ලැබිය යුතු මුදල්

සෙස් ආදායම තුළ ජාතික රක්ෂණ භාර අරමුදලින් ලැබිය යුතු ලෙස නිශ්චය කළ රු.11,225,235/- ක් අන්තර්ගත වන අතර එකී අගය 2014 හා 2015 වසර වෙනුවෙන් ජා.ර.භා. අරමුදලින් ලද සෙස් ආදායමේ සාමාන්‍යයට 10%ක වර්ධනයක් ගලපා ඇස්තමේන්තු කර ඇත. ජා.ර.භා. අරමුදල කාර්තුමය වශයෙන් මණ්ඩලයට සේ ගෙවා නොමැත.

17. මණ්ඩලයේ ජංගම ගිණුම් 20 සම්බන්ධව අරමුදල් කලමණාකරන ගිණුම් 2 ක් පවත්වාගෙන යන අතර ජංගම ගිණුමේ ශේෂය රු. 1,000,000/- ඉක්මවන විට එකී ඉක්මවූ අගය අරමුදල් කළමණාකරන ගිණුමට මාරු කෙරේ. මණ්ඩලය විසින් නිකුත් කරන චෙක් පත් සැම විටම, එසැනින්ම බැංකුවට ගෙවීම් සඳහා ඉදිරිපත් නොකරන බැවින්, ඉහත අරමුදල් කළමණාකරණ ගිණුම් හා සම්බන්ධිත ගණුදෙනු මණ්ඩලයේ ගිණුම්වලට ඇතුලත් කළ පසු, ලෙජරයේ දැක්වෙන බැංකු ශේෂය ඍණ අගයක් ගත හැක.

2016 දෙසැම්බර් 31 දිනට බැංකු ශේෂය පහත පරිදි වේ.

| | |
|---|---|
| මණ්ඩලය | - රු. 984,287.27 |
| රක්ෂණ ඔප්පු හිමියන්ගේ ආරක්ෂණ අරමුදල | - රු. 503,267.39 |

18. බදුකරණය

බදුකරණය සඳහා ප්‍රතිපාදන ගණනය කර ඇත්තේ 2006 අංක 10 දරණ ආදායම් පනතේ විධිවිධාන වලට අනුකූලවයි.

18.1 රජයේ සුරැකුම්පත් පිළිබඳ ද්විතීය වෙළඳපල ගනුදෙනු වෙනුවෙන් රඳවාගත් බදු සඳහා ලැබෙන නාමික බැර

2006 අංක 10 දරන දේශීය ආදායම් පනතේ අංක 137 වන වගන්තිය ප්‍රකාරව මණ්ඩලය රජයේ සුරැකුම්පත් පිළිබඳ ද්විතීය වෙළඳපොළ ගනුදෙනු මත උපයන පොලී ආදායම අදාළ තක්සේරු වර්ෂය සඳහා වන ව්‍යවස්ථාපිත ආදායමේ කොටසක් සේ සලකන අතර එම පොලිය වෙනුවෙන් නාමික බදු බැර සඳහා හිමිකාරත්වය ලැබේ.

ඒ අනුව රජයේ සුරැකුම්පත් පිළිබඳ ද්විතීය වෙළඳපොළ ගනුදෙනුවලින් මණ්ඩලය විසින් උපයන ලද ශුද්ධ ආදායම දළ ආදායම බවට පරිවර්තනය කර මූල්‍ය ප්‍රකාශනවල දක්වා ඇති අතර එහි ප්‍රතිඵලයක් වශයෙන් නාමික බදු බැර වටිනාකම රුපියල් 289,286.21/- ක් 2016 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ මූල්‍ය ප්‍රකාශනවල හඳුනාගෙන ඇත.

රක්ෂණ ඔප්පු හිමියන්ගේ ආරක්ෂණ අරමුදල විසින් රජයේ සුරැකුම්පත් පිළිබඳ ද්විතීය වෙළඳපොළ ගනුදෙනු මත කරනු ලැබූ ආයෝජනයන්ගෙන් උපයන ලද පොලී ආදායම ගිණුම්ගත කර හඳුනාගෙන ඇත්තේ ශුද්ධ අගයටය.

19. ප්‍රාග්ධන බැඳියාව

2016 දෙසැම්බර් 31 දිනට කිසිදු ප්‍රාග්ධන බැඳියාවකට එළැඹ නොමැත.

20. අසම්භාව්‍ය බැරකම්

2016 දෙසැම්බර් 31 දිනට කිසිදු අසම්භාව්‍ය බැරකමක් නොමැත.

21. වාර්තා කරන දිනෙන් පසු හටගත් සිදුවීම්

මූල්‍ය ප්‍රකාශනවල ගැලපීම් කළ යුතු හෝ අනාවරණය කිරීම අවශ්‍ය වන කිසිදු සිද්ධියක් වාර්තා කරන දිනට පසු සිදු වී නොමැත.

22. සම්බන්ධිත පාර්ශව අනාවරණ

ඉන්ද්‍රානි සුගතදස මහත්මිය (සභාපතිනිය), පී. සමරසිරි මහතා, ඩී.එන්.ආර්. සිරිවර්ධන මහතා (නිල බලයෙන් පත්වූ සාමාජිකයන්), ජෙරම් බෝලින් මහතා හා ආචාර්ය අලි අස්ගර් ශබීර් ගුලාම් හුසේන් මහතා 2016 වසර පුරාම මණ්ඩය අධ්‍යක්ෂ මණ්ඩලය සාමාජිකත්වය හොබවන ලදි.

නිල බලයෙන් පත්වූ සාමාජිකා පුෂ්පා වෙල්ලප්පිලි මහත්මිය 2016 මාර්තු 31 දින සිට එකී ධූරයෙන් ඉවත් වූ අතර ඩී.ආර්. දේශප්‍රිය මහතා 2016 ජුනි 08 දින සිට එකී ධූරයට පත්විය.

සමාලෝචිත වර්ෂය තුළ දී මණ්ඩලයේ සාමාජික සාමාජිකාවන්ගේ සංස්ථාපිත සම්බන්ධතාවය පහත වගුවෙන් නිරූපණය කෙරේ.

| සාමාජිකයාගේ නම | සම්බන්ධිත ආයතනයේ නම | සම්බන්ධතාව |
|---|---|---|
| ඉන්ද්‍රාණි සුගතදාස මහත්මිය | කළුබොවිටියාන තේ කම්හල් සමාගම<br>එන් ඩී බී බැංකුව | අධ්‍යක්ෂිකා<br>අධ්‍යක්ෂිකා |
| පුෂ්පා වෙල්ලප්පිලි මෙනෙවිය | ලංකා බැංකුව<br>මර්චන්ට් බෑන්ක් ඔෆ් ශ්‍රී ලංකා | විධායක නොවන අධ්‍යක්ෂිකා (2016 මාර්තු 30 දක්වා)<br>විධායක නොවන අධ්‍යක්ෂිකා (2016 මාර්තු 01-30 දක්වා) |
| ඩී.ආර්. දේශප්‍රිය මහතා | ප්‍රාදේශීය සංවර්ධන බැංකුව<br>සුභසාධන ප්‍රතිලාභ මණ්ඩලය | මණ්ඩල සාමාජික (2016 ජුලි 14 සිට)<br>මණ්ඩල සාමාජික (2016 ජුලි 12 සිට) |

# මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන්

| සාමාජිකයාගේ නම | සම්බන්ධිත ආයතනයේ නම | සම්බන්ධතාව |
|---|---|---|
| ජී සමරසිරි මහතා | ශ්‍රී ලංකා බැංකුකරුවන්ගේ ආයතනය | සභාපති |
| | ශ්‍රී ලංකා ණය තොරතුරු කාර්යාංශය | සභාපති |
| | ශ්‍රී ලංකා සුරැකුම්පත් හා විනිමය කොමිෂන් සභාව | සාමාජික |
| | ආරක්ෂක අමාත්‍යාංශය යටතේ වූ අපි වෙනුවෙන් අපි කළමණාකරන මණ්ඩලය | සාමාජික |
| ඩී.එන්.ආර්. සිරිවර්ධන මහතා | ශ්‍රී ලංකා සුරැකුම්පත් හා විනිමය කොමිෂන් සභාව | සාමාජික |
| | ශ්‍රී ලංකා ගණකාධිකරණ හා විගණන ප්‍රමිත අධීක්ෂණ මණ්ඩලය | සාමාජික |
| | ශ්‍රී ලංකා වරලත් ගණකාධිකරුවන්ගේ ආයතනය | සාමාජික |
| ජෙරමි බෝලින් මහතා | ඔක්ටගන් කන්සල්ටන්ස් (පෞද්) සමාගම | අධ්‍යක්ෂක |
| | එන්ඩිලස් අවුට්ඩෝස් (පෞද්) සමාගම | අධ්‍යක්ෂක |
| | එන්එච්ජේ රිස්ක් මැනේජ්මන්ට් (පෞද්) සමාගම | අධ්‍යක්ෂක |
| ආචාර්ය අලි අස්ගර් ශබීර් ගුලාම්හුසේන් මහතා | ඇඩම් කැපිටල් පීඑල්සී | අධ්‍යක්ෂක |
| | සිලෝන් ඇන්ඩ් ෆොරින් ට්‍රේඩ්ස් පීඑල්සී | අධ්‍යක්ෂක |
| | බිස්නස් චේම්බර් ඔෆ් කොමර්ස් | අධ්‍යක්ෂක |
| | ශ්‍රී ලංකා රෙදිපිළි හා ඇපරල් ආයතනය | අධ්‍යක්ෂක |
| | ඇඩම් එක්ස්පෝ (පුද්) සමාගම | අධ්‍යක්ෂක |
| | ඇඩම් කාබන්ස්(පුද්) සමාගම | අධ්‍යක්ෂක |
| | ඇඩම් කැපිටල් මයික්‍රෝ ක්‍රෙඩිට් (පුද්) සමාගම | අධ්‍යක්ෂක |
| | නෙට්වර්ක් කොමියුනිකේෂන්ස් (පුද්) සමාගම | අධ්‍යක්ෂක |
| | ඇඩම් මෙටල්ස්(පුද්) සමාගම | අධ්‍යක්ෂක |
| | ඇඩම් කෝපරේට් සෙක්‍රටේරියල් (පුද්) සමාගම | අධ්‍යක්ෂක |
| | ඇඩම් එයා කන්ඩිෂනර්ස් (පුද්) සමාගම | අධ්‍යක්ෂක |
| | ඇඩම් ඇපරල්ස් (පුද්) සමාගම | අධ්‍යක්ෂක |
| | ඇඩම් ඔටොමොබයිල්ස් (පුද්) සමාගම | අධ්‍යක්ෂක |
| | වෙල්වින් (පුද්) සමාගම | අධ්‍යක්ෂක |
| | ජියෝර්ජියෝ මොරැන්ඩි (පුද්) සමාගම | අධ්‍යක්ෂක |
| | ස්පයිස් ඔෆ් ලයිෆ් (පුද්) සමාගම | අධ්‍යක්ෂක |
| | සිලෝන් ඇන්ඩ් ෆොරින් සර්ජිටෙක් (පුද්) සමාගම | අධ්‍යක්ෂක |
| | කලම්බෝ ඇපොතිකරීස් (පුද්) සමාගම | අධ්‍යක්ෂක |
| | කලම්බෝ ෆ්‍රේට් ඇන්ඩ් ට්‍රාන්ස්පෝට් සමාගම | අධ්‍යක්ෂක |
| | ඩොඩ්වෙල් ඇන්ඩ් කම්පනි සමාගම | අධ්‍යක්ෂක |
| | හැමිල්ටන් රිසෝට්ස් (පුද්) සමාගම | අධ්‍යක්ෂක |

වෙළඳපොළ වටිනාකම් මත සිදු කරන ලද සාමාන්‍ය ව්‍යාපාරික කටයුතු මත සිදු කල ගනුදෙනු හැර උක්ත ආයතන සමඟ සමාලෝචිත වර්ෂය තුළ දී වෙනත් කිසිදු ගනුදෙනුවක් සිදු කර නොමැත.

# විගණකාධිපති වාර්තාව

**විගණකාධිපති දෙපාර්තමේන්තුව**
**கணக்காய்வாளர் தலைமை அதிபதி திணைக்களம்**
**AUDITOR GENERAL'S DEPARTMENT**

මගේ අංකය / எனது இல. / My No. } ටිආර්ඊ/සී/අයිබීඑස්එල්/ එෆ්එස්/2016

ඔබේ අංකය / உமது இல. / Your No. }

දිනය / திகதி / Date } 2017 සැප්තැම්බර් 14 දින.

**ශ්‍රී ලංකා රක්ෂණ මණ්ඩලයේ 2016 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව 1971 අංක 38 දරන මුදල් පනතේ 14(2)(සී) වගන්තිය ප්‍රකාර විගණකාධිපති වාර්තාව**

ශ්‍රී ලංකා රක්ෂණ මණ්ඩලයේ 2016 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය සහ මුදල් ප්‍රවාහ ප්‍රකාශනය හා වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2016 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1971 අංක 38 දරන මුදල් පනතේ 13 (1) වගන්තිය සහ 2000 අංක 43 දරන ශ්‍රී ලංකා රක්ෂණ කර්මාන්තය විධිමත් කිරීමේ පනතේ 8(3) වගන්තිය සමග සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (1) ව්‍යවස්ථාවෙහි ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. මුදල් පනතේ 14(2)(සී) වගන්තිය ප්‍රකාර මණ්ඩලයේ වාර්ෂික වාර්තාව සමග ප්‍රකාශයට පත්කළ යුතුයයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ. මුදල් පනතේ 13(7)(ඒ) වගන්තිය ප්‍රකාර විස්තරාත්මක වාර්තාවක් මණ්ඩලයේ සභාපති වෙත 2017 ජූනි 16 දින නිකුත් කරන ලදී.

**1.2 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම**

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

**1.3 විගණකගේ වගකීම**

මාගේ විගණනය මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ. මා විසින් උත්තරීතර විගණන ආයතනයන්ගේ ජාත්‍යන්තර විගණන ප්‍රමිතිවලට (ISSAI 1000 - 1810) අනුරූප ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව මාගේ විගණනය සිදු කරන ලදී. ආචාර ධර්මවල අවශ්‍යතාවන්ට මම අනුකූලවන බවට සහ මූල්‍ය ප්‍රකාශන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවන්නේද යන්න පිළිබඳ සාධාරණ තහවුරුවක් ලබා ගැනීම පිණිස විගණනය සැළසුම්කර ක්‍රියාත්මක කරන බවට මෙම ප්‍රමිති අපේක්ෂා කරයි.

මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන අගයන් හා හෙළිදරව් කිරීම් වලට අදාළවන විගණන සාක්ෂි ලබාගැනීම පිණිස පරිපාටි ක්‍රියාත්මක කිරීම විගණනයට ඇතුලත් වේ. තෝරාගත් පරිපාටීන්, වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගේ අවදානම් තක්සේරු කිරීම් ද ඇතුළත් විගණකගේ විනිශ්චය මත පදනම් වේ. එම අවදානම් තක්සේරු කිරීම්වලදී අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස මණ්ඩලයේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට සහ සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාළ වන්නා වූ අභ්‍යන්තර පාලනය විගණක සැලකිල්ලට ගන්නා නමුත් මණ්ඩලයේ අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි. කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය හා යොදා ගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය ඇගයීම මෙන්ම මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම පිළිබඳ ඇගයීමද විගණනයට ඇතුළත් වේ. විගණනයේ විෂය පථය හා ප්‍රමාණය තීරණය කිරීම සඳහා 1971 අංක 38 දරන මුදල් පනතේ 13 වගන්තියේ (3) හා (4) උපවගන්තිවලින් විගණකාධිපති වෙත අභිමතානුසාරී බලතල පැවරේ.

මාගේ විගණන මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

# විගණකාධිපති වාර්තාව

**1.4 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම**

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරණු ලැබේ.

**2. මූල්‍ය ප්‍රකාශන**

**2.1 තත්ත්වාගණනය කළ මතය**

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2016 දෙසැම්බර් 31 දිනට ශ්‍රී ලංකා රක්ෂණ මණ්ඩලයේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

**2.2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම**

**2.2.1 ගිණුම්කරණ අඩුපාඩු**

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) මණ්ඩලය ආදායම් හඳුනා ගැනීම උපචිත පදනම මත සිදු කලද, ජාතික රක්ෂණ භාර අරමුදල වෙතින් 2014 හා 2015 වර්ෂවලට අදාළව හිඟව තිබූ වාර්ෂික ගාස්තු රු. 2,894,316 ක් හා 2013 වර්ෂයේ සිට 2015 වර්ෂය දක්වා හිඟව තිබූ සෙස් ආදායමෙන් රු. 29,429,323 ක් වශයෙන් සමාලෝචිත වර්ෂය තුළ ලැබී තිබුණු එකතුව වූ රු. 32,323,639 ක් අදාල පූර්ව වර්ෂවල ආදායම් ලෙස හඳුනා ගැනීමට කටයුතු නොකර සමාලෝචිත වර්ෂයේ ආදායමක් ලෙස ගිණුම්ගත කර තිබුණි.

(ආ) මණ්ඩලයේ නියමයන්ට අනුව සාමාන්‍ය හා දිගුකාලීන ලෙස වෙන් වශයෙන් ලියාපදිංචි කිරීමේ අවශ්‍යතාවය සඳහා ලියාපදිංචි ගාස්තු ලෙස 2015 වර්ෂය හා ඊට පෙර වර්ෂවලදී ආයතන 03 කින් ලැබී තිබූ රු.1,500,000 කින් නිවැරදි ප්‍රමාණය මණ්ඩලයේ ආදායම් ලෙස හඳුනා නොගෙන කලින් ලද අත්තිකාරම් ගිණුමේ රඳවාගෙන තිබුණි.

(ඇ) විදේශ සෞඛ්‍ය රක්ෂණ කටයුතු සඳහා අතරමැදියෙකු ලෙස කටයුතු කිරීමට අනුමැතිය ලබා ගැනීම සඳහා ආයතනයකින් 2016 අගෝස්තු මාසයේදී ලැබුණු රු.500,000කින් සමාලෝචිත වර්ෂයේ දින 93කට අදාල ආදායම වූ රු.127,397 ක් ගිණුම්ගත කර නොතිබුණි.

(ඈ) ලියාපදිංචි ගාස්තු ලෙස 2015 දෙසැම්බර් මාසයේදී ලැබුණු රු. 500,000 ක මුදල තුළ ඇතුළත් 2017 ජනවාරි මාසයට අදාළ රු. 43,836 ක මුදල සමාලෝචිත වර්ෂයේ ආදායමක් ලෙස ගිණුම්ගත කර තිබුණි.

**2.3 නීති රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම්.**

පහත සඳහන් අනුකූල නොවීම් නිරීක්ෂණය විය.

| නීති රීති, රෙගුලාසිවලට යොමුව | අනුකූල නොවීම් |
|---|---|
| (අ) 2000 අංක 43 දරන රක්ෂණ කර්මාන්තය විධිමත් කිරීමේ පනත | |
| (i) 13 (1) (ඇ) වගන්තිය | තැන්පතු වශයෙන් රීති මගින් මණ්ඩලය විසින් නිශ්චය කරනු ලබන යම් මුදලක් ඒ තැනැත්තා විසින් භාණ්ඩාගාරයට ගෙවනු ලබන්නේ නම් මිස, ඒ තැනැත්තා ශ්‍රී ලංකාව තුළ රක්ෂණ ව්‍යාපාරයක් කරගෙන යාම සඳහා ලියාපදිංචි කරනු නොලැබිය යුතු වුවද , ආයතන 10 කට අදාළව එම අවශ්‍යතාවය සපුරා ඇති බවට විගණනයට තහවුරු නොකෙරුණි. |

# විගණකාධිපති වාර්තාව

| | |
|---|---|
| (ii) 38(1)(ආ) වගන්තිය | තනිව හෝ සාමාන්‍ය රක්ෂණ ව්‍යාපාරයට අමතරව, දීර්ඝ කාලීන රක්ෂණ ව්‍යාපාරය කරගෙන යන සෑම රක්ෂණකරුවෙකු විසින්ම දීර්ඝ කාලීන රක්ෂණ ව්‍යාපාරය සම්බන්ධයෙන් වන වත්කම්, වෙනත් යම් පංතියක රක්ෂණ ව්‍යාපාරය සම්බන්ධයෙන් වූ වත්කම් වලින් වෙන්ව තබා ගත යුතු වුවද ලියාපදිංචි රක්ෂණ සමාගම් 12න් රක්ෂණ සමාගම් 3 ක් මෙතෙක් එපරිදි කටයුතු කර නොතිබුණි. |
| (iii) 49(ආ) වගන්තිය | තත්කාර්ය සඳහා සාදන ලද රීති මගින් නිශ්චය කරනු ලබන යම් තොරතුරු ඇතුළත් ත්‍රෛමාසික වාර වාර්තාවක් මණ්ඩලය වෙත සපයනු ලැබිය යුතු වුවද, විගණනයට ඉදිරිපත් කළ තොරතුරු අනුව, රක්ෂණ සමාගම් හා රක්ෂණ තැරැව්කාර සමාගම් වලින් කාර්තුමය වාර්තා නියමිත දිනට ඉදිරිපත් නොකළ අවස්ථා නිරීක්ෂණය විය. |

(ආ) 2003 ජූනි 02 දිනැති අංක පීඊඩී/12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛය

| | |
|---|---|
| (i) 6.5.1 ඡේදය | මූල්‍ය වර්ෂය අවසාන වී දින 60 ක් ඇතුළත මූල්‍ය ප්‍රකාශන සමග කෙටුම්පත් වාර්ෂික වාර්තාව විගණකාධිපති වෙත ඉදිරිපත් කළයුතු වුවද, මණ්ඩලය විසින් කෙටුම්පත් වාර්ෂික වාර්තාව 2017 මැයි 30 දින තෙක් විගණනයට ඉදිරිපත් කර නොතිබුණි. |
| (ii) 9.14. ඡේදය | පරිපාලන අත්පොතක් සකස් කර ඒ සඳහා අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතිය සහිතව භාණ්ඩාගාර ලේකම් වෙත ඉදිරිපත් කර එකඟතාවය ලබා ගත යුතු වුවද, එම අත්පොත විගණිත දිනය වූ 2017 මැයි 30 දින වන විට භාණ්ඩාගාර ලේකම් වෙත ඉදිරිපත් කර තිබුණ ද එකඟතාවය ලැබී නොතිබුණි. |

### 3. මූල්‍ය සමාලෝචනය

### 3.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව, සමාලෝචිත වර්ෂය සඳහා වූ මණ්ඩලයේ බදු පෙර අතිරික්තය රු. 373,480 ක් වූ අතර ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ අතිරික්තය රු. 187,126 ක් වූයෙන් ඉකුත් වර්ෂය හා සැසඳීමේදී සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රතිඵලය රු. 186,354 කින් වර්ධනය වී තිබුණි. වර්ෂය තුළදී රක්ෂණ ඔප්පු හිමියන්ගේ ආරක්ෂණ අරමුදලට කළ රු. 12,185,206 ක් වූ මාරු කිරීම් වියදම් ලෙස ගිණුම්ගත කිරීම හේතුවෙන් මණ්ඩලයේ මුළු වියදම ද රු.13,243,862 කින් එනම් සියයට 11 කින් වැඩි වී තිබුණ ද මණ්ඩලයේ ප්‍රධාන ආදායම වන රක්ෂණ සමාගම් වලින් ලද වාර්ෂික ගාස්තු, ලියාපදිංචි ගාස්තු හා අලුත් කිරීමේ ගාස්තු ආදායම පෙර වර්ෂයට සාපේක්ෂව රු. 17,822,791 කින් එනම් සියයට 16 කින් වැඩි වී තිබීම ඉහත වර්ධනයට ප්‍රධාන වශයෙන් හේතු වී තිබුණි.

සමාලෝචිත වර්ෂය සහ ඉකුත් වර්ෂ 04 ක මූල්‍ය ප්‍රතිඵල සැසඳීමේදී සෑම වර්ෂයක් සඳහාම මණ්ඩලයේ බදු පෙර අතිරික්තය වැඩි වී තිබුණි. එම අතිරික්තයට සේවක පාරිශ්‍රමික හා ජංගම නොවන වත්කම් සඳහා ක්ෂයවීම් නැවත ගැලපීමේදී ආයතනය විසින් 2012 වර්ෂයේදී රු. 36,425,902 ක දායකත්වයක් ලබා දී තිබුණි. එය අඛණ්ඩව වර්ධනයක් වී තිබුණු අතර 2016 වර්ෂයේදී රු. 89,053,695 ක් වී තිබුණි.

### 4. මෙහෙයුම් සමාලෝචනය

### 4.1 කාර්යසාධනය

2000 අංක 43 දරන රක්ෂණ විධිමත් කිරීමේ පනත අනුව, මණ්ඩලය පිහිටුවීමේ අරමුණ ශ්‍රී ලංකාවේ රක්ෂණ ව්‍යාපාරය, ගෞරවාන්විතව ද රක්ෂණ සහතික දරන්නන්ගේ හා අනාගත රක්ෂණ සහතික දරන්නන්ගේ සම්බන්ධතා ආරක්ෂාවන වෘත්තීයමය හා විචක්ෂණ ආකාරයෙන්ද. කරගෙන යනු ලබන බවට වග බලා ගැනීම වේ.

ඉහත අරමුණු ඉටුකර ගැනීම සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) නව ලියාපදිංචියක් වෙනුවෙන් රක්ෂණ ආයතනයක් වෙතින් 2015 සැප්තැම්බර් 30 දින මණ්ඩලය වෙත රු.500,000ක් ලැබී තිබුණද සමාලෝචිත වර්ෂය අවසාන වන විටත් අදාල ලියාපදිංචි කටයුතු අවසන් කර නොතිබුණි.

# විගණකාධිපති වාර්තාව

(ආ) රක්ෂණ සහතික දරන්නන්ගේ සහ අනාගත රක්ෂණ සහතික දරන්නන්ගේ සම්බන්ධතා ආරක්ෂා කිරීම මණ්ඩලයේ ව්‍යවස්ථාපිත වගකීමක් වන බැවින් රක්ෂිතයෙකු විසින් ඉදිරිපත් කරනු ලබන රක්ෂණ හිමිකම් ගෙවීමක් සම්බන්ධ ආරවුලක දී එය විමර්ෂණය කිරීමේ ව්‍යවස්ථාපිත බලතල මණ්ඩලය සතුවේ. එහෙත් 2016 වර්ෂයේ ලද පැමිණිලි 353 න් පැමිණිලි 44 ක් තවදුරටත් නොවිසදී පැවතුණි.

(ඇ) 2009 වර්ෂයේදී මණ්ඩලය විසින් අත්හිටුවීමේ නියෝගයක් පනවා තිබුණු සමාගමක් වෙනුවෙන් ශ්‍රේෂ්ඨාධිකරණ නියෝග මත අව්‍යාජ රක්ෂණ හිමිකම් පෑම් ක්‍රමවත්ව බේරුම් කිරීම සඳහා එකී සමාගමේ වත්කම් බැහැර කිරීමට මණ්ඩලය සමාගම සමඟ අවබෝධතා ගිවිසුමකට එළඹ තිබුණද විගණිත දිනය වූ 2017 ජූනි 29 දින වන විටත් එම බේරුම් කිරීම් අවසන් කර නොතිබුණි.

(ඈ) 2015 ජූනි 30 දිනැති අධ්‍යක්ෂ මණ්ඩල තීරණයක් මත හානි තක්සේරුකරුවන් ලියාපදිංචි කිරීමේ රීතිය අනුමැතිය සඳහා නීති කෙටුම්පත් සම්පාදක වෙත යොමු කර තිබුණද, 2017 අප්‍රේල් 17 දින වන විටත් එම රීතිය අනුමත වූ බවට තොරතුරු ඉදිරිපත් නොකෙරුණි. මේ නිසා ක්‍රියාකාරී සැලැස්මේ දක්වා තිබුණු හානි තක්සේරුකරුවන් ලියාපදිංචි කිරීමේ අයදුම්පත් ලැබී මාස 02 ක් ඇතුළතදී එහි සමාලෝචන කටයුතු කිරීම සිදු වී නොතිබුණි.

(ඉ) 2000 අංක 43 දරන රක්ෂණ කර්මාන්තය විධිමත් කිරීමේ පනත, සංශෝධනය කිරීම සඳහා වූ පනත (Regulation of Insurance Industry ( Amendment ) ) රේඛීය අමාත්‍යංශය වෙත ඉදිරිපත්කර තිබුණද විගණිත දිනය වූ 2017 අප්‍රෙල් 17 දින වන විටත් අනුමත වී නොතිබුණි.

(ඊ) 2000 අංක 43 දරන රක්ෂණ කර්මාන්තය විධිමත් කිරීමේ පනත ප්‍රකාරව. රක්ෂණ ඔප්පු දරන්නන්ගේ ආරක්ෂණ අරමුදල් යනුවෙන් අරමුදලක් පිහිටුවා තිබුණු අතර වී අරමුදලට සෙස් බද්දෙන් උපචිතවන මුදල් බැර කිරීමෙන් අරමුදල සඳහා මුදල් උපයා ගනු ලැබේ. එම පනතේ 103(3) වගන්තිය ප්‍රකාරව , අරමුදලේ වහා අවශ්‍ය නොවන මුදල් දිගුකාලීන ආයෝජනවල යෙදවීමට හැකියාව තිබියදී 2016 දෙසැම්බර් 31 දිනට රු. 3,291,835,366 ක් වූ අරමුදලේ ශේෂය සියයට 64 ක් කෙටිකාලීන ආයෝජනවල ආයෝජනය කර තිබුණි. තවද අරමුදලේ මුදල් වැය කිරීම සම්බන්ධයෙන් රීති සකස් කර අනුමත කරවා ගෙන නොතිබුණි.

### 4.2 කළමනාකරණ ක්‍රියාකාරකම්

අවශ්‍යතාවය නොසලකා විශාල පිරිවැයක් දරමින් මණ්ඩලයේ වාර්ෂික වාර්තාවල පිටපත් විශාල ප්‍රමාණයක් මුද්‍රණය කර තිබීම නිසා 2014 හා 2015 වර්ෂවලදී වාර්තා පිටපත් පිළිවෙලින් 162 ක් හා 117 ක් බෙදාහැරීමකින් තොරව ගබඩා කර තිබුණි.

### 4.3 ප්‍රමාද වූ ව්‍යාපෘති

මුළු ඇස්තමේන්තුව රු. මිලියන 3 ක් වූ මණ්ඩලයේ පරිගණක පද්ධති මෙහෙයුම් කාමරය සඳහා සිසිලන පද්ධතියක් සවිකිරීමට ඉංජිනේරුමය කාර්යයන් පිළිබඳ මධ්‍යම උපදේශන කාර්යාංශය සමග 2016 මැයි මස 11 දින ගිවිසුමකට එළඹ 2016 ජූනි 07 දින රු. 50,000 ක අත්තිකාරමක් ගෙවා තිබුණි. ගිවිසුමේ කොන්දේසි අනුව, ගිවිසුම ක්‍රියාත්මක වන දින සිට සති 20 ක කාල සීමාවක් තුළ එනම් 2016 ඔක්තෝම්බර් මාසය වන විට මෙම සේවාව සම්පූර්ණ කළ යුතු වුවද විගණිත දිනය වූ 2017 ජූනි 20 දින වනවිටත් සේවාව සම්පූර්ණ කර නොතිබුණි.

### 4.4 කාර්ය මණ්ඩල පරිපාලනය

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) 2016 දෙසැම්බර් 31 දිනට පුරප්පාඩුව පැවති තනතුරු 06 න් සහකාර ජීවගණක තනතුරක් 2017 අගෝස්තු මාසය වන විටත් පුරප්පාඩුව පැවතුණි.

(ආ) 2003 ජූනි 02 දිනැති අංක පීඊඩී/12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 9.3.1 වගන්තිය ප්‍රකාරව, මණ්ඩලයේ තනතුරු වලට අදාළ බඳවා ගැනීමේ පටිපාටිය මෙතෙක් අනුමත කර ගැනීමට මණ්ඩලය ක්‍රියා කර නොතිබුණු අතර එය පරිපාලන අත්පොතට ඇතුළත් කර ඇති බව මණ්ඩලය විසින් විගණනයට දන්වා තිබුණද එම පරිපාලන අත්පොත සඳහා හෝ මෙතෙක් අනුමැතිය ලැබී නොතිබුණි.

(ඇ) මණ්ඩලය විසින් 2016 ජනවාරි 01 දින ජීවගණක තනතුර සඳහා කොන්ත්‍රාත් පදනමින් බඳවා ගැනීම් සිදුකර තිබුණද 2016 ජූනි 09 දිනැති අධ්‍යක්ෂ ජනරාල් (පරිපාලන හා මානව සම්පත් සංවර්ධන) ගේ අනුමත කිරීමේ ලිපිය අනුව බඳවා ගැනීමේ පටිපාටිය සකස්කර, කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ අනුමැතිය ලබා ගැනීමෙන් පසුව, එම විධිවිධානයන්ට අනුකූලව විධිමත් භාවයකින් හා විනිවිද භාවයකින් බඳවා ගැනීම් සිදුකළ යුතු බව දක්වා තිබුණි.

# විගණකාධිපති වාර්තාව

(ඈ) 2016 වර්ෂයේදී බඳවා ගැනීම් සිදුකර තිබූ තනතුරු 03 ක් සඳහා 2017 අගෝස්තු මාසය දක්වාම කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ අනුමැතිය නොලැබුණු පරිපාලන අත්පොතේ සඳහන් විධිවිධාන ප්‍රකාරව , වැටුප් හා දීමනා ගෙවා තිබුණි.

## 5. ගිණුම් කටයුතුභාවය හා යහපාලනය

### 5.1 අයවැය ලේඛනමය පාලනය

මණ්ඩලයේ අයවැයගත ආදායම් හා වියදම් , මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් තත්‍ය අගයන් හා සැසඳීමේදී සියයට 100 සිට සියයට 246 දක්වා පරාසයක විචලනයන් නිරීක්ෂණය වූයෙන් අයවැය ලේඛනය ඵලදායී මූල්‍ය පාලන කාරකයක් ලෙස යොදාගෙන නොතිබුණු බව නිරීක්ෂණය විය.

## 6. පද්ධති හා පාලනයන්

විගණනයේදී නිරීක්ෂණය වූ පද්ධති හා පාලන ක්ෂේත්‍රවල අඩුපාඩු වරින් වර මණ්ඩලයේ සභාපතිවරයාගේ අවධානයට යොමු කරන ලදී. පහත සඳහන් පාලන ක්ෂේත්‍රයන් කෙරෙහි විශේෂ අවධානය යොමුකළ යුතුය.

| පද්ධති හා පාලන ක්ෂේත්‍ර | නිරීක්ෂණ |
|---|---|
| (අ) මූල්‍ය පාලනය | (i) රක්ෂණ ඔප්පු දරන්නන්ගේ ආරක්ෂණ අරමුදලින් සිදු කරන ගෙවීම් සඳහා විධිමත් ක්‍රමවේදයක් හඳුන්වාදී නොතිබීම. |
| | (ii) අරමුදලේ මුදල් දිගු කාලීන ආයෝජන වල නොයෙදීම |
| | (iii) නිලධාරීන්ට ලබාදෙන අත්තිකාරම් පියවීම කඩිනම් නොවීම |
| (ආ) ආදායම් පාලනය | (i) මණ්ඩලයේ ගිණුම්කරණ ප්‍රතිපත්තිය මත ආදායම් ගිණුම්ගත නොවීම. |
| | (ii) ආදායම් හඳුනාගැනීම ප්‍රමාද වීම. |
| (ඇ) කාර්ය මණ්ඩල පරිපාලනය | බඳවාගැනීම් සිදු කිරීමේදී විනිවිදභාවයකින් තොරව අදාළ තෝරා ගැනීම සිදුවීම. |

එච්. එම්. ගාමිණී විජේසිංහ
විගණකාධිපති

# විගණකාධිපති විසින් මතුකළ කරුණුවලට මණ්ඩලයේ ප්‍රතිචාර දැක්වීම

<table>
<tr><th></th><th>විගණකාධිපති වාර්තාව</th><th>ශ්‍රී ලංකා රක්ෂණ මණ්ඩලයේ ප්‍රතිචාර දැක්වීම</th></tr>
<tr><td>2.2</td><td>මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම</td><td></td></tr>
<tr><td>2.2.1</td><td>ගිණුම්කරණ අඩුපාඩු<br>පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.</td><td></td></tr>
<tr><td>(අ)</td><td>මණ්ඩලය ආදායම් හඳුනා ගැනීම උපචිත පදනම මත සිදු කළද, ජාතික රක්ෂණ භාර අරමුදල වෙතින් 2014 හා 2015 වර්ෂවලට අදාළව හිඟව තිබූ වාර්ෂික ගාස්තු රු. 2,894,316 ක් හා 2013 වර්ෂයේ සිට 2015 වර්ෂය දක්වා හිඟව තිබූ සෙස් ආදායමෙන් රු. 29,429,323 ක් වශයෙන් සමාලෝචිත වර්ෂය තුළ ලැබී තිබුණු එකතුව වූ රු. 32,323,639 ක් අදාල පූර්ව වර්ෂවල ආදායම් ලෙස හඳුනාගැනීමට කටයුතු නොකර සමාලෝචිත වර්ෂයේ ආදායමක් ලෙස ගිණුම්ගත කර තිබුණි.</td><td>2016 වසරේදී ලද හිඟ වාර්ෂික ගාස්තු හා සෙස් ආදායම පිළිබඳ විස්තර පහත පරිදි වේ.
<table>
<tr><th>වර්ෂය</th><th>වාර්ෂික ගාස්තු රු.</th><th>සෙස් රු.</th></tr>
<tr><td>2011</td><td>462,615</td><td>2,496,241</td></tr>
<tr><td>2012</td><td>602,571</td><td>3,350,105</td></tr>
<tr><td>2013</td><td>629,123</td><td>6,497,002</td></tr>
<tr><td>2014</td><td>1,218,188</td><td>12,027,470</td></tr>
<tr><td>2015</td><td>3,006,867</td><td>8,382,047</td></tr>
<tr><td>එකතුව</td><td>5,919,364</td><td>32,752,865</td></tr>
<tr><td>බදු</td><td>785,222</td><td>-</td></tr>
<tr><td>මුළු මුදල</td><td>6,704,586</td><td>32,752,865</td></tr>
<tr><td>පෙර වර්ෂවලදී ලැබීම්</td><td>(3,357,209)</td><td>(7,668,309)</td></tr>
<tr><td>ලැබිය යුතු මුදල</td><td>3,347,377</td><td>25,084,556</td></tr>
<tr><td>2016 වසරේ ලැබුණු මුදල</td><td>3,347,377</td><td>28,976,263</td></tr>
<tr><td>වැඩිපුර ගෙවා ඇති මුදල</td><td>-</td><td>* 3,891,707</td></tr>
</table>
*ජාතික රක්ෂණ භාර අරමුදල සමඟ එකඟ වූ පරිදි 2016 වසරේ සෙස් ආදායමෙන් කොටසක් ලෙස හඳුනාගෙන ඇත.<br><br>
සෑම ගිණුම් වර්ෂයකදීම රක්ෂණ සමාගම්වලින් ලැබූ / ලැබිය යුතු වාර්ෂික ගාස්තු හා සෙස් ආදයම ගිණුම්වල හඳුනාගෙන ඇති බැවින් ශ්‍රී ලංකා රාජ්‍ය ගිණුම්කරණ ප්‍රමිත අංක 3ට අනුව තක්සේරු වටිනාකම්වල වෙනස්වීම් ප්‍රවර්තන වර්ෂයට ගැළපිය හැකි වන අතර ඒ අනුව පෙර වර්ෂවලට අදාළව 2016 වසරේදී මණ්ඩලය වෙත ලද හිඟ මුදල ප්‍රවර්තන වර්ෂයට ගළපන ලද බව කරුණාවෙන් සලකන්න.<br><br>
අදාළ හිඟ ආදයම් ගිණුම්කරණ ප්‍රමිත අංක 03 ට අනුකූලව ප්‍රවර්තන වර්ෂයේ ආදයමක් ලෙස ගළපා ඇති බැවින් පූර්ව වර්ෂ ආදයම් අගයන් සංශෝධනය කිරීම අවශ්‍ය නොවේ.<br><br>
තවද, මණ්ඩලය විසින් ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත අංක 3 හි අන්තර්ගතයන්ට අනුරූපව මෙකී ගැළපීම කරන ලද බව 2017 ඔක්තෝම්බර් 11 දින පැවති, 2017 වසරේ 3 වන විගණන කමිටු රැස්වීමේදී තවදුරටත් පැහැදිලි කරන ලදි.</td></tr>
<tr><td>2.2.1</td><td>ගිණුම්කරණ අඩුපාඩු</td><td></td></tr>
<tr><td>(ආ)</td><td>මණ්ඩලයේ නියමයන්ට අනුව සාමාන්‍ය හා දිගුකාලීන ලෙස වෙන් වශයෙන් ලියාපදිංචි කිරීමේ අවශ්‍යතාවය සඳහා ලියාපදිංචි ගාස්තු ලෙස 2015 වර්ෂය හා ඊට පෙර වර්ෂවලදී ආයතන 03කින් ලැබී තිබූ රු.1,500,000 කින් නිවැරදි ප්‍රමාණය මණ්ඩලයේ ආදායම් ලෙස හඳුනා නොගෙන කලින් ලද අත්තිකාරම් ගිණුමේ රඳවාගෙන තිබුණි.</td><td>අදළ සමාගම් 3 මණ්ඩලය විසින් ලියාපදිංචි කර නොමැති නිසා උපලබ්ධි සංකල්පයට අනුව ආදායමක් ලෙස හඳුනාගත නොහැක. ඒ අනුව එය කලින් ලද අත්තිකාරම් ගිණුමේ රඳවා ගත යුතු වේ.</td></tr>
</table>

# විගණකාධිපති විසින් මතුකළ කරුණුවලට මණ්ඩලයේ ප්‍රතිචාර දැක්වීම

| | | |
|---|---|---|
| (ඈ) | විදේශ සෞඛ්‍ය රක්ෂණ කටයුතු සඳහා අතරමැදියෙකු ලෙස කටයුතු කිරීමට අනුමැතිය ලබා ගැනීම සඳහා ආයතනයකින් 2016 අගෝස්තු මාසයේදී ලැබුණු රු.500,000කින් සමාලෝචිත වර්ෂයේ දින 93කට අදාළ ආදායම වූ රු.127,397 ක් ගිණුම්ගත කර නොතිබුණි. | ලියාපදිංචි මුළු කාලයෙන් මාස 8/9 කට වඩා වැඩි කාලයක් එක් ගිණුම්/ලිත් වර්ෂයක් තුළට අදළ වන අවස්ථාවලදී අදළ ආදයම එකී වර්ෂයේ ආදයමක් ලෙස හඳුනාගැනීමේ සාමාන්‍ය පිළිවෙතක් මේ දක්වා අප විසින් අනුගමනය කරන ලදි. එබැවින් මෙහි (ඇ) 2017 වසරේ අදයමක් ලෙසත්, (ඈ) 2016 වසරේ ආදයමක් ලෙසත්, මණ්ඩලයේ ගිණුම්වල හඳුනාගෙන ඇත. |
| (ඇ) | ලියාපදිංචි ගාස්තු ලෙස 2015 දෙසැම්බර් මාසයේදී ලැබුණු රු. 500,000 ක මුදල තුළ ඇතුළත් 2017 ජනවාරි මාසයට අදාළ රු. 43,836 ක මුදල සමාලෝචිත වර්ෂයේ ආදායමක් ලෙස ගිණුම්ගත කර තිබුණි. | ඔබගේ නිරීක්ෂණයන් සැලකිල්ලට ගෙන ආදයම අදළ කාල පරිච්ඡේදයටම සමපාත වන අයුරින්ම හඳුනාගැනීමට ඉදිරියේදී පියවර ගන්නා බව දන්වනු කැමැත්තෙමු. |
| **2.3** | **නීති, රීති රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම** | |
| (අ) | 2000 අංක 43 දරන රක්ෂණ කර්මාන්තය විධිමත් කිරීමේ පනතේ | |
| (i) | -13 (1) (ඇ) වගන්තිය<br>තැන්පතු වශයෙන් රීති මගින් මණ්ඩලය විසින් නිශ්චය කරනු ලබන යම් මුදලක් ඒ තැනැත්තා විසින් භාණ්ඩාගාරයට ගෙවනු ලබන්නේ නම් මිස, ඒ තැනැත්තා ශ්‍රී ලංකාව තුළ රක්ෂණ ව්‍යාපාරයක් කරගෙන යාම සඳහා ලියාපදිංචි කරනු නොලැබිය යුතු වුවද, ආයතන 10 කට අදළව එම අවශ්‍යතාවය සපුරා ඇති බවට විගණනයට තහවුරු නොකෙරුණි. | ආයතන 10 ට අදළ තොරතුරු ඇමුණුමක් ලෙස 2017 ජුනි මස 06 දිනැති ලිපිය මගින් ද 2017 සැප්තැම්බර් මස 15 දින 13.7.A වාර්තාව සඳහා පිළිතුරු ඉදිරිපත් කිරීමේදී, විගණනය වෙත යොමුකර ඇත. |
| (ii) | -38(1)(ආ) වගන්තිය<br>තනිව හෝ සාමාන්‍ය රක්ෂණ ව්‍යාපාරයට අමතරව, දීර්ඝ කාලීන රක්ෂණ ව්‍යාපාරය කරගෙන යන සෑම රක්ෂණ කරුවෙකු විසින්ම දීර්ඝ කාලීන රක්ෂණ ව්‍යාපාරය සම්බන්ධයෙන් වන වත්කම්, වෙනත් යම් පංතියක රක්ෂණ ව්‍යාපාරය සම්බන්ධයෙන් වූ වත්කම් වලින් වෙන්ව තබාගත යුතු වුවද, ලියාපදිංචි රක්ෂණ සමාගම් 12 න් රක්ෂණ සමාගම් 3 ක් මෙතෙක් එපරිදි කටයුතු කර නොතිබුණි. | සමාගම් 3න් 2ක් අදාළ අවම ප්‍රාග්ධන අවශ්‍යතා සපුරා නොමැති බැවින් ලියාපදිංචිය මෙතෙක් ලබා දී නැත. අනෙක් සමාගම ඉදිරියේදී විභේදනය වීම සඳහා කටයුතු කරන බව අප වෙත දන්වා ඇත. |
| (iii) | 49(ආ) වගන්තිය<br>තත්කාර්ය සඳහා සාදන ලද රීති මගින් නිශ්චය කරනු ලබන යම් තොරතුරු ඇතුළත් ත්‍රෛමාසික වාර වාර්තාවක් මණ්ඩලය වෙත සපයනු ලැබිය යුතු වුවද, විගණනයට ඉදිරිපත් කළ තොරතුරු අනුව, රක්ෂණ සමාගම් හා රක්ෂණ තැරැව්කාර සමාගම්වලින් කාර්තුමය වාර්තා නියමිත දිනට ඉදිරිපත් නොකළ අවස්ථා නිරීක්ෂණය විය. | රක්ෂණ සමාගම්වල සහ රක්ෂණ තැරැව්කාර සමාගම්වල කාර්තුමය වාර්තා අදළ දිනට ඉදිරිපත් නොකළ අවස්ථාවලදී ඒ සම්බන්ධයෙන් සිහි කැඳවීම් ලිපි යවා කාර්තුමය වාර්තා මණ්ඩලය වෙත ගෙන්වා ගැනේ. |

# විගණකාධිපති විසින් මතුකළ කරුණුවලට මණ්ඩලයේ ප්‍රතිචාර දැක්වීම

| | විගණකාධිපති වාර්තාව | ශ්‍රී ලංකා රක්ෂණ මණ්ඩලයේ ප්‍රතිචාර දැක්වීම |
|---|---|---|
| (ආ) | 2003 ජුනි 02 දිනැති අංක PED/12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛය | |
| (i) | -6.5.1 ඡේදය<br>මූල්‍ය වර්ෂය අවසාන වී දින 60 ක් ඇතුළත මූල්‍ය ප්‍රකාශන සමග කෙටුම්පත් වාර්ෂික වාර්තාව විගණකාධිපති වෙත ඉදිරිපත් කළ යුතු වුවද, මණ්ඩලය විසින් කෙටුම්පත් වාර්ෂික වාර්තාව 2017 මැයි 30 දින තෙක් විගණනයට ඉදිරිපත් කර නොතිබුණි. | ශ්‍රී ලංකා රක්ෂණ මණ්ඩලයේ වාර්ෂික වාර්තාව සඳහා රක්ෂණ ආයතන සියල්ලේම අදළ තොරතුරු ලබාගත යුතු බවත් එම තොරතුරු මණ්ඩලය වෙත ලැබෙන්නේ අප්‍රේල් මස බවත් එබැවින් වර්ෂය අවසාන වී දින 60ක් යන විට ඉදිරිපත් කළයුතු වාර්ෂික ගිණුම් සමග කෙටුම්පත් වාර්තාව ඉදිරිපත් කළ නොහැකි බව සහ එය ප්‍රායෝගික නොවන බවද මීට පෙර විමසුම් වලට පිළිතුරු සැපයීමේදී සහ විගණන කමිටු රැස්වීම් වලදී පැහැදිලි කර ඇති බව දන්වනු කැමැත්තෙමු.<br>මෙම කරුණු සම්බන්ධයෙන් ඔබේ අංක TRE/C/IBSL/2015/INFO/18 දරන ලිපියට අපගේ IBSL/DG/FAD/5/49/16/07/329 අංක දරන 2016.07.22 දිනැති ලිපියෙන් ලබා දී ඇති පිළිතුරට ඔබගේ අවධානය යොමු කරනු කැමැත්තෙමු.<br>මේ වන විට වාර්ෂික වාර්තාවේ මුද්‍රණ කටයුතු සිදු කෙරෙමින් පවතින අතර අදළ මුද්‍රණ කටයුතු නිම වූ වහාම එහි පිටපතක් ඔබ වෙත ලබාදීමට අපේක්ෂා කෙරේ. |
| (ii) | -9.14 ඡේදය<br>පරිපාලන අත්පොතක් සකස් කර ඒ සඳහා අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතිය සහිතව භාණ්ඩාගාර ලේකම් වෙත ඉදිරිපත් කර එකඟතාවය ලබා ගත යුතු වුවද, එම අත්පොත විගණිත දිනය වූ 2017 මැයි 30 දින වන විට භාණ්ඩාගාර ලේකම් වෙත ඉදිරිපත් කර තිබුණද, එකඟතාවය ලැබී නොතිබුණි. | ශ්‍රී ලංකා රක්ෂණ මණ්ඩලයේ පරිපාලන අත්පොත අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතිය සහිතව 2017 මාර්තු මස 30 වන දින මුදල් අමාත්‍යාංශ ලේකම් වෙත ඉදිරිපත් කරන ලදි. මේ පිළිබඳව සිහි කැඳවීමක් රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල් වෙත 2017.08.18 දින යොමු කරන ලදි.<br>එයට මුදල් අමාත්‍යාංශයේ ලේකම්ගේ අනුමැතිය ලැබෙතැයි අපගේ විශ්වාසයයි. |
| **4** | **මෙහෙයුම් සමාලෝචනය** | |
| **4.1** | **කාර්යසාධනය** | |
| (අ) | නව ලියාපදිංචියක් වෙනුවෙන් රක්ෂණ ආයතනයක් වෙතින් 2015 සැප්තැම්බර් 30 දින මණ්ඩලය වෙත රු. 500,000 ක් ලැබී තිබුණද, සමාලෝචිත වර්ෂය අවසාන වන විටත් අදාල ලියාපදිංචි කටයුතු අවසන් කර නොතිබුණි. | අදාළ සමාගම මණ්ඩලය විසින් නියම කරන ලද කොන්දේසි සපුරා නොමැති බැවින් ලියාපදිංචිය ලබා දී නැත. |
| (ආ) | රක්ෂණ සහතික දරන්නන්ගේ සහ අනාගත රක්ෂණ සහතික දරන්නන්ගේ සම්බන්ධතා ආරක්ෂා කිරීම මණ්ඩලයේ ව්‍යවස්ථාපිත වගකීමක් වන බැවින් රක්ෂිතයෙකු විසින් ඉදිරිපත් කරනු ලබන රක්ෂණ හිමිකම් ගෙවීමක් සම්බන්ධ ආරවුලකදී එය විමර්ශනය කිරීමේ ව්‍යාවස්ථාපිත බලතල මණ්ඩලය සතුවේ. එහෙත් 2016 වර්ෂයේ ලද පැමිණිලි 353 න් පැමිණිලි 44ක් තවදුරටත් නොවිසඳී පැවතුණි. | විගණිත දිනය වන විට නොවිසදී ඉතිරිව තිබූ 2016 වර්ෂයේ ලද පැමිණිලි වලින් පැමිණිලි 97ක් 2017.11.30 දින වන විට නිරාකරණය කර ඇත. ඉතිරි පැමැණිලි 04 ට අදල නිර්දේශයන් ඉහළ කළමනාකාරීත්වයේ සහ අධ්‍යක්ෂ මණ්ඩලයේ අවධානය සඳහා යොමු කර ඇත.<br>රක්ෂණ හිමිකම් ගෙවීම් සම්බන්ධ ආරවුල් පමණක් නොව, රක්ෂණ සමාගම් හෝ අතරමැදියන් (තැරැව්කාර සමාගම් හා රක්ෂණ නියෝජිතයන්) සම්බන්ධයෙන් වන පැමිණිලි ද මණ්ඩලය විසින් විමර්ශනය කරනු ලබයි. තවද අසාධාරණ ලෙස නියෝජිතභාවය අවලංගු කරන ලද බවට හිටපු රක්ෂණ නියෝජිතයන් විසින් යොමුකරන පැමිණිලි ද මණ්ඩලය විසින් විමර්ශනය කරනු ලබයි. |

# විගණකාධිපති විසින් මතුකළ කරුණුවලට මණ්ඩලයේ ප්‍රතිචාර දැක්වීම

| | විගණකාධිපති වාර්තාව | ශ්‍රී ලංකා රක්ෂණ මණ්ඩලයේ ප්‍රතිචාර දැක්වීම |
|---|---|---|
| | | මණ්ඩලය වෙත ලැබෙන සියළු පැමිණිලි අභ්‍යන්තර පැමිණිලි නිරාකරණය කිරීමේ ක්‍රමවේදය අනුව විමර්ශනය කෙරෙන අතර යම් පැමිණිල්ලක් නිරාකරණය කිරීම සඳහා ගත වන කාලය, රක්ෂණ මණ්ඩලයේ පාලනයෙන් පරිබාහිර වන, පහත කරුණු මත ද රඳා පවතී.<br>• රක්ෂණ ඔප්පු වර්ගය (ජීවිත, පුද්ගලික දේපල, ව්‍යාපාරික දේපල, ධීවර බෝට්ටු ආදී);<br>• වන්දි ඉල්ලුම්කරුවන්ගේ පාර්ශවයෙන් විමර්ශනය සඳහා අවශ්‍ය වැඩිදුර තොරතුර/ලියවිලි මණ්ඩලය වෙත යොමු කිරීමට ගත වන ප්‍රමාදයන්;<br>• තුන්වන පාර්ශවයන්ගෙන් (පොලිස් ස්ථාන, රෝහල් ආදිය) විමර්ශනය සඳහා අවශ්‍ය තොරතුරු ලබාගැනීමේ දී සිදුවන ප්‍රමාදයන්;<br>• අදාල පාර්ශවයන් සමග සාකච්ඡා පැවැත්වීමට දින යොදා ගැනීමේ දී හා ඔවුන්ගේ අවශ්‍යතාවයන් මත එම සාකච්ඡා කල් දැමීමේ දී වන ප්‍රමාදයන්;<br>• රක්ෂණ වන්දි ඉල්ලීමේ අපැහැදිලිතාවයන් සහ සංකූලතාවයන්;<br>• ආරවුලේ ස්වභාවය සහ ඉල්ලුම් කරන රක්ෂණ වන්දි මුදලේ ප්‍රමාණය; |
| (ඇ) | 2009 වර්ෂයේදී මණ්ඩලය විසින් අත්හිටුවීමේ නියෝගයක් පනවා තිබුණු සමාගමක් වෙනුවෙන් ශ්‍රේෂ්ඨාධිකරණ නියෝග මත අව්‍යාජ රක්ෂණ හිමිකම් පෑම් ක්‍රමවත්ව බේරුම් කිරීම සඳහා එකී සමාගමේ වත්කම් බැහැර කිරීමට මණ්ඩලය සමාගම සමග අවබෝධතා ගිවිසුමකට එළඹ තිබුණද, විගණිත දිනය වූ 2017 ජුනි 29 දින වන විටත් එම බේරුම් කිරීම් අවසන් කර නොතිබුණි. | මීට පෙර විගණන විමසුම්වලදී පැහැදිලි කර ඇති පරිදි නිරාකරණය නොවූ හිමිකම් ඉල්ලීම් 8ක් පමණක් හඳුනාගන්නා ලදි. මීට පෙර වසරකදී මේ සම්බන්ධයෙන් කළ පැහැදිලි කිරීම් 2015.05.25 දිනැති ලිපියේ අඩංගු කර ඇත. එම හිමිකම් ඉල්ලීම් 8ට අදළ ලිපිගොනු නිරාකරණය සඳහා මේ වන විට අදළ සමාගමට භාර දී ඇත. වන්දි ගෙවීම කඩිනම් කිරීම සඳහා අදළ සමාගම වෙත උපදෙස් ලබා දී ඇත. |
| (ඈ) | 2015 ජුනි 30 දිනැති අධ්‍යක්ෂ මණ්ඩල තීරණයක් මත හානි තක්සේරුකරුවන් ලියාපදිංචි කිරීමේ රීතිය අනුමැතිය සඳහා නීති කෙටුම්පත් සම්පාදක වෙත යොමුකර තිබුණද, 2017 අප්‍රේල් 17 දින වන විටත් එම රීතිය අනුමත වූ බවට තොරතුරු ඉදිරිපත් නොකෙරුණි. මේ නිසා ක්‍රියාකාරී සැලැස්මේ දක්වා තිබුණු හානි තක්සේරුකරුවන් ලියාපදිංචි කිරීමේ අයදුම්පත් ලැබී මාස 2 ක් ඇතුළතදී එහි සමාලෝචන කටයුතු කිරීම සිදු වී නොතිබුණි. | අදළ රීතිය මණ්ඩලය විසින් අනුමැතිය සඳහා නීති කෙටුම්පත් සම්පාදක වෙත යොමුකර ඇති අතර, 2017.07.05 දිනැති අංක 2026/27 අති විශේෂ ගැසට් පත්‍රයේ පල කර ඇත. |
| (ඉ) | 2000 අංක 43 දරණ රක්ෂණ කර්මාන්තය විධිමත් කිරීමේ පනත, සංශෝධනය කිරීම සඳහා වූ පනත (Regulation of Insurance Industry Act) රේඛීය අමාත්‍යාංශය වෙත ඉදිරිපත් කර තිබුණද විගණිත දිනය වූ 2017 අප්‍රේල් 17 දින වන විටත් අනුමත වී නොතිබුණි. | මණ්ඩලය විසින් අනුමැතිය සඳහා මුදල් අමාත්‍යාංශය වෙත යොමුකර ඇති අතර, එය අනුමත වීම මණ්ඩලයේ පාලනයෙන් බැහැර වේ. මේ වන විට අදළ සංශෝධිත පනත (වර්ෂ 2017 අංක 23 දරන පනත) ගැසට් කර ඇත. |

# විගණකාධිපති විසින් මතුකළ කරුණුවලට මණ්ඩලයේ ප්‍රතිචාර දැක්වීම

| | විගණකාධිපති වාර්තාව | ශ්‍රී ලංකා රක්ෂණ මණ්ඩලයේ ප්‍රතිචාර දැක්වීම |
|---|---|---|
| (ඊ) | 2000 අංක 43 දරන රක්ෂණ කර්මාන්තය විධිමත් කිරීමේ පනත ප්‍රකාරව, රක්ෂණ ඔප්පු දරන්නන්ගේ ආරක්ෂණ අරමුදල් යනුවෙන් අරමුදලක් පිහිටුවා තිබුණු අතර ඒ අරමුදලට සෙස් බද්දෙන් උපචිත වන මුදල් බැර කිරීමෙන් අරමුදල සඳහා මුදල් උපයා ගනු ලැබේ. එම පනතේ 103(3) වගන්තිය ප්‍රකාරව, අරමුදලේ වහා අවශ්‍ය නොවන මුදල් දිගුකාලීන ආයෝජනවල යෙදවීමට හැකියාව තිබියදී 2016 දෙසැම්බර් 31 දිනට රු. 3,291,835,366 ක් වූ අරමුදලේ ශේෂය සියයට 64ක් කෙටි කාලීන ආයෝජනවල ආයෝජනය කර තිබුණි. තවද, අරමුදලේ මුදල් වැය කිරීම සම්බන්ධයෙන් රීති සකස් කර අනුමත කරවා ගෙන නොතිබුණි. | 2000 අංක 43 දරණ රක්ෂණ කර්මාන්තය නියාමනය කිරීමේ පනතේ 103(3) උපවගන්තිය ප්‍රකාරව අරමුදලේ අතිරික්ත මුදල් ආයෝජන ප්‍රතිලාභ උපරිම වන අයුරිනුත් සුරක්ෂිතතාව තහවුරු වන අයුරිනුත් විචක්ෂණ පදනමක් මත ආයෝජනය කළ යුතුවේ.<br><br>මේ අනුව අප සැලකිලිමත් විය යුත්තේ,<br>1. ප්‍රතිලාභ උපරිම වීම<br>2. ආයෝජිත මුදලේ මූල්‍යමය සුරක්ෂිතතාව<br>යන කරුණු පිළිබඳවය.<br><br>පසුගිය වසර කිහිපය තුළ සමස්ථයක් ලෙස ගත්කළ පොළී අනුපාතිකය ක්‍රමයෙන් ඉහළ යන තත්ත්වයක් දක්නට ලැබුණු අතර එවන් තත්ත්වයක් යටතේ දිගු කාලීන ආයෝජන ලාභදායී නොවුණි. 2016 වසරේ වසරින් කල්පිරෙන භාණ්ඩාගාර බිල්පත් හා ප්‍රමිතිමිළදී ගැනුම්වල පොළී අනුපාතිකය 10% මට්ටමේ පැවති අතර ස්ථාවර තැන්පතුවල (වසරින් කල් පිරෙන) පොලී අනුපාතිකය 12.5% - 13.5% පරාසයක පැවතිණ. තවද, වසර 2, 3, 4 සඳහා අප ලද පොලී අනුපාතිකයන් සතුටුදායක මට්ටමක නොපැවතිණ.<br><br>කරුණු එසේ හෙයින් මණ්ඩලයේ ආයෝජන වාර්ෂිකව කල් පිරෙන ප්‍රභවයන්හි ආයෝජනය කරන ලද්දේ උපරිම ප්‍රතිලාභයක් අරමුදලට අත්කර දීම සඳහා බව සඳහන් කරනු කැමැත්තෙමු.<br><br>තවද, අරමුදලේ ආයෝජනවල මූල්‍ය සුරක්ෂිතතාව තහවුරු කිරීම පිණිස කරනු ලැබෙන සියලුම ආයෝජන රාජ්‍ය බැංකුවල හා රාජ්‍ය ප්‍රාථමික වෙළඳුන් මාර්ගයෙන් පමණක් සිදුකරන බව දන්වා සිටිමු.<br><br>මේ අනුව මණ්ඩලයේ ආයෝජන දිගුකාලීන විය යුතුද, කෙටි කාලීන විය යුතුද යන්න පනතේ දක්වා නොමැති අතර "වහා අවශ්‍ය නොවන මුදල් කිසිවක් යහපත් ඵල ප්‍රයෝජනයක් ලැබෙන හා ආයෝජන ආරක්ෂා වන යම් විචක්ෂණ ආකාරයකින් මණ්ඩලය විසින් ආයෝජනය කරනු ලැබිය යුතු බව" පනතේ දක්වා ඇත. ඒ අනුව කරනු ලබන ආයෝජන එහි ප්‍රතිලාභ මත තීරණය කළ යුතු විනා, ඒ සම්බන්ධ වෙනත් නිර්ණායකයන් යොදගතහොත් පනතේ සඳහන් විධි විධානවලට පටහැනිවීමක් සිදුවන බව දන්වනු කැමැත්තෙමු.<br><br>මීට පෙරද, අප විසින් ඔබට දැනුම් දුන් පරිදි 2016 දෙසැම්බර් මස 27 දින පැවති මණ්ඩලයේ 4 වන විගණන කමිටු රැස්වීමේදී මේ පිළිබඳව සාකච්ඡා වූ අතර එවන් මාර්ගෝපදේශ/අනුමත ක්‍රියාපටියාටින්, ක්ෂණිකව පිළියෙල කළ හැකි ඒවා නොවන බැවින් මේ සම්බන්ධයෙන් පිළියෙල කරන ලද කෙටුම්පත සම්බන්ධයෙන් මණ්ඩලයේ අංශ ප්‍රධාන අධ්‍යක්ෂකවරුන්ගේ අදහස් විමසා ඉදිරි කටයුතු සිදු වෙමින් පවතී. |
| **4.2** | **කළමනාකරණ ක්‍රියාකාරකම්** | |
| | අවශ්‍යතාවය නොසලකා විශාල පිරිවැයක් දරමින් මණ්ඩලයේ වාර්ෂික වාර්තාවල පිටපත් විශාල ප්‍රමාණයක් මුද්‍රණය කර තිබීම නිසා 2014 හා 2015 වර්ෂවලදී වාර්තා පිටපත් පිළිවෙළින් 162 ක් හා 117ක් බෙදහැරීමකින් තොරව ගබඩා කර තිබුණි. | මේ වන විට ශ්‍රී ලංකා රක්ෂණ මණ්ඩලය ඉතා අවම වාර්ෂික වාර්තා පිටපත් සංඛ්‍යාවක් මුද්‍රණය කරනු ලබන අතර හුදෙක්ම මුද්‍රණ පිටපත් අඩු කිරීමෙන් පිරිවැය අඩු කළ නොහැක. මන්ද යත් මීට පෙරද දැනුම් දී ඇති පරිදි පොදු කාර්ය පිරිවැය අවම ඒකක සංඛ්‍යාවක් අතර බෙදී යාමේදී ඒකක පිරිවැය ඉහළ යන බැවිනි. කෙසේ නමුත් මුද්‍රණය කරනු ලබන පිටපත් සංඛ්‍යාව තවදුරටත් අඩුකිරීමට තීරණය කර ඇත. |

# විගණකාධිපති විසින් මතුකළ කරුණුවලට මණ්ඩලයේ ප්‍රතිචාර දැක්වීම

| | විගණකාධිපති වාර්තාව | ශ්‍රී ලංකා රක්ෂණ මණ්ඩලයේ ප්‍රතිචාර දැක්වීම |
|---|---|---|
| **4.3** | **ප්‍රමාද වූ ව්‍යාපෘති** | |
| | මුළු ඇස්තමේන්තුව රු. මිලියන 3ක් වූ මණ්ඩලයේ පරිගණක පද්ධති මෙහෙයුම් කාමරය සඳහා සිසිලන පද්ධතියක් සවි කිරීමට ඉංජිනේරුමය කාර්යයන් පිළිබඳ මධ්‍යම උපදේශන කාර්යාංශය සමග 2016 මැයි මස 11 දින ගිවිසුමකට එළඹ 2016 ජුනි 07 දින රු. 50,000 ක අත්තිකාරමක් ගෙවා තිබුණි. ගිවිසුමේ කොන්දේසි අනුව ගිවිසුම ක්‍රියාත්මක වන දින සිට සති 20 ක කාල සීමාවක් තුළ එනම් 2016 ඔක්තෝම්බර් මාසය වන විට මෙම සේවාව සම්පූර්ණ කළයුතු වුවද, විගණිත දිනය වූ 2017 ජුනි 20 දින වනවිටත් සේවාව සම්පූර්ණ කර නොතිබුණි. | මෙම කාර්යය ආරම්භ කිරීම සඳහා මේ වන විට අත්තිකාරම් ගෙවීමට සහ කාර්යය සාධනය සුරක්ෂණය සඳහා අවශ්‍ය ලියකියවිලි ලබාදෙන ලෙස සැපයුම්කරු වෙත දන්වා යවා ඇත. |
| **4.4** | **කාර්ය මණ්ඩල පරිපාලනය** | |
| (අ) | 2016 දෙසැම්බර් 31 දිනට පුරප්පාඩුව පැවති තනතුරු 06 න් සහකාර ජීවගණක තනතුරක් 2017 අගෝස්තු මාසය වන විටත් පුරප්පාඩුව පැවතුණි. | සහකාර ජීවගණක තනතුරට බඳවා ගැනීම සඳහා අවශ්‍ය කටයුතු සිදු කෙරෙමින් පවතී. |
| (ආ) | 2003 ජුනි 02 දිනැති අංක පීඊඩී/12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 9.3.1 වගන්තිය ප්‍රකාරව, මණ්ඩලයේ තනතුරු වලට අදාළ බඳවා ගැනීමේ පටිපාටිය මෙතෙක් අනුමත කර ගැනීමට මණ්ඩලය ක්‍රියා කර නොතිබුණු අතර එය පරිපාලන අත්පොතට ඇතුළත් කර ඇති බව මණ්ඩලය විසින් විගණනයට දන්වා තිබුණද එම පරිපාලන අත්පොත සඳහා හෝ මෙතෙක් අනුමැතිය ලැබී නොතිබුණි. | මණ්ඩලයේ ආරම්භක අවස්ථාවේ සිටම, සේවක සංඛ්‍යාව අනුමත කරගන්නා සෑම විටකදීම බඳවා ගැනීමේ පටිපාටියද ඒ සමඟම අනුමත කරවා ගෙන ඇත. ඒ අනුව මණ්ඩලයේ තනතුරුවලට අදාළ බඳවා ගැනීමේ පටිපාටිය එම තනතුරු ඇතිකිරීම සඳහා අනුමැතිය ඉල්ලා සිටින අවස්ථාවන්වලදීම විටින් විට අනුමත කරවාගෙන ඇත.<br>එනමුත්, පසුව සිදුකළ සංශෝධන සහිත බඳවා ගැනීමේ පටිපාටිය පරිපාලන අත්පොතට ඇතුළත් කර ඇති අතර මෙය අනුමැතිය සඳහා මුදල් අමාත්‍යාංශය වෙත යොමුකර ඇත්තේ 2012 වර්ෂයේ සිටය. කෙසේ වෙතත් අවසන් වරට සංශෝධන ඇතුළත් කිරීමෙන් පසු නැවත මුදල් අමාත්‍යංශය වෙත විගණකාධිපති දෙපාර්තමේන්තුවේ භාණ්ඩාගාර ශාඛාවටත් පිටපතක් සහිතව 2017.03.30 දින යොමුකර ඇත.<br>මේ පිළිබඳව සිහි කැඳවීමක් රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල් වෙත 2017.08.18 දින යොමු කරන ලදී. |
| (ඇ) | මණ්ඩලය විසින් 2016 ජනවාරි 01 දින ජීවගණක තනතුර සඳහා කොන්ත්‍රාත් පදනමින් බඳවා ගැනීම් සිදුකර තිබුණද 2016 ජුනි 09 දිනැති අධ්‍යක්ෂ ජනරාල් (පරිපාලන හා මානව සම්පත් සංවර්ධන) ගේ අනුමත කිරීමේ ලිපිය අනුව බඳවා ගැනීමේ පටිපාටිය සකස්කර, කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ අනුමැතිය ලබා ගැනීමෙන් පසුව, එම විධිවිධානයන්ට අනුකූලව විධිමත් භාවයකින් හා විනිවිද භාවයකින් බඳවා ගැනීම් සිදුකළ යුතු බව දක්වා තිබුණි. | මණ්ඩලයට අළුතින් ජීව ගණක ඒකකයක් ආරම්භ කිරීම සඳහා අවශ්‍ය තනතුරු අතරින් ජීවගණක තනතුර සඳහා අනුමැතිය අපේ යොමුව IBSL/FAD/9/1/18/16/05/230 හා 2016.05.10 දිනැති ලිපිය මගින් ඉල්ලා සිටි අතර එම තනතුර සඳහා කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ MF1/05/01/IBSL/1 හා 2016.05.27, ලිපිය මගින් අනුමැතිය ලබා දී ඇති අතර බඳවා ගැනීමේ පටිපාටිය අනුමැතිය සඳහා එවන මෙන් දන්වා තිබුණි. එම ඒකකයට අදාළ සහකාර ජීවගණක තනතුර හා විධායක තනතුර යන තනතුරුවලට අදාළ බඳවාගැනීමේ පටිපාටිද සමඟ ජීවගණක තනතුරට අදාළ බඳවා ගැනීමේ පටිපාටියද අපේ යොමුව IBSL/FAD/9/1/18/16/10/481 හා 2016.10.18 දිනැති ලිපිය මගින් මුදල් අමාත්‍යාංශය වෙත යොමු කරන ලදී. මෙහිදී ජීවගණක තනතුරෙහි බඳවා ගැනීමේ පටිපාටිය ඉදිරිපත් කරනු ලැබුයේ මුදල් අමාත්‍යාංශයේ MF1/05/01/IBSL/1 හා 2016.08.09 ලිපියේ සඳහන් අවශ්‍යතාවය සපුරාලීම පිණිසය.<br>රක්ෂණ මණ්ඩලයේ 2016.10.18 දිනැති ලිපියට පිළිතුරු ලෙස කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව විසින් එවන ලද DMS/1659/I හා 2016.12.07 දිනැති ලිපියෙහි සහකාර ජීවගණක හා විධායක තනතුරු පමණක් සඳහන්ව තිබුයේ එම තනතුරු අළුතින්ම ඇති කරන තනතුරු හේතුවෙන් බව දන්වමි. |

# විගණකාධිපති විසින් මතුකළ කරුණුවලට මණ්ඩලයේ ප්‍රතිචාර දැක්වීම

| | විගණකාධිපති වාර්තාව | ශ්‍රී ලංකා රක්ෂණ මණ්ඩලයේ ප්‍රතිචාර දැක්වීම |
|---|---|---|
| | | ජීවගණක තනතුර අනුමත තනතුරක් වන අතර ඊට අදාළ බඳවා ගැනීමේ පටිපාටිය පමණක් සකස්කර අනුමැතියට යොමුකරන ලෙස දන්වා තිබූ බැවින් එය අප විසින් ඉහත ලිපිය මගින් නිසි ලෙස යොමුකර තිබුණි. ඒ අනුව ඉදිරියේදී අවශ්‍ය කටයුතු අධ්‍යක්ෂ මණ්ඩලයේ උපදෙස් මත සිදුකෙරෙනු ඇත. |
| (ඇ) | 2016 වර්ෂයේදී බඳවා ගැනීම් සිදුකර තිබූ තනතුරු 03 ක් සඳහා 2017 අගෝස්තු මාසය දක්වාම කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ අනුමැතිය නොලැබුණු පරිපාලන අත්පොතේ සඳහන් විධිවිධාන ප්‍රකාරව, වැටුප් හා දීමනා ගෙවා තිබුණි. | ඉහත (ආ) හි දක්වා ඇති පරිදි මෙම තනතුරුවලට අනුමැතිය ලබාගන්නා අවස්ථාවේදීම, අදාළ බඳවා ගැනීමේ පටිපාටිද විටින් විට අනුමත කරවාගෙන ඇත. ඒ අනුව මෙම තනතුරු සඳහා වැටුප් හා දීමනා ගෙවනු ලබන්නේ, මුදල් අමාත්‍යාංශය විසින් අනුමත කර ඇති වැටුප් හා පරිමාණයන් අනුවය. |
| **5.** | **ගිණුම්කටයුතුභාවය සහ යහපාලනය** | |
| **5.1** | **අයවැය ලේඛනමය පාලනය** | |
| | අයවැයගත ආදායම් හා වියදම්, මූල්‍ය ප්‍රකාශන වල ඇතුලත් තත්‍ය අගයන් හා සැසඳීමේදී සියයට (100) සිට සියයට 246 දක්වා පරාසයක විචලනයන් නිරීක්ෂණය වූයෙන් අයවැය ලේඛනය ඵලදායී මූල්‍ය පාලන කාරකයක් ලෙස යොදා ගෙන නොතිබුණු බව නිරීක්ෂණය විය. | 246%ක අයවැයගත විචලනයක් නිරීක්ෂණය කළ හැක්කේ පොලී ආදායම හා ආදායම් බදු ගෙවීම් සම්බන්ධයෙන් වේ.<br>මණ්ඩලයේ සත්‍ය වාර්ෂික ගාස්තු ප්‍රමාණය අයවැයගත අගයට වඩා වැඩි වීමත්, පොලී අනුපාතිකයේ සිදුවූ කැපී පෙනෙන වර්ධනයත් හේතුවෙන් පොලී ආදායමේ වැඩිවීමක් දක්නට ලැබෙන අතර බදු ගෙවීම් පොලී ආදායම් මත පමණක් පදනම් වන බැවින් බදු වියදම් හි ද සමාන විචලනයක් පෙන්නුම් කෙරේ.<br>ප්‍රවර්තන වර්ෂයේ අයවැය ලේඛනය පෙර වර්ෂයේ අග භාගයේදී පිළියෙළ කරන අතර එහිදී පවත්නා තත්ත්වයන් සැලකිල්ලට ගෙන පසු වර්ෂය සඳහා අගයන් පුරෝකථනය කරන බැවින් ඒවා පූර්ණ තත්‍ය අගයන්මම නොවන බව කරුණාවෙන් සලකන්න. තවද, විචලනයන් හැකිතාක් දුරට අවම කරගනිමින් මණ්ඩලයේ අයවැය ලේඛනය පිළියෙල කිරීමට අප හැකි සෑම උත්සාහයක්ම දරනු ලැබේ. |
| **6.** | **පද්ධති හා පාලනයන්** | |
| | විගණනයේදී නිරීක්ෂණය වූ පද්ධති හා පාලන ක්ෂේත්‍රවල අඩුපාඩු වරින්වර මණ්ඩලයේ සභාපතිවරයාගේ අවධානයට යොමු කරන ලදි. පහත සඳහන් පාලන ක්ෂේත්‍රයන් කෙරෙහි විශේෂ අවධානය යොමු කළ යුතුය.<br>(අ) මූල්‍ය පාලනය<br>(i) රක්ෂණ ඔප්පුදරන්නන්ගේ ආරක්ෂණ අරමුදලින් සිදුකරන ගෙවීම් සඳහා විධිමත් ක්‍රමවේදයක් හඳුන්වාදී නොතිබීම<br>(ii) අරමුදලේ මුදල් දිගු කාලීන ආයෝජනවල නොයෙදීම<br>(iii) නිලධාරීන්ට ලබාදෙන අත්තිකාරම් පියවීම කඩිනම් නොවීම.<br>(ආ) ආදායම් පාලනය<br>මණ්ඩලයේ ගිණුම්කරණ ප්‍රතිපත්තිය මත ආදායම් ගිණුම්ගත නොවීම<br>ආදයම් හඳුනාගැනීම ප්‍රමාද වීම<br>(ඇ) කාර්ය මණ්ඩල පරිපාලනය<br>බඳවාගැනීම් සිදු කිරීමේදී විනිවිදභාවයකින් තොරව අදාළ තෝරාගැනීම සිදුවීම | ඉදිරියේදී කටයුතු කරගෙන යෑමේදී අදාළ ක්ෂේත්‍රයන් පිළිබඳව අවශ්‍යතාව පරිදි අවධානය යොමු කරනු ඇත.<br>(අ) (iii) නිලධාරීන්ට ලබාදෙන අත්තිකාරම් නිසි පරිදි පියවා ඇත.<br>(ඇ) රියැදුරු තනතුර සඳහා බඳවා ගැනීමේ කටයුතු සිදු කිරීමට සැලකිය යුතු කාලයක් ගතවීම මත මෙම කරුණ ඇතුළත් කරන ලද බව 2017 ඔක්තෝම්බර් 11 දින පැවති 2017 වසරේ තුන්වන විගණන කමිටු රැස්වීමේදී විගණන අධිකාරිතුමිය ප්‍රකාශ කරන ලද අතර එවන් ප්‍රමාදයන් සිදුවූයේ, කටයුතු විනිවිදභාවයකින් සිදු කිරීම හේතුකොටගෙන බව සඳහන් කරනු කැමැත්තෙමු. අදළ බඳවා ගැනීම ඉතාමත් විනිවිදභාවයෙන් සිදුකර ඇති බවද දන්වනු කැමැත්තෙමු. |

# පරිශිෂ්ඨය I

2015 දෙසැම්බර් 31 දිනට 2000 අංක 43 දරන රක්ෂණ කර්මාන්තය නියාමනය කිරීමේ පනත යටතේ ලියාපදිංචි වී ඇති රක්ෂණ සමාගම්

| රක්ෂණ සමාගම | ව්‍යාපාර කටයුතු වර්ගය |
| --- | --- |
| ඒඅයිඒ ඉන්ෂුවරන්ස් ලංකා පීඑල්සී | දිගුකාලීන රක්ෂණය |
| ඒඅයිජී ඉන්ෂුවරන්ස් ලිමිටඩ්* | සාමාන්‍ය රක්ෂණය |
| ඇලියොන්ස් ඉන්ෂුවරන්ස් ලංකා ලිමිටඩ් | සාමාන්‍ය රක්ෂණය |
| ඇලියොන්ස් ලයිෆ් ඉන්ෂුවරන්ස් ලංකා ලිමිටඩ් | දිගුකාලීන රක්ෂණය |
| අමානා තකාෆුල් ලයිෆ් ලිමිටඩ් | දිගුකාලීන රක්ෂණය |
| අමානා තකාෆුල් පීඑල්සී | සාමාන්‍ය රක්ෂණය |
| ආර්පිකෝ ඉන්ෂුවරන්ස් පීඑල්සී | දිගුකාලීන රක්ෂණය |
| සොෆ්ට් ලොජික් ලයිෆ් ඉන්ෂුවරන්ස් පීඑල්සී | දිගුකාලීන රක්ෂණය |
| ෆෙයාර් ෆස්ට් ඉන්ෂුවරන්ස් ලිමිටඩ් | සාමාන්‍ය රක්ෂණය |
| සෙලින්කෝ ජෙනරල් ඉන්ෂුවරන්ස් ලිමිටඩ් | සාමාන්‍ය රක්ෂණය |
| සෙලින්කෝ ලයිෆ් ඉන්ෂුවරන්ස් ලිමිටඩ් | දිගුකාලීන රක්ෂණය |
| කොන්ටිනෙන්ටල් ඉන්ෂුවරන්ස් ලංකා ලිමිටඩ් | සාමාන්‍ය රක්ෂණය |
| කෝපරේටිව් ඉන්ෂුවරන්ස් කම්පනි ලිමිටඩ් | සාමාන්‍ය රක්ෂණය |
| කෝප් ලයිෆ් ඉන්ෂුවරන්ස් ලිමිටඩ් | දිගුකාලීන රක්ෂණය |
| එච්එන්බී ඇෂුවරන්ස් පීඑල්සී | දිගුකාලීන රක්ෂණය |
| එච්එන්බී ජෙනරල් ඉන්ෂුවරන්ස් ලිමිටඩ් | සාමාන්‍ය රක්ෂණය |
| ජනශක්ති ජෙනරල් ඉන්ෂුවරන්ස් ලිමිටඩ් | සාමාන්‍ය රක්ෂණය |
| ජනශක්ති ඉන්ෂුවරන්ස් පීඑල්සී | දිගුකාලීන රක්ෂණය |
| ලයිෆ් ඉන්ෂුවරන්ස් කෝපරේෂන් (ලංකා) ලිමිටඩ් | දිගුකාලීන රක්ෂණය |
| එල්ඕඑල්සී ජෙනරල් ඉන්ෂුවරන්ස් ලිමිටඩ් | සාමාන්‍ය රක්ෂණය |
| එල්ඕඑල්සී ලයිෆ් ඇෂුවරන්ස් ලිමිටඩ් | දිගුකාලීන රක්ෂණය |
| එම්බීඑස්එල් ඉන්ෂුවරන්ස් කම්පනි ලිමිටඩ් | දිගුකාලීන රක්ෂණය සහ සාමාන්‍ය රක්ෂණය |
| ජාතික රක්ෂණ භාර අරමුදල | සාමාන්‍ය රක්ෂණය |
| ඔරියන්ට් ඉන්ෂුවරන්ස් ලිමිටඩ් | සාමාන්‍ය රක්ෂණය |
| පීපල්ස් ඉන්ෂුවරන්ස් පීඑල්සී | සාමාන්‍ය රක්ෂණය |
| සීමාසහිත සණස රක්ෂණ සමාගම | දිගුකාලීන රක්ෂණය සහ සාමාන්‍ය රක්ෂණය |
| ශ්‍රී ලංකා ඉන්ෂුවරන්ස් කෝපරේෂන් ලිමිටඩ් | දිගුකාලීන රක්ෂණය සහ සාමාන්‍ය රක්ෂණය |
| යුනියන් ඇෂුවරන්ස් පීඑල්සී | දිගුකාලීන රක්ෂණය |
| යුනියන් ඇෂුවරන්ස් ජෙනරල් ලිමිටඩ් | සාමාන්‍ය රක්ෂණය |

*මේ වන විට, ශ්‍රී ලංකාව තුළ රක්ෂණ ව්‍යාපාර කටයුතු වලින් ඉවත් වීම අරඹා ඇති අතර, තවදුරටත් නව රක්ෂණ ඔප්පු නිකුත් කරනු නොලැබේ.

# පරිශිෂ්ඨය II

2016 දෙසැම්බර් 31 දිනට 2000 අංක 43 දරන රක්ෂණ කර්මාන්තය නියාමනය කිරීමේ පනත යටතේ ලියාපදිංචි වී ඇති රක්ෂණ තැරැව්කාර සමාගම්

| අංකය | රක්ෂණ තැරැව්කරු | ව්‍යාපාර කටයුතු වර්ගය |
|---|---|---|
| 1 | ඒඑම්ඩබ්ලිව් ඉන්ෂුවරන්ස් බ්‍රෝකර්ස් (ප්‍රයිවට්) ලිමිටඩ් | සාමාන්‍ය රක්ෂණය |
| 2 | ඒඩීඉසෙඩ් ඉන්ෂුවරන්ස් බ්‍රෝකර්ස් (ප්‍රයිවට්) ලිමිටඩ් | දිගුකාලීන රක්ෂණය සහ සාමාන්‍ය රක්ෂණය |
| 3 | එයිට්කන් ස්පෙන්ස් ඉන්ෂුවරන්ස් බ්‍රෝකර්ස් (ප්‍රයිවට්) ලිමිටඩ් | දිගුකාලීන රක්ෂණය සහ සාමාන්‍ය රක්ෂණය |
| 4 | ඇල්ෆින්කෝ ඉන්ෂුවරන්ස් බ්‍රෝකර්ස් (ප්‍රයිවට්) ලිමිටඩ් | දිගුකාලීන රක්ෂණය සහ සාමාන්‍ය රක්ෂණය |
| 5 | ඇලියෝන් ඉන්ෂුවරන්ස් බ්‍රෝකර්ස් (ප්‍රයිවට්) ලිමිටඩ් | දිගුකාලීන රක්ෂණය සහ සාමාන්‍ය රක්ෂණය |
| 6 | ඇම්ට්‍රස්ට් ඉන්ෂුවරන්ස් බ්‍රෝකර්ස් (ප්‍රයිවට්) ලිමිටඩ් | දිගුකාලීන රක්ෂණය සහ සාමාන්‍ය රක්ෂණය |
| 7 | ඇක්විලයින් ඉන්ෂුවරන්ස් බ්‍රෝකර්ස් (ප්‍රයිවට්) ලිමිටඩ් | දිගුකාලීන රක්ෂණය සහ සාමාන්‍ය රක්ෂණය |
| 8 | අසෙකි ඉන්ෂුවරන්ස් බ්‍රෝකර්ස් (ප්‍රයිවට්) ලිමිටඩ් | සාමාන්‍ය රක්ෂණය |
| 9 | ඇසට්ලයින් ඉන්ෂුවරන්ස් බ්‍රෝකර්ස් ලිමිටඩ් | සාමාන්‍ය රක්ෂණය |
| 10 | ඇක්ස් ඉන්ෂුවරන්ස් බ්‍රෝකර්ස් (ප්‍රයිවට්) ලිමිටඩ් | සාමාන්‍ය රක්ෂණය |
| 11 | බ්‍රිලියන්ස් ඉන්ෂුවරන්ස් බ්‍රෝකර්ස් කම්පනි (ප්‍රයිවට්) ලිමිටඩ් | දිගුකාලීන රක්ෂණය සහ සාමාන්‍ය රක්ෂණය |
| 12 | සියෙක්ස් ඉන්ෂුවරන්ස් බ්‍රෝකර්ස් ලිමිටඩ් | සාමාන්‍ය රක්ෂණය |
| 13 | සීලෑන් ඉන්ෂුවරන්ස් බ්‍රෝකර්ස් කම්පනි (ප්‍රයිවට්) ලිමිටඩ් | සාමාන්‍ය රක්ෂණය |
| 14 | සිනර්ජි ඉන්ෂුවරන්ස් බ්‍රෝකර්ස් (ප්‍රයිවට්) ලිමිටඩ් | දිගුකාලීන රක්ෂණය සහ සාමාන්‍ය රක්ෂණය |
| 15 | සීඑෆ් ඉන්ෂුවරන්ස් බ්‍රෝකර්ස් (ප්‍රයිවට්) ලිමිටඩ් | දිගුකාලීන රක්ෂණය සහ සාමාන්‍ය රක්ෂණය |
| 16 | කලම්බුරේ ඉන්ෂුවරන්ස් බ්‍රෝකර්ස් (ප්‍රයිවට්) ලිමිටඩ් | දිගුකාලීන රක්ෂණය සහ සාමාන්‍ය රක්ෂණය |
| 17 | කොමර්ෂල් ඉන්ෂුවරන්ස් බ්‍රෝකර්ස් (ප්‍රයිවට්) ලිමිටඩ් | දිගුකාලීන රක්ෂණය සහ සාමාන්‍ය රක්ෂණය |
| 18 | ඩී එස් ඉන්ෂුවරන්ස් බ්‍රෝකර්ස් (ප්‍රයිවට්) ලිමිටඩ් | දිගුකාලීන රක්ෂණය සහ සාමාන්‍ය රක්ෂණය |
| 19 | ඩෙල්මේජ් ඉන්ෂුවරන්ස් බ්‍රෝකර්ස් (ප්‍රයිවට්) ලිමිටඩ් | දිගුකාලීන රක්ෂණය සහ සාමාන්‍ය රක්ෂණය |
| 20 | ඊඒජී - ආර්එම්එස් ඉන්ෂුවරන්ස් බ්‍රෝකර්ස් (ප්‍රයිවට්) ලිමිටඩ් | දිගුකාලීන රක්ෂණය සහ සාමාන්‍ය රක්ෂණය |
| 21 | ඉක්විටි ඉන්ෂුවරන්ස් බ්‍රෝකර්ස් (ප්‍රයිවට්) ලිමිටඩ් | දිගුකාලීන රක්ෂණය සහ සාමාන්‍ය රක්ෂණය |
| 22 | එසාජි කර්මිජි ඉන්ෂුවරන්ස් බ්‍රෝකර්ස් (ප්‍රයිවට්) ලිමිටඩ් | දිගුකාලීන රක්ෂණය සහ සාමාන්‍ය රක්ෂණය |
| 23 | ෆින්ලේ ඉන්ෂුවරන්ස් බ්‍රෝකර්ස් (ප්‍රයිවට්) ලිමිටඩ් | දිගුකාලීන රක්ෂණය සහ සාමාන්‍ය රක්ෂණය |
| 24 | ෆෝසයිට් ඉන්ෂුවරන්ස් ඇන්ඩ් රීඉන්ෂුවරන්ස් බ්‍රෝකර්ස් (ප්‍රයිවට්) ලිමිටඩ් | සාමාන්‍ය රක්ෂණය |
| 25 | ජෝර්ජ් ස්ටුව(ර්)ට් ඉන්ෂුවරන්ස් බ්‍රෝකර්ස් (ප්‍රයිවට්) ලිමිටඩ් | දිගුකාලීන රක්ෂණය සහ සාමාන්‍ය රක්ෂණය |
| 26 | ග්ලෝබල් ඉන්ෂුවරන්ස් බ්‍රෝකර්ස් ඇන්ඩ් සර්විසස් (ප්‍රයිවට්) ලිමිටඩ් | දිගුකාලීන රක්ෂණය සහ සාමාන්‍ය රක්ෂණය |
| 27 | ග්‍රෑන්ඩ් ඉන්ෂුවරන්ස් බ්‍රෝකර්ස් (ප්‍රයිවට්) ලිමිටඩ් | දිගුකාලීන රක්ෂණය සහ සාමාන්‍ය රක්ෂණය |
| 28 | ගාඩියන් ඉන්ෂුවරන්ස් බ්‍රෝකර්ස් (ප්‍රයිවට්) ලිමිටඩ් | සාමාන්‍ය රක්ෂණය |
| 29 | ඉන්ෂුවර්මී ඉන්ෂුවරන්ස් බ්‍රෝකර්ස් (ප්‍රයිවට්) ලිමිටඩ් | දිගුකාලීන රක්ෂණය සහ සාමාන්‍ය රක්ෂණය |
| 30 | ජේ ඉන්ෂුවරන්ස් බ්‍රෝකර්ස් ඇන්ඩ් කන්සල්ටන්ස් (ප්‍රයිවට්) ලිමිටඩ් | දිගුකාලීන රක්ෂණය සහ සාමාන්‍ය රක්ෂණය |
| 31 | ජේඑෆ් ඉන්ෂුවරන්ස් බ්‍රෝකර්ස් (ප්‍රයිවට්) ලිමිටඩ් | සාමාන්‍ය රක්ෂණය |
| 32 | එල්එම් ඇන්ඩ් ඩී ඉන්ෂුවරන්ස් බ්‍රෝකර්ස් ඇන්ඩ් කන්සල්ටන්ස් (ප්‍රයිවට්) ලිමිටඩ් | දිගුකාලීන රක්ෂණය සහ සාමාන්‍ය රක්ෂණය |
| 33 | ලක් ඉන්ෂුවරන්ස් බ්‍රෝකර්ස් (ප්‍රයිවට්) ලිමිටඩ් | දිගුකාලීන රක්ෂණය සහ සාමාන්‍ය රක්ෂණය |
| 34 | ලයිෆ් ඇන්ඩ් ජෙනරල් ඉන්ෂුවරන්ස් බ්‍රෝකර්ස් සිලෝන් (ප්‍රයිවට්) ලිමිටඩ් | දිගුකාලීන රක්ෂණය සහ සාමාන්‍ය රක්ෂණය |
| 35 | මැක්ස්වෙල් ඉන්ෂුවරන්ස් බ්‍රෝකර්ස් (ප්‍රයිවට්) ලිමිටඩ් | දිගුකාලීන රක්ෂණය සහ සාමාන්‍ය රක්ෂණය |
| 36 | මර්කන්ටයිල් ඉන්ෂුවරන්ස් බ්‍රෝකර්ස් (ප්‍රයිවට්) ලිමිටඩ් | සාමාන්‍ය රක්ෂණය |
| 37 | මයි ඉන්ෂුවරන්ස් බ්‍රෝකර්ස් (ප්‍රයිවට්) ලිමිටඩ් | සාමාන්‍ය රක්ෂණය |
| 38 | නේෂන්ස් ඉන්ෂුවරන්ස් බ්‍රෝකර්ස් ලිමිටඩ් | දිගුකාලීන රක්ෂණය සහ සාමාන්‍ය රක්ෂණය |
| 39 | ප්ලැසිඩ් ඉන්ෂුවරන්ස් බ්‍රෝකර්ස් (ප්‍රයිවට්) ලිමිටඩ් | දිගුකාලීන රක්ෂණය සහ සාමාන්‍ය රක්ෂණය |
| 40 | ප්‍රෝකෙයා ඉන්ෂුවරන්ස් බ්‍රෝකර්ස් (ප්‍රයිවට්) ලිමිටඩ් | දිගුකාලීන රක්ෂණය සහ සාමාන්‍ය රක්ෂණය |
| 41 | ප්‍රොටෙක්ෂන් ඇන්ඩ් ඇෂුවරන්ස් ඉන්ෂුවරන්ස් බ්‍රෝකර්ස් (ප්‍රයිවට්) ලිමිටඩ් | දිගුකාලීන රක්ෂණය සහ සාමාන්‍ය රක්ෂණය |

# පරිශිෂ්ඨය II

| | | |
|---|---|---|
| 42 | ප්‍රොටෙක්ෂන් ඇන්ඩ් අට්මෝස්ට් ඉන්ෂුවරන්ස් බ්‍රෝකර්ස් (ප්‍රයිවට්) ලිමිටඩ් | දිගුකාලීන රක්ෂණය සහ සාමාන්‍ය රක්ෂණය |
| 43 | රෙඩ්මෝ ස්විස් ඉන්ෂුවරන්ස් බ්‍රෝකර්ස් (ප්‍රයිවට්) ලිමිටඩ් | සාමාන්‍ය රක්ෂණය |
| 44 | රිලයන්ස් ඉන්ෂුවරන්ස් බ්‍රෝකර්ස් (ප්‍රයිවට්) ලිමිටඩ් | දිගුකාලීන රක්ෂණය සහ සාමාන්‍ය රක්ෂණය |
| 45 | රින්කුන් ලංකා ඉන්ෂුවරන්ස් බ්‍රෝකර්ස් (ප්‍රයිවට්) ලිමිටඩ් | සාමාන්‍ය රක්ෂණය |
| 46 | සැම්සන් ඉන්ෂුවරන්ස් බ්‍රෝකර්ස් (ප්‍රයිවට්) ලිමිටඩ් | සාමාන්‍ය රක්ෂණය |
| 47 | සේනාරත්න ඉන්ෂුවරන්ස් බ්‍රෝකර්ස් (ප්‍රයිවට්) ලිමිටඩ් | දිගුකාලීන රක්ෂණය සහ සාමාන්‍ය රක්ෂණය |
| 48 | සෙංකඩගල ඉන්ෂුවරන්ස් බ්‍රෝකර්ස් (ප්‍රයිවට්) ලිමිටඩ් | දිගුකාලීන රක්ෂණය සහ සාමාන්‍ය රක්ෂණය |
| 49 | ස්ට්‍රැටර්ජික් ඉන්ෂුවරන්ස් බ්‍රෝකර්ස් (ප්‍රයිවට්) ලිමිටඩ් | දිගුකාලීන රක්ෂණය සහ සාමාන්‍ය රක්ෂණය |
| 50 | ට්‍රස්ට් ඉන්ෂුවරන්ස් බ්‍රෝකර්ස් (ප්‍රයිවට්) ලිමිටඩ් | සාමාන්‍ය රක්ෂණය |
| 51 | යූඑන් ඉන්ෂුවරන්ස් බ්‍රෝකර්ස් (ප්‍රයිවට්) ලිමිටඩ් | සාමාන්‍ය රක්ෂණය |
| 52 | යුනයිටඩ් ඉන්ෂුවරන්ස් බ්‍රෝකර්ස් (ප්‍රයිවට්) ලිමිටඩ් | සාමාන්‍ය රක්ෂණය |
| 53 | වෙරාසිටි ඉන්ෂුවරන්ස් බ්‍රෝකර්ස් (ප්‍රයිවට්) ලිමිටඩ් | දිගුකාලීන රක්ෂණය සහ සාමාන්‍ය රක්ෂණය |
| 54 | වික්ටර් එමානුවෙල් ඉන්ෂුවරන්ස් බ්‍රෝකර්ස් (ප්‍රයිවට්) ලිමිටඩ් | දිගුකාලීන රක්ෂණය සහ සාමාන්‍ය රක්ෂණය |
| 52 | වොලන්කා ඉන්ෂුවරන්ස් බ්‍රෝකර්ස් (ප්‍රයිවට්) ලිමිටඩ් | දිගුකාලීන රක්ෂණය සහ සාමාන්‍ය රක්ෂණය |
| 56 | සෙනිත් ඉන්ෂුවරන්ස් බ්‍රෝකර්ස් (ප්‍රයිවට්) ලිමිටඩ් | දිගුකාලීන රක්ෂණය සහ සාමාන්‍ය රක්ෂණය |

# පාරිභාෂික ශබ්ද මාලාව

### සමුච්චිත වීම

එක් සමාගමක් සමඟ පවතින සැලකිය යුතු රක්ෂිත හෝ ප්‍රාරක්ෂිත අවදානම් සංඛ්‍යාවක් පාඩු ලබන සිදුවීමක් නිසා එක්වර පීඩාකාරී බවට පත්වන තත්ත්වයකි.

### අත්කර ගැනීමේ වියදම්

අබිනව රක්ෂණ ගිවිසුම් අත්කර ගැනීම සහ දැනටමත් පවත්නා රක්ෂණ ගිවිසුම් අළුත්කිරීම (උදා ඃ- කොමිස් මුදල්) යන අවස්ථාවලදී වෙනස්වීම්වලට ලක්වන සහ එයට මූලික වශයෙන් සම්බන්ධතාවක් දක්වන සියළු වියදම්.

### ජීවගණකඥ

රක්ෂණය, ආයෝජනය මූල්‍ය කළමනාකරණය සහ ප්‍රජා විද්‍යාව ආශ්‍රිත ගැටළුවලට සම්භාවිතා සහ සංඛ්‍යානමය සිද්ධාන්ත යොදා ගන්නා විශේෂඥයෙකි.

### පරිපාලන වියදම්

දේපල, පිරියත හා උපකරණ සඳහා ක්ෂය ප්‍රතිපාදන සහ සේවක පිරිවැය සහිතව වාරික එකතු කිරීමේ දී ආයෝජන කදම්බ පරිපාලනයේ දී ජනනය වන පරිපාලන ස්වභාවයේ වියදම්.

### ආවේශ්‍ය කරනු ලැබිය හැකි වත්කම්

ප්‍රමාණවත් ප්‍රාග්ධන අනුපාතය ගණනය කිරීමේදී 2015 ණය ගෙවීමේ හැකියාවේ සීමා (අවදානම් පදනම් ප්‍රාග්ධන) රීති යටතේ නිර්නය කර ඇති වත්කම් සීමා සහ තක්සේරු ක්‍රමවේදයන්ට යටත්ව පවතින වත්කම්.

### වාර්ෂිකය

යම් කිසි නිශ්චිත කාලසීමාවක් සඳහා වාර්ෂිකලාභියාගේ ආයු කාලය මුළුල්ලේ හෝ වාරමය වශයෙන් ආදායම් ප්‍රතිලාභ ගෙවන ජීවිත රක්ෂණයකි. විලම්භිත හා ක්ෂණිකව ක්‍රියාත්මක වන යනුවෙන් වන මූලික වශයෙන් වර්ග දෙකකට අයත් වාර්ෂික පවතියි. ගෙවීම් සිදුකිරීම යම්කිසි අනාගත කාලයකදී ආරම්භ වන්නේනම් එය විලම්භිත වාර්ෂිකය නම්වේ. ගිවිසුම ආරම්භ වන අවස්ථාවේදීම අදාල ගෙවීම් සිදුකිරීම අරඹන්නේනම් එය ක්ෂණික වාරිකය නම්වේ.

### බැංකු ගණුදෙනුකරුවන් සඳහා වූ රක්ෂණ ඔප්පු

බැංකු ගණුදෙනුකරුවන් සඳහා වූ රක්ෂණ සහ ආයෝජන ප්‍රතිලාභ ගෙනදෙන්නාවූ රක්ෂණ ඔප්පු අලෙවි කිරීම සඳහා කටයුතු සම්පාදනය කිරීම.

### ප්‍රමාණවත් ප්‍රාග්ධන අනුපාතය

පූර්ණ පවත්නා ප්‍රාග්ධනය, නියමිත අවදානම් ප්‍රාග්ධන අගයට දක්වන අනුපාතය ප්‍රතිශතයක් වශයෙන්

$$\text{ප්‍රමාණවත් ප්‍රාග්ධන අනුපාතය} = \frac{\text{පූර්ණ පවත්නා ප්‍රාග්ධනය}}{\text{නියමිත අවදානම් ප්‍රාග්ධනය}} \times 100$$

### ප්‍රතිලාභියා

ඔප්පු හිමියාගේ මරණයක දී රක්ෂිත මුදල් සහ අනෙකුත් ප්‍රතිලාභ ලැබිය යුතු ආදායකයා ලෙස ඔප්පු හිමියා විසින් නම් කරනු ලබන පුද්ගලයා.

### ප්‍රතිරක්ෂිතයා

ප්‍රතිරක්ෂණ සමාගමක සේවාදායකයෙක්. (ප්‍රාථමික රක්ෂණ සමාගම)

### ප්‍රතිරක්ෂිතය

ප්‍රාථමික රක්ෂණ සමාගම විසින් ප්‍රතිරක්ෂණ සමාගමට පවරනු ලබන අවදානම් කොටස.

### හිමිකම් පෑම

දේපල විනාශ වීම හෝ හානි වීම සහ ඒ ආශ්‍රිත මරණය හෝ තුවාල සිදුවීම, ආරෝග්‍යශාලා හෝ වෛද්‍ය බිල්පත් දැරීම. රක්ෂිතයාගේ මරණය හෝ ආබාධිතවීම, උපපාදන ඔප්පුවක් කල් පිරීම, විශ්‍රාමික වයසට පත්වීම යනාදී ආකාරවලට රක්ෂණයට බඳුන් වූ කාරණය සිදුවීම හේතු කරගෙන හෝ ඔප්පුවක් පවාරණය කිරීමේ දී රක්ෂණ ගිවිසුම පරිදි ගෙවිය යුතු මුදල.

### දරන ලද හිමිකම් පෑම

වර්ෂය ආරම්භයේ දි සහ වර්ෂය අවසානයේ දී හිඟ තබා ඇති හිමිකම්පෑම් සඳහා වූ ප්‍රතිපාදන වෙනුවෙන් අවශ්‍ය අවස්ථාවල දී ගැලපීම් කළ පසු ගිණුම් වර්ෂයක් තුළ හිමිකම් පෑම සඳහා අවශ්‍ය කටයුතු කිරීමට දරන වියදම සහිතව ගෙවන ලද මුළු හිමිකම් පෑම් වටිනාකම.

### දරන ලද නමුත් වාර්තා නොකරන ලද හිමිකම්පෑම්

දේපල, වගකීම් සහ මූල්‍ය යන රක්ෂණ පිළිබඳව සිදුවී ඇති නමුත් රක්ෂකයා වෙත තවමත් වාර්තා කරනු ලැබ නැති අලාභ ආවරණය කිරීම සඳහා දැරීමට සිදුවනු ඇතැයි අපේක්ෂිත පිරිවැය නිරූපණය කරමින් වර්ෂය අවසානයේ දී ඇති කරනු ලබන සංචිතයකි.

### හිඟ සිටි හිමිකම් පෑම් සංචිතය සාමාන්‍ය රක්ෂණ ව්‍යාපාර කටයුතු

සිදු වූ නමුත් වාර්තා කරනු ලැබ නොතිබූ හිමිකම් සහ ඒවා පිළිබඳව කටයුතු කිරීමේ දී දරන්නට සිදුවන පිරිවැය සහිතව ශේෂ පත්‍ර දිනය වන විට වී ඇති සිද්ධි වෙනුවෙන් ඒවා ආවරණය කිරීමට දැරිය යුතු ඇස්තමේන්තුගත පිරිවැයෙන් එවැනි හිමිකම් පෑම් සඳහා මේ වන විටත් ගෙවා ඇති මුදල අඩු කළ පසු ලැබෙන අගය.

### සහභාග රක්ෂණය

නිශ්චිත වාර මුදල් එකඟ වුණු අනුපාතයක් මත ගෙවීමේ පදනම මත අවදානම් ආවරණය සඳහා රක්ෂකයන් දෙදෙනකු හෝ කිහිප දෙනෙකු රක්ෂිතයා සමඟ අති කර ගන්නා තනි ගිවිසුමක්.

### කොමිස්

රක්ෂකයාගේ නිස්පාදනයක් විකිණීම හෝ සේවාකරණය වෙනුවෙන් තැරැව්කරුවකුට හෝ රක්ෂණ නියෝජිතයකුට කරන ගෙවීමක්.

### සම්බන්ධතා අවදානම

රක්ෂකයා විසින් සිය වත්කම් ණය ගෙවීමේ අවදානම අවම වන පරිදි විවිධාංගීකරණය වූ ආයෝජනයන්හි නොයෙදූ විට ඇතිවන අමතර අවදානම.

### ණය අවදානම

දුන් ණය නියමිත පරිදි නොලැබීමේ අවදානම.

# පාරිභාෂික ශබ්ද මාලාව

### විලම්භිත අත්කර ගැනීමේ පිරිවැය - සාමාන්‍ය රක්ෂණ ව්‍යාපාර කටයුතු

වාර්ෂික පදනමට ගිණුම්කරණයේ දී එක් ගිණුම් වර්ෂයක සිට ඊළඟ ගිණුම් වර්ෂයට ගෙන යා යුතු, අවදානම හා සම්බන්ධ ගිවිසුම්වල කල් ඉකුත් නොවූ කාලය සඳහා අදාළ වන අත්පත් කර ගැනීමේ පිරිවැය.

### අත්හිටවූ මෙහෙයුම්

නිල සැලැස්මකට අනුව සම්පූර්ණ අංශයක් පරිපාලිත හෝ සමාගමක කොටසක් අදාළ සමාගමෙන් ඉවත් කිරීම.

### ඉපැයූ වාරික

ගිණුම් කාලපරිච්ඡේදයක ආරම්භයේ දී සහ අවසානයේ දී නොඉපැයූ වාරික ප්‍රතිපාදන වෙනුවෙන් සැලසුම් කළ ලිඛිත වාරික මුදල්.

### සාමාන්‍ය රක්ෂණ ව්‍යාපාර කටයුතු

ගිනි, මුහුදු, උවදුරු, මෝටර් වාහන හෝ මිශ්‍ර රක්ෂණ ව්‍යාපාර කටයුතු එකක් හෝ කිහිපයක් තනිව හෝ බද්දට පවත්වාගෙන යාම, ගිණුම් කාලපරිච්ඡේදයක් තුළ දී සාමාන්‍ය රක්ෂණ ව්‍යාපාර කටයුතු සම්බන්ධව ලද මුළු වාරික හෝ ලැබිය යුතු මුළු වාරික ප්‍රතිරක්ෂණ කටයුතු සඳහා ලැබිය යුතු වාරික ද සහිත අගය.

### දළ වාරිකය

වට්ටම්, ආපසු ගෙවීම් හා ප්‍රතිදාන අඩුකිරීමෙන් පසුව එහෙත් ඉඩ දෙන ලද ප්‍රතිරක්ෂණ සඳහා රක්ෂණකරුවකු විසින් ගෙවන ලද හෝ ගෙවිය යුතු වාරික කිසිවක් අඩුකිරීමට පෙර වූ වාරිකය.

### රක්ෂකයා

2007 අංක 07 දරන සමාගම් පනත යටතේ පොදු සමාගමක් ලෙස සංස්ථාපිත කර ඇති සහ 2000 අංක 143 දරන රක්ෂණ කර්මාන්ත විධිමත් කිරීමේ පනත යටතේ ලියාපදිංචි කරනු ලැබ ඇති සමාගමකි.

### අවලංගු වූ රක්ෂණාවරණ

වාරික මුදල් නොගෙවීම මත සහන කාලයද අවසානයේදී අවලංගු වූ රක්ෂණාවරණ.

### රක්ෂණ සංචිතයන්හි ප්‍රමාණවත්භාවය පිළිබඳ පරීක්ෂා

අනාගත මුල්‍ය ප්‍රවාහයන්ගේ වාර්තමාන අගය ගණනය කිරීම තුළින් නිර්නිත රක්ෂණ සංචිතයන්හි ප්‍රමාණවත්භාවය පිළිබඳ පරීක්ෂාව.

### වගකීම් අවදානම

රක්ෂකයා විසින් පවත්වාගෙන යනු ලබන තාක්ෂණික සංචිත සහ රක්ෂණ සංචිතවල, අනාගත හිමිකම් ගෙවීම් සහ අදාල වියදම් ගෙවීම සඳහා එහි ප්‍රමාණාත්මක හැකියාව පිළිබඳ අවදානම.

### දීර්ඝකාලීන රක්ෂණ ව්‍යාපාර කටයුතු

මරණයක හෝ මනුෂ්‍ය ජීවිතයට බලපාන යම් අවිනිශ්චිත සිද්ධියක් වූ විට මුදල් ගෙවීම සඳහා සහතික කැරෙන ගිවිසුම ද ඇතුළුව මනුෂ්‍ය ජීවිතය පිළිබඳ රක්ෂණ ගිවිසුම්වලට සහ මනුෂ්‍ය ජීවිතය මත රඳා සිටිමින් යම් කාල පරිච්ඡේදයක් සඳහා වාරික ගෙවීමට යටත් ගිවිසුම්වලට එළැඹීමේ හෝ එවැනි ගිවිසුම් පවත්වාගෙනයාමේ ව්‍යාපාරයකි.

### වන්දි අනුපාතය

උපයාගත් වාරික සහ වන්දි වියදම් අතර අනුපාතය.

### වෙළඳපොල අවදානම

ආයෝජනයන්හි වෙළඳපොල මිල පහළ යෑමේ අවදානම.

### කල්පිරීම

දීර්ඝකාලීන රක්ෂණ ඔප්පුවක් යටතේ එහි වගන්ති ප්‍රකාරව කාලය අවසන් වීමෙන් රක්ෂිත මුදල් ගෙවිය යුතු අවස්ථාව.

### මරණ අනුපාතය

මුළු ජනගහනයෙන් හෝ එක්තරා වයස් කාණ්ඩයක හෝ මරණ සංඛ්‍යාව ප්‍රතිශතයක් ලෙස මෙය විවිධ ගණනයන් සඳහා භාවිතයට ගැනීමේ පහසුව තකා ගෝලීයව වගුගත කර ඇත.

### ශුද්ධ හිමිකම් පෑම් අනුපාතය හෝ ශුද්ධ අලාභ අනුපාතය

රක්ෂකයන් විසින් ශුද්ධ ආදායම් (අදාළ ප්‍රතිරක්ෂණයෙන් අඩු කළ පසු) සම්බන්ධ ශුද්ධ අලාභ වියදම් නිරූපණය කිරීමට උපයෝගී කර ගනු ලබන සූත්‍රයකි.

$$\frac{\text{දරන ලද ශුද්ධ හිමිකම් පෑම්}}{\text{ඉපැයූ ශුද්ධ වාරික ආදායම}} \times 100$$

### ශුද්ධ ඒකාබද්ධ අනුපාතය - ජීවිත නොවන

ශුද්ධ අලාභ අනුපාතය සමඟ ශුද්ධ වියදම් අනුපාතය සම්බන්ධ කර රක්ෂකයාගේ මෙහෙයුම්වල ලාභදායීත්වය මෙයින් නිරූපණය වෙයි. මෙම ඒකාබද්ධ අනුපාතය ගණනය කිරීමේ දී ආයෝජන අදායම් සැලකිල්ලට නොගැනෙයි.

$$\frac{\text{දරන ලද ශුද්ධ හිමිකම් පෑම්}}{\text{ඉපැයූ ශුද්ධ වාරික ආදායම}} \times 100 + \frac{\text{වියදම්} \times 100}{\text{ඉපැයූ ශුද්ධ වාරික}}$$

### ශුද්ධ ඉපැයූ වාරික - සාමාන්‍ය රක්ෂණ ව්‍යාපාර කටයුතු

ප්‍රතිරක්ෂණ වාරික සහ නොඉපැයූ වාරිකවල වැඩිවීම සහ අඩුවීම සඳහා ගළපන ලද දළ ලිඛිත වාරික ආදායම.

### ශුද්ධ වියදම් අනුපාතය - ජීවිත නොවන

ආදායම් අත්පත් කර ගැනීමේ සහ පරිපාලන වියදම් (උදා :- කොමිස්, බදු, සේවක පරිවැය, අලෙවිකරණ සහ මෙහෙයුම් වියදම්) අදාළ කර ගැනීම සඳහා රක්ෂණ සමාගම් විසින් යොදා ගනු ලබන සූත්‍රයකි.

### සහභාගීත්වය රහිතව ඔප්පුව - ජීවිත රක්ෂණ ව්‍යාපාර කටයුතු

ජීවිත රක්ෂණ ව්‍යාපාරය කටයුතුවල දී ඔප්පු හිමියාට අදාළ ජීවිත රක්ෂණ අරමුදලේ අතිරික්තයට හිමිකම ලැබීමට ගිවිසුම්මය අයිතියක් නොමැති රක්ෂණ ඔප්පු.

### එක් වරක් ලැබෙන අතිරික්තය

ශුද්ධ වාරික තක්සේරු ක්‍රමවේදයේ සිට දළ වාරික තක්සේරු ක්‍රමවේදයට වෙනස්වීම නිසා ජීවිත රක්ෂණ අරමුදලේ තක්සේරු වටිනාකමෙහි ඇතිවුණු අතිරික්තය.

### ඔප්පුව

රක්ෂණ ගිවිසුමක නියම හා කොන්දේසි ඇතුළත් කර ඇති ලියැවිල්ලකි.

# පාරිභාෂික ශබ්ද මාලාව

### ඔප්පු හිමියා

රක්ෂණකරු සමඟ අදාළ ගිවිසුමට පැමිණ අදාළ රක්ෂණ ඔප්පුවේ තත්කාලීන නෛතික හිමිකරුවන තැනැත්තා.

### ඔප්පු ණය

ජීවිත රක්ෂණ ඔප්පුවක පවාරන අගය ඇපයට තබමින් ඔප්පු හිමියකු විසින් රක්ෂකයාගෙන් ගනු ලබන ණය මුදලකි. මෙම ණය මුදල සාමාන්‍යයෙන් ඔප්පුවේ වර්තමාන පවාරන වටිනාකමේ ප්‍රතිශතයක් සඳහා සීමාවන අතර එවැනි ණය මුදල් සඳහා පොලී අය කරනු ලැබේ.

### ප්‍රාථමික රක්ෂකයා

රක්ෂණ වාරිකයක් වෙනුවෙන් අවදානම් බාර ගනු ලබන්නා වූ ද රක්ෂණ ඔප්පු හිමියා සමඟ සෘජු ගිවිසුම්ගත සම්බන්ධතාවක් පවත්වාගනු ලබන්නා වූ ද රක්ෂණ සමාගම්. (තනි පුද්ගලයන්, ආයතන හෝ සංවිධාන)

### මෙහෙයුම් ලාභය

ආයෝජන ආදායම, ශුද්ධ ප්‍රාග්ධන ලාභ සහ වෙනත් ආදායම් සැලකිල්ලට ගත් පසු සාමාන්‍ය රක්ෂණ ව්‍යාපාර කටයුතුවලින් උපයා ගන්නා ලද ලාභය.

### මෙහෙයුම් අවදාන

නිසි ලෙස කළමනාකරණය නොවූ මෙහෙයුම් පද්ධති, ශ්‍රම ක්‍රියාවලීන් සහ බාහිර බලපෑම් නිසා සිදුවන පාඩු පිළිබඳ අවදානම.

### ප්‍රතිරක්ෂණය

එක් පාර්ශ්වයක් (ප්‍රතිරක්ෂකයා) විසින් කිසියම් ප්‍රතිෂ්ඨාවක් සමඟ අනෙකුත් පාර්ශ්වයක් (ප්‍රතිරක්ෂිතයා - ප්‍රාථමික රක්ෂණකරු එළැඹුණු රක්ෂණ ඔප්පුවක හෝ ඔප්පුවල වගකීම්වලින් කොටසක් හෝ මුළුමණින්ම හානිපූරණය කිරීමට ඇති කර ගනු ලබන එකඟතාවකි.

### ප්‍රතිරක්ෂණ කොමිස්

ප්‍රතිරක්ෂකයාට ගෙවූ හෝ ගෙවිය යුතු වාරිකවලට අදාළව ලැබුණු හෝ ලැබිය යුතු කොමිස් මුදල්.

### භාරගනු ලබන ප්‍රතිරක්ෂණ

ප්‍රතිරක්ෂණ ගිවිසුමක් යටතේ අවදානම් භාරගැනීම.

### භාර දෙනු ලබන ප්‍රතිරක්ෂණ

ප්‍රතිරක්ෂණ ගිවිසුමක් යටතේ අවදානම් ස්ථානගත කිරීම.

### ප්‍රතිරක්ෂණ ලාභ කොමිස්

ප්‍රතිරක්ෂිත ගිවිසුමක් යටතේ ප්‍රතිරක්ෂිතයා විසින් උපයන ලද ලාභය (ප්‍රතිරක්ෂණ ගිවිසුමෙහි නිර්වචනය කරනු ලැබ ඇති පරිදි) පාදක කරගෙන ප්‍රතිරක්ෂකයකුගෙන් ප්‍රාථමික රක්ෂිතයා ලද හෝ ලැබිය යුතු කොමිස් මුදල්.

### රඳවා ගැනීම

භාරගනු ලැබ අවදානමින් රක්ෂණකරු /ප්‍රතිරක්ෂණකරු විසින් ප්‍රතිරක්ෂණය කරනු නොලබන / පවරනු නොලබන කොටස හෙවත් ස්වකීය ගිණුම වෙනුවෙන් රඳවාගත් ආදායම.

### ප්‍රති ප්‍රතිරක්ෂණය

ප්‍රතිරක්ෂකයා විසින් සිය අවදානමෙන් තවත් ප්‍රතිරක්ෂකයෙකු වෙත පැවරීම.

### නියමිත අවදානම් ප්‍රාග්ධනය (RCR)

2015 ණය ගෙවීමේ හැකියාවේ සීමා (අවදනම් පදනම් වූ ප්‍රාග්ධන) රීති ප්‍රකාරව නිර්නය කරනු ලැබූ අදාල සහ ප්‍රමාණවත් අවදනම් වෙනුවෙන් නියමිත ප්‍රාග්ධනය.

මෙය ගණනය කිරීමේදී රක්ෂණ අරමුදල මෙන්ම කොටස් හිමියන්ගේ අරමුදල්ද සලකා බැලේ. තවද මෙය ජීවිත සහ ජීවිත නොවන රක්ෂණ සඳහා ආකාර දෙකකි.

**(අ) සාමාන්‍ය රක්ෂණ ව්‍යාපාරය**

RCR = √[(ණය අවදනම් ප්‍රාග්ධන ගාස්තුව + සම්බන්ධතා අවදානම් ප්‍රාග්ධන ගාස්තුව + ප්‍රතිරක්ෂණ අවදනම් ගාස්තුව + වෙළඳපොළ අවදනම් ගාස්තු)$^2$ + වගකීම් අවදනම් ප්‍රාග්ධන ගාස්තුව$^2$ + මෙහෙයුම් අවදනම් ප්‍රාග්ධන ගාස්තුව$^2$]

**(ආ) දීර්ඝකාලීන රක්ෂණ ව්‍යාපාරය**

RCR = උපරිම [ පවාරණ වටිනාකම් / ප්‍රාග්ධන ගාස්තුව

√[(ණය අවදානම් ප්‍රාග්ධන ගාස්තුව + සම්බන්ධතා අවධානම් ප්‍රාග්ධන ගාස්තුව + ප්‍රතිරක්ෂණ අවදනම් ප්‍රාග්ධන ගාස්තුව + වෙළඳපල අවදනම් ප්‍රාග්ධන ගාස්තුව)$^2$ + වගකීම් අවදනම් ප්‍රාග්ධන ගාස්තුව$^2$ + මෙහෙයුම් අවදනම් ප්‍රාග්ධන ගාස්තුව$^2$]

### ණය ගෙවීමේ හැකියාවේ සීමා (අවදානම් පදනම් වූ ප්‍රාග්ධන)

2000 අංක 43 දරණ රක්ෂණ කර්මාන්තය විධිමත් කිරීමේ පනතේ 26(1) වගන්තිය සමග කියවිය යුතු එකී පනතේ 105 වැනි වගන්තිය යටතේ ශ්‍රී ලංකා රක්ෂණ මණ්ඩලය විසින් සාදනු ලබන රීති යටතේ රක්ෂණ සමාගම් විසින් පවත්වාගත යුතු අවම ප්‍රමාණවත් ප්‍රාග්ධන අනුපාතය සහ අවම පූර්ණ පවත්නා ප්‍රාග්ධනය.

### පවාරණ අගය

ජීවිත රක්ෂණයක් සම්බන්ධව එම රක්ෂණ ඔප්පුව කල්පිරීමට පෙර ඔප්පු හිමියකු ජීවිත රක්ෂණය අත්හිටුවීමේ දී රක්ෂකයා විසින් ඔප්පු හිමියාට ගෙවනු ලැබිය යුතු මුදල පවාරණ අගයයි. ඇතිවීම සඳහා අවම වශයෙන් වසර 3ක් වත් අඛණ්ඩව එම ජීවිත රක්ෂණ ඔප්පුව ක්‍රියාත්මකව පැවතිය යුතුය.

### පවාරණ වටිනාකම් ප්‍රාග්ධන ගාස්තු

බලාත්මක පවතින රක්ෂණ ඔප්පුවල පවාරණ වටිනාකම් වල එකතු අගයෙන් රක්ෂණ ඔප්පු වටිනාකම්වල එකතුව අඩුකල විට ලැබෙන අගය.

### තාක්ෂණික සංචිතය

රක්ෂණ ව්‍යාපාරය හා සෘජුවම සම්බන්ධ අවිනිශ්චිත වගකීම් වේ. මෙම වෙන්කිරීම් රක්ෂණ ගිවිසුමේ සඳහන් පොරොන්දු ඉටුකරන බවට තහවුරු කරගැනීම සඳහා වේ.

# පාරිභාෂික ශබ්ද මාලාව

### පළමුවන ශ්‍රේණියේ ප්‍රාග්ධනය

ක්‍රියාත්මකව පවතිද්දී සහ වසා නිම කිරීමේදී යන අවස්ථා දෙකේදීම සියලු විට රක්ෂණකරුවකුගේ පාඩු ආවරණය කිරීම සඳහා සම්පූර්ණයෙන් පවතින ස්ථිර ප්‍රාග්ධනය.

### දෙවන ශ්‍රේණියේ ප්‍රාග්ධනය

ක්‍රියාත්මකව පවතිද්දී හෝ වසා නිම කිරීමේදී යන අවස්ථා දෙකේදීම යම්තාක් දුරට පාඩු අන්තර්ග්‍රහණය කිරීම පෙන්නුම් කරන ප්‍රාග්ධනය.

### පවත්නා මුළු ප්‍රාග්ධනය

පළමුවන ශ්‍රේණියේ ප්‍රාග්ධනය සහ දෙවන ශ්‍රේණියේ ප්‍රාග්ධනය එකතු කලවිට ලැබෙන අගයෙන්, නියමිත අඩුකල යුතු අයිතමයන් ඉවත් කිරීමෙන් ලැබෙන අගය.

### ප්‍රාරක්ෂණ ලාභය

ආයෝජන ආදායම සහ අනෙකුත් ආදායම් සැලකිල්ලට නොගෙන සාමාන්‍ය රක්ෂණ ව්‍යාපාර ගනුදෙනු මඟින් උත්පාදනය කර ගනු ලබන තාක්ෂණික ලාභය.

### නොඉපැයූ වාරිකය

ගෙවීමට නියමිත ඇතැයි ගිණුම්වලට මේ වන විටත් ඇතුළත් කරනු ලැබ ඇති නමුත් ශේෂ පත්‍රයේ දිනයෙන් අනතුරුව එළැඹෙන යම් අවදානම් කාල සීමාවකට අදාළ වාරික මුදල්වල කොටසක් මෙයින් නියෝජනය වෙයි.

### නොඉපැයූ වාරික සංචිතය

දැනටමත් ක්‍රියාත්මකව පවතින රක්ෂණ ඔප්පු යටතේ අනාගතයේ දී උද්ගත විය හැකි හිමිකම් පෑම් සඳහා ප්‍රතිපාදනය කිරීම අරභයා සාමාන්‍ය රක්ෂණකරු විසින් පවත්වාගෙන යනු ලබන අරමුදලකි.

### කල් ඉකුත් නොවූ ආදායම් සංචිතය

ශේෂ පත්‍ර දිනට පෙර ගිවිසුම් හමාර කළ නමුත් ශේෂ පත්‍ර දිනයෙන් පසුව ඇති විය හැකි හිමිකම් පෑම්, වන්දි සහ වියදම් සඳහා ඇස්තමේන්තු කළ අගයෙන් මේ දක්වා නොඉපැයූ වාරික වශයෙන් (කිසියම් විලම්භිත අත්පත් කර ගැනීමේ පිරිවැයක් ඇත්නම් එය අඩු කළ පසු) ප්‍රතිපාදනය කරන ලද අගය ඉක්මන ප්‍රමාණය.

# පොදු තොරතුරු

## කාර්යාල ලිපිනය

11 වන මහල, නැගෙනහිර කුළුණ,
ලෝක වෙළඳ මධ්‍යස්ථානය
කොළඹ 01
ශ්‍රී ලංකාව
දුරකථන : +94 11 2396184-9
ෆැක්ස් : +94 11 2396190
විද්‍යුත් ලිපිනය : info@ibsl.gov.lk
වෙබ් අඩවිය : www.ibsl.gov.lk

## නෛතික ස්වභාවය

2000 අංක 43 දරන රක්ෂණ කර්මාන්තය විධිමත් කිරීමේ පනතෙහි වගන්ති ප්‍රකාරව ශ්‍රී ලංකාව තුළ ස්ථාපනය කරනු ලැබ ඇති ව්‍යවස්ථාපිත මණ්ඩලයක් වන අතර එය 2001 පෙබරවාරි 23 දින රජයේ ගැසට් නිවේදන අංක 1172/27 මගින් බලය දී ඇති පරිදි 2001 මාර්තු 01 දින සිට ක්‍රියාත්මක වන පරිදි මෙහෙයුම් කටයුතු අරඹන ලදි.

## මණ්ඩලයේ අරමුණ සහ වගකීම්

ශ්‍රී ලංකාව තුළ රක්ෂණ ව්‍යාපාර අවංකව, වෘත්තීයමය වශයෙන් හා විචක්ෂණශීලීභාවයෙන් පවත්වාගෙන යාම තුළින් ඔප්පු හිමියන්ගේ සහ අනාගත ඔප්පු හිමියන්ගේ අයිතිවාසිකම් ආරක්ෂා කිරීම තහවුරු කිරීම.

## ගිණුම් වර්ෂය

දෙසැම්බර් 31 දක්වා

## විගණකවරු

විගණකාධිපති

## බැංකුකරුවන්

ලංකා බැංකුව

## විගණන කමිටුව

ඒ.ආර්. දේශප්‍රිය මහතා
ආචාර්ය ඒ. ඒ. ශබීර් ගුලාම්හුසේන් මහතා
ජෙරම් බෝලින් මහතා

INSURANCE
BOARD OF SRI LANKA

11 වන මහල, නැගෙනහිර කුළුණ, ලෝක වෙළඳ මධ්‍යස්ථානය, කොළඹ 01, ශ්‍රී ලංකාව
දුරකථන : +94 11 2396184-9 | ෆැක්ස් : +94 11 2396190
විද්‍යුත් ලිපිනය : info@ibsl.gov.lk | වෙබ් අඩවිය : www.ibsl.gov.lk